

# විනය සංග්‍රහය.

# විනය සඞ්ග්‍රහය.

විද්‍යෝදය පිරිවෙණෙහි උපප්‍රධානාචාර්ය
පණ්ඩිත වල්ගොව්වාගොඩ සුමඞ්ගල ස්ථවිරයන්
වහන්සේ විසින් ලියන ලදී.

පොල්ගහවෙල වෙහෙරපිටියේ විද්‍යෝදය පරිවෙණාධිපති
කොසෙල්වතුගොඩ
ධර්මකීර්ති ශ්‍රී සාරාර්ථදර්ශී රතනජෝත්‍යභිධාන
දඹදෙණි හත්පත්තුවේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
වි සි න්
අවසාන ශෝධ්‍යපත්‍රාවලෝකනයෙන් ප්‍රතිගෘහිතයි.

යටිනුවර - වල්ගොව්වාගොඩ
ආර්. බී. විජේකෝන් මහතා
වි සි න්
වැල්ලම්පිටියේ නවජීවන යන්ත්‍රාලයේ
මුද්‍රාපිතයි.

2490
1946

# සංඥාපනය.

ත්‍රිභුවන චූඩාමාණික්‍යවූ ශ්‍රී ජිනෙන්ද්‍ර තථාගත සම්මා සම්බුද්ධ රජාණන්වහන්සේ විසින් සකල ලොකවාසී සත්ව ප්‍රජාව වෙත පතළ මහකුළුණින් ඇතිකර වදාළ පරියත්ති පටිපත්ති පටිවෙධ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ශාසනයාගේ චිරස්ථිතියට පයස්ථාපනී සඞ්ඛ්‍යාත ත්‍රිපිටක බුද්ධ වචනයම මුල් වන්නේය. එහිනුත් "විනයෙ ඛො පන ඨිතෙ සාසනං ඨිතං හොති" විනය දෙශනාව පවත්නාතාක්ම ශාසනය පවත්නේ වේ. (විනය දෙශනාව නටකල්හි ශාසනයද නටුයේ) නම් වනැයි ප්‍රකාශිත බැවින් විනය පිටකයම බුදුසසුනට මූලයයි දන්නාලදී. එහෙයින් අනුබුද්ධ මහාකාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ සිව්පිළිසිඹියාපත් පන්සියයක් මහ රහතන් වහන්සේලා විසින් ප්‍රථම සඞ්ගායනා සමයෙහි "විනයං පන බුද්ධ සාසනස්ස ආයු" විනය දෙශනාව වනාහි බුද්ධ ශාසනයාගේ ආයුෂය යයි නිශ්චයකොට ගෙණ සාටඨකථා විනය පිටකය උපාලි මහ තෙරුන් විචාරා පළමුකොටම සඞ්ගායනා කරණලදී. "විනය පරියත්ති කුසලොහි පුග්ගලො සාසනෙ පටිලද්ධ සද්ධානං කුලපුත්තානං මාතාපිතුට්ඨානියො හොති, තදායත්තා හි තෙසං පබ්බජ්ජා උපසම්පදා වත්තානුවත්ත පටිපත්ති ආචාර ගොචරකුසලතා" විනයෙහි ව්‍යක්තවූ පුද්ගලතෙමේ සැදැහැවත් ශාසනාවචර කුලපුත්‍රයන්ගේ දෙමා පිය තනතුරට යොග්‍ය වේ. කුමක් හෙයින්ද යත්? ඔවුන්ගේ පැවිද්ද, උපසපුව, වත්පිළිවෙත් පිරීම, ආචාර ගොචරවයෙහි බුහුටිබව, විනය නය නිපුණයා පිළිබඳවම පවත්නා හෙයිනි. "අපිච ස්ස විනය පරියත්තිං නිස්සාය අත්තනො සීලක්ඛන්ධො සුගුත්තොහොති සුරක්ඛිතො කුක්කුච්ච පකතානං පටිසරණං හොති, විසාරදො සඞ්ඝමජ්ඣෙ වොහරති, පච්චත්ථිකෙ සහ ධම්මෙන සුනිග්ගහිතං නිග්ගණ්හාති, සද්ධම්මට්ඨිතියා පටිපන්නො හොති" තවද ඔහුගේ විනය ප්‍රවීණත්වය හේතුකොටගෙණ ස්වකීය ශීල රාශිය සුගොපිත සුරක්ෂිත වන්නේය. හටගත් කුකුස් ඇත්තවුන්ට ඔහු පිළිසරණෙක් වන්නේය. සඟ මැද අභීතව ක්‍රියා කරන්නෙක් වන්නේය. වරද සහිත විරුද්ධවාදීන්ගට මොනවට නිගා කරන්නේය. ශාසනයාගේ චිරස්ථිතිය පිණිස පිළිපන්නෙක් වන්නේය. කුසල ධර්මයෝ යම්බඳු සංවරයක් මුල්කොට ඇත්තාහු යයි වදාරණ ලදද විනයධර පුද්ගල තෙමේ ඒ සංවරාදිය දයාදකොට ඇත්තෙක. කුමක්හෙයින්ද? ඒ සංවරාදියට විනය මුල්වන හෙයිනි. ඒ බැව් "විනයො සංවරත්ථාය සංවරො අවිප්පටිසාරත්ථාය අවිප්පටිසාරො පාමොජ්ජත්ථාය පාමොජ්ජං පීතත්ථාය පීති පස්සද්ධත්ථාය පස්සද්ධි සුඛත්ථාය සුඛං සමාධත්ථාය සමාධි යථාභූත ඤාණදස්සනත්ථාය යථාභූතඤාණදස්සනං අනුපාද පරිනිබ්බානත්ථාය" යනු වදාළහෙයින් විනය තෙමේ කායවාක් සංවරය පිණිසද කාය වාක් සංවරය නො විපිළිසර බව පිණිසද විපිළිසර නැතිබව කාශිත් ප්‍රමොදය පිණිසද කාශිත් ප්‍රමොදය ප්‍රීතිය පිණි

සඳ ප්‍රීතිය නැඟ ප්‍රීතිය පස්සද්ධිය පිණිසද එය සැපය පිණිසද සැපය චිත්ත සමාධානය පිණිසද සමාධිය යථාභූතඥාන දර්ශනය පිණිසද යථාභූතඥාන දර්ශනය අභිනිර්මාහී ඥානයෙන් සකලක්ලේශයන් මූලෝත්පාටනය කොට නිවන් පසක් කිරීම පිණිසද පවත්නේය.

භික්ෂු භික්ෂුණී දෙපිරිස පිළිබඳ කාය වාක් චාරයන් හික්මවා ගණී මින් පිළිපැදියයුතු උභයමාතිකා, උභයවිභඞ්ග, මාවීසතිඛන්ධක, සොළස පරිවාර යන ප්‍රඥප්තිපථය විනය යන නාමයෙන්ද, තදන්‍ය ජිනවචනය ධර්ම යන නාමයෙන්දැයි පිටකත්‍රයාත්මක සියලු බුදුවදන ධර්ම ප්‍රමාණ වශයෙන් සුවාසූදහසක් වුවද ධර්ම විනය වශයෙන් දෙවැදෑරුම් වන් නේය. “විනෙති සත්තා එතෙන වා ති විනයො, කාය වාචානං විනයනා තොාති විනයො”යි විනය නාමයාගේ නානාර්ථය දක්වෙන්නේ මේ කරණකොටගෙණ සත්වයන් හික්මවීම කාරණහෙයින් හෝ කාය වාක් චාරයන් හික්මවන හෙයින් හෝ විනය නම් වන්නේය කියායි.

තිලොවට ගුරුවූ තථාගත සර්වඥයන්වහන්සේගේ ඒ මේ විනය ප්‍රඥප්ති සමූහය නියොගකිරීම් හෙවත් අණවීම් ස්වරූපාර්ථයෙන් යුක්ත බැවින් “ආණා දෙසනා” යයිද අපරාධ කළවුන්හට යථායොග්‍ය පරිදි අනුශාසනා කරණලද හෙයින් “යථාපරාධ සාසන” යයිද වරදින් මිදීමට සංවර වීමෙහි අනුසස් හා අසංවර වීමෙහි ආදීනවයන් ප්‍රකාශ වනහෙයින් “සංවරා’සංවර කථා”යි ද මෙසේ නාමත්‍රයකින් ශාසන ධර්ම යෙහි ප්‍රකාශයට පැමිණියේය.

හික්මවීම් අර්ථයෙන් එක් වැදෑරුම්වූ විනය–සංවර විනය–ප්‍රහාණ විනය–සමථ විනය–ප්‍රඥප්ති විනය කියා සතරාකාර වන්නේය. සිය සිත අකුසලෝත්පත්තියෙන් වළකා රැක ගැණීමයයි කියනලද සංවර විනය–සතිසංවරය, සීලසංවරය, ඥාණසංවරය, ඛන්තිසංවරය, විරිය සංවරය කියා පස් ආකාර වේ. චක්ෂුරාදී ඉන්ද්‍රියයන් සමෘතිමත්ව සංවර කරගැණීම සති සංවරයයි. ප්‍රාතිමොක්ෂාදි චතුපාරිශුද්ධි සීල ගුණයෙන් සමන්විතව සංවරවීම සීල සංවරයයි. වරදින් නොබැඳෙනසේ යොනි–සොමනස්කාරයෙන් යුක්තවීම ඥාන සංවරයයි. ශීත සුලං ආදී විෂම ප්‍රත්‍යයයන් ඉවසමින් කායාදිය රැකගැණීම ඛන්ති සංවරයයි. කාම විතර්කාදිය වීර්‍ය්‍යයෙන් මැඩලීම විරිය සංවරයයි.

**ප්‍රහාණ විනය නම් :**—තදඞ්ග, වික්ඛම්භන, සමුච්ඡේද, පටිප්පස්සද්ධි නිස්සරණ යන පස්වැ හෙදයෙන් ඒ ඒ අඞ්ගයන් හේතුකොටගෙණ කෙලෙසුන් අනුත්පාද භාවයට පැමිණවීමය. **සමථ විනය නම් :**—භික්ෂූන් අතර ඇතිවන්නාවූ විවාදාධිකරණ, අනුවාදාධිකරණ, ආපත්තාධි කරණ කිච්චාධිකරණ, යන චතුර්විධ අධිකරණයන්ගේ සංසිඳවීම පිණිස පණවා වදාළ සම්මුඛාවිනය, සතිවිනය, අමූළ්හවිනය, පටිඤ්ඤාතකරණ, යෙභුය්‍යසිකා, තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරක යන සමථ නාමයෙන් දක්වෙන කාරුණු සතය. එහි සම්මුඛා විනය නම් :—සඞ්ඝයාගේ හමුවීම, ආපත්තිය එළඹීම, ඇවැත් අවන් පුඟුලාගේ එළඹීම යන ත්‍රිවිධ සම්මුඛතාවයෙන් යුක්තව පැමිණි අධිකරණය සංසිඳවීමයි. **සති විනය නම් :**—දබ්බමල්ලපුත්තාදි සතිවෙපුල්ලභාවයට පැමිණි “සුද්ධොහොති

භික්ඛු අභාපත්තිකො" යනාදී පසඟින් යුත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට දුගැමි සඞ්ඝයා විසින් කම්ම වාක්‍යයෙන් දියහැකි සමථයයි. **අමූළ්හ විනය නම්** :—"ගග්ග" භික්ෂුව බඳු උමතු බැවින් මුළාවූ භික්ෂූන්ට ත්‍රිවිධ ධාර්මිකයන්ගේ වශයෙන් දියයුතු විනයයයි. **පටිඤ්ඤාත කරණ නම්**:— පාරාජික සඞ්ඝාදිසෙසාදී ඇවැතකට පැමිණියේ යයි ප්‍රතිඥා දුන් කල්හි ධර්මානු ශාසනයෙන් ආයති සංවරයෙහි පිහිටුවන විනයයයි. **යෙභුය්‍ය සිකා නම්** :— යම් අධිකරණයෙක්හි ධර්මවාදී පිරිස අධික නම් එහි ලහ ගැණුම් ආදියෙන් කලහ විවාදවකාශ නොවන ලෙස බහුතර සම්මත යෙන් සමථය කිරීමයි. **තස්සපාපිය සිකා නම්** :— "උවාළ" භික්ෂුව වැනි පාපොත්සන්න පුද්ගලයන්ට කළයුතු සමථයයි. **තිණවත්ථාරකය නම්** :— යම් අධිකරණයක් කාර්කශනාවය ව්‍යාලුභාවය පිණිස පවතීනම් හෙදකරවූ ඒ අධිකරණය දුගීඹවූ යමක් තණපත් ආදියෙන් වසාලන් නාක්මෙන් සංසිඳවන සමථයයි.

"පඤ්ඤත්ති විනය" වනාහි සුත්ත, සුත්තානුලොම, ආචරියවාද, අත්ත නොමතියයි සතරාකාරවේ. සියලු විනය පිටකයට අයත්, මාතිකා, විභඞ්ග ඛන්ධක, පරිවාර වශයෙන් ප්‍රභෙද ඇති පාලි ධර්මය සූත්‍ර නම්. සතර මහා ප්‍රදෙශ නයසූත්‍රානුලොම නම්වේ. මෙය සූත්‍ර සඞ්ඛ්‍යාත පාලියට අනුලොම්ව ගතයුතු බැවින් සුත්තානු ලොමයයි කියනු ලැබේ. ධර්ම සඞ්ග්‍රාහක පන්සියයක් රහතුන්වහන්සේ විසින් තබනලද පාලිවිනිර් මුක්තවූ ඔකකනතික විනිශ්චයවූ අට්ඨ කථා පාලිය ආචරියවාද නම්. පාලිමුත්තක විනය යනුද මීට නමෙකි. **අත්තනොමති නම්** :—සුත්ත, සුත්තානුලොම, ආචරිය වාදයන්හි පිහිටි විනයධරයාගේ සිතෙහි අනු මෙය බුද්ධියෙන් උපදින නයග්‍රාහ කථාව හෝ සූත්‍රාභිධර්ම විනයාට්ඨ කථා ගත සියලු ථෙරවාදය හෝ අත්තනොමතියයි. තවද ශ්‍රී මූඛ පාලිය සූත්‍රයයිද, ශ්‍රාවක භාෂිතය සුත්තානු ලොමයයිද, අට්ඨ කථා පාලිය ආචරිය වාදයයිද, ටීකා පාලිය අත්තනොමතියයිද නයග්‍රාහ වශයෙන් කියහැකිය.

විභඞ්ග ඛන්ධකයන්හි වූ නිර්දෙශයන්ගට උද්දෙශමාත්‍රය වූ ප්‍රාති මොක්ෂය මාතිකායයිද, භික්ෂු භික්ෂුණී වශයෙන් හෙදවූ පාරාජිකා පාචිත්තිය යන ග්‍රන්ථායතනගත සිකපද රැස විභඞ්ගයයිද චුල්ලවග්ග- මහාවග්ගයන්හි ආ දෙවිසිකඳුවන් ඛන්ධක නමින්ද, සොළොස් පරිවාරය පරිවාර නමින්ද ව්‍යවහාරප්‍රාප්ත විය.

මේ ආදී ශාසනික විනය ඥානය පිළිබඳ ශ්‍රෙෂ්ඨතම අනුසස් රැශිය සිහිකරමින් ස්වභාෂාවෙන් විනය ග්‍රන්ථයක් ඇතිවීම මෙකලට අවශ්‍යය යි සැලකූ බුද්ධිමතුන්ගේ අදහසට ගරුකිරීමක් වශයෙන් විපුල ලොක ශාසනොපකාරයකැයි සලකා ආචාර්යොපදෙශ අනුගමනය කිරීමෙන් **විනය සංග්‍රහය** නැමැති මේ ග්‍රන්ථය ස්වභාෂාවෙන් තිපදවන ලදී. සිය බසින් විනය ග්‍රන්ථයක් සැපයීම ශාසන සඞ්ග්‍රහයක් වන නමුත් එබන්දෙහි ඇති දුෂ්කරභාවය තත්ත්වඥයෝ දනිත්මය. එහෙයින් මෙය ඌනාතිරික්තාදි දෙෂයන්ගෙන් මුක්තයයි නො පවසමු. ප්‍රථග්ජන ලොකයෙහි දෙෂ විනිර්මුක්ත කිසිවක් නොලැබෙන සෙයිනි.

මේ ග්‍රන්ථයෙහි අන්තර්ගත දෑ සැකෙවින් මෙසේ දත්වනු. **පළමුවෙනි පරිච්ඡේදයෙහි**— 1. විනය යන්නෙහි අදහස, 2. ශික්ෂා පැණවීම, 3. ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය, 4. ප්‍රථම පාරාජිකාව පිළිබඳ විස්තර හා සම තිස් මාගී, 5. ආපත්ති වාර, 6. ආපත්ති ප්‍රාප්තිය. **දෙවෙනි පරිච්ඡේදයෙහි**—1. ද්විතීය පාරාජිකාපත්තිය පිළිබඳ විස්තර, 2. කාෂාපණ විනිශ්චය, 3. පස්විසි අවහාර විභාග. **තුන්වෙනි පරිච්ඡේදයෙහි**—1. තෘතීය පාරාජිකාපත්තිය පිළිබඳ විස්තර, 2. සාහත්ථිකාදි ප්‍රයෝග විනිස, 3. ආපත්තිවාර, 4. ආපත්ති ප්‍රාප්ති. **සතරවෙනි පරිච්ඡේදයෙහි**—1. චතුර්ථ පාරාජිකාපත්තිය පිළිබඳ විස්තර, 2. අධිමානය පිළිබඳ ධර්ම විභාග, 3. ආපත්තිවාර, 4. ආපත්ති ප්‍රාප්තිය, 5. සූවිසි පරිජි විනිස. **පස්වෙනි පරිච්ඡේදයෙහි**—1. සුක්කවිස්සට්ඨිකා, 2. කාය සංසග්ග, 3. දුට්ඨුල්ලවාචා, 4. අත්තකාම පාරිචරියා, 5. සංචරිත්ත. 6. කුටිකාර, 7. මහල්ලක විහාර කාරාපන, 8. අමූලික චෝදනා, 9. කිසියම් දෙස ලෙස, විකුම් සොණෙහි ඇවැත් අවන් මේ නව සඟ වෙසෙස් පිළිබඳ විස්තර. 10. එකාලොස් ආශවාද, 11. දශප්‍රකාර ලේශ, 12. ආපත්ති වාර, 13. පැණවීම පිළිබඳ විස්තර. **සවෙනි පරිච්ඡේදයෙහි**—1. සංඝ භෙද, 2. භෙදානුවර්තක, 3. දුබ්බච, 4. කුලදූසක, තුන්වන සමනුභාෂණ කම්යාගේ අවසානයෙහි ඇවැතට පැමිණෙන සිව් සඟවෙසෙස් පිළිබඳ විස්තර, 5. ආපත්තිවාර, 6. පැණවීම, 7. සඟ වෙසෙස් ඇවැතින් මිදීම. **සත්වෙනි පරිච්ඡේදයෙහි**—1. පරිවාස සමාදානය පිළිබඳ විස්තර. **අටවෙනි පරිච්ඡේදයෙහි**—1. මානත්ත විභාග පිළිබඳ විස්තර. **නවවෙනි පරිච්ඡේදයෙහි**—1. ථුල්ලච්චයාපත්තිස්කන්ධ විභාග, 2. ගරුලඝු පිළිබඳ විනිශ්චය. **දසවෙනි පරිච්ඡේදයෙහි** — 1. නිසගි පචිති, 2. අනුලොම චීවර, 3. අධිෂ්ඨාන කටයුතු චීවර, 4. සීමා විනිස, 5. සඞ්ඝ කම් පිළිබඳ ත්‍රිවිධ සම්පත්ති, 6. අකාල චීවර විභාග, 7. පාත්‍ර විභාග, 8. නිස්සජ්ජන විභාග, 9. ආරණ්‍ය සයනාසන විභාග, 10. ආපත්ති විභාග. **එකොළොස්වන පරිච්ඡේදයෙහි**—1. මුසාවාද, 2. භූතගාම, 3. අසම්මතොවාදක, 4. ආවසථ පිණ්ඩ, මේ සතළිස් පාචිත්තියාපත්ති පිළිබඳ විනිශ්චය, 5. අභූත විනිස, 6. ඔමසවාද විනිස, 7. මාතුගාම විභාග, 8. ආපත්ති විභාග, 9. පෘථිවි විභාග, 10. පඤ්චප්‍රකාර බීජ ග්‍රාම විස්තර, 11. සොළොස් සම්මුති, 12. සිව්වැදෑරුම් ඇඳ පුටු පිළිබඳ විස්තර, 13. දශප්‍රකාර ශයන, 14. භික්ෂුණීන්ට අවවාද දීමට සුදුසු භික්ෂුව, 15. අෂ්ටවාචික උපසම්පදා, 16. අෂ්ට ගරු ධර්ම. **දොළොස්වෙනි පරිච්ඡේදයෙහි**–1. අචෙලක දාන, 2. සුරාපාන, 3. සප්පාණක, 4. සික්ඛාපදවිවණ්ණක, 5. අන්තෙපුරප්පවෙසන, මේ දෙපණස් පචිති පිළිබඳ විස්තර, 6. භික්ෂුණී උපශ්‍රය, 7. පඤ්චභොජන, 8. චීවර දාන, 9. චීවර කාරසමයයන්, 10. පවාරිත විනිස, 11. අනතිරිත්ත විභාග, 12. ඛාදනීය විභාග, 13. කාලික විනිස, 14. සිව්වැදෑරුම් සමයයන් පිළිබඳ විනය නියම, 15. ආපත්ති විභාග, 16. අධිකරණ විභාග, 17. අවසාරණ කම් විස්තරය, 18. විනය කම් විධි පිළිබඳ විස්තර. **දහතුන්වෙනි පරිච්ඡේදයෙහි**—1. පාටිදෙසනීයාපත්ති විභාග, 2. දුට්ඨුල්ලාපත්ති පිළිබඳ විස්තර. **දහසතරවෙනි පරිච්ඡේදයෙහි**—දුර්භාෂිතාපත්ති පිළිබඳ විස්තරය.

**පඤ්ඤාලෝකවෙනි පඤ්ඤානන්දයෝ**— තුදුස්වන් විනිශ පිළිබඳ විස්තර පරිශිෂ්ටය එකතු කරදීනාය.

මේ ග්‍රන්ථය කිරීමේදී අප විසින් ආශ්‍රිත ග්‍රන්ථයෝ නම් :- පාරාජික පාලි-පරිවාර පාලි-පාචිත්තිය පාලි-මහාවග්ග පාලි-චුල්ලවග්ග පාලි-පාතිමොක්ඛ-සමන්තපාසාදිකා විනය අට්ඨකථා-පාලිමුත්තක විනය-කුදු සික-සිකවලඤ්ඤවිනිස-කඞ්ඛාවිතරණී-විනයත්ථමඤ්ජූසා යනාදීහු වෙත්.

මේ විනය ග්‍රන්ථය කිරීමෙන් මා ලත් පුණ්‍යඵලය මාගේ ධර්මාචාර්යවූ **විද්‍යෝදය පරිවෙණාධිපතිවරව වූ බුද්ධ භික්ෂු සංඝයා ශිරෝමණී ශාසනව ශ්‍රී සුමංගල රත්නාකරාභිධාන** නායක මාහිමියානන් වහන්සේට හා මාගේ ප්‍රව්‍රජ්‍යාචාර්ය **පොල්ගහවෙල ඩෙහෙරපිටියේ විද්‍යෝදය පරිවෙණාධිපති පණ්ඩිතාචාර්ය ධර්මකීර්ති ශ්‍රී ඥානදර්ශී කොස්ගල් වතුගොඩ රත්නජෝත්‍යාභිධාන** දඹදෙණි හත්පත්තුවේ ප්‍රධාන සංඝ නායක මාහිමියානන් වහන්සේටද **ගාල්ලේ කළුවැල්ලේ ශ්‍රී ධර්මාරාමාධිවාසී ආචාර්ය භද්‍රාවන ශ්‍රද්ධානන්දාභිධාන** මාහිමියානන් වහන්සේටද ගුරුභක්ති පූර්වකව අනුමෝදන් කරවමි.

එසේම මෙය මුද්‍රණය කරවීමේදී ආමින්තොඩ පදිංචි ගුණවත් ජී. ඇල්. ද ඇස්. ජයවර්ධන සාමු මහත්මයා අපට අතිශය උපකාරීව ක්‍රියාකළ බැව් කෘතඥතා පූර්වකව සඳහන් කරමි.

මුද්‍රණාලයවල ඉතාමත් අවකාශ රහිතවූ මේ කාලයේ මේ ගැණ සැලකීමෙන් කලට වේලාවට නිසිලෙස මුද්‍රණය කරවා දුන් ඇම්. ඩී. ගුණසේන සමාගමේ මහතුන්ටද, වැල්ලම්පිටියේ නවජීවන යන්ත්‍රාලයේ අධිකාරී ගුණවත් ජයවර්ධන මහතුන් ප්‍රමුඛ දක්ෂ ශිල්පීන්ටද අපගේ ප්‍රශංසාව හිමිවේ.

මීට,

බල්ගොඩවාගොඩ සුමංගල ස්ථවිර.

2490
1946. 12. 23 දින
විද්‍යෝදය පිරිවෙණේ දීය.

# ශුද්ධි පත්‍රය.

| පිට. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|
| 4 | දුතීසිකා | දුතිසිකා |
| 23 | ඇවතට | ඇවතටද |
| 25 | මානත | මානත් |
| 30 | මුලාය | මූලාය |
| 32 | ප්‍රසඥ්ඥාතය | ප්‍රසඥ්ජනය |
| 32 | ඉධිෂ්ඨාන | අධිෂ්ඨාන |
| 39 | භික්‍ෂුණින්දට | භික්‍ෂුනීන්ටද |
| 46 | පතිකින් | පතකින් |
| 52 | ගණාමජේ‍යෂ්ඨ | ගණමජේ‍යෂ්ඨ |
| 53 | ද්විතීයාධ්‍යාන | ද්විතීයධ්‍යාන |
| 53 | බිණිනම් | බණිතම් |
| 54 | ද්විධ වේ | ද්වි විධවේ |
| 58 | ශුන්‍යතා | ශූන්‍යතා |
| 60 | මහිරි | මහරි |
| 65 | මසක් පසා | මසක් පාසා |
| 66 | සුයසීං | සුයසීයා |
| 73 | භික්‍ෂුගට | භික්‍ෂුවහට |
| 84 | ධයර්ම | ධර්මය |
| 90 | ඔසවීම් | එසවීම් |
| 91 | කුලා | දුකුලා |

# විනය සඞ්ග්‍රහය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

**"විවිධ විසෙස නයත්තා විනයනතො චෙව කායවාචානං විනයත්ථ විදූහි අයං විනයො විනයොති අක්ඛාතො"**

මේ විනය ධර්‍මයතෙම නානාප්‍රකාර විශෙෂ ක්‍රමයන්ගෙන් යුක්ත හෙයින්ද කය වචන දෙක හික්මවන අර්‍ථයෙන්ද විනයනම් වෙයි, ඒ මේ විනය ආදිබ්‍රහම චරියකය, ආභිසමාචාරිකය, යී දෙවැදෑරුම් වේ.

එහි ආදිබ්‍රහමචරියක ශික්‍ෂාවෝ නම් :—පාරාජික, සඞ්ඝාදිසෙසාදි ගරු ඇවැත් සමූහයයි.

ආභිසමාචාරික නම්:— චාරිත්‍ර වාරිත්‍ර ශික්‍ෂා පදයෝයි.

ආදිබ්‍රහමචරියක ශික්‍ෂාවෝ ආපත්තිසක්ඛන්ධ වශයෙන් සතෙකි.

එනම් :— පාරාජිකාපත්තිසක්ඛන්ධය, සඞ්ඝාදිසෙසාපත්තිසක්ඛන්ධය, ථුල්ලච්චයාපත්තිසක්ඛන්ධය, පාචිත්තියාපත්තිසක්ඛන්ධය, පාටිදෙසනීයාපත්ති සක්ඛන්ධය, දුක්කටාපත්තිසක්ඛන්ධය, දුබ්භාෂිතාපත්තිසක්ඛන්ධය වශයෙනි.

**ශික්‍ෂා පැණවීම.** අර්‍ථවත් කරුණු දසයක් හෙතුකොට භාග්‍ය වතුන්වහන්සේ විසින් ශික්‍ෂාපද පනවනලදී:— 1. සඞ්ඝයාගේ සුන්‍දරභාවය පිණිස හෙවත් සඞ්ඝයාගේ යහපත පිණිස, 2. සඞ්ඝයාගේ පහසු විහරණය පිණිස, 3. දුර්මුඛ පුද්ගලයන්ගේ හෙවත් දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහ පිණිස, 4. ප්‍රිය ශීලී භික්‍ෂූන්ගේ පහසු විහරණය පිණිස, 5. ඉහාත්මයෙහි ඇතිවන්නාවූ ආශ්‍රවයන්ගේ ප්‍රතිෂෙධය පිණිස හෙවත් වැළැක්ම පිණිස, 6. පරලෙව්හි ඇතිවන්නාවූ අකුශලාදි වෛරයන්ගේ ප්‍රතිෂෙධය පිණිස 7. සස්නෙහි නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස, 8. ප්‍රසන්නවූවන්ගේ මතුමත්තෙහි පැහැදීම පිණිස, 9. ශාසනයාගේ චිරස්ථිතිය පිණිස, 10. විනය ධර්‍මයට අනුග්‍රහ පිණිසද යන අර්‍ථවත් කරුණු දශය නිසයි.

**ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානය.** චිත්ත-ක්‍ෂෙත්‍ර-කාල-ප්‍රයොග-පුද්ගල-විජානන-යී ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානය පිළිබඳ අඞ්ග සයක් වෙත්.

උපසම්පදා සීලයෙන් පහවනු කැමැති සිත ඇතිකල්හිම ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානය වන්නේය, සිහිමුළාවීමාදියක් නිසා අනිකක් කියනු කැමැතිව "බුද්ධං පච්චක්ඛාමි" බුදුහු ප්‍රත්‍යාඛ්‍යානය කරමියි වැරැදිව

බණන්නාහට ප්‍රත්‍යාඛ්‍යානය නොම වේ. ඒ සිතින් යුතුවම ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යානය කටයුතු බැව් මෙයින් දක්විති. ඉන් තොරව ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානයක් නැත්.

"බුද්ධං පච්චක්ඛාමි, ධම්මං පච්චක්ඛාමි, සඞ්ඝං පච්චක්ඛාමි, සික්ඛං, විනයං, පාතිමොක්ඛං, උද්දෙසං, උපජ්ඣායං, ආචරියං, සද්ධිවිහාරිකං, අන්තෙවාසිකං, සමානුපජ්ඣායකං, සමානාචරියකං, සබ්‍රහ්මචාරිං, පච්චක්ඛාමීති." බුදුහු ප්‍රත්‍යාඛ්‍යානය කරමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යානය කරමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යානය කරමි,' ශික්‍ෂාව, විනය, ප්‍රාතිමොක්‍ෂය, උද්දෙසය, උපාධ්‍යාය, ආචාර්‍ය්‍ය, සද්ධිවිහාරික, අන්තේවාසික, සමානොපාධ්‍යාය, සමානාචාර්‍ය්‍ය, සබ්‍රම්සර, ප්‍රත්‍යාඛ්‍යානය කෙරෙමියි චතුර්දශ පදයන්ගේ වශයෙන්ද—"ගිහිතිමං ධාරෙහි, උපාසකො, ආරාමිකො, සාමණෙරො, තිත්ථියො, තිත්ථියසාවකො, අස්සමණො, අසක්‍යපුත්තියො'තිමං ධාරෙහීති" ගෘහස්ථයෙකැයි මා දරව, උපාසකයෙක, ආරාමිකයෙක, සාමණෙරයෙක, තීර්ථකයෙක, තීර්ථශ්‍රාවකයෙක, අශ්‍රමණයෙක, අශාක්‍ය පුත්‍රියෙකැයි මා දරව, මෙසේ ගිහි ආදි අට පදයන්ගේ වශයෙන් දැයි මේ දෙවිසි ක්‍ෂෙත්‍රපදයන්ගෙන් යම්කිසි වචනයකින් වාක් භෙදකොට කියන්නාහටද ක්‍ෂෙත්‍රපදයන්ට ඇතුළත්වූ සෙයින් ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යානය වේ. මේ දෙවිසි ක්‍ෂෙත්‍රපදයන්ගේ වශයෙන් විනා අන්‍ය පදයන්ගේ වශයෙන් ප්‍රත්‍යාඛ්‍යානය නොවේ.

"තත්ථයාදතං පච්චක්ඛාමීති ච මං ධාරෙහීති ච වුත්තං වත්තමාන කාල වචනං යානිච අලං මෙ බුද්ධෙන කින්නු මෙ බුද්ධෙන න මමත්ථො බුද්ධෙන සුමුත්තොහං බුද්ධෙනා'ති" එහි ඒ යමෙකු ප්‍රත්‍යාඛ්‍යානය කෙරෙමි සීද, එලෙස මා දරව සීද, කියහලද වර්තමාන කාලික වචනයක් වේද, බුදුන්ගෙන් මට කම්නැත, බුදුන්ගෙන් මට කටයුතු කිම,? බුදුන්ගෙන් මට අර්ථයක් නැත, බුදුන් කෙරෙන් මම මිදුනෙමි, යනාදීන් ආඛ්‍යානයෙන් කාලපරාමර්ශනය නොකොට බුද්ධාදි සබ්‍රම්සරුන් ආදිකොට ඇති පළමු තුදුස් පද යොදා කියූ මේ සතර පදයන්ගේ වශයෙන්ම ප්‍රත්‍යාඛ්‍යානය වේ.

ප්‍රත්‍යාඛ්‍යානය කෙළෙමි කියා හෝ ප්‍රත්‍යාඛ්‍යානය කරන්නෙමි කියා හෝ "මා ධැරූයෙහි" හෝ "ධරන්නෙහි" යයි හෝ මැනව ප්‍රත්‍යාඛ්‍යාන කෙළෙම් වීනම් කියා හෝ යනාදි අතීතානාගත පරිකල්ප වචනයන් බණන්නාහට ප්‍රත්‍යාඛ්‍යාන නොවේ. මෙලෙස වර්තමාන කාල වශයෙන් හා අනාමර්ශකාල වශයෙන්ම ප්‍රත්‍යාඛ්‍යානය වේ. අන් අයුරින් (තද්භාවයෙන්) නොවේ.

"පයොගොපන දුවිධො කායිකො වාචසිකොච, තත්ථ බුද්ධං පච්චක්ඛාමීති ආදිනානයෙන යාය කායචිභාසාය වචීභෙදංකත්වා වාචසික පයොගෙනව පච්චක්ඛාතං හොති, න අක්ඛරලිඛනංවා හත්ථමුද්දාදීහි දස්සනං වා කායප්පයොගං කාරෙන්තස්ස, එවං වාචසික පයොගෙනව පච්චක්ඛාතං හොති න තද්භාවෙන."

ප්‍රයොගය වනාහි කායික වාචසික වශයෙන් දෙවැදෑරුම් වේ. එහි බුදුහු ප්‍රත්‍යාඛ්‍යානය කෙරෙමි යනාදීන් යම්කිසි භාෂාවකින් වාක්

හෙදකොට වාචසික ප්‍රයොගයෙන්ම ප්‍රත්‍යාඛ්‍යානය වෙ. බුදුන් ප්‍රත්‍යාඛ්‍යානය කෙරෙමියි අන්‍යයකුට දැන්වීම පිණිස අක්‍ෂර ලිඛනයක් හෝ හස්තවිකාර ශීර්ෂකම්පනාදී කායප්‍රයොගයක් හෝ කරන්නාහට නොම වේ. මෙසේ වාචසික ප්‍රයොගයෙන්ම ප්‍රත්‍යාඛ්‍යානය වේ. තද භාවයෙන් නොවේ.

“පුග්ගලො පන දුවිධො යොච පච්චක්ඛාති යස්සච පච්චක්ඛාති, තත්‍ථ යො පච්චක්ඛාති සො සචෙ උම්මත්තක ඛිත්ත චිත්ත වෙදනට්ටානං අඤ්ඤතරො න හොති, යස්ස පච්චක්ඛාති සො සචෙ මනුස්ස ජාතිකො හොති නච උම්මත්තකාදීනං අඤ්ඤතරො, සම්මුඛීභූතො ච සික්ඛා පච්චක්ඛාතං හොති න තදභාවෙන.

පුද්ගලයා වනාහි යමෙක් ප්‍රත්‍යාඛ්‍යානය කෙරේද, යමෙකුට ප්‍රත්‍යාඛ්‍යාන කරයිද කියා විවිධ වේ. එහි යමෙක් ප්‍රත්‍යාඛ්‍යාන කරයිදහෙතෙම් උම්මත්තක ඛිත්ත චිත්ත වෙදනට්ටයන් අතරෙන් අන්‍යතරයෙක් නොවියයුතුයි. යමෙකුට ප්‍රත්‍යාඛ්‍යාන කරයිද හෙතෙමේ මනුස්සජාතිකයෙක් වියයුතුයි. උම්මත්තක ඛිත්ත චිත්ත වෙදනට්ට, දෙවතා, තිරශ්චීනයන් අතරෙන් එකෙක් නොවියයුතුයි. සම්මුඛවූයේම ප්‍රත්‍යාඛ්‍යානය වේ. අසම්මුඛව දූතයකු අත හෝ පත්‍රයකින් ආරොචනය කෙළේ ප්‍රත්‍යාඛ්‍යානය නොවේ. මෙසේ කථිත පුද්ගලවශයෙන් ප්‍රත්‍යාඛ්‍යානය වේ, තදභාවයෙන් නොවේ.

“විජානනම්පි නියමිතා'නියමිත වසෙන දුවිධං, තත්‍ථ යස්සයෙසං වා නියමෙත්වා ඉමස්ස ඉමෙසං වා ආරොචෙමී'ති වදති සචෙ තෙ යථා පකතියා ලොකෙමනුස්සා වචනං සුත්වා ආවජ්ජනසමයෙ ජානන්ති එවං තස්ස වචනානන්තරමෙව තස්ස අයං උක්කණ්ඨිතොති වා ගිහිභාවං පත්‍ථයතීති වා යෙන කෙනචි ආකාරෙන සික්ඛා පච්චක්ඛානභාවං ජානන්ති, පච්චක්ඛාතාව හොති සික්ඛා, අථ අපරභාගෙ කිං ඉමිනා වුත්තන්ති චින්තෙත්වා ජානන්ති අඤ්ඤෙ වා ජානන්ති අපච්චක්ඛාතාව හොති සික්ඛා අනියමෙත්වා ආරොචෙන්තස්ස පන සචෙ වුත්තනයෙන යො කොචි මනුස්ස ජාතිකො වචනත්‍ථං ජානාති පච්චක්ඛාතාව හොති සික්ඛා එවං විජානනවසෙන පච්චක්ඛාතං හොති න තදභාවෙන”

විජානනයද නියම අනියම වශයෙන් දෙපරිදි වේ. එහි යමෙකුට හෝ යමෙකුන්ට නියම්කොට මොහුට හෝ මොවුන්ට ආරොචනය කරමියි කියාද, ලොකයෙහි මනුෂ්‍යයෝ යම්සේ පළමුකොට වචනයක් අසා ආවර්ජනා කාලයෙහි මෙලෙස මෙතෙමේ උකටලීයයි හෝ ගිහිබැව් පතයි හෝ යම්කිසි ආකාරයකින් ඔහුගේ ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානභාවය දනිත්ද ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යාන කළාම වේ. කිමෙන් පසු කාලයෙහි මොහු විසින් කුමක් කියනලද්දැයි සිතා දනිත්ද, අන්‍යයෝ හෝ දැනගනිත්ද, ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යාන නොකළාම වේ. නියම නොකොට ආරොචනය කරන්නහුගේ වනාහි කී නයින් යම්කිසි මනුෂ්‍යයෙක් වචනාර්ථය දනීනම් ශික්‍ෂාම ප්‍රත්‍යාඛ්‍යාන කළාම වේ. මේ විජානන වශයෙන් ප්‍රත්‍යාඛ්‍යානයයි, තදභාවයෙන් නොවේ. යමෙක් වනාහි යටත් පිරිසෙයින් කෙළිකවට වශයෙනුදු ප්‍රත්‍යාඛ්‍යාන කෙරේද ඔහු විසින්

ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාන නොකළාම වේ. මේ සමැදූරුම් ක්‍රමයන්ගෙන් යම් ක්‍රමයකින් ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාන නොකර මෛථුන්දම් සේවන යෙන් පරිජි අවදනෝයි.

**පාරාජිකාපත්ති ස්කන්ධය :—**

යම්කිසි උපසම්පදප්‍රාප්ත භික්‍ෂුවක් තෙමේ ප්‍රාතිමොක්‍ෂ සංවර ශීල සඞ්ඛ්‍යාත අධිශීල ශික්‍ෂාවෙහි පනවනලද ශික්‍ෂාපද සඞ්ඛ්‍යාත ආජීවයට පැමිණියේ ඒ අධිශීල ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යානය නොකොට එය රැකීමෙහි සවකිය දුර්ලභාවය පහළ නොකොට මෛථුන්දම් සේවනය කෙළේනම් ශාසනයෙන් පැරදුනේ වේ.

"කිලෙසාරීහි පරජීයතෙ පරාජිතිඤ්චාති වා පාරාජිකො" යන නිර් වචන හෙයින් කෙලෙස් සතුරන් විසින් පරදවනු ලැබේනුයි හෝ පරද වන ලදනුයි පාරාජිකා නම් වේ. එම ජාතියෙහි නැවත උපසම්පදාවට අභව්‍ය වේ. මෙසේ පරිජි අවන් භික්‍ෂුව ගිහිබවට හෝ සාමණේර භාව යට පැමිණ නැවත සරණාගමනය පටන් ඒ ඒ සිල් රැක මනාව පිළිපැදී මෙන් රහත් ඵලය හැර සෙසු මාර්ගඵල ලබන්ට හැකිවෙයි.

**සංලක්‍ෂණය.**

මනුෂ්‍යා'මනුෂ්‍ය තිරශ්චීන ස්ත්‍රීන්ගේ වර්චස්මාර්ග-මූත්‍රමාර්ග-මුඛමාර්ග වශයෙන් තුන් තුන් ප්‍රකාරයෙන් දක්වෙන නව මගද, මනුෂ්‍යා'මනුෂ්‍ය තිරශ්චීන උභතො ව්‍යඤ්ජනකයන් පිළිබඳ නව මගද, මනුෂ්‍යා'මනුෂ්‍ය තිරශ්චීන පුරුෂ යන්ගේ වර්චස්මාර්ග, මුඛමාර්ග වශයෙන් දෙකක් දෙකක් බැගින් දක්වන ලද මාර්ග සයද එසේම පණ්ඩකයන්ගේ ෂඩ්මාර්ගයද යන සමතිස් මගෙහි මෛථුන රාගයෙන් යුක්තව තමා නිමිති ප්‍රවේශයෙන් හා මෙරමා විසින් ප්‍රවේශ කරවන කල්හිත් ප්‍රවේශන-ප්‍රවිෂ්ට-ඨිති-උද්ධරණ-යන සතර ක්‍ෂණයෙහි ඉවසීමෙන් මෛථුන්දම් පරිජි ඇවැත සිදුවේ.

**ආපත්තියට පැමිණීම.**

සෙවනාභිප්‍රාය ඇති බව—මාර්ගයෙන් මාර්ගය ප්‍රතිපාදනය කිරීම යන කරුණු දෙක සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

**පැණවීම.**

1. භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රථම පාරාජිකාපත්තිය කොතැන්හිදී පනවන ලද්දේද? 2. කවරෙකු අරබයා පනවන ලද්දේද? 3. කවර වස්තුවෙක්හි පනවන ලද්දේද? 4. චතුර්විධ විපත් තීන් අතුරෙන් කවර විපත්තිගු වේද්ද? 5. සප්තාපත්ති ස්කන්ධයන් අතුරෙන් කවර ආපත්ති ස්කන්ධයෙක්ද? 6. සවැදෑරුම් ආපත්ති සමු-ට්ඨානයන් අතුරෙන් කොතෙක් සමුට්ඨානයන්ගෙන් සමුට්ඨානය වේද? 7. කොතෙක් අඞ්ගයන් කරුණු හේතුකොටගෙණ ප්‍රථම පාරාජිකාපත් තිය පනවන ලද්දේද?

1. බුදුරජානන්වහන්සේ විසින් ප්‍රථම පාරාජිකාපත්තිය විසල්පුරදී පනවන ලදී. 2. කලන්දපුත්‍ර සුදින්න තෙරුන් අරබයා වදාරණ ලදී. 3. සුදින්න භික්‍ෂුතෙමේ පුරාණ දුතියිකාව (පැරැණි භාර්‍ය්‍යාව) සමග

මෛථුන්දම් සෙවීම නිමිතිකොට පනවනලදී. 4. සීල විපත්තියි. 5. පාරාජිකා පත්තිසකන්ධයයි. 6. කාය චිත්ත සමුට්ඨානයයි. 7. අවි වත් කරුණු දසයක් නිසා භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රථම පාරාජිකාපත්තිය පනවන ලදී. (එය යට දක්වා ඇත.)

**ආපත්තිඛාරය.**

මෛථුන්දම් සේවනයෙන් භික්ෂුතෙමේ කොතෙක් ආපත්තීන්ට පැමිණේද? ත්‍රිවිධාපත්තියකට පැමිණේ. පාරාජික-ථුල්ලච්චය-දුක්කට යන ත්‍රිවිධාපත්තියටයි.

**පාරාජිකා පත්තිය.**

මනුෂ්‍යාදී සත්‍රීන්ගේ ශරීරයෙහි සම්ප්‍රකාරයෙන් ක්‍ෂය නොවූ නිමිත්තෙහි මෛථුන ධර්ම ප්‍රතිෂෙවනය කෙරේ නම් ඒ භික්ෂුව හට පාරාජිකාපත්තිය වේ.

බොහෝ සෙයින් ක්‍ෂයවූ සිරුරෙහි මෛථුන්දම් සෙවුයේ වේද ථුල්ලච්චයාපත්තිය වේ. සෙසු උපකැස් ආදියෙහි අඞ්ගජාත ප්‍රවේශ කරණ භික්ෂුවහට දුකුළා වේ.

## පළමුවන පරිච්ඡේදය යි.

2. යම් කිසි භික්ෂුවක් තෙමේ නීලකහාපණයෙන් සතරෙන් කොට සක් ගෙවත් රිදීපගක් ප්‍රමාණ අගනා හිමියන් විසින් කයින් හෝ වචනයෙන් නොදෙන ලද මෙරමා සතු වස්තුවක් ගමින් හෝ ආරණ්‍යයෙන් සොරකම් කරණු කැමැති පුරුෂයාගේ ස්වභාවයයි කියනලද චිත්ත පරම්පරාවෙන් යුක්තව පස්විසි අවහාරයෙන් යම්කිසි අවහාරයකින් සොරසිතින් ගණීනම් අදින්නාදාන පරාජිකාපත්තියට පැමිණේ. ඕනු ප්‍රකෘති භික්ෂූන් සමග කටයුතුකුදු මහත් විනයකර්ම සඞ්ඛ්‍යාත සමාන සංවාසය නැත්තෙක් වන්නේය.

**ශංල ක්‍ෂණය.**

නීලකහාපණය නම් :–පෞරාණික ශාස්ත්‍ර යුක්ති පරිදි නියමකරණලද පස්මදැටක් සවර්ණද පස්මදැටක් රිදීද තඹ දසමදැටක් දූයි විසිමදැටක් බර එක්කොට වියැටක බර ලෝහ මිශ්‍රණයෙන් අක්‍ෂර හා හස්ති පාදාදි අන්‍යතර රූ සටහන් යොදා සකස්කරණලද කහවණු වයි. මේ කහාපණයාගේ සිව්භාගයෙන් භාගය විසි වියැටක බර සුවර්ණ අගීය-මෙකල ඒට රිදී පගයයි ව්‍යවහාරවේ. අදින්නාදාන පරිජි ඇවැත පිළිබඳ මේ හෙටසීම ප්‍රමාණ සඞ්ඛ්‍යා නියමය යි.

**පස්විසි අවහාර.**

නානාභණ්ඩ පඤ්චකය-එකභණ්ඩ පඤ්චකය—සාහත්ථික පඤ්චකය—පුබ්බපයොග පඤ්චකය-ථෙය්‍යාවහාර පඤ්චකය යනුයි.

1. මෙහි නානාභණ්ඩ පඤ්චකය නම් :—ආදියෙය්‍ය-හරෙය්‍ය-අවහරෙය්‍ය-ඉරියාපථංවිකොපෙය්‍ය-ඨානාචාවෙය්‍ය-යන මේ පසයි.

එහි විස්තර:—ආදියෙය්‍ය-අනුන්ගේ ආරාමාදිය ගන්ට කරණ (යාම් ඊම් ආදි) සියලු කාය වාක් ප්‍රයෝගයෝයි. එහි වාක් ප්‍රයෝග දුකුළා ඇවැත් වන්නේය. හිමියා හට ඒ පිළිබඳව විමති උපන් කල්හි තුලසි ඇවැත් වන්නේය. සොර තෙමේ මම නොදෙමි යිද හිමි තෙමේ මට නොලැබෙයිද දෙදෙන ධුරනිඃක්ෂේප කළකල්හි පරිජි වේ. එකකුගේ ධුරනිඃක්ෂේපය ප්‍රමාණ නොවේ.

**හරෙය්‍ය.**

අනිකක් හුගේ පිරිකරාදියක් ගෙන යෙමින් සිට පහැරගැණිමට සොරසිතින් පිරිමදීනම් දුකුළාවේ. සොලවා නම් තුලසි වේ. තුබූ ස්ථානයෙන් චුතකළ කෙණෙහි පරිජි වේ.

**අවහරෙය්‍ය.**

අනුන් විසින් තමා වෙත තගා තුබූ දෙය ආපසු ඉල්ලූ විට මම එය නොගණිමි යි රැවටීමෙන් ගණීනම් අදත්තාදානයට පූර්‍ව භාග බැවින් දුකුළා වේ ස්වාමියාහට විමති උපන් කල්හි තුලසි වේ. දෙදෙනාගේ ධුරනිඃක්ෂේපයෙන් පරිජි වේ.

**ඉරියාපථං විකොපෙය්‍ය.**

බඩු ගෙණයන්නා හා සමග යමින් ඒ බඩු සොරකම් කරණ අදහසින් ඉරියව් විකොපනය කරණ හැම ප්‍රයොගයෙහි දුකුළා වේ. පළමුවන පියවර ඉක්මවූ කල්හි තුලසි වන්නේය. දෙවන පියවර ඉක්මවූ කල පරිජි වේ.

**ඨානාචාවෙය්‍ය.**

අනුන් අයත් බඩු සොර සිතින් පිරිමදින් නාවූ භික්ෂුවට දුකුළා වන්නේය. බඩුව සෙලවූයේ නම් තුලසි වේ. තුබූ තැනින් උගුළුවා නම් පරිජි වේ. මෙය සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වශයෙන් මිශ්‍රවූ හෙයින් නා නා භණ්ඩපඤ්චක නම්.

**2. ඒකභණ්ඩපඤ්චකය.**

ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍ය, යන මේ පඤ්චකයන් කෙරෙන් සවිඤ්ඤාණක වස්තු ගත්කල්හි ඒකභණ්ඩ පඤ්චක නම් වන්නේය.

**3. සාහත්ථික පඤ්චකය.**

සාහත්ථික, ආණත්තික, නිස්සග්ගිය, අත්ථසාධක, ධුරනික්ඛෙපයි පස්වැදෑරුම් වේ.

**සාහත්ථික.**

මෙරමා සතු හෙවත් අනුන් සන්තකවූ බඩුවක් සියතින් සොරා ගැන්මයි.

**ආණත්තිකය.**

අසවලාගේ බඩු සොරකම් කොට ගෙණෙවයි අනිකක්හට අණවීමයි.

**නිස්සග්ගිය.**

ඇබදු ගන්නා ස්ථානය හෝ මෙරමා බඩු අසවල් තැනට ගියකල ගණිමියි සනිටුහන් කළ තැන හෝ ඉක්මවා සොරකම් කිරීමයි.

**අත්ථසාධක.**

අසවලාගේ බඩු අසවල්කාලයෙහි සොර කම් කොට ගණුවයි අනිකක්හට අණවූ කල්හි හෙතෙම එකල නොගත හැක්කෙ මියි කීවිට නුඹට හැකි යම් අවස්ථාවක ගණුවයි නියම කෙළේ යම් විටක ගණීනම් අණවූවහුට අණවූ කෙණෙහි පරිජි වේ. අනෘයාහටගත් කොණෙහි පරිජි වේ.

තවද අනිකෙකු අයත් තෙල් සැළි ආදියෙක්හි පාදඋක් අගනා තෙල් බොන වහන් ආදියක් සොර සිතින් බහාලා නම් අතින් මිදුනු කල්හි පරිජි වේ.

**ධුරනික්ෂේපය.**

ආරාමාදිය පිළිබඳව චොදනා විනිශ්චය කිරීමෙහිදීද තමා කෙරෙහි ප්‍රවේශම් පිණිස තුබූ දෙය මම නොගනිමි කියා රවටා ගැන් මෙහිද තාවකාලිකව ගත් දෙය නුදුන්කල්හිද දෙදෙනාම ධුරනික්ෂේපය කළ කල්හි පරිජි වේ. එසෙක් ධුරනික්ෂෙප නොකළේ පරිජි නොවේ.

**පුබ්බපයොගපඤ්චකය.**

පුබ්බපයොග, සහපයොග, සංවිදාවහාර, සඞ්කෙත කම්, නිමිත්ත කම් යි පස් වැදෑරුම් වේ.

**පුබ්බපයොග.**

අසවලාගේ වස්තුව ගණුවයි කියා අණවන ලද්දේ ඒකාන්තයෙන් ගණීනම් අණවූවහුට අණවූ කෙණෙහි පරිජි වේ. ගත්තහුට ගත් කොණෙහි පරිජි වේ. අණවන ලද්දහු ගැණීමට පෙරටුව අණවූවාහට පරිජි වනබැවින් පුබ්බපයොග නම් වේ.

**සහපයොග.**

අනුන්ගේ ආරාම ක්ෂෙත්‍ර වස්තූන් ගණීමියි ප්‍රයොග කිරීමක් ඇතිකල්හි අවසාන ප්‍රයොග හා සමග පරිජි වන්නීය, දෙදෙනාගේ ධුරනික්ෂෙපයද මෙහිලා ගිණියයුතුයි.

**සංවිදාවහාර.**

අසවලාගේ භාණ්ඩ ගණිමුයි සාථකොට ගෙණ ගියවුන් අතුරෙන් එක් මහණෙක් ඒ භාණ්ඩය තුබූ ස්ථානයෙන් චුතකෙළේ නම් සාකච්ඡාකොට ගෙණ ගිය සියල්ලෝම පරිජි ඇවතට පැමිණෙති.

**සංකෙත කම්ම.**

අසවලාගේ වස්තුව පූර්වාහ්න අපරාහ්න කාලයන් අතුරෙන් අසවල් කෙණෙහි සොරකම්කොට ගණුවයි කී කල්හි එම අවස්ථාව වෙනස් නොකොට ගත්තේ නම් කාලපරිච්ඡෙදදීන් සලකුණු කළ මහණතෙම පරිජි ඇවැතට පැමිණේ.

**නිමිත්ත කම්ම.**

අසවලාගේ බඩු ගණුවයි කියේ බැම නැහවීම් ඉඟිකිරීම් ආදි සලකුණු කෙරේද ඒ ඉඟි සලකුණු නොවරදවමින් ගත්තේ වීනම් නිමිත්තකාර මහණ තෙමේ ඒ සංඥකළ කෙණෙහි පරිජි ඇවතට පැමිණේ.

**5. ථෙය්‍යාවහාරපඤ්චකය.**

ථෙය්‍යාවහාර-පසය්හාවහාර-පරිකප්පාවහාර-පටිච්ඡන්නාවහාර-කුසාවහාර යි පස් අයුරුයි.

**ථෙය්‍යාවහාර.**

උමං කැණීම් ආදියෙන්ද තුලාකූට මාණකූටාදිවූ වඤ්චන ක්‍රියාවෙන්ද කූට කහවණු ආදීන්ගේ පරිවර්තනය කිරීමෙන්ද වඤ්චාකොට ගන්නේ වීනම් පරිජි වේ.

**පසය්හාවහාර.**

ගම් පහරණ සොරුන් මෙන් අනුන් අයිති දෙය බලයෙන් ගැන්මෙහිද එසේම ග්‍රාමහොජ රජභටාදීන් විසින් ගතයුතු අයබදු ප්‍රමාණයට වඩා අධිකව ගන්නේ නම් පරිජි වේ.

**පරිකප්පාවහාරය.**

සොරකම් පිණිස ඇතුළු ගෙට ගියේ "වස්ත්‍රයෙක් වන්නේ නම් ගණිමි නූල් උව නොගණිමි" මෙසේ කල්පනාකොට භාණ්ඩ පසුම්බිය ගන්නේ වීනම් ඒ පසිබ්බකයෙහි වස්ත්‍රයෙක් වීනම් තුබූ තැනින් චුත කිරීමෙහි හෙවත් පහකොට ගත් කෙණෙහි පරිජිවේ. එහි නූල් වීනම් රැකේ. නූල් බව දැන "යමක් ලබන ලදද එය ගතයුතු යයි" ගෙණායේ නම් පළමුවෙනි පියවරෙහි තුලසී වේ, දෙවන පියවරෙහි පරිජි වේ. නූල්බව දැන බිම තබා නැවත සොර සිතින් ගන්නේ වීනම් තුබූ තැනින් චුතකළ කල්හි පරිජිවේ. නූල්බවද නොදන්නේ හිමියන් සොරු සොරුයයි ලුහුබඳනාකල්හි බඩු පොදිය දමා යන්නේ නම් පරිජි නොවේ, හැම ප්‍රයොගයෙහි දුකුළා වේ, දමනලද බඩුපොදිය ස්වාමීහු දැක ගතිත් නම් මැනවි, අනිකක්හු දැක ගත්තේ වීනම් භණ්ඩ දෙය්‍ය (වටිනාකම දියයුතු) වන්නේය. අනුන් නොගත හිමියන් ධුරනිඃක්ෂෙපයද නොකොට ගියකල්හි නැවත තෙමේම අවුත් සොර සිතින් ස්ථානයෙන් චුතකෙළේ නම් පරිජිවේ. එය සක සංඥවෙන් හෝ පංසුකූල සංඥවෙන් ගැන්මෙහි ආපත්ති නොවේ. භණ්ඩදෙය්‍යට සුදුසු වන්නේයි. ධුරනිඃක්ෂෙපය කළ කල්හිද ගත්තාහට භණ්ඩදෙය්‍යම වේ, කුමක්හෙයින්ද? තමාගේ ප්‍රයොගයෙන් ගෙණ දැමූ බැවිනි. භණ්ඩදෙය්‍ය නම් :- ඒ ගත් බඩු හෝ ඒ බඩු අගනා මිල හෝ හිමියාට ආපසු දියයුතු බවයි. මේ භාණ්ඩපරිකප්පනයයි මේ ක්‍රමයෙන් ඔකාස පරිකප්පයද දතයුතුයි.

**පටිච්ඡන්නාවහාරය.**

යම්කිසි භික්ෂුවක් අනුන්ගේ බහානබන ලද මුදු ආදී ලොභනීය වස්තුවක් දැක සොර සිතින් පරඬැල් පත් ආදියෙන් වැසුයේ වීනම් දුකුළා වේ, සොලවා නම් තුලසී වේ. තුබූ තැනින් චුතකෙළේ පරිජි වේ. පංසුකූල සංඥවෙන් හෝ ස්වකීයය යන සංඥවෙන් හෝ තුබූ තැනින් චුත කෙළේ නම් ඇවැත් නැත්තේයි, භණ්ඩදෙය්‍ය වන්නේය. තමාගේ ප්‍රයොගය හෙතුකොටගෙණ ධුරනිඃක්ෂෙපකිරීමෙන් ඉවත්කරණලද බඩු සොර සිතින් ගත් මහණහට දුකුළා වේ. බඩු හිමියා දැන ඉල්ලූ කල්හි බඩු දීම වේ. නුදුන් කල

භාණ්ඩයාගේ අගයවූ පමණින් ඇවැත් වන්නේය. කුමක් හෙයින්ද? තමාගේ ප්‍රයොගය නිසා ඔවුන් විසින් බඩු නොදක්නාලද හෙයිනි, මුද්‍ර ආදිය සොයා නුදුටුවාහු ධුරනික්‍ෂෙප නොකොට ගියේ නම් භික්‍ෂුව සොර සිතින් එතැන්හිම යටකළකල්හි මතු භාගය යටකොට තුබුනු ස්ථානයෙන් චුතකෙළේ වීනම් පරිජි වේ.

**කුසාවහාරය.** කුසපත් ලා සිවුරු ආදිය බෙදනකල්හි තමාගේ බොහෝ- වටනා කොටස පෙරළා මෙරමාගේ පාදයක් වටනාවූ (පස්මඬුටක් බර අමුරණ) කොටස වඩුවාකොට (හෙවත්) සොරකම්කොට ගනු කැමැත්තේ තමා අයත් කොටසෙහි තුබූ කුසපත මෙරමාගේ කොට සෙහි තුබූ කල්හිද පරිජි නොවේ. යමෙක් තමාගේ කුසපත ගෙණ අනුන්ගේ කොටසෙහි තබාද එය අතින් චුතවූ පමණකින්ම පරිජි වේ.

## පස්විසි අවහාර විනිස,

**ආපත්තියට පැමිණීම.** මනුෂ්‍ය සන්තක වස්තුවක්වීම, මනුෂ්‍ය සන්තක වස්තුවක් බව දැනගැණීම, සොර කම්කරමි යන සිත් ඉපදීම, පාරාජිකාවට ප්‍රමාණවූ වස්තුවක්වීම, ඒ වස්තුව පස්විසි අවහාරයන් අතුරෙන් යම් අවහරණ ප්‍රයොගයකින් ගැණීම, මෙම කාරුණු සම්පූර්ණ වීමෙන් ඇවැතට පැමිණේ.

1. භාග්‍යවතුන්වහන්සේ විසින් දෙවන පාරාජිකාපත්තිය (අදින්නාදාන) කොතැන්හිදී පනවන ලද්දේද? 2. කවර පුද්ගලයකු අරබයා පනවන ලද්දේද? 3. කවර වස්තුවෙක්හි පනවන ලද්දේද? 4. කොතෙක් සමුට්ඨානයන්ගෙන් ආපත්ති සමුට්ඨානය වේද?

1. රජගහනුවරදී පනවනලදී. 2. කුම්භකාර පුත්‍ර ධනිය ස්ථවිරයන්වහන්සේ අරබයාය. 3. ධනිය ස්ථවිරයන්වහන්සේ බිම්සර රජු අයත් දැවභාණ්ඩ පැහැරගැණීම් වස්තුවෙහි පනවනලදී. 4. කාය වාචා චිත්ත යන ත්‍රිවිධ සමුට්ඨානයෙන් ආපත්ති සමුට්ඨානය වේ.

**ආපත්ති වාරය.** 1. යම් උපසපන් භික්‍ෂුවක් තෙමේ හිමියන් විසින් නුදුන් දෙය සොරසිතින් ගැණීමෙහි කොතෙක් ආපත්තීන්ට පැමිණේද?

1. යම් උපසපන් භික්‍ෂුවක් තෙමේ මසු පසක් හෝ අතිරේක මසු පසක් අගනා හිමියන් විසින් නුදුන් වස්තුවක් සොරසිතින් ගණිතම් අදින්නාදාන පරිජි ඇවතට පැමිණේ. අතිරේක මාසකයක් හෝ ඌන පඤ්ච මාසකයක් හෝ අගනා යම් වස්තුවක් සොරසිතින් ගණිතම් තුලහිවේ. මස්සක් හෝ ඌනමාසකයක් අගනා වස්තුව සොරසිතින් ගැණීමෙහි දුකුළා වේ. මෙසේ අන්සතු වස්තුව සොරසිතින් ගන්නා භික්‍ෂු තෙමේ ත්‍රිවිධාපත්තීන්ට පැමිණෙන්නේය.

## දෙවන පරිච්ඡේදය යි.

3. යම් භික්ෂුවක් තෙමේ ප්‍රතිසන්ධි විඥාන සහිත කලල රූපය පටන් මනුෂ්‍ය ප්‍රාණයක් මරණ සිතින් තැවීම් හැඹීම් බෙහෙත් යෙදීම් ආදි ප්‍රයොගයන්ගෙන් ජීවිතෙන්ද්‍රියයෙන් තොර කෙරේ නම් හෝ අනුන් ලවා තොර කරවා නම් මනුස්ස විග්ගහ පරිජි ඇවතට පැමිණේ.

**සංක්‍ෂෙපය.**

මේ ඇවැත පිළිබඳ ප්‍රයොග සයක් වෙති, සාහත්ථික, නිස්සග්ගිය, ආණත්තික, ථාවර, විජ්ජාමය, ඉද්ධිමය යන මොහුයි.

**සාහත්ථික.**

සියතින් මිනිස් සතක් මැරීමයි.

**නිස්සග්ගිය.**

දුරසථව සිටි මිනිස් සතක් ජීවිතෙන්ද්‍රියයෙන් තොර කරණු සඳහා කයින් හෝ කය පිළිබඳ යමකින් උල් ශස්ත්‍ර පාෂාණාදිය දමා ගැසීමෙන් මරණය සිදුකිරීමයි. මෙය උද්දිස්ස අනුද්දිස්ස වශයෙන් දෙවැදෑරුම්. එහි යමෙක් උදෙසා පහරණ ලද්දෙන් ඔහුම මළ කල පරිජි වේ. කවුරු නමුත් මැරේවායි පහළේ කවුරු නමුත් එම ප්‍රහාර යෙන් මරණයට පැමිණියේ නම් පරිජි වේ. එකෙණෙහි වේවා කල් යෑමෙන් වේවා තත් ප්‍රහාරයෙන් ම මරණය සිදුවී නම් ප්‍රහාර මාත්‍ර යෙහි ම පරිජි වේ.

**ආණත්තිය.**

මනුෂ්‍ය සත්වයෙකු ජීවිතෙන්ද්‍රියයෙන් තොර කිරීම පිණිස ඇණවීමයි. එය වත්ථු-කාල-ඕකාස-ආවුධ-ඉරියව්-ක්‍රියා විශෙෂ වශයෙන් සවැදෑරුම් වේ.

**වත්ථු.**

පුද්ගලයායි, යම් පුද්ගලයෙකු මරවයි අණවන ලද්දේ ඔහු ම මරා නම් ඇණවූවා හට ඇණවූ කෙණෙහි පරිජි වේ. අණ නොලත් කෙනෙකු මැරුවා නම් ඇණවූ තැනැත්තේ ඇවතින් මිදේ-මොහු මරවයි ඇණවූ කල දුකුළා වේ.

**කාලය.**

පෙරවරු පස්වරු ආදි කාලයයි-අද පෙරවරු කාලයෙහි මරවයි අණවන ලද්දේ ඇණවූ ලෙස මරා නම් පරිජි වේ. නියම කාල වේලාව ඉක්මවා මැරුයේ නම් ඇණවූවා හට පරිජි නොවේ. දින-මාස-හවුරුදු-පිළිබඳ වද ගම් නියමය මැයි.

**ථාවර.**

උගුල් ඇටවීම්-බොරු වළවල් කැපීම් ආදි උපායකින් දිවි නැසීමයි. අනිකෙකු මරණු කැමැතිව, වළ කැනීම්-විෂ යෙදීම්-කඩු ආදිය එළවා තැබීම්, මරණයෙහි ගුණ කීම්, ඊට උපදෙස් දීම්, ආදි වශයෙන් එය නන්වැදෑරුම් වේ. අසවල් මිනිසා මෙයින් මියේවායි වළ කැණීනම් හැම ප්‍රයොගයෙක්හි ම දුකුළා වේ-ඔහු එයින් දුක් විඳී නම් ථුලයි වේ, ඉන් මළ පරිජි වේ.

**විජ්ජාමය.** විද්‍යාවකින් (මන්ත්‍ර ජපකිරීම් ආදියකින්) මැරීමයි, මන්ත්‍ර ජපකරණ කල හැම කාය වාක් ප්‍රයොගයෙහි දුකුළා වේ. මෙරමා දුක් විඳිනා කල තුලසි වේ, මළ පරිජි වේ.

**ඉද්ධිමය,** ස්වාභාවික සෘද්ධියකින් හෝ කෘත්‍රිම සෘද්ධියකින් හෝ සතුන් මැරීමයි, මෙරමා මරන්නට දත් කෑම, කිපීම් වශයෙන් මුහුණු බැලීම් ආදී හැම ප්‍රයොගයෙක්හි දුකුළා වේ. එයින් මෙරමා දුක් විඳුත් තුලසි වේ-මළ පරිජි වේ-මරණ සිත් නැත්තා හට ඇවැත් නැති-නොදන්නා හටද-මරණ සිත් නැත්තා හටද-උම්මත්තකාදීන්ටද ඇවැත් නැත.

**ආපත්තියට පැමිණීම.** මනුෂ්‍යයෙක් වීම, මනුෂ්‍යයෙකු බව දැනීම, මරණු කැමැති සිත් ඇතිබව, මරණ උපාය යෙදීම, එම උපායෙන් මරණය සිඩ වීමය, යන කරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

**පැණවීම.** 1. බුදුරදුන් විසින් තුන් වන පරිජි ඇවැත කොහෙන්හිදී පණවන ලද්දේද? 2. කවුරුන් අරබයා පණවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිතිකොට පනවන ලදද? 4. කෙතෙක් සමුට්ඨාන යන්ගෙන් ආපත්ති සමුට්ඨානය වේද?

1. විසල්පුරදී පනවනලදී. 2. විසල්පුර වැසි බොහෝ භික්ෂූන් අරබයා පනවනලදී. 3. විසල්පුර වැසි බොහෝ භික්ෂූහු ඔවුනොවුන් ජීවිතෙන්ද්‍රියයෙන් තොරකිරීම් වස්තුව නිමිතිකොට පනවනලදී. 4. කාය හිත වචන යන ත්‍රිවිධ සමුට්ඨානයෙන් ආපත්ති සමුට්ඨානය වේ.

**ආපත්ති වාරය.** මනුෂ්‍ය ශරීරයක් ජීවිතෙන්ද්‍රියයෙන් තොරකරණ භික්ෂුව කෙතෙක් ආපත්තින්ට පැමිණේද? දුක්කටථුල්ලච්චය-පාරාජිකා ත්‍රිවිධ ආපත්තීන්ට පැමිණේ. යම් මනුෂ්‍යයකු වැටී මැරේවායි බොරු වළවල් කණිනය කිරීමෙහි දුකුළා වේ. එහි වැටුනුකල දුක් වේදනා උපදීද එකල තුලසි වේ. එයින් මරණයට පැමිණියේ පරිජි ඇවැතවේ. දූන දූන මිනිස් සතක් ජීවිතෙන්ද්‍රියයෙන් තොර කරණුයේ මේ ත්‍රිවිධ ඇවැතට පැමිණේ.

## තුන් වන පරිච්ඡෙදයයි.

---

4. යම් කිසි භික්ෂුවක් තෙමේ තමා සතන්හි නූපන්නාවූ ප්‍රථමධ්‍යානාදි උතුරු මිනිස්දම් ලාමක අදහසින් (පාපෙච්ඡතාදියෙන්) වචනය හේ‍රෙණ මිනිසක්හට තමා කෙරෙහි ඇතිබව ප්‍රකාශ කෙරේ නම් මිනිසා එවිගස දත පරිජි වේ. නොමදත්තේ නම් තුලසි වේ. නො

මිනිස් සතක්හට කියනුයේ ඔහු එවිගස දත්තේ තුලසි වේ. එසැණෙහි නොදත කල් පසුව දත දුකුළා වේ. විතියධ්‍යානාදී ලොවී ලොවුතුරු උතුරු මිනිස්දම් තමා වෙත ඇතිබැව් පැවැසීමෙහිද මේ විනිශ්චය මැයි.

“සුසමතුන්ගේ සෙනසුන වසන පැවිද්දේ ප්‍රථමධ්‍යානය ලදහ” යනාදීන් පරියාය වශයෙන් කිව මෙරමා එවිගස දත්තේ තුලසි වේ. පසුව දත දුකුළා වේ. ධ්‍යාන ගුණ ලැබුයෙමි යන අධිමානයෙන් හෝ නොකියැවි අදහසින් යුතුව කියන්නන් හටද උමතු ආදීන්ටද ඇවැත් නැති.

**ආපත්තියට පැමිණීම.**

තමන් කෙරෙහි උතුරු මිනිස්දම් ප්‍රකටව නැතිබවය-ලාමක අදහසින් ඒ උතුරු මිනිස්දම් ඇස්වීමය - අනුන්ට නොදක් වීමය-ඒ අසන තැනැත්තා මිනිස් ජාතිකයෙක් වීමය-ඇසූ කෙණෙහිම තේරුම් ගැණීමය-යන කරුණු සම්පූර්ණ වීමෙන් පරිජි ඇවැතට පැමිණේ.

විසාලා මහනුවර වග්ගුමුදා නම් ගංතෙර වාසි භික්ෂූන් අරභයා ඔවුන්ගේ උත්තරි මනුස්ස ධර්මාරෙවන වස්තුව නිමිතිකොට මෙය පනවනලදී.

**මෙකී අධිමානය.**

ඇරඹූ විදසුන් ඇති යොගාවචරයාහට ඒ තියුණු විදසුන් නැණින් ත්‍රෛභූමික ධර්මයන් (කාම-රූප-අරූප) සම්මර්ශනය කරණකල්හි දශවැදෑරුම් විදර්ශනොපක්ලේශයෝ උපදිති, ඒ දශය නම්:- විදර්ශනා චිත්තයෙන් යුත් සිරුරින් නික්මෙන ආලොකයද, විදසුන් සිත හා එක්ව පහළවූ ඛුද්දකාදි පඤ්චවිධ ප්‍රීතියද, කායචිත්තදරථයන්ගේ සංසිඳවාලීම ස්වාභාවික කොට පවත්නා කායචිත්තප්‍රශ්‍රබ්ධියද, බලවත් වීර්යෙන්ද්‍රිය නම්වූ විදර්ශනාව හා සමග යෙදුනාවූ ප්‍රග්‍රහයද, විදර්ශනාචිත්ත සම්ප්‍රයුක්ත චෛතසික සැපයද, ත්‍රිලක්ෂණ දර්ශනයෙන් පහළ වන්නාවූ ඥාණයද, ලෞකික සතිපට්ඨානයයි කියනලද චිරකෘතාදිය සිහිකිරීමෙහි සමත් ස්මෘතියද, සමව පැවැත්තාවූ විදර්ශනාව සමග එක්ව පහළවූ තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂාව හෙවත් විදර්ශනොපෙක්ෂාව හා මනොද්වාරයෙහි ආවර්ජනොපෙක්ෂාව යන මේ දෙවදෑරුම් උපෙක්ෂාවද, මේ ඔභාසාදීවූ නවදෙන පහළවූ කල්හි මින් පෙර මෙබඳු ඔභාසයෙක් මට නූපන්නේය, එකැතියෙන් ම ආර්ය මාර්ගයට පැමිණියෙම්මය, ඵලයටද පැමිණියෙම්ය, මෙලෙසින් ඒ ඔභාසාදියෙහි ආලය කෙරෙමින් උපදනා සියුම්වූ (ක්ලේශයකැයි කියන්ටද නොහැකි තරම්වූ) තෘෂ්ණා ස්වරූපවූ නිකාන්තියද යනමේ දශයයි, මේ දශදෙනාගෙන් මුලකී නවදෙන අකුසල් නොවූවත් විදර්ශනාවගේ කෙලෙසීමට වස්තුවන බැවින් උප ක්ලේශයයි දක්වනලදී.

මොහු දශදෙන වස්තු වශයෙන් දශයක් වුවද තෘෂ්ණා දෘෂ්ටිමාන යන්ගේ වශයෙන් ගැණීමෙන් එකී එකී උපක්ලේශය තුන් තුන් අයුරින් සමතිස් වැදෑරුම් වේ. මේ දශදෙනා උපන් කල්හි අව්‍යක්ත යොගා

වවරතෙමේ අභිමාන උපදවා සවකී පරිද්දෙන් "මාර්‍ගාධිගමයට පැමිණියෙමියි" සිතා ලෝකයාට උතුරු මිනිස්දම් ගුණ කීයේ නමුදු පරිජි ඇවතට නො පැමිණෙන්නේය.

**පැණවීම.** 1. බුදුරදුන් විසින් සිව්වන පරිජි ඇවැත කොතැන්හිදී පනවන ලද්දේද? 2. කවරුන් අරබයා පනවන ලද්දේද? 3. කිනම් වස්තුවක් හේතුකොටගෙණ පනවන ලදද?

1, විසල්පුරයෙහිදී පනවනලදී. 2, විසල්පුර වග්ගුමුදා ගංතෙර වැසි භික්ෂූන් අරබයා පනවනලදී. 3, වග්ගුමුදා නම් ගංතෙර වැසි භික්ෂූහු ගිහීන්ට ඔවුනොවුන් පිළිබඳ උතුරු මිනිස්දම් වර්‍ණනය කිරීම් වස්තුව නිමිතිකොටගෙණ පනවනලදී.

1. තමා තුළ අවිද්‍යමාන උතුරු මිනිස්දම් අභූතයෙන් පවසන භික්ෂු තෙමේ කෙතෙක් ආපත්තීන්ට පැමිණේද? පාරාජික-ථුල්ලච්චය-දුක්කට යන ත්‍රිවිධාʼපත්තියට පැමිණේ. තමා සතන්හි අවිද්‍යමාන උතුරු මිනිස්දම් පාපෙච්ඡායෙන් ප්‍රකාශ කරණ භික්ෂු තෙමේ පාරාජිකාපත්තියට පැමිණේ. යම් භික්ෂුවක් තොපගේ විහාරයෙහි වෙසේද ඒ භික්ෂුව රහත්යයි පාපෙච්ඡායෙන් කියා නම් එය දැනගත්කල තුලසී වේ. එය නොමදත්තේ වීනම් දුකුළා වේ.

**සූවිසි පරිජි විනිස.** භික්ෂූන්ට සාධාරණ නොවූ භික්ෂුණීන් සම්බන්ධයෙන් පමණක් දැක්වෙන උබ්භජානුමණ්ඩලිකාය, වජ්ජපටිච්ඡාදිකාය, උක්ඛිත්තානුවත්තිකාය, අට්ඨවත්ථුකාය, යන සතර පාරාජිකාවෝද මේ ජන්මයෙහි පැවිදිබවට යොග්‍ය නොවූ පණ්ඩක, තිරච්ඡානගත, උභතොබ්‍යඤ්ජනක, ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, මාතුඝාතක, පිතුඝාතක, අරහන්තඝාතක, ලොහිතුප්පාදක, භික්ඛුණීදූසක, සංඝභෙදක, යන මෙකී එකළොස්දෙන පිළිබඳ එකාදසපාරාජිකාපත්තීහුද, මෛථුනධර්‍මපාරාජිකාවට අනුලොම්වූ මොලොක් පිටු පරිජි, ලම්බීපරිජි, මුඛග්ගාහී පරිජි, නිසීදනපරිජි, යන සිව් පරිජිද, විබ්භන්තභාව සංඛ්‍යාත හෙළුහන් පරිජියද මෙහි ස්වරූප වශයෙන් දැක්වෙන සතර හා සියල්ල සූවිස්සකි.

**සංලක්ෂණය.** මුදුපිට්ඨි:- මෘදු පිට ඇති බැවින් තමා නිමිත්ත තමා මුවෙන් ගන්නේ මුදුපිට්ඨි නම්.

**ලම්බී.** ප්‍රලම්බමාන දිඝී නිමිත්ත ඇති බැවින් තමා මුඛමාර්‍ගයෙහි හෝ වර්‍චස් මාර්‍ගයෙහි අඞ්ගජාතය ප්‍රවෙශ කරණුයේ ලම්බී නම්,

**මුඛගගාහී.** පරහුනිමිත්ත මුවෙන් ගැණීම් ඇත්තේ මුඛග්ගාහී නම්.

**නිසීදනකො.** පරහුඅඞ්ගජාතය (නිමිත්ත) මතු තමා වස මගින් ගන්නේ නිසීදක නම්.

වස්ත්‍රාදි යමකින් වසනලද හෝ නොවසනලද ස්වාඞ්ගජාතය එබඳු තමා වසමග මූත්‍රමග ප්‍රවේශකර ගැණිමෙන්ද එසේම මෙරමා අඟදූය එබඳු තමා මුඛයෙන් ගැණීමෙන්ද එහි තමා වසමගට ප්‍රවේශවන අඳුමට ඉඳිමෙන්ද සිදුවන මේ අනුලොම පාරාජිකා සතරයි.

භික්ෂුණීන්ට නියම උබ්භජානුමණ්ඩලික-වජ්ජපටිච්ඡාදික-උක්ඛිත්තානුවත්තික-අට්ඨවත්ථුක යන-මේ සතර පාරාජිකාවන්ට අනුලොම්වූ තමා හැඳි සිවුර ගිහි මාගමුන් හඳින ලෙස හැඳ ගිහි වෙසට කැමැතිවූ භික්ෂුණීය පිළිබඳ විබ්භන්තභාව පරිජිය දතයුතුයි.

**පණ්ඩකායෝ.** ආසිත්තපණ්ඩක - උසූයපණ්ඩක - පක්ඛපණ්ඩක - ඔපක්කමිකපණ්ඩක - නපුංසකපණ්ඩකයයි පස්දෙනකි.

**තිරච්ඡානගතො.** මෙසින් නාග සුපර්ණාදි සියලු තිරිසන් හුද යක්ෂාදි සියලු අමනුෂ්‍යයෝද සඞ්ගෘහීතයි.

**උභතොබ්‍යඤ්ජනකො.** ස්ත්‍රී උභතොබ්‍යඤ්ජනකය-පුරුෂ උභතොබ්‍යඤ්ජනකයයි දෙවැදෑරුම් වේ.

මේ තුන්දෙන යම්හෙයකින් විනෂ්ටවූ ප්‍රව්‍රජ්‍යාහීනා සඞ්ඛ්‍යාත වස්තු ඇත්තාහුද එහෙයින් ප්‍රව්‍රජ්‍යාවෙහි අභව්‍ය වෙති. අහේතුක ප්‍රතිසන්ධි ඇත්තාවූ විපාකාවරණයෙන් යුක්තවූ මොව්හු මාර්ගාධිගමයෙන්ද වැළකුනෝයි. කර්මාවරණයෙන් යුක්ත ස්වර්ග මොක්ෂ සම්පත්තියෙන් පිරිහුණු මරණින් මතු නිරයෙහි ප්‍රතිසන්ධිය නියත මාතෘඝාතක, පිතෘඝාතක, අරහන්තඝාතක, ලොහිතුප්පාදක, සඞ්ඝභෙදක යන පඤ්චානන්තරිකයෝද, ලිඞ්ගස්තේනක, සංවාසස්තේනක, උභයස්තේනක, යන තුන්ප්‍රකාර ථෙය්‍යසංවාසකද, භික්ෂුණීදූෂකද, තීර්ථකයන්ගේ ලබ්ධිය වේශය කැමැතිවී එය ගෙණ ඔවුනතරට පිවිසි තිත්ථියපක්කන්තකයාද්දූයි මේ පුද්ගලයන් අටදෙන මාතෘවධාදී ක්‍රියාවෙන්ම ඉහාත්මයෙහිම භික්ෂුභාවයට නුසුදුස්සෝව නැසුනෝ වෙති.

මේ සූවිසි වැදෑරුම් පාරාජිකාපත්තීන්ගෙන් යම් පරිජි ඇවතකට පත් උපසපන් භික්ෂූතමේ ශීර්ෂච්ඡේදය ලත් පුද්ගලයක්හට ජීවත්වීම නොහැකිවන්නාක් මෙන් භික්ෂුභාවයට අභව්‍ය වේ.

## සතරවන පරිච්ඡේදය නම් උතුරු මිනිස්දම් පරිජි විනිස නිමි.

---

**සඞ්ඝාදිසෙසාපත්ති ස්කන්ධය.** උපසම්පදාප්‍රාප්ත භික්ෂුවක් භික්ෂූන්ගේ ප්‍රාතිමොක්ෂසංවර ශීලසඞ්ඛ්‍යාතවූ අධිශීල ශික්ෂාවෙහි පනවා වදාරණලද ශික්ෂාපද සඞ්ඛ්‍යාත සාජීවයට පැමිණීයේ ප්‍රාතිමොක්ෂ සංවරශීල සඞ්ඛ්‍යාත අධිශීල ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යානය නොකොට

එකොළොස් ආස්වාදයන් අතුරෙන් මොචනාස්වාදයෙන් (හෙවත්) මොචනය කරණු කැමැත්තෙන් හස්තාදි යම් කිසිවකින් උපක්‍රමකොට නිද්‍රෝපගත නුවූයේ ශුක්‍රමොචනය කෙරේනම් සුක්කවිස්සට්ඨිකා නම් සඟ වෙසෙස් අවදනේයි.

**සංලක්ෂණය.** මෛථුන රාගයෙන් යුක්තව මාගම වැළඳ ගැණීම් සිපගැණීම් ආදිය කළ කල්හි ශුක්‍ර මොචනය වීද සඟවෙසෙස් නොවේ. වැළඳ ගැණීම් සිපගැණීම් හෙතුයෙන් දුකුළා ඇවැත් වේ. කෑසීම් රිසියෙන් නිමිති කසන කල ශුක්‍ර මොචනය වීද සඟවෙසෙස් නොවේ. රාගසිතින් නිමිති බැලූ හේතුයෙන් දුකුළා වේ. මාගමක් හා ප්‍රතිච්ඡන්නාසනාත යෙහි හුන්නේ ශුක්‍ර මොචනය වීද ඇවැත් නැත්තේයි. හිඳීම් හේතුයෙන් පචිති වේ.

**ආපත්තීන්ට පැමිණීම.** ශුක්‍ර මොචනය කිරීම පිළිබඳ චෙතනාව, සුකුරු මිදීමෙහි උත්සාහ කිරීම, සුකුරු මිදීම, යන කරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

**ආස්වාද එකොළොස.** මොචනාස්වාදය, මුච්චනාස්වාදය, මුක්තාස්වාදය, මෛථුනාස්වාදය, කෑසීමෙහි ආස්වාදය, ස්පර්ශයෙහි ආස්වාදය, දර්ශනාස්වාදය, හිඳීමෙහි ආස්වාදය, කථාකිරීමෙහි ආස්වාදය, ගෙහසිත ආස්වාදය, වණභඞ්ගාස්වාදය, යන මොහු එකළොස් ආස්වාදයෝයි.

**පැණවීම.** 1. මුනීන්ද්‍රයන් වහන්සේ විසින් උපක්‍රම කොට ශුක්‍ර මොචනය කරණ භික්ෂුවහට සිදුවන සුක්කවිස්සට්ඨිකා සඟවෙසෙස් ඇවත කොතැන්හිදී පනවන ලද්දේද? 2. කවරකු අරබයා පනවන ලද්දේද? 3. කිනම් වස්තුවෙක්හි පනවන ලද්දේද? 1. සැවැත්නුවරදී පනවන ලදී. 2. ආයුෂ්මත් සෙය්‍යසක භික්ෂුව අරබයා පනවනලදී. 3. ආයුෂ්මත් සෙය්‍යසක භික්ෂුතෙමේ හස්තයෙන් උපක්‍රමකොට ශුක්‍ර මොචනය කිරීම් වස්තුව නිමිත්තකොට පනවනලදී.

1. චතුර්විධ විපත්තීන් අතුරෙන් කිනම් විපත්තියෙක්ද? 1. සීල විපත්තියයි; 2. සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කිනම් ආපත්තිස්කන්ධයෙක්ද? 2. සඞ්ඝාදිසේසාපත්තිස්කන්ධයයි. 3. උපක්‍රම කොට ශුක්‍ර මොචනය කරණ භික්ෂුතෙමේ කොතෙක් ආපත්තීන්ට පැමිණේද? 3. සඞ්ඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට, යන ත්‍රිවිධ ආපත්තියට පැමිණේ. යම් භික්ෂුවක් තෙමේ මිදියටි සිතින් උපක්‍රම කොට ශුක්‍ර මොචනය කෙළේ සඟවෙසෙස් අවදනේයි. මිදියටිසිතින් උත්සාහ කෙළේ ශුක්‍ර මොචනය නොවූයේ නම් ථුලසි වේ. ශුක්‍ර මොචනය පිණිස කරණ සියලු ප්‍රයෝගයන්හි දුකුළා වේ.

2. යම් භික්ෂුවක් ප්‍රථම රාගයෙන් මඩනාලද විපර්‍යාස්ත සිත් ඇත්තේ මාගමකගේ හස්තපාද කෙශලොමාදී ශරීරාවයව ම්හිස්මාග

මක යන සංඥා ඇතිව පරාමර්ශනය කෙරේ නම් කායසංසග්ග සඟවෙසෙස අවදනේයි.

**සංලක්ෂණය.** මනුෂ්‍ය ස්ත්‍රියක යන සංඥාව, තමාගේ සිරුර ඇයගේ කාය පිළිබඳ යමකින් ස්පර්ශ කිරීම, ඇයගේ කාය තම සිරුර පිළිබඳ යමකින් ස්පර්ශකිරීම වෙයි නම් තුලසි වේ.

මනුෂ්‍ය ස්ත්‍රියක කෙරෙහි මිනිස් මාගමක් නොවේය යන සංඥාව; පණ්ඩකයෙක, තිරිසනෙක, පුරුෂයෙක යන සංඥාව, මාගමක් කෙරෙහි නොමාගමක යන සංඥා ඇතිව කයින් කාය ස්පර්ශ කෙරේ නම් තුලසි වේ. තම සිරුරෙන් ඇගේ සිරුර පිළිබඳ යමක හෝ සිරුර ඇගේ පිළිබඳ යමකින් තම සිරුර පහරී නම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** මිනිස් ස්ත්‍රියක් වීම, මනුෂ්‍ය ස්ත්‍රියක යන සංඥා ඇතිවීම, කයින් කාය ගැටීමෙහි කැමැත්ත, ඒ කැමැත්ත කාරණකොට ගෙණ උත්සාහකිරීම, අතගැණීම් ආදී ක්‍රියාවකට පැමිණීම යන කරුණු පස සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණේ.

**පැණවීම.** 1, මාගමක් හා කායසංසර්ගයට පැමිණි භික්ෂුවහට සිදුවන කාය සංසග්ග සඟ වෙසෙස් ඇවත කොතැන්හිදී පනවන ලදද? 2. කවරකු අරබයා පනවන ලදද? 3 කවර වස්තුවෙක්හි පනවන ලදද? 4. මාගම හා කාය සංසර්ගයට පැමිණි භික්ෂු තෙමේ කෙතෙක් ආපත්තීන්ට පැමිණේද?

1. සැවැත්නුවරදී පනවනලදී. 2. ආයුෂ්මත් උදායි භික්ෂුව අරබයා පනවනලදී. 3. මාගමක් හා කාය සංසර්ගයට පැමිණීම් වස්තුව නිමිති කොට පනවනලදී. 4. සඟවෙසෙස්, තුලසි, දුකුළා යන ත්‍රිවිධාපත්තීන්ට පැමිණේ. යම් භික්ෂුවක් මාගමකගේ සිරුර තම සිරුරෙන් පහස්නේ වී නම් සඟවෙසෙස් අවදනේයි. තම කයින් මාගමකගේ කාය ප්‍රතිබද්ධ වස්තුවක් ආමර්ශනය කෙරේ නම් තුලසි වේ. තම කාය ප්‍රතිබද්ධ වස්තුවකින් මාගමකගේ කායප්‍රතිබද්ධ වස්තුවක් ආමර්ශනය කරන්නේ දුකුළා වේ.

3. යම් භික්ෂුවක් තෙමේ රාගනිශ්‍රිතාධ්‍යාශයන්ගෙන් මඩනලද සිත් ඇත්තේ කාමය පිළිබඳ කථා කිරීමෙහි අදහසින් හොඳ නරක වචන තේරෙණ මිනිස් මාගමක් හා සමග වර්චස් මාර්ග මූත්‍ර මාර්ගයන් පිළිබඳ ධූර්ත වචන බෙණේ නම් දුට්ඨුල්ලවාචා සඟවෙසෙස් අවදනේයි.

**සංලක්ෂණය.** කථනාවස්ථාවෙහි නොම දත්තේ පසුව දත්තේ නම් තුලසි වේ. වර්චස් මාර්ග පස්සාවමාර්ගයන් පිළිබඳ කථනය නම්:- උස්ව සිටි මාංසයන්ගෙන් යුක්ත තැනැත්තිය, සිඛරණිය, මිශ්‍රව්‍යඤ්ජන ඇත්තිය, සම්භින්නය, ස්ත්‍රී පුරුෂ නිමිති ඇත්තිය, උභතොව්‍යඤ්ජනකය, මෙලෙස පැවැසීම මාගම පිළිබඳ ධූර්තවචන කථනය වෙයි, ගම් ගුණ දොසාත්මක වචන නොයෙක් මාගමුන් සමග කියා නම්

මාගමුන් ගේ සඞ්ඛ්‍යාවෙන් සහ වෙසෙස් අමදනේ යි. එක් මාගමකට ධ්‍රුති වචන බොහෝ සෙයින් කියා නම් වචන ගණනාවෙන් සහ වෙසෙස් අමදනේයි. මනුෂ්‍ය ස්ත්‍රියක කෙරෙහි "මාගමක කියා හෝ නො මාගමක කියා හෝ" විමති සිත් ඇත්තේ හෝ යක්ෂ–පණ්ඩක–තිරශ්චීන යන සංඥා ඇත්තේ වර්චස්මාර්ගී පස්සාව මාර්ගීයන් පිළිබඳව සිවරණීය, සම්භින්නය, උභතොබ්‍යඤ්ජනකය, තිගේ වර්චස්මාර්ගීය සුභය, මොනවට පිහිටියේය, පස්සාව මාර්ගීය සුභය මොනවට පිහිටියේය, මෙවුන්දම දෙව යන සමැදූරුම් වදන් අතුරෙන් එක් වදනකින් මුත් ගුණ දෙස් කියා නම් ඕ තොමෝ එ විගස දත්තී තුලසි වේ, එකෙණෙහි නොමදත්තී පසුව දත්තී නම් දුකුළා වේ.

මනුෂ්‍ය ස්ත්‍රියකගේ වර්චස්මාර්ගී පස්සාවමාර්ගී තබා අකු යටින් යට දණින් මත්තේ රාග නිශ්‍රිත ධ්‍රුතිංත්මක ගුණා ගුණ වදන් කියනුයේ ඇ එවිගස දත්තී නම් තුලසි වේ – පසුව දත්තී නම් දුකුළා වේ. අකු යටින් මතු දණින් පහත ගුණා ගුණාත්මක මිශ්‍ර ධ්‍රුති වචන කියා නම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.**

මනුෂ්‍ය ස්ත්‍රියක් වීම, මනුෂ්‍යස්ත්‍රියකා යන සංඥා ඇතිවීම, වර්චස්මාර්ගී පස්සාව මාර්ගී පිළිබඳ දුට්ඨුල්ල වචනාස්වාද රසයෙහි ඇලීම, ඒ රාගයෙන් කථා කිරීම, ඒ කථාවෙහි අදහස එකෙණෙහි ම දැන ගැණීම යන මේ කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

**පැනවීම.**

1. දුට්ඨුල්ල වාචා සහ වෙසෙස් ඇවැත කොහැන්හි දී පනවන ලදද? 2. කවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවෙක්හි පනවන ලදද? 4. දුට්ඨුල්ල වචනාස්වාදයෙහි යෙදුන භික්ෂු තෙමේ කෙතෙක් ආපත්තීන්ට පැමිණේද? 1. සැවැත් නුවර දී පනවන ලදී, 2. ආයුෂ්මත් උදායි ස්ථවිරයන් අරබයා පනවන ලදී, 3. ආයුෂ්මත් උදායි මිනිස් මාගමකගේ වර්චස්මාර්ගී මූත්‍ර මාර්ගීයන් පිළිබඳ ගුණදෙස් දක්වීම් වස්තුව නිමිති කොට ගෙණ පන වන ලදී, 4. සංඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට, යන ත්‍රිවිධාපත්තියට පැමිණේ. මාගමකගේ වර්චස්මාර්ගී මූත්‍රමාර්ගීයන් පිළිබඳ ගුණ දෙස් කියන භික්ෂුව සඟ වෙසෙස් ඇවතට පැමිණේ. වර්චස්මාර්ගී පස්සාව මාර්ගී හැර අන්‍ය ශරීරාවයවයන් පිළිබඳ ගුණදෙස් කියනුයේ තුලසි අවදනේ යි. කය පිළිබඳව වස්තූන් හි ගුණ දෙස කියනුයේ දුකුළාවේ.

4. යම් භික්ෂුවක් මාගමකගේ සමීපයෙහි තමා විසින් කැමැති වන ලද මෛථුන ධර්මසඞ්ඛ්‍යාත කාම ගුණයෙන් උපස්ථාන කිරීමේ අනුසස් පවසන්නේ එම්බා නැගෙනියෙනි "යම් ස්ත්‍රියක් තොමෝ සපිරුණු සිල් ඇති යහපත් ස්වභාව ඇති ශ්‍රෙෂ්ඨ චරියාවෙන් යුක්ත මා වැන්නකුට මෛථුන ධර්මයෙන් උපස්ථාන කරන්නේ නම් ඒ උපස්ථානය ශ්‍රෙෂ්ඨ වන්නේ යයි මෛථුන නිශ්‍රිත වචනයෙන් කියන්නේ නම් අත්ත කාම පාරිචරිය සඟ වෙසෙස් ඇවතට පැමිණෙන්නේ ය.

**සංලක්ෂණය.** යක්ෂ ප්‍රේත, පණ්ඩකයන් කෙරෙහි– යක්ෂණියෙකු—ප්‍රේතියෙකු, පණ්ඩකයෙකු යන සංඥයෙන් තමන්ට මෙවුන්දම්න් මෙහෙකිරීමෙහි අනුසස් කියා නම් කී කෙණෙහිම දත් තේ තුලයි වේ, පසුව දත්තේ දුකුලාවේ, යක්ෂ ප්‍රේතාදීන් කෙරෙහි විප්‍රයර්‍ය්‍යාස සිතින් මෛථුන ධර්‍මයෙන් උවැටන් කිරීමෙහි ගුණ පවසනුයේ ප්‍රකාශිත අවස්ථායෙහි දත දුකුලාවේ, ඥත්තියක් නැති පැවරීමක් ද නොකරණ ලද්දවුන් කෙරෙහි ගුණ කිවහොත් අසදෘශීක විසදෘශිකී ශික්ෂාවට අනුව දුකුලා ඇවැත්වේ.

**ආපත්තීන්ට පැමිණීම.** මනුෂ්‍ය ස්ත්‍රියක් වීම, මාගමක යන සංඥව ඇති බව, අත්තකාම පාරිචරියාවෙහි ඇලීම, ඒ රාගයෙන් ගුණකීම එකෙණෙහි ඒ අර්ථය දැනීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණේ.

1. අත්තකාම පාරිචරියා සඟ වෙසෙස් ඇවත කොතැන් හිදී පනවන ලද්ද? 2. කවරකු අරබයා පනවන ලද්ද? 3. කිනම් වස්තුවක් නිමිති කොට පනවන ලද්ද? 4. ආපත්ති සමුට්ඨානය කෙලෙසින් වේද?

1. සැවැත් නුවරදී පනවන ලදී, 2 ආයුෂ්මත් උදායි භික්‍ෂුව අරබයා පනවන ලදී, 3 ආයුෂ්මත් උදායි භික්‍ෂුව මාගමක් සමීපයෙහි මෙවුන් දම්න් උපස්ථාන කිරීමෙහි අනුසස් පැවසීම් වස්තුව නිමිති කොට පනවන ලදී, 4. කාය වාචා චිත්ත යන ත්‍රිවිධ සමුට්ඨානයෙන් ආපත්ති සමුට්ඨානය වේ.

1. අත්තකාම පාරිචරියායෙහි අනුසස් කියන භික්‍ෂු තෙමේ කොතෙක් ආපත්තීන්ට පැමිණේ ද? 1 සංඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට, යන ත්‍රිවිධ ආපත්තියට පැමිණේ. මාගමක් හමුවෙහි මෙවුන්දම්න් උවැටන් කිරීමෙහි අනුසස් කියන භික්‍ෂුව සඟ වෙසෙස් ඇවතටද, පණ්ඩකයකු හමුවෙහි එසේ පවසන භික්‍ෂුව තුලයි ඇවතටද, තිරශ්චීන සත්වයෙකු හමුවෙහි මෙවුන් දම්න් උපස්ථාන කිරීමෙහි ගුණ කියන භික්‍ෂුව දුකුලා ඇවතටද පැමිණේ.

5. යම් කිසි භික්‍ෂුවක් තෙමේ ආවාහ විවාහ වනු කැමැති ස්ත්‍රී පුරුෂයන් ගේ කාම පිළිබඳ හසුන් ගෙණගොස් පුරුෂ ස්ත්‍රීන්ට දී පිළි හසුන් ගෙණවුත් ඔවුනොවුන්ට දේ නම් සංචරිත්ත සඟ වෙසෙස් ඇවතට පැමිණේ.

**ආපත්තියට පැමිණීම.** ස්ත්‍රී පුරුෂ දෙදෙනකු අතර පනිවුඩ ගෙණයන්නේ නම් ඔවුන් මනුෂ්‍ය ජාතිකයන් වීම, පණිවුඩ ගෙණ යාමට සුදුසු බව, පණිවුඩ ගෙණ යම්හයි ඉවසීම, කැමැත්ත අකැමැත්ත පරීක්‍ෂා කිරීම, නැවත පණිවුඩ ආපසු ගෙණ ඒම, මේකරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණීම වේ.

1. සැවරිත්ත සඟ වෙසෙස් ඇවැත කොතැන්හිදී පනවන ලදද? 2. කවරකු අරබයා පන වන ලදද? 3. කිනම් වස්තුවක් නිමිති කොට පනවන ලදද? 4. ආපත්ති සමුට්ඨානය කෙසේ ද? 5. ස්ත්‍රී පුරුෂයන් ගේ පණිවුඩ සංවරණයෙහි යෙදුන භික්ෂුව කොතෙක් ආපත්තීන්ට පැමිණේද? 1. සැවැත්නුවර දී පනවනලදී. 2. ආයුෂ්මත් උදායි භික්ෂුව අරබයා පනවන ලදී. 3. උදායි භික්ෂුව ආවාහ විවාහ වනු කැමැති ස්ත්‍රී පුරුෂයන්ගේ පණිවුඩ ගෙණයෑම් වස්තුව නිමිති කොට පනවන ලදී. 4. ෂට්සමුට්ඨානයෙන්ම ආපත්තිසමුට්ඨානය වේ. 5. සංඝාදිසෙස, ථුල්ලච්චය, දුක්කට, යන ත්‍රිවිධාපත්තියට පැමිණේ. යම් භික්ෂුවක් පිළිගැණීම්, විමසීම්, ප්‍රත්‍යාවහරණ කෙරේ නම් සඟ වෙසෙස් අවදනෝයි. පිළිගැණීම්, විමසීම් කරණුයේ ප්‍රත්‍යාවහරණය නොකෙරේ නම් තුලසි වේ. පිළිගැණීම් කරණුයේ විමසීම් ප්‍රත්‍යාවහරණ නො කෙරේ නම් දුකුළා වේ.

6. යම් භික්ෂුවක් තෙමේ කරවාදෙන දායකයෙක් නැතිව දිගින් සුගත් වියතින් දෙළොස් වියතනටද පුළුල සත් වියතකටද වඩා රැගෙණ කුටිවස්තු නොදෙසා තමන්ට විසීම පිණිස ඉල්වාගන්නා ලද මැ පොරෝ ආදි උපකරණයන්ගෙන් ලොකු ගෙයක් කරවීනම් කුටි කාර සඟවෙසෙය් ඇවැතට පැමිණේ.

**සංලක්ෂ්‍යය.** සුගත් වියතනම් මැදුම් පුරුෂයක්හුගේ එක්රියන් සමාරකි, මැදුම් පුරුෂයාගේ රියන පියවි පුරුෂයන්ගේ එක්රියන් සමාරක් වෙයි, සාමාන්‍ය රියනින් සත්වියි රියන් දිග හා සතළොස් රියන් පුළුල මෙහි ප්‍රමාණය වශයෙන් ගතයුතු. මේ කුටිය උල්ලිත්ත, අවලිත්ත, උල්ලිත්තා'වලිත්ත වශයෙන් තුන් ප්‍රකාර වෙයි. උල්ලිත්ත නම් :—ඇතුළ මැටි ආදිය ආලෙපකරණ ලද කුටියයි. අවලිත්ත නම්:—පිටත මැටි ආදිය ආලෙපකරණ ලද කුටියයි. ඇතුළ පිට ආලෙපකරණ ලද්දේ උල්ලිත්තාවලිත්ත කුටියයි.

**ආපත්තියට පැමිණීම.** ත්‍රිවිධ කුටි අතුරෙන් එක්තරා කුටියක් වීම, ඇඳක් ඔබ් මොබ ගතහැකිවූ හෙටසීම ප්‍රමාණවීම, අදෙසිත වස්තු බව, ප්‍රමාණාතික්‍රාන්ත බව, අනුද්දසික බව, වාසාගාර බව, ලෙපඝටන බව යන කරුණු සම්පූර්ණවීමෙන් ඇවතට පැමිණීම වේ.

1. කුටිකාර සඟ වෙසෙස් ඇවත කොතැන්හිදී පනවන ලදද ? 2. කවරෙකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිතිකොට පනවන ලදද? 4. සඤ්ඤාචික කුටිකරණයෙහි යෙදුන භික්ෂුතෙමේ කොතෙක් ආපත්තීන්ට පැමිණේද ?

1. අලව් නුවරදී පනවන ලදී. 2. අලව් නුවර වැසි භික්ෂූන් අරබයා පනවන ලදී. 3. අලව් නුවරවැසි භික්ෂූහු කුටි වස්තු නො දෙසා ප්‍රමාණය ඉක්මවා තමා වාසයට ලොකු ගෙයක් කරවීම් වස්තුව නිමිතිකොට පනවන ලදී. 4. දුකුළා—තුලසි—සඟවෙසෙස් යන තුන් ඇවැතට

පැමිණේ. කුටි කිරීම් පිළිබඳ සියලු ප්‍රයොගයෙහි දුකුළා වේ. එක් මැටි පිඩක් ශේෂව තිබියේ නම් තුලසි වේ. එම මැටි පිඩද අවසාන කළ කල්හි සඟවෙසෙස් අවදනේයි.

7. කරවාදෙන කෙනෙක් ඇතිකල්හි පූර්වොක්ත ශික්‍ෂාපදයෙහි කියනලද ප්‍රමාණයට වඩා මහත්කොට ගනහැකි නමුත් විහාර වස්තු නො දෙසා මහත්වූ විහාරයක් කරවීනම් මහල්ලක විහාරකාරාපන සඟවෙසෙස් ඇවැතට පැමිණේ.

සංලක්‍ෂ්‍යය. ප්‍රමාණයක් නැති බවත් අකිරිය මාත්‍රය කින් ඇවැත් නගින බවත් එක සංඝාදිසෙසයක් වන බවත් පූර්වොක්ත ශික්‍ෂාපද යට වඩා මෙහි ඇති වෙනස වේ.

1. මහල්ලක විහාර කාරාපන සඟ වෙසෙස් ඇවත කොතැන්හිදී පනවන ලදද? 2. කවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තු වක් නිමිති කොට පනවන ලදද? 4. මහල්ලක විහාරයක් කරවන භික්‍ෂු තෙමේ කෙනෙක් ආපත්තීන්ට පැමිණේද?

1. කොසඹෑ නුවරදී පනවන ලදී. 2. ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් අරබයා පනවන ලදී. 3. විහාර වස්තු සොධනයෙහි නියුක්ත ආයුෂ්මත් ඡන්න ස්ථවිරතෙමේ එක්තරා චෛත්‍යස්ථ වෘක්‍ෂච්ඡේදන වස්තුව නිමිති කොට පනවන ලදී. 4. දුක්කට, ථුල්ලච්චය, සංඝාදිසෙස යන ත්‍රිවිධ ආපත්තීන්ට පැමිණේ. මහල්ලක විහාරකාරාපන පියෝගි දුකුළාවේ. මත්තිකාලෙපයෙහි එක් මැටිපිඩක් සේස වූයේ තුලසි වේ. සියල්ල නිමවූ කල සඟවෙසෙස් ඇවැත වේ.

8. යම් කිසි භික්‍ෂුවක් තෙමේ ක්‍රොධ සිතින් සිල්වත් භික්‍ෂුවක් මේ යහපත් ශාසනික හැසිරීමෙන් චුත කළහොත් යෙහෙකැයි සිතා දිට්ඨ-සුත පරිසංකිත වශයෙන් මුල් නැත්තාවූ අමූලික පාරාජිකා ඇවතකින් චොදනා කෙළේනම් අමූලික චොදනා සඟ වෙසෙස් ඇවැතට පැමිණේ.

සංලක්‍ෂ්‍යය. දිට්ඨ නම් :—තම මසැසින් හෝ දිවැසින් දැකීමයි.

සුත නම් :— තමා ප්‍රකෘති කණියෙන් හෝ දිව කණින් ඇසීමයි.

පරිසංකිත තුන් ප්‍රකාරවේ. මාගමක් හා භික්‍ෂුවක් ප්‍රතිච්ඡන්න ස්ථානයෙක්හි දැකීමෙන් හෝ එබඳු තැනකින් නික්ම යන්නහු දැකීමෙන් මෙ තෙම පරිජි ඇවතට පැමිණියේ ය යි සැකකිරීම, ප්‍රතිච්ඡන්න ස්ථානයක මාගමක් හා පැවිද්දෙකු බණන තෙපුල් අසා එහි අන්‍යයන් ඇති බව නොම දැන මෙතෙම පරිජි ඇවතට පැමිණියේ ය යි සැකකිරීම, ප්‍රව්‍රජ්‍යාප්‍රාප්තයන් ගේ සිරුරෙහි හෝ වසන තන්හි වූ මල් සුවඳ ඈ ආඝ්‍රාණය කිරීමෙන් මෙතෙම පරිජි ඇවැතට පැමිණියේ ය යි සැක කිරීම යන මෙලෙසින් කාරණ සැකය දිට්ඨ, සුත පරිසංකිත වශයෙන් සැක කාරණ අයුරුයි.

**අවැතට පැමිණීම.** යම් පුද්ගලයෙකු හට චෝදනා කරන්නේ විනම් ඒ පුද්ගලයා භික්ෂු සඞ්ඛ්‍යාවට ගිණීමය, ඒ භික්ෂුව කෙරෙහි දෝෂාරෝපනය කරන්නේය යන සංඥ ඇති බවය, යම් පරිජි ඇවැතකින් චෝදනා කරන්නේ නම් ඒ පරිජි ඇවැතත් මිදෙන බවය, ශාසනයෙන් පහ කරණු කැමැත්තේ අභි මුඛයෙහි එකෙණෙහි චෝදනාවේ අඬ දැනීමය, යන කරුණු සම්පූර්ණවීමෙන් අමූලක සඞ්ඝාදිසෙස් ඇවතට පැමිණීමවේ.

1. අමූලික චෝදනා සඞ්ඝාදිසෙස් ඇවත කොතැන්හි දී පනවන ලදද? 2. කවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවෙක්හි පනවන ලදද? 4. භික්ෂුවක් හට අමූලික පාරාජිකාපත්තියෙන් අනුධංසනය කරණ භික්ෂු තෙමේ කෙතෙක් ආපත්තීන්ට පැමිණේද?

1. රජගහ නුවරදී පනවන ලදී. 2. මෙත්තිය භුම්මජක භික්ෂූන් අරබයා පනවන ලදී. 3. මෙත්තිය භුම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බ මල්ල පුත්‍ර ස්ථවිරයන් අමූලික පාරාජිකාපත්තියෙන් අනුධංසනය කිරීම් වස්තුව නිමිතිකොට පනවන ලදී. 4. සංඝාදිසෙස, දුක්කට, ඔමසවාද යන තුන් ඇවතට පැමිණේ. සසුනෙන් නෙරපන අදහස් ඇත්තේ අමූලික පරිජි ඇවතකින් චෝදනා කෙරේනම් සඞ්ඝාදිසෙස් ඇවතට පැමිණේ. එසේම සඞ්ඝාදිසෙස් ඇවතින් චෝදනා කරණුයේ දුකුලා වේ. ආක්‍රොශ කිරීම් වශයෙන් කියානම් ඔමසවාදාපත්ති වේ.

9. උපසපන් භික්ෂුවක් බ්‍රහ්මචරියා සඞ්ඛ්‍යාත උතුම් ශාසන ප්‍රතිපත්තියෙන් චුතකරණු කැමැත්තේ එළු බැටලු ආදී අන් කිසිවෙකුගේ මෛථුන සංසර්ගයක් දැක ඒ ලේසයෙන් චෝදනා කොළේනම් කිසුවිදෙස ලේස සඞ්ඝාදිසෙස් ඇවතට පැමිණේ.

**සංලක්ෂණය.** මෙහි ලේස නම් :— ජාති, නාම, ගොත්ත, ලිඞ්ග, ආපත්ති, පත්ත, චීවර, උපජ්ඣාය, ආචරිය, සෙනා වශයෙන් දශප්‍රකාරවේ.

**ජාතිලේස නම්:–** "ඛත්තියො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, ත්වං ඛත්තියො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි" පරිජි අවන් ක්ෂත්‍රිය තෙමේ මා විසින් දක්නා ලදී, ක්ෂත්‍රියවූ නුඹ පරිජි අවදනෙහිය, යනාදීන් චෝදනා කරණ කරවන මහණ සඞ්ඝාදිසෙස් අවදනේ යි.

**නාමලේස නම්:–** "බුද්ධ රක්ඛිතො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, ත්වං බුද්ධ රක්ඛිතො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො'සි" මා විසින් පාරාජිකාපත්තියට පත් බුද්ධරක්ඛිත නැමැත්තහු දක්නා ලදී. බුද්ධරක්ඛිත නුඹ පරිජි ඇවතට පැමිණියෙහි ය, යනාදී වශයෙන් චෝදනා කරණ කරවන මහණ සඞ්ඝාදිසෙස් අවදනේ යි. ගොත්තාදිසෙසු පදයන් පිළිබඳවද මේ ක්‍රමයෙන් ම දතයුතුයි.

"පඨමං ආපත්ති එතෙසන්ති පඨමාපත්තිකා" යි නිර්වචන හෙයින් මේ සඟ වෙසෙස් නවය විකුම් කොණෙහි නොහොත් ඒ ඒ බුද්ධප්‍රඥප්තිය කඩකළ කෙණෙහිම සඟ වෙසෙස් ඇවැතට පැමිණේ.

1. කිඤ්චිදෙස ලෙස සඟ වෙසෙස් ඇවැත කොතැන්හිදී පනවන ලද්දේද? 2. කවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිතිකොට පනවන ලදද? 4. කිඤ්චිදෙස ලෙස මත්ත පාරාජිකාපත්තියෙන් චොදනාකරණ භික්‍ෂු තෙමේ කොතෙක් ආපත්තීන්ට පැමිණේ ද?

1. රජගහ නුවරදී පනවන ලදී. 2. මෙත්තිය භුම්මජක භික්‍ෂූන් අරබයා පනවන ලදී. 3. මෙත්තිය භුම්මජක භික්‍ෂූහු එළු බැටළු ආදි අන් කිසිවකුගේ මෙවුන්දමක් දැක ඒ ලේසයෙන් පාරාජිකාපත්තියෙන් චොදනා කිරීම් වස්තුව නිමිතිකොට පනවන ලදී. 4. සංඝාදිසෙස, දුක්කට, ඔමසවාද යන ත්‍රිවිධාපත්තියට පැමිණේ. සසුනෙන් තෙරපන රිසියෙන් අඤ්ඤභාගිය ලෙසමත්ත පරිජ් ඇවතින් චොදනා කරන්නේ සඟ වෙසෙස් අවදනෝ යි. එසේ සඟ වෙසෙසින් චොදනා කරණුයේ දුකුළාවට පැමිණේ. ආක්‍රොශකිරීම් අදහස් ඇත්තේ නියාද ඔමසවාදපත්ති වේ.

## විකුම් කොණෙහි ඇවැත් අවත් නව සඟ වෙසෙස් විනිස නම් පස්වන පරිච්ඡේදය නිමි.

---

10. සමඟි සඞ්ඝයා හෙදකිරීමට උත්සාහ කරණ භික්‍ෂුව හට ඒ දෘෂ්ටිය අත් හරවනු පිණිස සෙසු භික්‍ෂූන් විසින් තුන් යළුන් අවවාදකළ කල්හි එම දෘෂ්ටිය නොහරිනම් ඉන් පසු තුන් යළක් සමනුභාෂණ කර්‍මය කළ යුතුය. එය කරණ තුරුත් ස්වකීය දෘෂ්ටිය අත් නොහළේ නම් සංඝ හෙද සඟ වෙසෙස් ඇවතට පැමිණේ.

**සංලක්‍ෂණය.** ඥප්තිය අවසන් වූ කල්හි දුෂ්කෘතයද, කර්‍මවාක්‍යය දෙවරක් කී කල්හි ථුල්ලසියද, කර්‍මවාක්‍යය තෙවරින් අවසන් වූ කල්හි සඟ වෙසෙස් ඇවතට පැමිණේ.

**ආපත්තියට පැමිණීම.** සමඟි සඞ්ඝයා හෙද කිරීම පිණිස උත්සාහ කිරීමය, ධර්‍ම කර්‍මයෙන් අවවාද කිරීමය, කර්‍මවාක්‍යය අවසන් කිරීමය, දෘෂ්ටිය අත් නොහැරීමය යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

1. සංඝ හෙද සඟ වෙසෙස් ඇවැත කොතැන්හිදී පනවන ලදද? 2. කවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවෙක්හි පනවන ලදද? 4. තුන් වරක් සමනුභාෂණකම් කළ කල්හිත් ස්වකීය දෘෂ්ටිය අත් නොහැර සංඝයා හෙද කිරීමට යත්න දරණ භික්‍ෂුව කොතෙක් ආපත්තීන්ට පැමිණේද?

1. රජගහ නුවරදී පනවන ලදී. 2. දෙව්දත් තෙරුන් අරබයා පනවන ලදී. 3 දෙව්දත් තෙරුන් සමගි සංඝයා භෙද කිරීමට උත්සාහ කිරීම් වස්තුව නිමිතිකොට පනවන ලදී. 4. දුක්කට, ථුල්ලච්චය, සංඝාදිසෙස යන ත්‍රිවිධ ආපත්තියට පැමිණේ. ඤත්තිය අවසානයෙහි දුකුළාවටද, දෙවරක් කම්වාක්‍ය කීකල්හි තුලසියටද, කම්වාක්‍ය අවසානයෙහි සඟ වෙසෙස් ඇවැතට පැමිණේ.

11. සමගි සංඝයා භෙදකිරීම පිණිස ව්‍යායාම් කළ භික්ෂුවගේ දෘෂ්ටිය පැවැත්වීමට අනුබල දී වගී වීමට සුදුසු කථාබස් කරන්නාවූ භික්ෂූනු කීප නමක් වෙද්ද, ඔවුන්ට ස්වකීය දෘෂ්ටිය හරණා පිණිස සෙසු භික්ෂූන් විසින් තුන් වරක් අවවාදකළ කල්හි ඉන් පසු තුන් යලක් සමනුභාෂණ කම් කළයුතුයි. එය කරණකුරුත් ස්වකීය දෘෂ්ටිය අත් නොහරිනම් භෙදානුවත්තක සංඝාදිසෙසා පත්තියට පැමිණේ.

**සංලක්ෂය.**
**ආපත්තියට පැමිණීම.**

අනුවත්තීක වනබව, අනුශාසනා කිරීම, කම්වාක්‍යය තුන් යලක් කීම, ඒතාක් දෘෂ්ටිය අත් නොහැරීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

1. භෙදානුවත්තක සඟ වෙසෙස් ඇවත කොතැන්හිදී පනවන ලද්දේද? 2. කාවරකු අරබයා පනවන ලද්දේද? 3. කිනම් වස්තුවක් නිමිතිකොට පනවන ලදද? 4. තුන් වරක් සමනුභාෂණකම් කළ කල්හිත් ස්වකීය දෘෂ්ටිය අත් නොහැර භෙදානුවත්තීක භික්ෂූනු කොතෙක් ආපත්තින්ට පැමිණෙත්ද?

1. රජගහ නුවරදී පනවන ලදී. 2. රජගහ නුවර බොහෝ භික්ෂූන් අරබයා පනවන ලදී. 3. සංඝ භෙද කම්යට අනුවත්තීකවීම් වස්තුව නිමිති කොට පනවන ලදී. 4. දුක්කට, ථුල්ලච්චය, සංඝාදිසෙස යන ත්‍රිවිධ ආපත්තියට පැමිණේ. ඤත්තිවාක්‍යය අවසානයෙහි දුකුළාවටද, දෙවරක් කම් වාක්‍ය කී කල්හි තුලසියටද, කම් වාක්‍ය අවසානයෙහි සඟ වෙසෙස් ඇවතටද පැමිණේ.

සමගි සංඝයා භෙදකිරීම පිණිස උත්සාහ කරන්නාවූ දෙව්දත් තෙරණුවන් අනුගමනය කළ රජගහ නුවර වැසි බොහෝ භික්ෂූන් අරබයා පනවන ලදී.

12. භික්ෂු සංඝයා විසින් නිදාන, පාරාජිකා, සංඝාදිසෙස, අනියත, විත්ථාරුද්දෙශයන්හි ඇතුළත් ශික්ෂාපදයකින් අවවාද කරණු ලබන කල ඒ අවවාද කිරීම ප්‍රතික්ෂෙප කරණ අක්කරු භික්ෂුව හට සෙසු භික්ෂූන් විසින් දුර්වචභාවය දුරු කරණු සඳහා තුන් වරක් අවවාදකළ කල්හි ස්වකීය දෘෂ්ටිය අත් නොහලේ නම් ඉන් පසු තුන් යලක් සමනුභාෂණකම් කළ යුතුයි. එය අවසන් කරණ කුරුත් තම ලාමක දෘෂ්ටිය අත් නොහරිනම් දුබ්බචභාව සඟ වෙසෙස් ඇවතට පැමිණේ.

**ආපත්තියට පැමිණීම.** නොකියන ලද්ද කිරීමය, අනුශාසනා කිරීමය, තුන් වරක් කම්වාක්‍ය කීමය, දෘෂ්ටිය අත්නොහැරීමය යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණේ.

1. දුබ්බචභාව සඟ වෙසෙස් ඇවත කොතැන්හිදී පනවන ලදද? 2. කවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිතිකොට පනවන ලදද? 4. තුන් වරක් සමනුභාෂණකම් කරණ තුරුත් සවකීය දුර්වචභාවය අත් නොහරණ භික්‍ෂු තෙමේ කෙතෙක් ආපත්තීන්ට පැමිණේද?

1. කොසඹෑ නුවරදී පනවන ලදී. 2. කොසඹෑ නුවර ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් අරබයා පනවන ලදී. 3. භික්‍ෂූන් විසින් කරුණු සහිතව අවවාද කරණු ලබනකල තමාට අවවාද නොකරවයි කීම වස්තුව නිමිතිකොට පනවන ලදී. 4. දුකකට, ථුල්ලච්චය, සංඝාදිසෙස යන ත්‍රිවිධ ආපත්තියට පැමිණේ. ඥත්ති අවසානයෙහි දුකුළා ඇවතටද, කම්වාක්‍යය දෙවරක් කී කල්හි ථුලසී ඇවතටද, කම් වාක්‍ය අවසන් කළ කල්හි සඟ වෙසෙස් ඇවතටද පැමිණේ. මේ ඇවැත් අවන් පරිදිසි.

13. යම් භික්‍ෂුවක් ගමක් හෝ නියම්ගමක් ඇසුරු කරමින් පුෂ්ප දානාදියෙන් කුල සඞ්ග්‍රහ කරන්නේ වේද, ඒ භික්‍ෂුව සෙසු භික්‍ෂූන් විසින් ඒ විහාරයෙන් බැහැර කරණු පිණිස කරුණු කී කල්හි "භික්‍ෂූහු ඡන්ද යෙන් මෙෂයෙන් භයෙන් අගතියට යතියි" කියාහම් ඒ දුර්ග්‍රාහය දුරලනු පිණිස සෙසු භික් සඟන විසින් තුන් වරක් අවවාද කරණුයේ තම දෘෂ්ටිය නොහරී නම් තුන් වරක් සමනුභාෂණ කර්මය කළයුත්තේ සි. එසේ කළ කල්හිදු සවකීය දෘෂ්ටිය නොහරී නම් ඒ කුලදූෂක භික්‍ෂුව කුලදූෂක සඟ වෙසෙස් ඇවතට පැමිණේ.

**සංලක්ෂ්‍යය.** දූවද, හිදෙළුයට ඇඹුණද, තල් කොස් ආදී ඵලද, පුවඟු මල් ආදී මල්ද, මහරි සුණු ආදී සුණුද, නහන දිය හා මුව දොනා දියද, පියවි මැටි ආදී මැටිද, දැවිටි දඹු ආදියද, කුල සඞ්ග්‍රහ පිණිස නො දිය යුතුයි.

**ආපත්තියට පැමිණීම.** ඡන්දයෙන් අගතියට යෑම, අනුශාසනා කිරීම, තුන් වරක් කම් වාක්‍ය කීම, සවකීය දෘෂ්ටිය නොහැරීම, යන කරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණීම වේ.

1. කුලදූෂක සඟ වෙසෙස් ඇවැත කොතැන්හිදී පනවන ලද ද? 2. කවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිතිකොට පනවන ලදද? 4. තෙ වරක් සමනුභාෂණකම් කරණ තුරුත් තම දෘෂ්ටිය අත් නො හරණ කුලදූෂක භික්‍ෂු තෙමේ කෙතෙක් ආපත්තීන්ට පැමිණේද?

1. සැවැත් නුවරදී පනවන ලදී. 2. අස්සජි පුනබ්බසුක භික්ෂූන් අරබයා පනවන ලදී. 3. කුලදූසක භික්ෂුව වෙහෙරින් බැහැර කිරීම පිණිස සරුණු කියන කල්හි "ඒ සැළුනු ඡන්දාදියෙන් අගතිගාමීහුය" යි කීම් සංඛ්‍යාත දුර්ග්‍රාහික වස්තුව නිමිති කොට පනවන ලදී. 4. දුකකට, ථුල්ලච්චය, සංඝාදිසෙස යන ත්‍රිවිධ ඇවතට පැමිණේ. ඤත්තියෙහි දුකුලාවටද, දෙවරක් කර්මවාක්‍යය කී කල්හි ථුලසියට ද, කර්මවාක්‍යය අවසානයෙහි සඟ වෙසෙස් ඇවතට ද පැමිණේ.

**සංඝාදිසෙසය.** "සඞ්ඝො ආදිම්හි චෙව සෙසෙ ච ඉච්ඡිතබ්බො අස්සාති සංඝාදිසෙසො" යි නිර්වචන හෙයින් සඟ වෙසෙස් ඇවැත් අවදිමින් සීල විපත්තියට පැමිණි භික්ෂුව විසින් පූරණය කටයුතු වූ ආදියයි දක්වන ලද පරිවාස (පිරිවෙස්) සමාදානයෙහි ද, සෙසයයි කියන ලද මානත අබ්භාන කර්මයන්හි ද සඞ්ඝයා ඇතිවම සිදු විය යුත්තේ නුයි. මේ ඇවැත සංඝාදිසෙස නම් වේ. ඒ දූෂිත සිල් ඇති භික්ෂුවගේ සීල ශුද්ධිය පිණිස කළයුතු වත් මානත් අබ්භාන කර්මයන්ට සංඝයා උවමනා සෙයින් මෙයට සංඝාදිසෙස යයි නාමය තබන ලදී.

## තුන්වන සමනුභාෂණ කර්මාවසානයෙහි ඇවැත් අවන් සිව් සඟ වෙසෙස් විනිස නම් ස වන පරිච්ඡේදය නිමි.

"පරිවසන්ති පරිවාසො" යි, නිරුක්ති හෙයින් ගරු ඇවැත් අවන් භික්ෂුවට ප්‍රතිච්ඡන්න දින ප්‍රමාණයට දඬුවම් වශයෙන් පිළිපැදිය යුතු වත පරිවාස නම්.

එය, පටිච්ඡන්න පරිවාසය, සුද්ධන්ත පරිවාසය, සමොධාන පරිවාසය යි ත්‍රිවිධ වේ.

**සංලක්ෂණය.** උට්ඨාන ගාමිණී තෙළෙස් සඟ වෙසෙස් ගරු ඇවැත් අවන් උපසපන් පැවිද්දනු විසින් (දැන දැන ඇවැත් ප්‍රතිච්ඡන්න කෙළේ වී නම්) පිරිවෙස් මානත් පුරා අබ්භාන කර්මයෙන් පිරිසිදු විය යුතුයි.

**පටිච්ඡන්න පරිවාසය.** ප්‍රතිච්ඡන්න වූ ඇවැත් ප්‍රමාණයට දිය යුතු පිරිවෙසයි. කිසිවෙකුට එක දිනක් ප්‍රතිච්ඡන්න වෙයි. කිසිවෙකුට දෙ දිනක් තෙ දිනක් හෝ ඊට වැඩි දින ගණනක් ප්‍රතිච්ඡන්න වෙයි. එ බැවින් පටිච්ඡන්න පරිවාසය දෙන්නහු විසින් පළමුකොට ප්‍රතිච්ඡන්නවීම දැන ගත යුතු වෙයි.

දස ආකාරයකින් වෙයි. 1. පැමිණි **ආපත්ති ප්‍රතිච්ඡන්නවීම.** ඇවැත් ඇති බව. 2. ඇවැතට පැමිණි යේය යන හැඟීම. 3. උකෙව්හි කම් නො කළ බව. 4. එය නො කෙලෙස යන හැඟීම. 5. දස විධ අනතරාය යන් ගෙන් එකකුදු නැති බව. 6. එය නැත්තේය යන හැඟීම. 7. ආපත්තාරෝචනයට යා හැකි බව. 8. එසේ යා හැකි යන හැඟීම. 9. ඇවැත් වසනු කැමැත්ත. 10. ඇවැත් වැසීම, මේ දස කරුණින් ප්‍රතිච්ඡන්න වූ ඇවැත් ඇති භික්ෂු තෙමේ ඇවැත් අවන් කෙණෙහි ම ගින්නක් ඇක්ම වූ පුරිසක්හු සෙයින් සභාග භික්ෂුවක් වෙත වහා එළඹ ආපත්තාරෝචනය කළමනා වේ. ඉදින් සභාගයකු දැකද මෙ තෙම මාගේ උපාධ්‍යාය හෝ ආචාර්‍ය්‍ය යි ලජ්ජාවෙන් ඇවත ආරෝචනය නො කරයි නම් එකල ආපත්ති ඡන්නය වෙයි. විසභාගයන් වෙත ඇවැත් ආරෝචනය නො කටයුතුයි. ප්‍රතිච්ඡන්න හේතුවෙන් දුකුළා වේ.

මේ දස කාරණයන් පරීක්ෂාකොට පටිච්ඡන්න පරිවාසය දෙන්නහු විසින් පිළිසන් දිනයන් හා ඇවැත් සලකා ඉදින් එක දිනක් පිළිසන් වීනම් (ප්‍රතිච්ඡන්න දින ප්‍රමාණ හා ඇවැත් ප්‍රමාණ ඇති සැටියෙන් යොදා ගත යුතුයි.) "අහං භන්තෙ එකං ආපත්තිං ආපජ්ජිං සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං එකාහපටිච්ඡන්නං" යනාදීන් ඛන්ධකයෙහි සඳහන් පරිදි කම්වාක්‍යය කියා පිරිවෙස් දිය යුතුයි. මේ පරිවාසාදි විනය කර්මය වත්‍ථු, ගොත්ත, නාම, ආපත්ති කිත්තනයෙන් කටයුතුයි. එහි සුක්කවිස්සට්ඨි යනාදිය වස්තු ද ගොත්‍ර ද වෙයි. සංඝාදිසෙසො යනාදිය නාමය ද ආපත්තිය ද වෙයි.

මෙසේ ඤත්ති ද්විතීයකම් වාක්‍යාවසානයෙහි සීමා මාලකයෙහිදීම ඒ භික්ෂුව විසින් "පරිවාසං සමාදියාමි, වත්තං සමාදියාමි" යි වත සමාදන් විය යුතුයි. සමාදන්ව එහිදී ම ඒ බව සඞ්ඝයාට දැන්විය යුතුයි:- "අහංභන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං එකාහ පටිච්ඡන්නායො, සොහං සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහ පටිච්ඡන්නානං එකාහං පරිවාසං අදාසිං, සොහං පරිවසාමි, වෙදියාමහං භන්තෙ, වෙදියතීති මං සඞ්ඝො ධාරෙතූති" මෙසේ කියා දැන්විය යුතුයි.

මේ අයිය ඇති වෙන වචන වලින් හෝ දැන්වීම සුදුසු යි. වත නික්ෂේප කිරීමට කැමැති විට "පරිවාසං නික්ඛිපාමි, වත්තං නික්ඛිපාමි" යි නික්ෂේප කටයුතුයි. නික්ෂේප කළතැන් පටන් භික්ෂු තෙමේ ප්‍රකෘති තන්හි පිහිටියේ වෙයි: වත නික්ෂේප නො කොට රැකීමට පහසු වූ සවල්ප භික්ෂූන් ඇති විහාරයක් වීනම් එහි රාත්‍රි ච්ඡේදනය නො කොට ආරක්ෂා කටයුතුයි. එසේ වත පිරිසිදුව රැකගැනීමට අපහසු වූ බොහෝ භික්ෂූන් ඇති තැනක් නම් කියනලද ක්‍රමයෙන් නික්ෂේප කොට අලුයම් වේලෙහි එක භික්ෂුවක් සමග විහාර සීමාවෙන් පිටත කැට දෙකක් පතනය වන ප්‍රමාණය ඉක්මවා මඟ මාර්ගයෙන් ඉවත් ව පඳුරකින් හෝ වැටකින් වැසුනු තැනෙක හින්ද යුතුයි. පසුදා අරුණු නැඟුනු කල්හි ම වත සමාදන් ව ආරෝචනය කටයුතුයි. ආරෝචනා කිරීමේදී එය

නවකයකුට ආරොචනය කෙරේ නම් "ආවුසො" යි කිය යුතුයි. වෘද්ධයෙක් නම් "භන්තෙ" යි කිය යුතුයි. ඉදින් අන් කිසි භික්ෂුවක් කිසි කටයුත්තක් සඳහා එතනට පැමිණියේ වීනම් හෙතෙම ඔහු දනීද, ඔහුගේ ශබ්දය හෝ අසයිද, ඒ භික්ෂුව හට ද ආරොචනය කටයුතුයි. ආරොචනය නො කළහුට රාත්‍රිච්ඡෙදනය ද, වත බිඳීම ද වෙයි. යම් භික්ෂුවක් නො දැන දොළොස් රියන් තැන් උපචාරය ඉක්මවා යයි ද රාත්‍රිච්ඡෙදය වෙයි, වත බිඳීම නො වේ. අරුණු නැගී කල්හි වත නික්ෂෙප කටයුතුයි. ඉදින් ඒ භික්ෂු තෙම කිසියම් කටයුත්තකින් බැහැර ගියේ වේද, හැමට පළමුව යම් අතිකකු දකී ද ඔහුට ආරොචනය කොට නික්ෂෙප කටයුතුයි. විහාරයට ගියේද යමකු පළමුව දකී ද, ඔහුට ආරොචනය කොට නික්ෂෙප කටයුතුයි. මේ කියේ වත නික්ෂෙප කළහු පිළිපැදිය යුතු සැටිය යි.

මෙසේ යම් පමණ දවස් ආපත්ති ප්‍රතිච්ඡන්න ද එ පමණ දින ගණනක් හෝ සැක දුරුවීම පිණිස ඊට වැඩි දින ගණනක් හෝ පිරිවෙස් වැස|සඞ්ඝයා වෙත එළඹ මානත්ත ඇයැදිය යුතුයි. වත සමාදන් වූ කල්හි ම මානත්තාර්හ වෙයි.

අනික්ෂිප්ත වත ඇත්තහුට නැවත සමාදාන කෘත්‍යයන් නැත. හෙතෙමේ ප්‍රතිච්ඡන්න දිවසාවශානයෙහි ම මානත්තාර්හ වෙයි. එ හෙයින් ඔහුට මානත දිය යුතුයි.

**ශුද්ධාන්ත පරිවාසය.** "තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපන්නො හොති ආපත්ති පරියන්තං න ජානාති රත්ති පරියන්තං න ජානාති" යි මේ වස්තුවෙහි අනුදත වදාළ පිරිවෙසකි. එය චූල ශුද්ධාන්තය, මහා ශුද්ධාන්තය යි දෙ පරිදි වේ. මේ දෙවැදෑරුම් පිරිවෙස ම රත්තිපරිච්ඡෙදය සියල්ල හෝ එක දෙශයක් නො දන්නා හට ද, සිහි නො කරන්නා හට ද, එහි වෙමතිකයා හට ද දිය යුතු වෙයි. ආපත්ති පරියන්තය වනාහි මම මෙ පමණ ඇවැත් වලට පැමිණියෙය කියා දන්නේ හෝ වේවා, නො දන්නේ හෝ වේවා, එය මීට කාරණය නොවේ. එහි යමෙක් උපසම්පදාවේ පටන් අනුලොම ක්‍රමයෙන් හෝ ආරොචිත දින පටන් ප්‍රතිලොම ක්‍රමයෙන් හෝ අසුවල් දවස හෝ පක්ෂය හෝ මාසය හෝ අවුරුද්ද හෝ ඔබ පිරිසිදුය කියා දන්නෙහි දැ යි විචාරණු ලබන්නේ, එසේය ස්වාමීනි, මෙතෙක් කල් මම පිරිසිදු වන්නෙක්මි යි කියයි ද ඕ හට දෙන ශුද්ධාන්ත පරිවාසය "චූල ශුද්ධාන්තය" යි කියනු ලැබේ. එය ගෙණ පිරිවසන්නහු විසින් යම් පමණ කල් තමාගේ පිරිසිදු බව දනී ද, ඒ ප්‍රමාණය ඉවත් කොට සෙසු මස හෝ දෙ මස පිරිවෙස් පිරිය යුතුයි. ඉදින් මසක් පමණක් අශුද්ධය යි සලකාගෙණ පිරිවෙස් පුරණ අතර තව මසක් ඇති බැව් සිහි වීනම් ඒ මසද පිරිවෙස් පිරිය යුතුයි. එහි පරිවාස දානය අවශ්‍ය නොවේ.

තවද, දෙ මසක් අශුද්ධයයි සලකාගෙණ පිරිවෙස් වසන අතුර "මම මසක් පමණක් අශුද්ධ වෙමිය" නිශ්චිත වීනම් මසක්ම පිරිවෙස් විසිය යුතුයි. එහිදු පරිවාස දානය අවශ්‍ය නොවේ.

යමෙක් හෙම වනාහි කියන ලද අනුලෝම ප්‍රතිලෝම ක්‍රමයෙන් පිවාරණු ලබන්නේ රත්තිපරියන්තය නො දනීද, සිහි නො කෙරේද, විමති ඇත්තෙක් හෝ වේද, ඔහුට දෙනලද සුද්ධන්ත පරිවාසය "මහා සුද්ධන්තය" යි කියනු ලැබේ.

**සමෝධාන පරිවාසය.** ඕධාන සමෝධානය, අග්ඝ සමෝධානය, මිස්සක සමෝධානය යයි ත්‍රිවිධ වේ.

**එහි ඕධාන සමෝධානය.** පිරිවෙස් ගත් අනික්ඛිත්තවත් ඇති යමෙක් පිරිවෙස් නො නිමියේ ඒ අතරතුර ගරු ඇවතකට පැමිණ එය පිළිසන් කෙරේ ද, පසුව පැමිණි ඇවත කාමීවාසායයෙන් මූලාය පටිකස්සන වශයෙන් එකතුකොට ඔහුට දියයුතු පිරිවෙසයි. එනම්:– යම් භික්ෂුවක් පිරිවෙස් වසන්නේ මානත්තාරහ වේද, ඒ අතර අන් ඇවතකට පැමිණ මුල් ඇවතට සම වූ හෝ අඩු වූ රාත්‍රීන් පිළිසන් කරයි ද, මූලාය පටිකස්සනයෙන් ඒ ඇවැත් සියල්ල එකතුකොට ඔහුට පිරිවෙස් දිය යුතුයි. මුල් ඇවත පක්ඛපටිච්ඡන්න ද අතර ඇවත ඉන් අඩු ද නමුත් පක්ෂයක්ම පිරිවෙස් විසිය යුතුයි. සැට අවුරුදු ප්‍රතිච්ඡන්න වූයේ නමුදු මේ එහි විනිශ්චය ක්‍රමය යි. සැට වසක් පිරිවෙස් වැස මානත්තාරහවූයේ නමුදු අතරතුර එක දවසක් පිළිසන් කෙළේනම් නැවත සැට වර්ෂයකට පරිවාසාර්හ වෙයි.

**අග්ඝ සමෝධානය.** බොහෝ ඇවැත් අතරෙන් යම් එක ඇවතක් හෝ දෙකක් හෝ තුනක් හෝ බොහෝ හෝ ඇවැත් සියල්ලෙන් වැඩිකල් යම් ඇවතක් ප්‍රතිච්ඡන්න ද, ඔවුන් අතරෙන් වැඩිකල් ප්‍රතිච්ඡන්න ඇවත හා එක්කොට ඔවුන්ගේ රත්තිපරිච්ඡේද වශයෙන් සෙසු ඉතා අඩු ප්‍රතිච්ඡන්න ඇවැත් වලට පිරිවෙස් දියයුතුයි. කෙසේද? යමෙකුට වනාහි ඇවැත් සියයක් දසාහ පටිච්ඡන්න ද, අනිකුදු ඇවැත් සියයක් එසේම දසාහ පටිච්ඡන්න ද, මේ ක්‍රමයෙන් දසාහ පටිච්ඡන්න වාර දසයක් වීනම් එහි ඇවැත් දහසක් වන්නේය. මේ ඇවැත් දහසටම පිරිවෙස් පිරිය යුත්තේ දින දසයකි.

**මිස්සක සමෝධානය.** නානා වස්තුක ඇවැත් එකතුකොට දෙනු ලබන්නකි. එනම්, "අහං භන්තෙ සම්බහුලා සංඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං එකං සුක්කවිස්සට්ඨිං එකං කායසංසග්ගං එකං දුට්ඨුල්ල වාචං එකං අත්තකාමං එකං සඤ්චරිත්තං එකං කුටිකාරං–සොහං භන්තෙ සබ්බාසං ආපත්තීනං සමෝධාන පරිවාසං යාචාමි" යි තෙ වරක් ඇයද ඊට සුදුසුකම් වදතින් පිරිවෙස දියයුතුයි.

## පිරිවෙස් විනිස නම් සත්වන පරිච්ඡේදය නිමි.

"මානස්සභාවො මානත්තං" යි නිර්වචන සෙයින් පිරිවෙස් පිරිමෙන් මත්තෙහි භික්ෂූන්ගේ චිත්තාරාධනය පිණිස රෑ සයක් පිළිපැදිය යුතු වත මානත්ත නම්, එය පටිච්ඡන්න, අප්පටිච්ඡන්න, පක්ඛ, සමෝධාන යයි සිව් වැදෑරුම් වේ.

පිරිවෙස් පිරූ භික්ෂුව සෙසු භික්ෂූන්ගේ චිත්තාරාධනය පිණිස රෑ සයක් මානත්ත සමාදන් වියයුතුයි.

**පටිච්ඡන්න මානත්ත.** පිළිසන් ඇවැත් ඇති බැවින් පිරිවෙස් පිරූවනුට දෙනු ලබන මානත්ත පටිච්ඡන්න මානත්ත නම්.

**අප්පටිච්ඡන්නමානත්ත.** නොපිළිසන් ඇවැත් ඇත්තනුට පිරිවෙස නොදී හුදෙක් ඇවැත් අවන් බැවින්ම මානත්තාර්හ වූවනුට දෙනු ලබන මානත්ත අප්පටිච්ඡන්න මානත්ත නම්.

**පක්ඛමානත්ත.** පිළිසන්වූ හෝ නුවූ හෝ ඇවැත් ඇති භික්ෂුණීන්ට අඩමසක් පිරිමට දෙනු ලබන මානත්ත පක්ඛමානත්ත නම්.

**සමෝධානමානත්ත.** ඇවැත් සියල්ල එකතු කොට දෙනු ලබන මානත්ත සමෝධාන මානත්ත නම්. මොවුන් අතරෙන් මෙහි සැලකිය යුත්තේ අප්පටිච්ඡන්න මානත්තය යි දතයුතු.

එය දෙන්නහු විසින් පිරිවෙස දුන් අයුරින්ම කර්මවාක්‍යය කියා සීමා මාලකයෙහිදීම මානත්ත සමාදන් වියයුතුයි. මෙසේ නො කඩකොට රෑ සයක් මානත්ත පිරූ භික්ෂුව විසති ගණවූ භික් සඟන වෙත පැමිණ අබ්භාන කම් කළයුතුයි; ඒ අබ්භාන කර්මයද දෙශනා පාළියෙහි එන කර්මවාක්‍යය කියා සිදු කට යුතුයි.

**පිරිවෙස් පුරණ භික්ෂුව විසින් පිළි පැදිය යුතු වත්.** 1. අනාය යා උපසපන් නොකට යුතුයි. 2. නිස නොදිය යුතුයි. 3. හෙරණ හට උවටැන් නොකට යුතුයි. 4. මෙහෙණින් නන්ට අවවාද දීමේ සම්මුතිය නොපිළිගත යුතුයි. 5. සම්මත ලදුයේ නමුදු භික්ෂුණීන්ට අවවාද නොදිය යුතුයි. 6. යම් ඇවතකින් පිරිවෙස දෙන ලද්දේ වේද ඒ ඇවතට නොපැමිණිය යුතුයි. 7. එබඳු අන් ඇවතකට හෝ නොපැමිණිය යුතුයි. 8. ඊට වඩා ලාමක ඇවැතකට හෝ නොපැමිණිය යුතුයි. 9. පිරිවෙස් කම් වදනාට නොගැරහිය යුතුයි. 10. කම් වදන කියූ භික්ෂූන්ට නොගැරහිය යුතුයි. 11 පියම් භික්ෂූන්ට උපොසථ ඨපනය නොකට යුතුයි. 12. පවාරණ ඨපනය නොකට යුතුයි. 13. සවචනීය නොකට යුතුයි. 14. විහාරයෙහි දෙටුබැම් නොකට යුතුයි. 15. චොදනා මට අවකාශ නොකට යුතු යි. 16 චොදනා නොකට යුතුයි. 17. ඡෙසයන් සිහි නොකරවිය යුතු යි. 18. භික්ෂූන් ඔවුනොවුන් කලහ නොකර

විය යුතුයි. 19. පියවි භික්ෂුවට පෙරටුව නොයා යුතුයි. 20. එසේම නොහිඳිය යුතුයි. 21 සඞ්ඝයාගේ ඉතා ලාමක ආසන, සයන විහාර, ඔහුට දිය යුතුයි. 22. පියවි භික්ෂුව සමග කුලයන් වෙත නොඑළඹිය යුතුයි. 23. ආරණ්‍යකාඞ්ගය සමාදන් නො විය යුතුයි. 24. පිණ්ඩපාතිකාඞ්ගය සමාදන් නො විය යුතුයි. 25. ඒ හේතුවෙන් පිඩු නොගෙන්වා ගත යුතුයි. 26. ආගන්තුක පාරිවාසිකයා විසින් ආරොචනය කටයුතුයි. 27. ආගන්තුකයාට ආරොචනය කටයුතුයි. 28. පෙහෙවස් දිනයෙහි ආරොචනය කටයුතුයි. 29. පවාරණ දිනයෙහි ආරොචනය කටයුතුයි. 30. ගිලන් කල දූතයකු ලවා දූත් විය යුතුයි. 31. පියවි භික්ෂුවක් හැර ආපදුවක් හැර භික්ෂූන් ඇති අවසින් භික්ෂූන් නැති අවසට නොයා යුතුයි. මෙය ආවාස අනාවාස වශයෙන් නවප්‍රකාර වන්නේ ය. යම් තැනෙක භික්ෂූහු නානා සංවාසක වෙද්ද පියවි භික්ෂූන් නැතිව ආපදුවක් නැතිව භික්ෂූන් ඇති අවසින් භික්ෂූන් ඇති අවසකට නොයා යුතුයි. මෙයද ආවාස අනාවාස භෙදයෙන් නවප්‍රකාරවේ. යම් තැනෙක භික්ෂූහු සමාන සංවාසකද අදමගන්ට හැකියයි දනීද භික්ෂූන් ඇති අවසින් භික්ෂූන් ඇති අවසකට යා යුතුයි. මෙයද ආවාස අනාවාස භෙදයෙන් නවවිධවේ. පියවි භික්ෂුව සමග එක සෙවෙනි වූ අවසෙහි නොවිසිය යුතුයි. එක සෙවෙනි අනාවාසයෙහි නොවිසිය යුතුයි. එබඳු ආවාසයක හෝ අනාවාසයක හෝ නොවිසිය යුතුයි. පියවි භික්ෂුව දුක අස්නෙන් නැගිටිය යුතුයි. පියවි භික්ෂුවට අස්න පැවරිය යුතුයි. පියවි භික්ෂුව සමග එකාසනයෙහි නොහිඳිය යුතුයි. පියවි භික්ෂුව මිටි අස්නෙහි හුන් කල තමන් උච්චාසනයෙහි නොහින් ද යුතුයි. පියවි භික්ෂුව බිම හුන් කල තමන් අස්නෙහි නොහිඳිය යුතු යි. එක සක්මනෙහි සක්මන් නොකට යුතුයි. පහත් සක්මනෙහි පියවි භික්ෂුව සක්මන් කරණ කල උස් සක්මනෙහි තෙමේ සක්මන් නොකට යුතුයි. බිම සක්මන් කරණ කල සක්මනේ සක්මන් නොකටයුතු යි. වෘඩ පාරිවාසිකයකු සමගද, මූලාය පටිකස්ස නාරහයකු සමගද, මානත්තාරහයකු සමගද, මේ කරුණු නවය මෙලෙස මැයි. පාරිවාසික වූ තෙමේ සිව්වෙනි කොට පිරිවෙස් නො දිය යුතු යි. මූලාය පටිකස්සනය නොකට යුතුයි. මානත නො දිය යුතු යි. අබ්භාන් කම් නොකට යුතුයි. මානත පූරණ භික්ෂුව විසින් ද, අබ්භානාරහ භික්ෂුව විසින් ද, පිළිපැදිය යුතු වත් මොච්හුමය, සහවාස, විප්පවාස, අනාරොචනා, යන තෙකරුණින් පිරිවෙස් පූරණ භික්ෂුවගේ රත්ති ච්ඡෙදය වන්නේ ය.

## මානත්ත විනිශ්චය නම් අට වන පරිච්ඡෙදය නිමි.

**තුලසි ඇවැත් රැස.** අන් සතු වස්තුව පැහැර ගැනීම් සඞ්ඛ්‍යාත අදත්තාදාන පාරාජිකාපත්තින්-ගේද, සඟවෙසෙස් ආපත්තින්ගේද, සාමන්තා පත්ති වශයෙන් සිඩවන තුලසි ඇවැත්ද, ප්‍රථම පාරාජිකා පත්තිය සමග ඒ ඒ ආපත්තීන්ගේම අඞ්ග සම්පූර්ණ නොවීමෙන් සිඩවන තුලසි ඇවැද්ද, යම් භික්ෂුවක් ඉසුරුමත් භාවයෙන් යුක්ත වූයේ සෙනසුන් පිණිස නියම කරනලද සඟ සතු ගරු බඩු අනිකෙකුට දේනම් තුලසි ඇවැත් වේ.

**ගරු බඩු නම්.** පුෂ්පාරාම ඵලාරාමාදි අරම්ද, ආරාම වස්තුද, විහාර වස්තුද, යන සථාවරදෑද, ඇඳ පුටු, කොට්ට, මෙට්ට, සැතපෙන තිඳිනා දෑද, ලොහොසැළි, ලොහොකටාරම්, මහලොහොසැළි, ලොහොකලගෙඩි, කොවේරි, වෑ, පොරෝ, උදලු, නියන්, යන මේ දෑද, වේවැල් ආදි වැල්ද, හුණ, බට, ආදියද ඉලුප්, ආදි ගෙවල් සෙවිලි කරණ තණද තල්කොල ආදි කොලද, මුදු තණද, බබුස් තණද, මැටිද, ලීබඩු හා මැටි බඩුද, මෙම පස්විසි වැදෑරුම් ගරු බඩු සඟ සතු කොට දෙන ලද හෝ සඞ්ඝසන්තකභූමියෙහි උපන්නා වූ හෝ භාණ්ඩයන් බෙදා ගන්නා භික්ෂුව හට තුලසි වේ.

සොර සිතින් යම් භික්ෂුවක් පාදයක් අගනා (හෙවත්) පස් මදටක අගනා වස්තුවක් දේනම් ගනීනම් පරිජි අවදනෝ ය, යම් භික්ෂුවක් බික් සඟුන් අබි බවා මෙම ගරු බඩු ඉසුරු මතුන්ට (පරහට) දේ නම් තුලසිවේ.

**මේ ගරු බඩු පිළිබඳ කලාප නිශ්චය.** පඤ්චප්‍රකාරවේ, එනම්:- විහාර විහාර වස්තු ප්‍රථම කලාපය යි, ආරාම ආරාම වස්තු දෙවන කලාපය යි, ඇඳ, පුටු, කොට්ට, මෙට්ට, තුන් වන කලාපයයි, ලොහොසැළි, ලොහොකටාරම්, මහලොහොසැළි, ලොහොකලගෙඩි, වෑ පොරෝ, උදළු, නියන්, සතරවන කලාපයයි, වේවැල්, හුණ, ඉලුක් ඈ (ගේ සොයන) තණ, හල්පත් ඈපත්, මුදුතණ බබුස්තණ, මැටි, දරු භාණ්ඩ, මත්තිකා භාණ්ඩ පස්වන කලාපයයි, මෙසේ කලාප පසකින් පස් විසි වැදෑරුම්යයි (මසැස, දිවැස, දහමැස, බුදුඇස, සමතැස,) යි පඤ්ච ප්‍රකාර නිමල ඇස් ඇති සුගතෙන්ද්‍රයන් වහන්සේ විසින් ප්‍රකාශිතයි. මෙසේ කලාප වශයෙන් පඤ්චවිධවූ ගරු බඩු කිසිවෙකුට අයිතිකර නොදිය යුතුයි, සංඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයකු විසින් හෝ අයිති කර දෙන ලද්දේ ද නොදෙන ලද්දේම වෙයි, යම් ගරු බඩු යමෙකුට යම් භික්ෂුවක් අයිති කර දෙන ලද්දේ නම් ඒ භික්ෂුව හට තුලසි වේ.

“ථුලොච්චයො අච්චයො වෙයි ථුල්ලච්චයො” යි තිර් වචන සෙයින් මහත් වූයේත් ඒ මය වරද වූයේත් එමනුයි ථුල්ලච්චය නම් වේ, දේශනා සුඩියෙන් (හෙවත්) ආපයති දෙසීම් සංඛ්‍යාත විනය් කර්මයෙන් සුඩවන ඇවැත් අතුරෙන් මහ වරද තුලසිය යි දතයුතු යි.

**තුලසි ගරු බඩු විනිශ්චය නම් නවවන පරිච්ඡේදය නිමි.**

## නිසඟි

**පචිති ඇවැත් රූප.**

යම් භික්ෂුවක් තෙමේ අනුලෝම් සහිත වූ බොම කොසෙය්‍යාදි යම්කිසි සිවුරක් ඉටි මද, විකප්පනයද නො කොට දස දවසක් ඉක්මවා නම් ඒ භික්ෂුවහට අතිරේක චීවර ධාරණයෙහි නිසඟි පචිති වේ.

**අනුලෝම් සහිත වූ චීවර.**

වෘක්ෂ වැහැරින් කළ වස්ත්‍ර, කෘමිකෝෂ හුයින් කළ වස්ත්‍ර, කපු හුයින් කළ වස්ත්‍ර, සන වැහැරින් කළ වස්ත්‍ර, බොම හූ ආදි සියල්ල හෝ සමහරක් මිශ්‍රකොට කළ වස්ත්‍ර, සිංහ ව්‍යාඝ්‍රාදී ව්‍යාල ලොම් හැර අවශේෂ ලොම වලින් කළ වස්ත්‍ර යන සවැදෑරුම් වස්ත්‍ර, ජාතිවශයෙන් අනුදන වදළ කැප වස්ත්‍රයෝ යි. මේ වස්ත්‍රයන්ගෙන් කළ සිවුරු කැප සිවුරු වෙති.

දුහුල් නම් වෘක්ෂ වැහැරින් කළ වස්ත්‍ර, පත්තුනන දෙශයෙහි උපදනා, වස්ත්‍ර, කොසාම්බර දෙශයෙහි උපදනා වස්ත්‍ර, චීන දෙශයෙහි උපදනා වස්ත්‍ර පුණ්‍යර්ධියෙන් පහළ වූ සිවුරු, දෙවියන් විසින් දෙන ලද සිවුරු මේ සවැදෑරුම් චීවර වස්ත්‍ර පූර්වෝක්ත සවැදෑරුම් වස්ත්‍රවලට අනුලොම් වෙති.

**අධිෂ්ඨාන කටයුතු චීවර.**

සඞ්ඝාටිය, උත්තරාසඞ්ගය, අන්තරවාසකය, පිරිකර චොළය, වැසිසළු සිවුර, පස තුරුණු සිවුර, කස්පිළිසන් සිවුර, මුඛ පුඤ්ඡනය, නිසීදනය යන නවවැදෑරුම් චීවර අධිෂ්ඨාන කටයුතුයි.

**අධිෂ්ඨාන කරණ විධි.**

“ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි, දුතියම්පි ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි, තතියම්පි ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි” මෙ ලෙසින් සඞ්ඝාටිය අධිෂ්ඨාන කර සෙසු චීවර අටද ඒ ඒ චීවර නාමයෙන් වාක්‍ය යොජනා කොට ඉටිය යුත්තේ යි.

1. සඞ්ඝාටිය නම්– දෙපට සිවුරයි. 2. උත්තරාසඞ්ගය නම්– තනිපට සිවුරයි. 3. අන්තරවාසකය නම්– අඳනා සිවුරයි. 4. පරික්ඛාර චොළ නම්– සියලු චීවර වගීයෝයි. 5. වස්සික සාටිකය නම්– වර්ෂා ඍතු සාර මාසයෙහි පමණක් අධිෂ්ඨානකර හැඳ නහන්ට අනුදත් ඉන්පසු ඉධිෂ්ඨාන ඉගුළුවිය යුතු වැසි සළුවයි. 6. පසතුරුණය නම්– ඇඳ පුටු ආදියෙහි අතුරන්නා වූ ඇතිරිය යි. 7. කණ්ඩුපටිච්ඡාදනය නම්– හිනෙන් පහත ගටගන්නා වූ ව්‍රණාදිය නිසා ඇන්දයුතු කස් පිළියන් සිවුර යි. 8. මුඛපුඤ්ඡනය නම්– “මුඛ සන්දමානාලාලා පුඤ්ඡන්ති එතෙනාති මුඛ පුඤ්ඡනං” කෙළින් සීලියෙන කෙළ ඇත්තවුන් මුව පිස්නා සඳහා අනුදන්නා මුව පිස්නා කඩයි. 9. නිසීදනය නම්–“නිසීදනන්ති එතෙනාති” නිසීදනං, දවලු සහිතව වැඩහිඳීමට සුදුසු අයුරින් නොයෙක් පාට වස්ත්‍රයෙන් කරණලද වැඩහිඳිනා ඇතිරිය යි. මේ නව ප්‍රකාර චීවරයම අධිෂ්ඨාන කරණු ලබන කල්හි සිවුර නමා සකස්කොට ගෙණ වාම, හස්තයෙහි තබා දකුණතින් සිවුර පිරිමදිමින් මුඛයෙන් වාක්‍යය කිය

යුතුයි. මේ කයින් හා වචනයෙන් අධිෂ්ඨාන කරණ අයුරුයි. ඒ ක්‍රියා දෙකින්ම හෝ එකකින් අධිෂ්ඨානය කළ හැකියි. පරික්ඛාරචොළ, පච්චත්ථරණය මේ දෙක අධිෂ්ඨාන කරණ කල්හි බොහෝ වස්ත්‍ර හෝ පසතුරුණු එකාධිෂ්ඨානයෙන් එක විට අධිෂ්ඨාන කටයුත්තේ යි.

මුඛ පුඤ්ඡන චොළය, එකවිට දෙකක් ඉටිය යුත්තේයි, ඉතිරි සවැදෑරුම් චීවර එක එක වෙන් වෙන් වශයෙන් අධිෂ්ඨාන කටයුත්තේ යි, මෙසේ අධිෂ්ඨාන කරණලද යම් චීවරයක් අනුන්ට දෙනු කැමැත්තේ හෝ ඉවත්කරණු කැමැත්තේ හෝ "ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි" කියා එකක් වශයෙන් හෝ විකපුන්කළයුතු සිවුරු බොහෝ වේත්නම් එබඳු අවස්ථාවෙහි සුදුසු පරිදි "එතං ඉමං එතානි ඉමානි" යන පදයොජනා වාක්‍යයන්ගෙන් උද්ධරණය කට යුතුයි, විනය දත් මහණ ප්‍රච්චුද්ධරණය කටයුතු සිවුර අත් පසින් දුරස්ථ උවහොත් "එතං සඞ්ඝාටිං පච්චුද්ධරාමි" කියාද අත් පස උවහොත් "ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි"යි පච්චුද්ධරණය කටයුතුයි, උත්තරාසඞ්ග අන්තරවාසකාදිය පිළිබඳවද තත් නාම යොදාගෙණ පච්චුද්ධරණය කටයුතු යි, අධිෂ්ඨාන කළා වූ තුන් සිවුරෙන් යම් සිවුරකින් වෙන්ව නොසිටිය යුතුයි, එසේ සිටියොත් නිසගි වෙයි.

**සංඝාටිය**

(දෙපට සිවුර) එහි ප්‍රමාණය:— දිගින් මිටි රියන් පසක් විය යුතුයි. උඩත් පිරිසෙයින් සුගත් සිවුරට අඩුවිය යුතුයි- පුළුලින් මිටි-රියන් තුනක්ද සුගත් සිවුරට ඌණවද ගත යුතුයි, තනි පට සිවුර පිළිබඳවද දිග පුළුල නියමය මේ ලෙසමැයි.

**අන්තරවාසකය**

(අඳනා සිවුර) දිගින් මිටිරියන් පසක් හා පුළුලින් දෙරියන් වියතක් හෝ දෙ රියනක් ගැණීම වටනේයි.

**නිසීදනය**

සුගත් වියතින් දෙවියතක් දිගද පුළුලින් වියත් එකහමාරක් ගැණීමට වටනේයි.

**කණ්ඩු පටිච්ඡාදනය**

(කස් පිළිසන් සිවුර) සුගත් වියතින් දිග සිව් වියතෙක.

**වස්සික සාටිකය**

(මැසි සළු සිවුර) සුගත් වියතින් දිග සවියතෙක. පුළුල වියත් දෙකහමාරකි. (මෙහි සුගත් වියතනම් වඩු වියතින් තුන් වියතෙකි.)

**පරික්ඛාරචොළය**

පිරිකර චොළය සිවුරෙහි එකෙක් දෙකෙක් කියා හෝ දිග පුළුල මෙපමණය කියා හෝ ප්‍රමාණය නියමයක් නැත්තේයි.

**ආපත්තියට පැමිණීම**

බොම කොසෙය්‍ය සාම්බලාදී සවැදෑරුම් චීවර ජාතියක් හා ප්‍රමාණයෙන්ද සම්පූර්ණ වූ චීවරයක් තමා සතු බවය–දවස් ගණනක් හුගේ ඇතුළත්ති කිරීමය, ගෙත්තම් රැඳුම් ආදිවූ පලිබොධ සිදීමය–අධිෂ්ඨාන විකප්පනය නොකිරීමය–දස දවසක් ඉක්මවීමය–යන කාරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

1. සියල්ල දත්තාවූ, සියල්ල දක්තාවූ ජිනෙන්‍ද්‍රයන් වහන්සේ විසින් අතිරේක චීවර ධාරණ නිසගි පචිත්තිය කොතැන්හිදී පනවා වදාරණ ලදද? 2. කවරකු අරබයා පනවන ලදද? 3 කවර වස්තුවෙක්හි පනවන ලදද? 4. ආපත්ති සමුට්ඨානය කොසේද?

1. විසල් පුරයෙහිදී පනවන ලදී. 2. ෂට්වර්ගික භික්ෂූන් අරබයා පනවන ලදී. 3. ෂට්වර්ගික භික්ෂූහු දස දවස ඉක්මවා අතිරේක චීවර ධාරණ වස්තුව නිමිත්තකොට පනවන ලදී. 4. කයින් හා වචනයෙන් ආපත්ති සමුට්ඨානය වේ.

2. යම් භික්ෂුවක් තොමෝ සංඝසම්මුතියක් නොලැබ අධිෂ්ඨාන කාරණ ලද චීවරයෙන් වෙන්ව එක රැයක් වාසය කෙරේනම් නිසගි පචිති වේ.

**සංලක්ෂ්‍යය**

සංඝ සම්මුතිය නොලත් යම් භික්ෂුවක් අධිෂ්ඨාන කාරණ ලද තුන් සිවුරෙන් වෙන්ව ඇතුළුගම හෝ, නිවෙස්හි හෝ, නැවක හෝ, දොරටු හලක හෝ, කැණිමඬුලු එකක් ඇති සිව්රැස් පායෙහි හෝ, පුෂ්පාරාම ඵලාරාමයෙහි හෝ, ජඹසසත් සකට සත් යන දෙවැදෑරුම් සත් මූලයෙහි හෝ, කුඹුරෙහි හෝ, සාලවිට හෝ, රුක්මුල හෝ, අභ්‍යවකාශයක හෝ, වෙහෙර හෝ, අරුණු නගානම් නිසගි පචිති වේ. එසේ හෙයින් අධිෂ්ඨාන කළාවූ තුන් සිවුරෙන් යම් සිවුරකින් වෙන්ව නොසිටිය යුත්තේයි. වෙන්ව සිටියේනම් නිසගි වේ. ඒ නිසගි චීවරය සංඝ – ගණ – පුද්ගලයන් අතුරෙන් එක්තරා කෙනෙකු වෙත එළඹ උක්කුටුකයෙන් හිඳ තමහට වැඩ සළුවිරනමක් වීනම් ඇඳිලි බැඳගෙණ "ඉදමෙමභන්තෙ චීවරං රත්තිවිප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං අහං ආයස්මතො නිස්සජාමි", මෙලෙසින් නිස්සජ්ජනය කොට අනතුරුව ඇවත් දෙසිය යුත්තේයි. ඉන්පසු එම චීවර පිළිගත් විනයධර මහතෙර විසින් "ඉමං චීවරං තුය්හං දම්මි" මෙය තුන් වරක් කියා ආපසු දිය යුතුයි. එසේ දෙන ලද සිවුර මා සතු විය යන සිතින් නුදුන්නේ වීනම් භණ්ඩදෙය්‍ය දුෂ්කටාපත්තිය වෙයි. සොර සිතින් නුදුන්නේ නම් එහි මිල නියම ලෙස දුකුළා, තුලයි පරිජි ඇවැත් නියම කට යුතුයි.

**ආපත්තියට පැමිණීම**

අධිෂ්ඨාන කළ තුන් සිවුරෙන් යම් සිවුරක් වීම, හාඩිනය නො ඇතිරීම, සම්මුති නො ලැබීමය, සිවුරෙන් වෙන්ව අරුණු නැගීමය යන කාරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණීම වේ.

1. චීවර විප්පවාස නිස්සග්ගි පචිතිය කොතැන්හිදී පනවන ලද්දේද? 2. කවරෙකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවෙක්හි පනවන ලදද?

1. සැවැත් නුවරදී පනවන ලදී. 2. බොහෝ භික්ෂූන් අරබයා පනවන ලදී. 3. සැවැත් නුවර වැසි බොහෝ භික්ෂූන් අධිෂ්ඨාන කරණ ලද තුන් සිවුරු නික්ෂිප්තකොට හඳනා පොරෝනා පමණින් දනව් සැරිසැරීම් වස්තුව නිමිතිකොට පනවන ලදී.

3. කඨිනය නො අතුළ කල ඉල් මාසයෙන් සෙසු මාසයන්හිද අතුළ කල ඉල්, උඳුවප්, දුරුතු, නවම්, මැදින් දින යන පස් මාසයෙන් අනික් මාසයෙක්හිද උපන් බොමාදි චීවර වස්ත්‍රයක් පිළිගෙණ ප්‍රත්‍යාසාව ඇතිව මාසයකට වැඩි කල් තබා ගණීනම් ඒ භික්ෂු හට නිස්සග්ගි පචිති වේ.

**අෂ්ටප්‍රකාර චීවර ලාභයః**—1. සීමාපරම්පරිණයෙන් දීම. 2 කතිකා කර ගෙණදීම 3. භික්ෂා පැනවීම් වශයෙන් දීම. 4. සංඝයා පිණියෙහි දීම. 5. උභතො සංඝයා කෙරෙහි දීම. 6. වස් විසූ සංඝයා කෙරෙහි දීම. 7. කැඳ බත් ආදිය පිළිගත් සංඝයා පිරිසිඳ දීම. 8. පුද්ගලයා කෙරෙහි දීම, මෙලෙසින් චීවර ලාභය පිණිස ශෙෂත්‍රයෝ අෂ්ට ප්‍රකාරයක් අනුදැන වදාරණ ලදී.

**ෂොඩශ සීමා** — බද්ධ සීමා–උපචාර සීමා–සමාන සංවාස සීමා–අවිප්පවාස සීමා–ලාභ සීමා–ග්‍රාම සීමා–නිගම සීමා–නගර සීමා–සත්තබ්භන්තර සීමා–උදකුක්ඛෙප සීමා–ජනපද සීමා–රට්ඨ සීමා–රජ්ජ සීමා–දීප සීමා– චක්කවාල සීමා–යයි පසළොස් ආකාර වේ.

**බද්ධ සීමා** — ඒකාදස විපත්තීන්ගෙන් වෙන් වූ ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්තව නිමිත්තෙන් නිමිත්ත සම්බන්ධකොට සම්මත කරණ ලද්ද බද්ධ සීමාවයි.

**ඒකාදස විපත්ති** — 1. අති ඛුද්දකා– 2. අතිමහතී– 3. ඛණ්ඩ නිමිත්තං–4. ඡායා නිමිත්තං–5. අනිමිත්තා 6. බහිසීමෙ ඨිතසම්මතා– 7. නදියා සම්මතා–8. සමුද්දෙසම්මතා–9. ජාතස්සරෙසම්මතා–10. සීමා සම්මතා ය සීමංසම්භින්දන්තෙන සම්මතා 11. සීමාය සීමං අජ්ඣොත්ථරන්තෙන සම්මතා–යි ඒකා දසය යි.

**අතිඛුද්දකා** — එක් විසි නමක් හිඳීමට නො පොහොනා සීමාවයි. අති මහතී නම් තුන් යොදුන් සීමාවට වඩා කෙසඟක් පමණකිනිදු මහත් වූ සීමාවයි.

**ඛණ්ඩ නිමිත්ත** — නො ගළපන ලද නිමිති ඇති සීමාවයි. නැගෙනහිර දිග නිමිත්ත කිත්තනය කොට පිළිවෙළින් දක්ෂිණ පශ්චිමෝත්තර, තුන් දිශාවෙහිද නිමිති කිත්තනය කොට එයින් නො නැවති නැගෙනහිරදිග

ප්‍රථම කිත්තනය කළ නිමිත්ත නැවතත් කිත්තනය කොට නැවැත්වීමයි. එසේ කළ කල්හි අඛණ්ඩ නිමිත්තනම් වෙයි. එසේ නොකොට ප්‍රථම කිත්තනය දෙවරක් නොකෙළේනම් ඛණ්ඩනිමිත්ත නම් වේ.

**ඡායා නිමිත්ත** — පර්වත සෙවෙනි ආදී යම් කිසි සෙවණැල්ලක් නිමිතිකොට බඳනා ලද්දී ය.

**අනිමිත්ත** — සම්ප්‍රකාරයෙන් නිමිති කිත්තනය නො කරණ ලද්දීය.

**“බහිසීමෙඨිත සම්මතා”** :—නිමිති කිත්තනය කිරීමේදී නිමිති වලට පිට සිටියහු විසින් සම්මතකළ සීමාවයි.

**නදීයා—සමුද්දෙ—ජාතස්සරෙසම්මතා** :—නදී ආදීන්හි සම්මත කළ තුන් සීමාසි.

**“සීමාය සීමං සම්භින්දන්තෙන සම්මතා”** :—තමන්ගේ බද්ධසීමාවෙන් මෙරමා බද්ධසීමාව මුසුකරන්නහු විසින් (හෙවත්) මෙරමා සීමාවෙන් කොණාග්‍රමාත්‍රයෙහි පටන් සතර නම්කට නොපොහොනා ප්‍රදේශය දක්වා තමන්ගේ සීමාවට ඇතුල්කොට සම්මතකළ සීමාවයි.

**“සීමාය සීමං අජ්ඣොත්ථරන්තෙන සම්මතා”** :—තමන්ගේ බද්ධසීමාවෙන් අනුන්ගේ බද්ධසීමාව යට කරන්නහු විසින් (හෙවත්) අනුන්ගේ බද්ධසීමාව සියල්ලම හෝ එක් ප්‍රදේශයක් හෝ තමන්ගේ සීමාවට ඇතුල්කොට සම්මතකළ සීමාවයි. මේ එකාදශ විපත්තීහුයි.

**ත්‍රිවිධ සම්පත්ති.** — නිමිත්තසම්පත්ති, පරිසසම්පත්ති, කම්මවාචාසම්පත්ති යනුයි.

**නිමිත්ත සම්පත්ති** — පබ්බත නිමිත්තං-පාසාණ නිමිත්තං-වන නිමිත්තං-රුක්ඛ නිමිත්තං-මග්ග නිමිත්තං-වම්මික නිමිත්තං-නදී නිමිත්තං-උදක නිමිත්තං-මෙසේ වදාරණලද අෂ්ට ප්‍රකාර නිමිති අතුරෙන් ඒ ඒ දිසාවෙහිලද ලද සුදුසු නිමිත්තයන් මනාකොට කිත්තනය කිරීම නිමිත්ත සම්පත්තියයි.

**පරිස සම්පත්ති** — යටත් පිරිසෙයින් සතරනමක් රැස්ව සීමාබන්ධනය කරණු කැමැති ග්‍රාමක්ෂෙත්‍රයෙහි බද්ධසීමා, නදී, ජාතස්සරයන්ට ඇතුළත් නොව ගම්හි සියලුම උපසම්පන්නයන් අත්පසට පැමිණවීමෙන් හෝ ඔවුන්ගේ ඡන්දය හෝ ගැණීමයි.

**කම්මවාචා සම්පත්ති** — “සුණාතු මෙ භන්තෙ සංඝො යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා” යනාදී නයින් වදාරණලද ඤත්තිදුතිය කම්මවාක්‍ය, ඤත්ති දෝෂ, අනුසාවන දෝෂ දුරුකොට දසවිධ ව්‍යඤ්ජනයන් නොපිරිහෙලා කිරීමයි. මෙසේ එකාදස විපත්තීන්ගෙන් තොරව, ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්තවූ සම්මත කරණලද සීමා තොමෝ බද්ධසීමා නම්.

**උපචාර සීමා**

පරික්ෂිප්ත විහාරයාගේ පරික්ෂෙපයෙන්ද, අපරික්ෂිප්ත විහාරයාගේ පරික්ෂෙපය සුදුසු තැනින් පිරිසිඳිනීවේද, එසේවුවත් භික්ෂූන් නිතර රැස්වෙන ස්ථානයෙන් හෝ, සොළවර සිටි බොජුන් හලින් හෝ නිබඳ වසන ආවාසයෙන් හෝ, ශක්තිමත් මධ්‍යම පුරුෂයකුගේ ලෙඩ්ඩු පාත දෙසක් තුළ උපචාර සීමාවයයි දතයුතුයි. ඒ සීමා තොමෝ ආවාසය වැඩුනු සල්හි වැඩේ, පිරිහුණු කල්හි පිරිහේ, යොදුන් සියයක් නමුදු උපචාර සීමාවේ. භික්ෂුණීන්ගේ ආශ්‍රම ප්‍රවෙශන, සෙනසුන් විචාරීම, පිරිවෙස්මාතනතාරොචන, වස්සච්ඡෙද, නිස්සය සෙනසුන් ගැණිම් ආදි විධියද යන මේ සියල්ල උපචාර සීමාවගේ වශයෙන්ම දත යුතුයි.

**ලාභසීමාව**

රජ රජ මහාමාත්‍යාදීහු යම් විහාරයක් සරවා ගව්වක් හෝ, අඩයොත්තක් හෝ, යොත්තක් හාත්පසින් පිරිසිඳ "අපගේ විහාරයට මේ ලාභ සීමායි—මේ සීමාතුළ යමක් උපදීද ඒ හැම අපගේ විහාරයට සිම්සාර දෙන්නෙමුයි" සීමාවක් වෙන්කර ශිලාස්ථම්භයක් පිහිටුවා තබත්ද මේ ලාභසීමා නම් වේ.

**සමාන සංවාස සීමා**

සීමන්තරිකාවෙන් පිටත්හි වූ ස්වයංජාත විල්, ගඟා, සමුද්‍ර, අනාබද්ධ සීමා යන මෙයින් තොරවූ ජාපිව්, පර්වත, පිටිපසත් යනාදී වූ ග්‍රාමප්‍රදෙශයෙක්හි හෝ, ආරණ්‍යප්‍රදෙශයක හෝ, මෙදකින් මුසුපෙදෙසක හෝ, බඳනාලද තුන්යොදුන උත්කෘෂ්ට පරිච්ඡෙද කොට ඇති, ඕට සිටි සමීප බද්ධ සීමාවන්ගේ සීමන්තරිකාවෙන් පගවූ, යම් සීමාවක් වීද ඕතොමෝ සමාන සංවාස සීමායි.

**අවිප්පවාස සීමාව**

තුන් සිවුරෙන් වියෝවීම පිණිස අවිප්පවාස කම්මදනින් සම්මුතිකරණලද යථොක්ත බද්ධසීමාව අවිප්පවාස සීමාවයයි ප්‍රකාශ කරණ ලදී.

**ගාමනිගම නගර සීමා**

යම් පෙදෙසක් පවුරු පදනම් වලින් තොරව ආපණයෝ පමණක් වූද, නොහොත් ආපණයින්ගෙන් තොර පවුරු පදනම් පමණක් වේද එය ග්‍රාම නම් වේ. ප්‍රාකාර ආපණ ශාලාවන්ගෙන් තොර ගෘහයන්ගෙන්ම යුක්තද එය නිගම නම් වේ. යම් ප්‍රදෙශයක් පවුරු පදනම් වලින් හා ආපණ ශාලාවන්ගෙන් පරිපූරිතද එය නගර නම් වේ.—මේ ග්‍රාම-නිගම-නගරාදීන්ගේ හාත්පස අයබදු ගැන්මෙන් පිරිසිඳින ලද යම් පෙදෙසක් වේද කර්ම වාක්‍යයෙන් සම්මත නොකරණ ලද සීමා ගාම නිගම නගර සීමායයි දතයුතුයි.

**සත්තබ්භන්තර සීමා**

ග්‍රාමක්ෂෙත්‍රයන්ගෙන් තොරවූ ආරණ්‍යයෙහි හාත්පස සත් අබ්භන්තරයෙහි සම්මතවූ යම් සීමාවක් වේද මෝ තොමෝ සත්තබ්භන්තර සීමායයි දතයුතුයි.

**උදකුක්ඛෙප සීමා** උදකුක්ඛෙප ප්‍රමාණයෙන් හාත්පස්හි පිරිසුන් යම් සීමාවක් ඇද්ද, අබද්ධවූ මේ තොමෝ උදකුක්ඛෙප සීමායයි දතයුතුයි.

**ජනපද සීමා :—** කාසි කොසොල් ආදී රටවල බොහෝ ජනපද වෙති. එහි එක් එක් ජනපද පරිච්ඡේදයක් ජනපද සීමා නම් වේ.

**රට්ඨ සීමා** කාසි කොසොල් ආදී රටවල පරිච්ඡේදයයි.

**රජ්ජ සීමා** චෝල, භොග, කෙරල, භොග වශයෙන් එකී එකී රජවරුන්ගේ ආඥාව පවත්නා ප්‍රදෙශයයි.

**දීපසීමාව** මුහුදු කෙලවරින් පිරිසිඳින මහදිවයින්ද, අතුරු දිවයින්ද වෙති.

**චක්කවාල සීමා** චක්‍රවාට පර්වතයෙන්ම පිරිසිඳිනු ප්‍රමාණයයි. මෙලෙසින් දෙසින අෂ්ටමාතිකා වන්ගේ වශයෙන් හැර අන්‍ය ක්‍රමයකින් ලත් චීවරය ආකාල චීවර නම් වේ. "ඛණ්ඩ සීමාය දෙමාති" ඛණ්ඩ සීමාවෙහි සිටි සංඝයාට දෙමූයි දෙන ලද ලාභය ඛණ්ඩ සීමාව තුළට පැමිණියෝද ඔවුන්ටම ඒ ලාභය පැමිණේ. අන්තකුදු සීමාන්තරික යෙහි හෝ උපචාර සීමාවෙහි හෝ සිටියවුන්ටද චීවරාදී ලාභය නො පැමිණේ–"උපචාර සීමාය දෙමාති" උපචාර සීමාවෙහි සංඝයාට දෙමූයි, දුන් ලාභය ඛණ්ඩ සීමා තුළ හා සීමාන්තරිකාවල සිටියවුන්ට නො පැමිණේ. සමාන සංවාසක සීමාවෙහි සංඝයාට දෙමූයි දුන් ලාභය බද්ධසීමා තුළ හා සීමානතරිකවල සිටියවුන්ට නො පැමිණේ, ගාම නගර සීමාදියෙහි සිටිය සංඝයාට දුන් ලාභය ඒ ගාම සීමාදිය තුළ පිහිටි බද්ධ සීමාවෙහි සිටියවුන්ටද නොපැමිණේ, "සතතබ්භනතර සීමා උදකුක්ඛෙප සීමාවන්හි සිටි සංඝයාට දුන් ලාභය එහි තුළ පැමිණියවුන්ටම පැමිණේ. ජනපද, රට්ඨ, දීප, චක්කවාල, සීමාවන්හි සිටි සංඝයාට දුන් කල්හිද ග්‍රාම සීමාදියෙහි කියන ලද විනිශ්චය සමාන වේ, ඉදින් දඹදිව සිටියෙක්" තාම්‍රපර්ණියෙහි සංඝයාට දෙමියි දේද තාම්‍රපර්ණී ද්වීපයෙන් එකද නමක් ගොස් සියලු ලාභය ගන්ට ලබයි, එහිම (දඹදිවට) තාම්‍රපර්ණී දිවයින භික්ෂූන්ට සභාග එක් භික්ෂුවක් වේද සභාගයින්ගේ භාගය ගණිද නොවැළැක්විය යුතුයි. සීමා පරාමර්ශනය කොට දෙනු ලබන චීවරාදී ලාභයන් පිළිබඳ විනිසයි.

**කතිකාය දෙති:–** කතිකා කරගත් පරිද්දෙන් දීමයි. මේ කතිකාව නම් සමාන ලාභය සඳහා කළ කතිකාවයි. කතිකා කළයුතු පරිදි මෙසේය:– එක් වෙහෙරක රැස්වූ භික්ෂූන් විසින් යම් වෙහෙරකට සඞ්ග්‍රහ කරනු කැමැත්තෙන් සමාන ලාභය කරන්ට කැමති වේද ඒ විහාර නාමය ගෙණ අසවල් වෙහෙර පුරාණය කියා හෝ, මද ලාභ ඇත්තක කියා හෝ, යම් කිසි කාරණයක් කියා, ඒ විහාරය මෙම

විහාරය සමග ඒක ලාභ කරන්ට සංඝයාට රුචිදැයි තුන් වරක් ඇස්විය යුතුයි, මෙපමණකින් එ වෙහෙරෙහි හුන්නේද මෙහි හුන්-නාම වේ- එක් විහාරයක ලාභයක් බෙදනු ලබන කල්හි ඉතිරි වෙහෙර සිටියා හටද කොටස ගන්ට වටී. මෙය කතිකා කරගත් අයුරු දෙනු ලබන පිළිවෙළය.

**භික්ෂා ප්‍රඥප්ති**

තමන් සතුදෙය පරිත්‍යාග කිරීමට නියම කිරීමයි, භික් සඟනට දියයුතුයයි නියම ලෙස කිරීම භික්ෂා ප්‍රඥප්ති යයි, යම් ස්ථානයෙක්හි භික් සඟනට නිති උපකාර කරත්ද යම් වෙහෙරක භික්ෂූන් තමහට භාර කරගෙණ යම් කාලක්හි ගෙයි වළඳවාද, යම් තැනෙක්හි ආවාසය ඔහු විසින් කරණ ලද්දේද, සලාක බත් ආදිය නිතර දේද, නිති උපකාර කිරීම නම් වේ, යමෙකු විසින් විහාර පිහිටුවන ලද්දේ වේද, එබැවින් යමෙක් යම් තැනෙක්හි මහග් නිති උපකාරය කරණු ලැබේද්ද, එහි දෙම් කියා හෝ දෙවම් හෝ කියාද, ඉදින් බොහෝ ස්ථානයන්හිද නිති උපකාර වේද්ද, ඒ හැම තැන්හිම හුන්නාම් වේ, මෙම අයුරින් පැවැත්වීම භික්ෂාව පිළිබඳ ප්‍රඥප්ති යයි දත යුතුයි.

**“සංඝස්ස දෙමාති”**

සංඝයාට දෙමියි කියා දේද, උපචාර සීමාවෙහි වූද, ඉන් පිටත්හි වූද, ඔවුන් සමග එකාබද්ධවූවන්ටද, චීවර ලාභය පැමිණේ. එසේ ඔවුන්ගේ ගැණීම ඇතිකල්හි නොපැමිණියවුන්ටද කොටස දියයුතුයි. යමෙක් වනාහි උපචාර සීමාවෙහි භික්ෂූන් දක සංඝයාට දේද එය එකාබද්ධ පිරිසට පැමිණේ. යමෙක් තුමූ දෙලොස් රියනකින් පිරිස වෙත නොපැමිණියෝද ඔවුන්ට චීවර ලාභය නො පැමිණේ. මෙය සංඝයාට දීම පිළිබඳ ප්‍රඥප්ති නියමයයි.

**“උභතො සංඝස්ස දම්මීති”**

භික්ෂු සංඝයාටද භික්ෂුණී සංඝයාටද දෙමියි දේද එයින් අඩක් භික්ෂූන්ටද අඩක් භික්ෂුණීන්ටද දියයුතුයි. ඉතිදු එක් භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ වේද ඇති පරිද්දෙන් දෙකොන් කොටසක් දිය යුතුයි. යටත් පිරිසෙයින් අනුපසම්පන්නයා හටද (සාමණේර සාමණේරීන් හටද) අඩක්ම දිය යුතුයි, උභතො සංඝයාටද “නුඹ වහන්සේටද දෙමියි” කී කල්හි ඉදින් භික්ෂූහුද භික්ෂුණීහුද දස දස නම වේද්ද විසිඑක් කොටසක් කොට එක් කොටසක් පුද්ගලයාට දිය යුතුයි, භික්ෂු සංඝයාට දස කොටසක්ද භික්ෂුණී සංඝයාට දස කොටසක්ද දිය යුතුයි, යම් හෙයකින් පුද්ගලිකව ලත් ඒ කොටස සහින් ලද්දේද තමන්ගේ වස් ගණනින් ගන්ට ලැබේ, කුමක් හෙයින්ද? උභතො සංඝ ගණයෙන් ගත් බැවිනි, උභතො සංඝයාටද චෛත්‍යයටද දෙමියි කී කල්හිද එම පිළිවෙළ වේ. මෙහි වනාහි චෛත්‍යයට සහින් පැමිණෙන කොටසක් නම් නැත. එක් පුද්ගලයෙකුට පැමිණි කොටස සම්වම කොටසක් වේ. භික්ෂූන්ටද භික්ෂුණීන්ටද දෙමියි කී කල්හි මැදින් බිඳ නො දිය යුතුයි. භික්ෂූන්ද භික්ෂුණීන්ද ගැණ දිය යුතුයි. භික්ෂු සංඝයාටද භික්ෂුණීන් දට නුඹ වහන්සේටදැ යි කී කල්හි වනාහි පුද්ගල තෙමේ වෙනම

නො ලබා පැමිණෙන ස්ථාන වශයෙන් එකම කොටසක් ලබයි. කුමක් හෙයින්ද යත්- භික්ෂු සංඝ ගණය සෙයිනි. භික්ෂු සංඝයාටද භික්ෂුණීන්ටද තුඹ වහන්සේටද චෛත්‍යයටදැයි කී කල්හිද චෛත්‍යයට එක් පුද්ගල කොටසක් ලැබේ, පුද්ගලයා හට වෙනම නො ලැබේ, එසෙයින් එක් කොටසක් චෛත්‍යයට දී ඉතිරි දෑ භික්ෂූන්ද භික්ෂුණීන්ද ගැණ බෙදිය යුතුයි. උභය සංඝයාට දෙනලද චීවර ලාභ යන් පිළිබඳ ප්‍රඥප්ති විනිසයි.

**වස් විසූ සඟනට දීම**

වෙහෙරට පැමිණ වස් විසූ සඟනට දෙමියි කියාද එහි යම් පමණ භික්ෂූහු වස්සච්ඡිදනො කොට පෙර වස් විසුවෝද සීමාවෙන් පිටත වුවත් ඔවුන්ට ලාභය පැමිණේ. අන්‍යයන්ට නො පැමිණේ, ඉදින් වනාහි උපචාර සීමාවෙන් බැහැර සිටියෙක් "වස් විසූ සංඝයාට දෙමියි" කියාද එය එහි පැමිණි සියල්ලට පැමිණේ. ඉක්බිති "අසවල් වෙහෙර වස් විසූ සංඝයාටය"යි කියාද යම්තාක් කෙළින් උදුරද ඒතාක් දක්වා එහි වස් විසුවවුන්ටම පැමිණේ. ගිම්හානයාගේ පළමු දිනය පටන් මෙසේ කියාද එහි සම්මුඛ වූ සියල්ලන්ට පැමිණේ, මෙය වස් විසූ සංඝයා පිළිබඳ චීවරාදී ලාභ ප්‍රඥප්ති විනිශ්චයයි.

**ආදිස්සදෙති**

නියමකොට දෙයි යනු මෙහි කැඳබත් හෝ, කැයුත්තක් හෝ, සිවුරු සෙනසුන් බෙහෙත් හෝ, එළවා පිරිසිඳ දෙන්නාවූ දායකා තෙම "ආදිස්සදෙති" නම් වේ. කෙසේද? භික්ෂූන්ට අද පිණිස හෝ සෙට පිණිස හෝ යාගු පානය පිණිස නිමන්ත්‍රණය කොට ඔවුන් ගේ ගෙට පැමිණියවුන්ට යාගු දානය කොට යාගු පානය කළ කල්හි "යමෙකු විසින් මාගේ යාගු පානය කරණ ලද්දේද? මේ සිවුරු ඔවුනට දෙමි"යි දේද යමෙකු විසින් ලබන ලද ආරාධනා ඇතිව යාගු පානය කෙළේද ඔවුනටම පැමිණේ, ඛාද්‍ය භොජ්‍යාදියෙන් නිමන්ත්‍රණය කළ කල්හිද මේ ක්‍රමයමැයි.

**පුග්ගලස්සදෙති**

පුද්ගලයාට දෙමියි යන මෙහි මේ සිවුර මෙනම් අයට දෙමියි මෙසේ අභිමුඛව පාමුල තබා "මෙය තුඹ වහන්සේටය"යි කියා සම්මුඛයෙහි දේද එය ඔහටම වේ. මෙය පුද්ගලයාට දීම පිළිබඳ ප්‍රඥප්ති නියමයයි.

මෙලෙසින් දක්වන ලද අෂ්ටමාතෘකාවෙන් තොරව ලබන ලද යම් චීවරයක් වේද එය අකාල චීවර නම්.— තවද කඨිනය නො අතුරණ ලද කල්හි පවාරණ මාසයේ ශුක්ල පක්ෂ පඤ්චමිය පටන් පවුරුණු දින දක්වා අවෙචක චීවර කාලය වූ එකොළොස් දින හා වස්සාන ඍතුව පිළිබඳ පශ්චිම මාසයද කඨිනය අතුරණ ලදනම් යථොක්ත එක්මස් එකාදශ දිනය හා හේමන්ත ඍතුවෙහි සාර මසද යන පස් මස් එකාදශ දින චීවර කාලයයි. මින් පිටත් මාසයන්හි ලබන ලද චීවර අකල් සිවුරු නම් වෙත්.

1. අකාල චීවර පරිග්ගහන නිසඟි පචිත්තිය කොතැන්හිදී පනවන ලදද? 2. කවරකු අරබයා පනවන ලද්දේද? 3. කිනම් වස්තුවක් නිමිතිකොට පනවන ලදද?

1. සැවැත් නුවරදී පනවන ලදී. 2. සැවැත් නුවර වැසි බොහෝ භික්ෂූන් අරබයා පනවන ලදී. 3. සැවැත් නුවර බොහෝ භික්ෂූහු අකල් සිවුරක් පිළිගෙන මසක් ඉක්මවීම් වස්තුව නිමිතිකොට පනවන ලදී.

4. යම් භික්ෂුවක් තෙම නො නෑ භික්ෂුණියකු ලවා වරකුදු ප්‍රයෝජන ගත් පරණ සිවුරක් දොවවන්නේ හෝ රඤ්ජනය කරවන්නේ හෝ අපුලවන්නේ හෝ වේද ඒ භික්ෂුව හට පොරාණ චීවර ධොවන නිසඟි පචිති වේ.

**සංලක්ෂ්‍යය**

නො නෑ භික්ෂුණිය නම්:- මවු පසින් හෝ, පිය පසින් හෝ සත් මුතු පරම්පරව තෙක් කිසියම් අයුරකින් ඤාතිත්වයක් නැත්තේ සි යනුයි.

**පුරාණ සිවුර**

රඤ්ජනය කොට කප්බිඳු තබා එක වරකුදු හැඳීම, පෙරවීම කළාවූ හෝ, යටත් පිරිසෙයින් අංසකූටයෙහි හෝ, මස්තකයෙහි හොට මගට පැමිණියේ වේද, ශීර්ෂ ප්‍රදේශයෙහි කොට වැදහොත්තේ වේද, මෙය පැරණි සිවුර වේ.

**ධෞවනය කිරීම**

"ධෞවනය කරවයි" වදනින් කියාද, කායවිකාර හෝ කෙරේද, අතින් හෝ දේද, පා මුල්හි හෝ තබාද, අතිකෙකු ගේ අත හෝ යවාද, ධොවනය කරවන ලද්දේ වෙයි.

**ආපත්තියට පැමිණීම**

උක්තප්‍රකාරයෙන් පුරාණ චීවරයක් වීම, උපචාරයෙහි සිට මෙහෙණින්නක් හට ඇණවීම, ඒ මෙහෙණ විසින් දෙවීම්, ඇපිළීම්, කිරීමය යන මේ කරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණීම වේ. (ධෞවනය කිරීම පිළිබඳ සියලු පියෝහි දුකුළා වේ.)

5. යම් භික්ෂුවක් තෙමේ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය මාරුකොට ගැන්මක් හැර අධිෂ්ඨානයට සෑහෙන වඩු රියනක් දිගැති වඩු වියතක් පුළුලැති පශ්චිම සිවුරක් නමුදු නො නෑ මෙහෙණින්නක් අතින් පිළිගන්නේ වීනම් (පාරිවට්ටකයෙහි) නිසඟි පචිත්තිය වේ.

**ආපත්තියට පැමිණීම**

විකප්පුන් කටයුතු සිවුරක් වීම, ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය පෙරළා ගැණීම, නො නෑ මෙහෙණින්නකගේ අතින් ගැණීම, යන මේ කරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණේ.

1. පාරිවට්ටක නිසඟි පචිත්තිය කොතැන්හිදී පනවන ලද්දේද? 2. කවරෙකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිති කොට පනවන ලදද?

1. රජගහ නුවරදී පනවන ලදී. 2. ආයුෂමත් උදායී භික්ෂුව අරබයා පනවන ලදී. (3) ආයුෂ්මත් උදායි භික්ෂුව නො නෑ මෙහෙණින්-නක අතින් සිවුරක් පිළිගැණිම් වස්තුව නිමිතිකොට පනවන ලදී. ප්‍රතිග්‍රහණය පිළිබඳ සියලු පියෝගී දුක්‍ඛලා වේ.

6. යම් භික්ෂුවක් තෙමේ සොරුන් විසින් උදුරාගන්නාලද සිවුරු ඇත්තෝ හෝ, දා ගියාවූ සිවුරු ඇත්තෝ හෝ වේද—මෙකියනලද කාලය හැර අන් කාලයෙක්හි නො නෑ නො පැවරූ ගෘහපතියෙකු කරා හෝ ගෘහපතිනියක කරා ඇමිණ සිවුරක් ඉල්වන්නෝ නම් චීවර විඤ්ඤත්ති නිසග්ගි පචිතිය වේ.

සංලක්ෂ්‍යය — සුදුසු කාලයෙන් අන්‍ය කාලයෙක්හි විඤ්ඤපන ප්‍රයෝගයෙහි දුකුලාවේ. ප්‍රතිග්‍රහණයෙන් නිසග්ගිපචිති වේ. මෙසේ ලත් චීවරය "ඉදං මෙ භන්තෙ චීවරං අඤ්ඤාතිකං ගහපතිංවා ගහපතානිංවා අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං" ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි" මේ වාක්‍යය කියා චීවර නිස්සජ්ජනය කොට ඇවැත් දෙසිය යුතුයි.

ආපත්තියට පැමිණීම — විනාපූත්නාටයුතු සිවුරක්වීම, සිවුරක් ඉල්වීමට නුසුදුසු කාලයක් වීම, නො නෑයෙකුගෙන් ඉල්වීම, ඉල්ලූ පරිදි ලැබීම යන මේ කරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණීම වේ.

1. චීවර විඤ්ඤපන නිසග්ගි පචිතිය කොතැන්හිදී පනවන ලද්දේ ද? 2. කවරෙකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවෙක්හි පනවන ලදද?

1. සැවැත් නුවරදී පනවන ලදී. 2. ශාක්‍යපුත්‍ර ආයුෂ්මත් උපනන්ද ස්ථවිරයන් අරබයා පනවන ලදී. 3. උපනන්ද ස්ථවිර තෙමේ නො නෑ සිටු පුත්‍රයෙකුගෙන් චීවර විඤ්ඤපන වස්තුවෙහි පනවන ලදී.

7. යම් භික්ෂුවක් තෙමේ සොරුන් විසින් සිවුරු පැහැරගත් කාලයෙහි හෝ, දාගිය කාලයෙහි, නොනෑ නොපැවරූ ගෘහපතිනියකුට හෝ ගෘහපතියකුට සිවුරු වුවමනා බැව් ඇඟවූ පසු ඔවුන් විසින් උවමනා තරම් සිවුරු ගැණිම පිණිස බොහෝ සිවුරු දෙතු ලබන්නෝ වේද, එයින් අඳනය හා පොරෝණයට වඩා අධික වූවක් ගන්නේ නම් ඒ භික්ෂුව හට තතුත්තරිසාදියනයෙහි නිසග්ගි පචිති වේ.

ආපත්තියට පැමිණීම — හඳනය හා පොරෝණයට අධිකවූ වස්ත්‍රයක් වීම, අච්ඡින්නාදී කාරණයක් හේතු කොටගෙණ පිදීම, නො නෑයන් සමීපයෙහි ඉල්ලීම, ඉල්ලූ පරිදි ලැබීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

තතුත්තරිසාදියන නිසග්ගි පචිතිය කොතැන්හිදී පනවන ලදද? 2. කාවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිතිකොට පනවන ලදද?

1. සැවැත් නුවරදී පනවන ලදී. 2. ෂඩ්වර්ගීය භික්ෂූන් අරබයා පනවන ලදී. 3. සමග භික්ෂූහු පමණ ඉක්මවා බොහෝ සිවුරු විනවා ගැණීම් වස්තුව නිමිත්තකොට පනවන ලදී. විඥප්ත පියෝති දුකුලා ඇවැත් වේ. විඥප්ති කල්හි නිසඟි පචිති වේ.

8. යම් භික්ෂුවක් තෙමේ නො නෑ නො පැවරූ ගෘහපතියකු විසින් හෝ ගෘහපතිනියක විසින් හෝ තමහට දීමට පුදනම් කරණලද සිවුරෙහි සුන්දරත්වය මහාඝීත්වය සලකා "මෙ පමණ දිග පුළුල් ඇති චීවරය කින් පවරන්නේ නම් මැනවැයි" චීවරය පිළිබඳ අධික විධානයට පැමිණියේ නම් අප්පවාරිතයෙහි නිසඟි පචිති වේ.

**ආපත්තියට පැමිණීම** — සිවුරෙහි අතිකත්වය කැමැතිවීම, නො නෑයන් සමීපයෙහි කය වචන දෙකින් දන්වීම, ඒ විඥප්තියෙන් දන්වීමෙන් ලැබීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණේ.

1. අප්පවාරිත නිසඟි පචිතිය කොතැන්හිදී පනවන ලදද? 2. කවරෙකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවෙක්හි පනවන ලදද?

1. අප්පවාරිත නිසඟි පචිතිය සැවැත් නුවරදී පනවන ලදී. 2. ශාක්‍ය පුත්‍ර ආයුෂ්මත් උපනන්ද ස්ථවිරයන් අරබයා පනවන ලදී. 3. ශාක්‍ය පුත්‍ර ආයුෂ්මත් උපනන්ද ස්ථවිරතෙම පෙර නො පවරණ ලද නො නෑ ගෘහපතියකු වෙත පැමිණ චීවරයෙහි අධික විධානයට පැමිණීම් වස්තුව නිමිත්තකොට පනවන ලදී. අධික විධානයට පැමිණීම පිළිබඳ සියලු පියෝගි දුකුලා වේ. නෑයන් කෙරෙහි නො නෑ යන සංඥ ඇත්තහුටද විමති ඇත්තහුටද දුකුලා වේ.

9. යම්කිසි භික්ෂුවක් උදෙසා නොනෑ ගෘහපතියකු විසින් හෝ ගෘහපතිනියක විසින් හෝ වෙන් වෙන්වූ සිවුරු මිළ සකස්කරණ ලද්දේ වේද "අපි වෙන් වෙන්වූ සිවුරු මිළයෙන් වෙන් වෙන් සිවුරු මිළට ගෙණ අසවල් නම් ඇති භික්ෂුව සිවුරෙන් පුදම්හයි" කියායි. මෙසේ ඇතිකල යම් භික්ෂුවක් සකස්කරණ ලද සිවුරු මිළ ඇති දායකයින්ගේ ගෘහයට පැමිණ තමහට පැවරීමක්ද නොමැතිව "මේ වෙන් වෙන්වූ සිවුරු මිළයෙන් දිග පුළුල ඇති එක සිවුරක් දෙදෙනාම එකතුව පූජා කරවා නම් යහපතැයි" අධික විධානයට පැමිණියේ නම් ද්විතිය අප්පවාරිතයෙහි නිසඟි පචිතිවේ.

ආපත්තියට පැමිණීම වස්තු පුද්ගලාදිය පූර්ව ශික්ෂාපදය මෙනි.

10. රාජ රාජ මහාමාත්‍යාදී යම් කිසිවකු විසින් භික්ෂුවක් හට සිවුරක්කරදීම පිණිස දූතයකු අත යවනලද චීවර මූල්‍යයෙන් දූතයාගේ නො කැමැත්තෙන්, භික්ෂුවගේ දන්වීමෙන් ඒ මුදල ලැබූ කැපකරු විසින් නිපදවන ලද යම් චීවරයක් තුන් වාරයෙන් මතු "ඇවැත්නි! මට චීවරයෙන් ප්‍රයොජනයයි" සිහිකරවා හෝ සයවාරයකින් මතු උදෙසා සිට හෝ චීවරය ලබාගණී නම් නිසඟි පචිතිවේ.

**ආපත්තියට පැමිණීම** භික්‍ෂුව විසින් කැපකරුවකු දක්වීම, දූතයා සිවුරු මිළය ඔහුට භාරකිරීම, තුන් විටක් ඉල්වීම හා සයවරක් උදෙසා සිටීමෙන් අධික උත්සාහකිරීම, ඒ උත්සාහයෙන් සිවුර ලබාගැණීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

# පළමුවැනි සිවුරු වගයි.

---

1. යම් භික්‍ෂුවක් තෙමේ පටනූල් මිශ්‍රවූ ඇතිරියක් කරවන්නේ වීනම් ඒ භික්‍ෂුව හට සන්ථත කාරපත නිසඟි පචිතිවේ.

**ආපත්තියට පැමිණීම** පටනූල්වීම, තමා පිණිස ඇතිරියක් කිරීම හා කරවීම, ලැබීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණීම වේ.

1. සන්ථත කාරපත නිසඟි පචිතිය කොතැන්හිදී පනවන ලදද? 2. කවරෙකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවෙක්හි පනවන ලදද? 4. කෙතෙකින් ආපත්ති සමුට්ඨානය වේද?

1. සන්ථත කාරාපත නිසඟි පචිතිය අලව් නුවරදී පනවන ලදී. 2. ෂට්වර්ගීය භික්‍ෂූන් අරබයා පනවන ලදී. 3. ෂට්වර්ගීය භික්‍ෂූහු කොසිය කාරකයන් වෙත එළඹ ඇවැත්නි! බොහෝ පටනූල් මිශ්‍ර කරව, අපටද දක්වව. අපිදු කොශිය මිශ්‍ර සන්ථත කාරාපතයෙහි කැමැත්තමෝයි පැවතීම් වස්තුව නිමිතිකොට පනවන ලදී.

2. යම් භික්‍ෂුවක් තෙමේ අමිශ්‍රකාලවණ් එළුලොම්වලින් ඇතිරියක් කරවන්නේ නම් ඒ භික්‍ෂුවහට සුද්ධ සන්ථත කාරාපතයෙහි නිසඟි පචිති වේ.

**ආපත්තියට පැමිණීම** අමිශ්‍ර කාලවණ්බව, තමා පිණිස කිරීම හෝ කරවීම, ලැබීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණේ.

1. සුද්ධ සන්ථත කාරපත නිසඟි පචිතිය කොතැන්හිදී පනවන ලදද? 2. කවරෙකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිති කොට පනවන ලදද?

1. සුද්ධ සන්ථත කාරපත නිසඟි පචිතිය විසල්පුරදී පනවන ලදී. 2. ෂට්වර්ගීය භික්‍ෂූන් අරබයා පනවන ලදී. 3. ෂට්වර්ගීය භික්‍ෂූහු හුදු කළුලොමින් ඇතිරියක් කරවීම් වස්තුව නිමිතිකොට පනවන ලදී. සන්ථත කාරපත ප්‍රයෝගයෙහි දුකුළා වේ. කරවූ කල්හි නිසඟි පචිතිවේ.

3. අලුත් ඇතිරියක් කරවනු ලබන භික්‍ෂුව විසින් අමිශ්‍ර කාලවණ් එළු ලොම් දෙකොටසක්ද, සුදු එළු ලොම් තුන්කොටසක්ද, පඬුවන් එළු ලොම් සතර භාගයක්ද ගතයුතුයි. යම් භික්‍ෂුවක් තෙමේ එසේ අමිශ්‍ර කළුලොම් දෙකොටසක්ද, සුදු එළුලොම් තුන්භාගයක්ද, පඬුවන් එළු ලොම් සතර භාගයක්ද නොගෙණ අලුත් ඇතිරියක් කරවීනම් නව සන්ථත කාරපතයෙහි නිසඟි පචිතිවේ.

**ආපත්තියට පැමිණීම** අලුත් ඇතිරියක්වීම, කිරීම හෝ කරවන බවය, ලබාගැණීමය යන කරුණු සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණීම වේ.

1. නවසන්ථත කාරාපන නිසගි පචිතිය කොහැන්හිදී පනවන ලදද? 2. කවරකු අරබයා පනවන ලදද? 3. කිනම් වස්තුවක් නිමිති කොට පනවන ලදද?

1. නවසන්ථත කාරාපන නිසගි පචිතිය සැවැත්නුවරදී පනවන ලදී. 2. ෂට්වර්ගීය භික්ෂූන් අරබයා පනවන ලදී. 3. ෂට්වර්ගීය භික්ෂූහු සුදු එළලොම් ස්වල්පයක් ඇතුළත්හි යොදා හුදු කළු එළලොමින් ඇතිරියක් කරවීම් වස්තුව නිමිතිකොට පනවන ලදී. කාරාපන ප්‍රයෝගයෙහි දුකුළාවේ.

4. යම් භික්ෂුවක් විසින් අළුත් සන්ථරණයක් සකස්කොටගෙණ සාවුරුද්දක් මුළුල්ලෙහි දැරියයුතුයි. ඒ කරණලද ආස්තරණය සාවුරුද්දක් තුළ විසජ්ජනය නොට හෝ සංඝ සම්මුතියක්ද නොලැබ අළුත් ඇතිරියක් කරවී නම් අනුවස්සක සන්ථත කාරාපනයෙහි නිසගි පචිතිවේ. (ආපත්ති විභාගාදිය පූර්ව ශික්ෂාපදය හා සම වේ.

5. වරෙකුදු හිඳීමෙන් පරණවූ හිඳිනා ඇතිරියක් ඇති භික්ෂුව විසින් එයින් සුගත් වියතක් පමණ රෙදිකඩක් ගෙණ නො අල්වා අළුත් හිඳිනා ඇතිරියක් කරන්නේ නම් ඒ භික්ෂුවහට පුරාණ සන්ථතයෙහි නිසගි පචිතිවේ.

(ආපත්ති විභාග යට ශික්ෂාපදයට අනුව මැයි.)

6. දීර්ඝ මාර්ගයට පිළිපන්නාවූ භික්ෂුවක්හට එළලොම් ලැබුනේ වේද එය කැමැත්තාවූ භික්ෂුව විසින් ප්‍රතිග්‍රහණයකොට ගෙණයෑමට කෙනෙකු නැතිකල තුන්යොදුනක් පමණ තැන් සියතින් ගෙණ යා හැකිය. තුන්යොදුනකින් මත්තෙහි ගෙණ යාතම් ලෝම හරණයෙහි නිසගි පචිතිවේ.

**ආපත්තියට පැමිණීම** එළලොමින් නොකළ වස්තුවක් වීම, පළමුකොට ලැබීම, අනිකෙකු නැතිකල සියතින් හෝ යානාවක තබා හෝ තුන් යොදුන ඉක්මවීම, යාම් ඊම් දෙක්හි ගෙණයාම, පැමිණි විහාරයෙහි නොවසනු කැමැත්ත යන මේ කරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. යම් භික්ෂුවක් තෙමේ නො නෑ මෙහෙණින්නක ලවා එළලොම් දෙවීම්, රජන්කිරීම්, අවුල්හැරීම්, කරවන්නේ නම් ඒ භික්ෂුවහට ධොවනයෙහි නිසගි පචිතිවේ. ආපත්තින්ට පැමිණීම් ආදිය චීවර ධොවන ශික්ෂාපදයට සමානයි.

8. යම්කිසි භික්ෂුවක් තෙමේ රන් රිදී මසු කහවණු තෙමේ ප්‍රති-ග්‍රහණය කරන්නේ හෝ අනුන් ලවා ප්‍රතිග්‍රහණය කරවන්නේ හෝ

සමීපයෙහි එලවා තබන කල "මෙය පිළිගැණීම නුසුදුසුය"යි මුවෙන් නොබැණ ඉවසන්නේ හෝ වී නම් ඒ භික්ෂුවහට රූපිය පටිග්ගහණයෙහි නිසගි පචිති වේ.

**සංලක්ෂණය**

රන් රිදී මසු කහවණු අතුරෙන් යමක් ගන්නේද, ඒ ගන්නා වස්තු ගණනට නිසගි පචිති වේ. "අහං භන්තෙ රූපියං පටිග්ගහෙසිං" ඉදං මෙ නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජාමි යි මෙසේ සඟමැද නිස්සජ්ජනය කොට පැවිජි කෙනෙකුන් වෙත පැමිණ ආපත්ති දෙසනාකොට පිරිසිදුවිය යුතුයි.

**ආපත්තියට පැමිණීම**

රන් රිදියක් වීම, තමා විසින් උදෙසන ලද බව පිළිගැණීම, පිළිගැන්වීම, ඉවසීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

**කහවණුව නම්** :—මාසක හෙවත් මසු විස්සක ප්‍රමාණයයි. මාසක තුන් කොටසකි. එනම්–ලෝහමාසක–දරුමාසක–ජතුමාසක වශයෙනි. එහි තඹ ලොහ ආදියෙන් කල මසු ලොහ මාසක නමි.—දර අරටුවලින් හෝ උණපතුරු කැබැලිවලින් හෝ යටත් පිරිසෙයින් රූප සිඳ තල් පතිකින් හෝ කල මසු දරුමාසක නමි. ලාකඩින් හෝ මැලියම් වලින් රූප නගා කල මසු ජතුමාසක නමි.

9. යම් භික්ෂුවක් තෙමේ අනෙකප්‍රකාර ප්‍රභෙද ඇති රන් රිදී මසු කහවණු ගණුදෙනුවට පැමිණියේ නම් ඒ භික්ෂුවහට රූපිය සංවොහාරකයෙහි නිසගි පචිති වේ.

**ආපත්තියට පැමිණීම**

යම් වස්තුවක් තමාගේ වස්තුවෙන් පෙරළා ගන්නේ වේද, ඒ වස්තුව තමා සතු රන්රිදී වන බව, පෙරළා ගැණීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. යම් භික්ෂුවක් තෙමේ වස්ත්‍රාදී කැපවස්තූන් සම්බන්ධවද "මෙය රැගෙණ මෙය දෙව" යනාදී වශයෙන් නානාප්‍රකාර ගණුදෙනුවට පැමිණේ නම් එසේ පැමිණෙන භික්ෂුවහට කය වික්කයෙහි නිසගි පචිතිවේ.

**ආපත්තියට පැමිණීම**

යම් වස්තුවක් තමාගේ වස්තුවෙන් පෙරළා ගන්නේවේද, ඒ වස්තුව කැප වස්තුවක් නොවන බවය, සබ්‍රහ්මචාරී නොවන බවය, කයවික්කය සංඛ්‍යාත විකුට දීමට හෝ විකුට ගැණීමට පැමිණීමය යන කරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

"අහං භන්තෙ නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිං ඉදං මෙ භන්තෙ නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජාමි"යි සඟ මැද මෙසේ නිස්සජ්ජනය කොට ඇවැත් දෙසිය යුතුයි.

1. යම් භික්ෂුවක් තෙමේ නො ඉටූ නො විකප්පූ ඉටීමට සුදුවූ පාත්‍රයක් දස දවසක් පරමකොට ඇති කාලයක් දැරිය යුත්තේය. ඒ දසාහ පරම කාලය ඉක්මවන්නාවූ භික්ෂුවහට පත්තනිද්දහකයෙහි නිසගි පචිතිවේ.

**සංලක්‍ෂණය** කැප පාත්‍රනම්–අයොමය පාත්‍රය–මෘන්මය පාත්‍රය—යන දෙපාත්‍රයෝ ජාති වශයෙන් කැප පාත්‍රයි. එයම උත්කෘෂ්ට පාත්‍රය මධ්‍යම පාත්‍රය, ඔමක පාත්‍රයයි තුන් ප්‍රකාර වේ.

**උත්කෘෂ්ට පාත්‍රය** අඩපතක් ගන්නා මගධ නැලියෙන් දෙනැලියක් සහලින් පිසිනලද බත්ද එයින් සතරෙන් කොටසක් අතින් ගෙණ යාහැකි මුද්ග සූපයද අවසාන බත්පිඩ දක්වා හැම බත් පිඩකට අනුරූපවූ මත්ස්‍ය මාංසාදී අවුලුද ගණී. (උත්කෘෂ්ට පාත්‍රයයි මේ.)

**මධ්‍යම පාත්‍රය** උත්කෘෂ්ට පාත්‍රයෙන් භාගයක් ආහාර සූපව්‍යඤ්ජන ගන්නා පාත්‍රයයි.

**ඔමක පාත්‍රය** මධ්‍යම පාත්‍රයෙන් භාගයක් ආහාර සූපව්‍යඤ්ජන ගන්නා පාත්‍රයයි. එහි උත්කෘෂ්ට පාත්‍රය තෙම උත්කෘෂ්ට උත්කෘෂ්ටපාත්‍රය– මධ්‍යම මධ්‍යම පාත්‍රය– මධ්‍යම ඔමක පාත්‍රය යි තුන් තුන් ප්‍රකාර වේ. මෙකී නව වැදෑරුම් පාත්‍රයෙන් උත්කෘෂ්ට උත්කෘෂ්ට පාත්‍රයද ඔමක ඔමක පාත්‍රයද යන දෙක හැර මධ්‍යයෙහි දක්වෙන පාත්‍ර සත අධිෂ්ඨානයට ප්‍රමාණ වේ. මෙසේ අධිෂ්ඨානාහී පාත්‍රයන්ගෙන් යම් පාත්‍රයක් පරිභොග කර තමා විසින්ම දෙවා දිය නොසුන් පාත්‍රය සඟවා නො තැබිය යුතුයි. අව්වෙහි ගින්නෙහි තොම වියලිය යුතුයි, බොරළු සහිත පිරියම් නොකළ භූමියක නො තැබිය යුතුයි, ඇකයෙහි නොහොත් උකුලෙහි පාත්‍රය තබා ගෙණ අහර නො වැළඳිය යුතුයි. යම් අතුරු මාර්ගයෙක්හි පාත්‍රාධාරයක් නො ලැබුයේනම් පාත්‍ර පසුම්බි පටියෙන් උරෙහි එල්වා ගෙණ උකුළෙහි තබා වැළඳිම නිරුපත්තික බව "අංසවද්ධකෙන අංසකූටෙ ලග්ගෙත්වා අඞ්ක ඨපෙතුං වට්ටති" යන අඨ පාඨයෙන් හැඟෙයි.

**ආපත්තියට පැමිණීම** ජාතියෙන් හා ප්‍රමාණයෙන් සම්පූර්ණ නොවූ පාත්‍රයක් වීම, දිවස සඞ්ඛ්‍යාව ඇතුලත් නොවන බව, පිසීම් සඞ්ඛ්‍යාත පලිබොධ ඇති බව, අධිෂ්ඨාන විකප්පනය නොකළ බව, දස දවස ඉක්මවීම, යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. පස් බැඳුමකින් හෙවත් පිළියම් පසකින් අඩුවූ පාත්‍රයක් ඇති කල්හි අතික් අළුත් පාත්‍රයක් (නො නෑ නො පැවරූවන් අතින්) යම් කිසි භික්‍ෂුවක් ඉල්වා ගණීනම් ඒ භික්‍ෂුව හට ඌන පඤ්ච බන්ධනයෙහි නිසගි පචිති වේ.

**සංලක්‍ෂණය** තමා විසින් පරිභොග කරණ පාත්‍රය පිළියම් පසකින් ඌනව තිබියදී නො නෑ නො පැවරූවන්ගෙන් ඉල්වීන්නේ විඤ්ඤප්ති මාත්‍රයෙන් දුකුළා වේ. ලැබූ කල නිසගි පචිති වේ. මෙලෙස විනවා ගත් පාත්‍රය සඟමැද නිස්සජ්ජනය කළ යුතුයි.

**නිසඳුන පරිදි**

"අයං මෙ භන්තෙ පත්තො ඌණ පඤ්ච බන්ධනෙන පත්තෙන චෙතාපිතො නිස්සග්ගියො ඉමාහං සඞ්ඝස්ස නිස්සජාමි"යි නිස්සර්ජනය කොට ඇවැත් දෙසිය යුතුයි. ව්‍යක්ත ප්‍රතිබල සම්පන්න භික්ෂුවක් විසින් ආපත්ති ප්‍රතිග්‍රහණය කළ යුතුයි. එසේම ඡන්දයෙන්, ද්වේෂයෙන් මොහයෙන්, භයින්, අගතිගාමී නො වූ පාත්‍ර ගත් නොගත් තැන් දන්නාවූ පසගින් යුක්ත වූ භික්ෂුව පත්තගාහක වශයෙන් සම්මත කරගත යුතුයි. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථං නාමං භික්ඛුං පත්තගාහකං සම්මන්නති යස්සායස්මතො ඛමති ඉත්ථං නාමස්ස භික්ඛුනො පත්තගාහකස්ස සම්මුති සො තුණ්හස්සයස්සනක්ඛමති සො භාසෙය්‍ය සම්මතොසඞ්ඝෙන ඉත්ථං නාමෙන භික්ඛු පත්තගාහාපකො ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි"යි සම්මත කටයුතුයි. මෙහි "ඉත්ථං නාමං" යනාදි තන්හි ඒ ඒ භික්ෂූන්ගේ නාමයෙන් වාක්‍යයෝජනය කටයුතුයි.

**ආපත්තියට පැමිණීම**

අධිෂ්ඨාන කටයුතු පාත්‍රය පඤ්චබන්ධන-යකින් සම්පූර්ණ නොවීමය, තමා උදෙසා ඉල්වීමය, නො නෑ නො පැවරුවන්ගෙන් ඉල්වීමය, ඉල්ලූ පරිද්දෙන් ලැබීමය, යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

3. ගිතෙල්, වෙඬරු, තලතෙල්, මීපැණි, උක්සකුරු, යන පඤ්ච විධ භෛෂජ්‍යයන් පිළිගෙණ සතියක් පිරිසිඳිනා ලද කාලය මුළුල්ලෙහි නිධානකොට තබා අනුභව කටයුත්තාහුය, ඒ සතිය ඉක්මවා පරිභොග කරණ භික්ෂුව හට භෙසජ්ජ සික්ඛාපදයෙහි නිසඟි පචිති වේ.

**මෙහි වැළඳිය යුත්තේ** උග්ගහිත පටිග්ගහිත නොවූ ගිතෙල් ආදියයි

**උග්ගහිත** පිළිගතයුතු දෙය නො පිළිගත් බව දැන දැන තබාගැණීමයි.

**පටිග්ගහිත**

පිළිගත් ගිතෙල් ආදිය නැවත පිළිගන්වා ගැණීමයි. මෙලෙසින් උග්ගහිත පටිග්ගහිත වශයෙන් ලත් ගිතෙල් ආදිය පිළිගන්වා ගත් සත් දවස ඉක්මුනේ නමුදු නිසඟි නො වේ. වැළඳීම නො වටී, ශරීරයෙහි ආලෙප කිරීමාදී බාහිර ප්‍රයෝජනයට වටී. මිනිස්, හස්ති, සුනඛ, දිවි, සිංහ, ව්‍යාඝ්‍ර, තරස්, වලස්, දීඝී ජාතික සර්ප, මේ සතුන්ගේ මාංස අකැප මෙන්ම මොවුන්ගෙන් සකස් කළ වෙඬරු ගිතෙල්ද නිසඟිවත් වේ. සෙසු වෙඬරු-ගිතෙල් දුකුළාවත් වේ. තලතෙල්-මී තෙල්-අබ තෙල්-එඬරු තෙල්-වසා තෙල්-නිසඟිවත් වේ. අවශෙෂ තෙල් දුකුළාවත් වේ. කණවෙල්බෑ මැස්සෝ, දඹුළුල්බෑ මැස්සෝ, මහ බමර මැස්සෝ, මිහි මැස්සෝ-යන මේ සතුන් විසින් නිපදවන ලද මධු (මී) නිසඟි වත් වේ, අවශෙෂ මධු වගී දුකුළා වත් වේ, පිසන ලද ගෝ නො පිසන ලද උක් රසය නිසඟි වත් වේ, ගිතෙල් ආදි සත්තාහ කාලික (භෙවත්) සත් දවසක් තුළ වැළඳිය යුතු දෑ අටවන දින අරුණු නැඟුව හොත් නිසඟි පචිති වේ.

**නිස්සර්ජනය කරණ පරිදි**

"ඉදං මෙ භන්තෙ භෙසජ්ජං සත්තාහ අතික්කන්තං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි"යි පැවිදි කෙනෙකු හමුයෙහි නිස්සර්ජන කොට ඇවැත් දෙසිය යුතුයි.

**ආපත්තියට පැමිණීම**

ගිතෙල් ආදී භෛෂජ්‍ය වස්තු තමා සතු බව, දින වශයෙන් සතියක් තබන බව–බෙහෙදින් කටයුතු පළිබොධ සිඳීම–ඉස ගැල්විය යුතු තෙලාදිය පිණිස නොඳුරීම–සතිය ඉක්මවීම–යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසය ඉතිරිව තිබියදී වැසිසළු සිවුර (වර්ෂා ජලයෙන් තෙමියයුතු සිවුර) සෙවිය යුතුයි, එම ඍතුවෙහි අඩ මසක් ඉතිරිව තිබියදී සිවුර ගෙත්තම් රැඳීම් කොට හැන්ද යුතුයි, ඉල් මස අව පැළවිය පටන් පොසොන් මස පුර පසළොස්වක් දවස දක්වා ඇති සත් මස තුළ වැසි සළු සිවුර සොයන්නේ හෝ ඉල් මස අව පැළවිය පටන් පොසොන් මස අමාවක් දවස දක්වා පක්ෂයක් අධික කොට ඇති සත්මස ඇතුළත ගෙත්තම් රැඳීම් කොට වැසිසළු සිවුර පරිභොග කෙරේනම් ඒ භික්ෂුව හට වස්සික සාටිකායෙහි නිසඟි පචිති වේ.

**ආපත්තියට පැමිණීම**

වැසිසළු සිවුර තමා උදෙසා යැපීම–නො කල්හි සෙවීම – සෙවූ පරිදි ලැබීම – යන කරුණු පරියේෂණාපත්තිකයෝ සි. මේ කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. යම් භික්ෂුවක් තෙමේ උපසපන් භික්ෂුවක් හට සිවුරක් දී නැවත එක්තරා කාරණයක් නිසා කිපුනේ නොසතුටු සිත් ඇත්තේ ස්වකීය යන සංඥාවෙන් තෙමේ පැහැර ගන්නේ හෝ අනුන් ලවා පැහැර ගන්වා නම් හෝ ඒ භික්ෂුව හට අච්ඡින්දනයෙහි නිසඟි පචිති වේ.

**සංලක්ෂණ**

උපසපන් භික්ෂුව කෙරෙහි අනුපසම්පන්නය යන සංඥා ඇත්තේ සිවුරක් දී කුපිත වූයේ නො සතුටු සිත් ඇත්තේ ස්වකීය යන සංඥාවෙන් ගණී නම් හෝ අන්‍යයෙකු ලවා ගන්වා නම් හෝ නිසඟි පචිති වේ. අන්‍ය පරිෂ්කාරයක් දී නො සතුටු සිත් ඇත්තේ පැහැර ගණී නම් හෝ ගන්වා නම් දුකුළා ඇවැත් වේ.

අනුපසම්පන්නයෙකු හට සිවුරක් හෝ වෙන යම් පිරිකරක් හෝ දී පසුව කිපුනේ නො සතුටු සිත් ඇත්තේ පැහැර ගණීනුයි හෝ ගන්වා නම් හෝ දුකුළා ඇවත් වේ. අනුපසම්පන්නයා කෙරෙහි අනුපසම්පන්න යන සංඥා ඇත්තේ අනුපසම්පන්නයා කෙරෙහි විමති ඇත්තේ–අනුපසම්පන්නයා කෙරෙහි අනුපසම්පන්න යන සංඥා ඇත්තේ–වීනම් දුකුළා වේ. ගැණීම සඳහා අන්‍යයෙකුට ඇණවූ කල දුකුළා වේ. ගත්කල දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** විකප්පුන් කළහැකි සිවුරක් වීම, තමා විසින් දීම, තමාගේ වස්තුව යන සංඥ ඇතිබව, භික්ෂුවක් බව, කොපයෙන් ඉද්රීම හෝ ඉද්රවීම යන කරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ

**නිස්සජ්ජනය කිරීම.** "ඉදං මෙ භන්තෙ චීවරං භික්ඛු සඞ්ඝස්ස සාමං දත්වා අච්ඡින්නං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමි" සී පැවිජ් කෙනෙකු සම්පයෙහි නිස්සජ්ජනය කොට ඇවැත් දෙසත්තේයි.

6. යම්කිසි භික්ෂුවක් තෙමේ අනුලොම් සහිත සවැදෑරුම් නූල් ඉල්වා ගෙණ පෙහෙරුන් ලවා සිවුරක් විංචග්තෝ වීනම් එම භික්ෂුව හට සුත්තවිඤ්ඤත්තියෙහි නිසඟි පචිති වේ.

**සංලක්ෂ්‍යය.** සවැදෑරුම් නූල්:- ඛොමං-කොසෙය්‍යං-කප්පාසකං-කම්බලං-සාණං-භඞ්ගං යනුයි.

**ඛොම යනු.** වෘක්ෂයකට ව්‍යවහාර නාමකි. ඒ ගස වැහැරි ඛොම නූල් නම්.

**කොසෙය්‍ය.** තිහිරිය (කෘමිකොෂ) නුහුල්ය.

**කප්පාසික.** කපු නූල් නම්.

**කම්බල** මිනිස් ලොම්-වාළලොම හැර සෙසු ලෝමයෝයි.

**සාණ.** සණ වැහැරියි.

**භඞ්ග.** පස්හුයින් මිශ්‍ර කළ නුහුල්ය. නො නෑ නො පැවරූ ගිහි මිනිසුන් අයත් නූල් විත වාගෙණ පෙහෙරුන් ලවා සිවුරු වියවන සියලු පියෝහි දුකුළා වේ. ලැබීමෙන් නිසඟි පචිති වේ. වියවූ කල වියවන ලදූයි යන සංඥ ඇත් තෝ නිසඟි පචිති වේ. නොවියවූ කල වියවන ලදූයි යන සංඥ ඇත්තෝ දුකුළං ඇවැත් වේ.

**නිසඳන පරිදි** "ඉදං මෙ භන්තෙ චීවරං සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි වායාපිතං නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජ්ජාමි" මෙලෙසින් නිසඳ, ඇවැත් දෙසත්තේයි.

**ආපත්තියට පැමිණීම** සිවුරක් සඳහා ඉල්වන ලද නූල්වීම, තමා උදෙසා වියවන ලද බව, නොපැවරූ පෙහෙරුන් ලවා නොකැපවූ ඉල්වීමෙන් වියවන බව, යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. භික්ෂුවක් උදෙසා නොනෑ නොපැවරූ ගෘහපතියෙක් හෝ ගෘහපතිනියක් පෙහෙරුන් ලවා සිවුරක් වියවන්නේ වේද පෙර නොපැවරූ ඒ භික්ෂු තෙම පෙහෙරුන් කරා එළඹ ඇවැත්නි! මේ සිවුර මා උදෙසා වියනු ලබන්නකි, එහෙයින් එය දිග පුළුල

හා ගණකම් ඇතියක් කරවා, ඊට කුළිය වශයෙන් අපිත් යමක් දෙන්නෙමුයි, අධික විධානයෙන් නූල් වැඩිකොට කරවන ලද සිවුර ලැබුයේ නම් තන්තවායනයෙහි නිසගි පචිති වේ.

**සංලක්ෂණය** එම භික්ෂුවගේ වචනයෙන් පෙහෙරුන් විසින් දිග පුළුල හා ගණවූවක් කෙරේද ඒ පිළිබඳ හැම ප්‍රයොගයෙහිම දුකුලා වේ. එය ලැබීමෙහි නිසගි වේ. මෙලෙසින් ලත් සිවුර සංඝයා මධ්‍යයෙහිද, ගණයා මධ්‍යයෙහිද, එකක්හුගේ මධ්‍යයෙහිද, එක් වීමෙන් නිසඳ ඇවැත් දෙසිය යුතුයි.

**නිස්සර්ජනය** “ඉදං මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකස්ස ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපන්නං නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජාමි”යි නිසදිය යුතුයි.

**ආපත්තියට පැමිණීම** නොනෑ නොපැවරුවන්ගේ පෙහෙරුන් කරා පැමිණ අධික විධානය කිරීම, සිවුර තමා උදෙසා වියමන බව එහි භික්ෂුවගේ වචනයෙන් නූල් වැඩි කිරීම, සිවුර ලැබීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

8. වප්මස පුර විසේනිය පටන් මේ අතරෙහි වූ දවස්හි හෙවත් පෙර වස් මැස පවාරණයට දස දවසක් තිබියදී භික්ෂුවක් හට ඉක්මන් කටයුත්තක් සඳහා පුදන ලද සිවුරක් වී නම් පිළිගත යුතුයි. පිළිගෙණ නොඉටා නොවිකපා චීවර කාලසමය මුළුල්ලෙහි තැබිය යුතුයි. ඒ චීවර කාලයෙන් මත්තෙහි තබන්නේ වී නම් ඒ භික්ෂුව හට අච්චෙක චීවරයෙහි නිසගි පචිති වේ.

**සංලක්ෂණය** කඨිනය නො අතුළ කල්හි වස්සාන සෘතුව පිළිබඳ පශ්චිම දවස ඉක්මවාද නිසගි පචිති වේ. කඨිනය අතුළ කාල කඨිනුද්ධරණ දිනය ඉක්මවාද නිසගි පචිති වේ. සංඝයා මධ්‍යයෙහි හෝ ගණයා මධ්‍යයෙහි හෝ පුද්ගල මධ්‍යයෙහි හෝ මෙලෙසින් වාචොද්ගත කොට නිස්සජ්ජනය කට යුතුයි. “ඉදං මෙ භන්තෙ අච්චෙක චීවරං චීවර කාල සමයං අතික්කාමිතං නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජාමි”යි මෙලෙසින් නිසදිය යුතුයි. ඉක්මන් කටයුත්තක් සඳහා පුදනු ලබන අච්චෙක චීවරය නම්:- ගිලන් අවස්ථාවක හෝ, ගර්භිණී අවස්ථාවක හෝ, අශ්‍රද්ධාවන්තයෙකුට ශ්‍රද්ධාව පහළ කල හෝ, අප්‍රසන්න වූවකු ප්‍රසන්න කල යනාදී අත්‍යාවශ්‍යක කරුණක් ඇතිවී භික්ෂූන්ට නිමන්ත්‍රණයකොට පුදනු ලබන චීවරය අච්චෙක චීවර නම්.

ප්‍රාථමික කඨින ශික්ෂාපදයට සමානය.

**ආපත්තියට පැමිණීම.** මෙහි කාලය ඉක්මවීම මාත්‍රය පමණක් වෙනුයි.

9. පෙරවස් මැස පවාරණය කොට ඉල් මස පසළොස්වක් දක්වා කාලය තුළ අධිෂ්ඨාන කරනලද තුන් සිවුරෙන් එක් සිවුරක් ඇතුළු ගම තබා සැක කටයුතු භය සහිත ආරණ්‍ය සෙනාසනයෙහි වසන භික්‍ෂුව ගට ඒ ඇතුළු ගම තබනලද සිවුරෙන් වෙන්ව භික්‍ෂු සම්මුතියක් නො මැතිව දින සයකින් පිරිසිඳිනාලද කාලය තුළ විසිය හැක. ඒ දින සයෙන් මත්තෙහි ඒ සිවුරෙන් වෙන්ව වාසය කෙළේ නම් ඡාරතන විප්පවාසයෙහි නිසගි පචිති වේ.

**ආරණ්‍ය සෙනාසනය** ග්‍රාමයත් ග්‍රාමූපචාරයත් හැර අවශෙෂ ප්‍රදෙශය ආරණ්‍ය නම්. එහි දුනු පන්සියයකින් පිරිසිඳින ලද ස්ථානයෙහි පනවන ලද සෙනසුන ආරණ්‍ය සෙනාසන නම්. නිස්සජ්ජනය කළයුතු චීවරය නිස්සජ්ජනය නොකොට පරිභොග කෙරේද, දුකුළා ඇවැත් වේ. රෑ සයක් ඌනයයි විමති ඇතිකලත් දුකුළා වේ. රෑ සය සම්පූර්ණ නොවූ කල රෑ සය සම්පූර්ණ නොවිය යි සංඥා ඇත්තහුට ඇවැත් නැත්තේයි.

**ආපත්තියට පැමිණීම.** නිච්වර අධිෂ්ඨානයෙන් අධිෂ්ඨාන නො කරනලද සිවුරක් වීම, සම්මුති නො ලැබීම, සිවුරෙන් වෙන්ව විසීම, යන කරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. යම් භික්‍ෂුවක් තෙම කායවාර-වාක්වාර-දෙකින් පිරිනමන ලද්දවූ සංඝයාට අයත්වූ චීවරාදී ලාභයක් දැන දැන තමහට පිරිනමන්නේ වීනම් ඒ භික්‍ෂුහට අත්තපරිනාමකායෙහි නිසගි පචිති වේ.

**සංලක්‍ෂණය.** තමහට එළවීම පිළිබඳ හැම ප්‍රයොග යෙක්හිම දුකුළා වේ. පිළිගැණීමෙහි නිසගි පචිති වේ. මෙලෙසින් ලත් ලාභය සඟ මැද හෝ ගණයා හෝ පුද්ගල මධ්‍යයෙහි හෝ නිස්සජ්ජනය කළයුතුයි.

**නිසඳන පරිදි.** “ඉදං මෙ භන්තෙ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිනාමිතං නිස්සග්ගියං ඉමාහං සංඝස්ස නිස්සජ්ජාමී”ති මෙලෙසින් නිසඳ ඇවැත් දෙසිය යුතුයි.

**ආපත්තියට පැමිණීම.** සඞ්ඝයා විෂයෙහි පරිනාමිත බව, ඒ ලාභය දැන දැන තමහට පිරිනැමීම, තමා විසින් ලබනලද බව, යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ. “නිස්සග්ග නියුත්තා නිස්සග්ගියා” යි නිර්වචන සෙයින් මේ ආපත්තිය වස්තු නිස්සජ්ජනයෙහි යෙදුනේ නුයි නිස්සග්ගිය නම් වේ.

“නිස්සග්ගියානියං වුත්තං – තංසුණාහි යථා තථං
සංඝ මජ්ඣෙ ගණ මජ්ඣෙ – එකෙකස්සව එකතො
නිස්සජ්ජිත්වාන දෙසෙති – තෙනෙතං ඉති වුච්චති”

මෙයින් නිස්සග්ගිය යන්න තෝරුම් කරණ ලදි. එයින් පැවසෙන අදහස නම් නිස්සග්ගිය යි යමක් කියන ලද්දේද එය යම්සේ වී නම් ඒ වූ ලෙස ශ්‍රවණය කරව! සඞ්ඝ මධ්‍යයෙහි හෝ ගණයා මධ්‍යයෙහි හෝ එකෙක්හුගේ මධ්‍යයෙහි හෝ එක්වී නිස්සජ්ජනය කිරීම් වශයෙන් ඇවැත් දෙසයි ද එහෙයින් මෙම ආපත්තිනු නිස්සග්ගිය නම්වෙති.

## දසවන පරිච්ඡේදය නම් නිසගි ඇවැත් විනිස.

**පචිති ඇවැත් රැස.**

යම් භික්ෂුවක් තෙමේ ශික්ෂාවෙන් සමාන ආජීවයට පැමිණියේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නොකොට දුබල බැව් පහළ නොකොට දූත දූත අභූත වචනයක් සිදුවූ දෙයක් මෙන් කියා නම් ඒ භික්ෂුව හට මුසාවාදයෙහි පචිති ඇවැත් වේ.

**අභූත විනිස.**

දශ කුශල සම්පථ සංඛ්‍යාත මනුෂ්‍ය ධර්මයෙන් මත්තෙහි වූ ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලාදියට පැමිණියෙක් යයි අභූත කියා නම් එම භික්ෂුව හට පරිජි ඇවැත් වේ.

අමූලික වූ හෙවත් දිට්ඨ-සුත-මුත-පරිසංකිත වශයෙන් මුල් නැත් තාවූ පරිජි ඇවතකින් චොදනාකරණ භික්ෂුවහට සඟවෙසෙස් ඇවැත් වේ. සඟවෙසෙස් ඇවතකට පැමිණියේ යයි මුසාවාදයෙන් චොදනා කරණ මහණතෙම පචිති ඇවතකට පැමිණේ. ආචාර විපත්ති වශයෙන් මුසවා කිව දුකුලාවේ.-තාගේ වෙහෙර වසන ප්‍රව්‍රජිතයෝ ප්‍රථමධ්‍යාන විතියාධ්‍යාන ලදහ යනාදීන් මුසාවාද කියනුයේ අන්‍යයන් එය දැනගත් කල්හි තුලසිවේ-මෙරමා නොමදත්තේ දුකුලාවේ. හුදෙක් දූත දූත බොරු කියානම් පචිතිවේ. කෙළි කවට වශයෙන් නම් ගොත් ආදිය අරබයා මුසවා කිව දුභාෂිත නම්වේ. මෙලෙස මුසාවාද කීමෙන් පාටිදෙසනීයාපත්තිය හැර සෙසු සවැදෑරුම් ඇවැත් ඇතිවන අයුරු දතයුතුයි.

**ආපත්තියට පැමිණීම**

මුසාවාදපුරෙචනයට ඉදිරිපත්වන බව, මුසාවාදයක් කියනු කැමැත්තේ තම අදහස අන්‍යයන්ට ඇඟවීම පිණිස කය වචන දෙකින් උත්සාහ කිරීම-යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. යම් භික්ෂුවක් තෙමේ හිත කය දෙකට දුක් උපදවන පරිදි ජාති-නාමගොත්‍ර-කර්ම—ශිල්ප—ව්‍යාධි—සණ්ඨාන—කෙලෙශ—ආපත්ති—ආක්‍රොෂ-යන දසවිධ පදයෙන් සටා උපසපන් භික්ෂුවකට සම්මුඛයෙහි බිණීනම් ඔමස වාදයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය**

ඔමස වාදය නම්:— දස ආකාරයකින් බැණීම වේ—එය නම් ජාතිවශයෙන්-නාම වශයෙන්-ගොත්‍ර වශයෙන්-කර්‍ම වශයෙන්-ශිල්ප වශයෙන්-ආබාධයන්ගේ වශයෙන්-ලිඞ්ග වශයෙන්-කෙලශයන්ගේ වශයෙන්-ආපත්ති වශයෙන්-ආක්‍රොෂ වශයෙන්දැයි දස විධවේ.

එහි ජාතිය-හීනජාතිය-උත්කෘෂ්ට ජාතියයි දිවිධ වේ. හීනජාතිය නම්:—සැඩොල්-කුලුපොතු-මුවවැදි-සම්කරු යනාදියයි.

උත්කෘෂ්ට ජාතිය නම්:—ක්‍ෂත්‍රිය-බ්‍රාහ්මණ යන දෙකයි. නාමද හීනොත්කෘෂ්ට වශයෙන් දිවිධවේ. හීන නාම නම්:—අවකණ්ණ-ජවකණ්ණ-ධනිට්ඨක යනාදිය හෝ ඒ ඒ රටවල ව්‍යවහාරණ ජනතාව විසින් පහත්කොට සලකන නාමයෝයි.

**උත්කෘෂ්ට නාම**

බුද්ධරක්ඛිත - ධම්මරක්ඛිත - සඞ්ඝරක්ඛිත යනාදී නම් හෝ ඒ ඒ රටවල ජනතාව විසින් ගරුකොට සලකන නාමයෝයි. ගොත්‍රද හීනොත්කෘෂ්ට වශයෙන් දෙකෙකි. එනම්:-කොසිය භාරද්වාජ ගොත්‍ර හෝ ඒ ඒ රටවල ජනයා විසින් අවමන්කරණ ගොත්‍ර හීන නම්. ගෞතම-මෞද්ගල්‍යායන-කාත්‍යායන-වශිෂ්ට ගොත්‍ර හෝ ඒ ඒ රටවල ගරුකොට සලකන ගොත්‍ර උත්කෘෂ්ට නම්. කර්‍ම:—හීනකර්‍ම-උත්කෘෂ්ට කර්‍මයයි ද්විධවේ. වඩුකර්‍ම-පරමල් දමන (පුෂ්පඡඩ්ඩක) කර්‍ම හෝ ඒ ඒ රටවල පහත්කොට සලකනු ලබන යම් කර්‍මාන්තයෝ නම් ඒ සියල්ල හීන කර්‍මයි.-කෘෂි-වණික් කර්‍මාන්තාදිය හෝ ඒ ඒ රටවල ගරුකොට සලකන කර්‍මාන්තයෝ උත්කෘෂ්ට නම්. ශිල්පයද-හීනොත්කෘෂ්ටයයි ද්විධවේ. නලකාර-කුම්භකාර-පේසකාර-සම්කරු ආදිය හෝ ඒ ඒ රටවල පහත් කොට සලකන ශිල්ප හීන නම්. හස්තමුද්‍රා ගණිත-අච්ඡිද්‍රකාදි අවශෙෂ ගණිත-අකුරුලිවීම් ශිල්පය යනාදිය හෝ ඒ ඒ රටවල ජනයා විසින් උසස්කොට සලකන ශිල්ප උත්කෘෂ්ට නම්. සියලුම ආබාධ හීනය-මධුමෙහෙය උත්කෘෂ්ටාබාධයයි (මෙය වෙදනාවක් නොමැති සෙයිනි) ලිඞ්ගයද හීනොත්කෘෂ්ට වශයෙන් ද්විධවේ. එනම්:— ඉතා උස් වූවහුය-ඉතා මිටිවූවහුය-ඉතා කළුවූවහුය-ඉතා සුදුවූවහුය-යනාදිය හීන ලිඞ්ග නම්. ඉතා උස් නොවීම-ඉතා මිටි නොවීම-ඉතා කළුනොවීම ඉතා සුදුනොවීම-යනාදිය උත්කෘෂ්ට ලිඞ්ග නම්. සියලුම කෙලශයෝ හීනයහ-සියලුම ආපත්තීහු හීනයහ-එසේ නමුත් ශ්‍රොතාපත්ති සමාපත්තීහු උත්කෘෂ්ටයෝය, ආක්‍රොෂයද හීනොත්කෘෂ්ට වශයෙන් ද්විධවේ.

**හීන ආක්‍රොෂය**

ඔටුවාය-එළුවාය-ගොණාය-කොටළුවාය තිරිසනාය - නිරිසතාය - තට සුගතියෙක් නැත, දුගතියමය, යනාදි වශයෙන් කරණ ආක්‍රොෂයද, පුරුෂ ලිඞ්ග-ස්ත්‍රී ලිඞ්ග වශයෙන් බැණුමද යන මොහුයි.

**උත්කෘෂ්ට ආක්‍රොශ**

පණ්ඩිතයාය-ව්‍යක්තයාය-බහුශ්‍රැතයාය-ධර්‍ම කථිකායාය-විනයධරයාය-තට සුගති යෙක් නැත සුගතියම කැමතිවිය යුතුය

යනාදියයි. මෙකී ආකාරවලින් යම්කිසි ආකාරයකින් පාරාජිකාවූ හෝ නොවූ හෝ භික්ෂුවකට අනිකෙකුට බණින අයුරු නැතිව යම්කිසි භික්ෂුවක් බණීනම් වචනයක් පාසා පචිති ඇවැත් වේ. මෙකී සඳහන් වචනයන්ගෙන් කොයි වචනයකින් නමුත් අනුපසම්පන්නයකුට (භික්ෂුණී සාමණේර ගිහි යන සියල්ලෝම අනුපසම්පන්නයන් ලෙස ගතයුතුයි.) ඔවුනට බැණීමෙහි දුකුළා ඇවැත්වේ. අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීම් වශයෙන් ජාත්‍යාදීන් සටා බිණීමෙහි ඇවැත් නොවේ.

**ආපත්තියට පැමිණීම**

යමෙකුහට ආක්‍රොශකරන්නේ නම් ඔහු උපසම්පන්නයෙක් වීම, අනිකෙකු නො උදෙසා ඔහුම උදෙසා ජාත්‍යාදීන් සටා ආක්‍රොශ කිරීම, ඒ ආක්‍රොශ කාරණුලබන භික්ෂුව මට ආක්‍රොශ කෙළේ යයි දැනගැණීම, අර්ථයට අභිමුඛ කිරීම, පාලියට අභිමුඛ කිරීම යන මේ දෙකින් වෙන්ව ආක්‍රොශ කිරීමය යන කරුණු සම්පූර්ණ වීමෙන් ඇවත සිද්ධවේ.

3. උපසපන් භික්ෂුවක් විසින් උපසපන් භික්ෂුවක්හට අසම්මුඛයෙහි කියනලද ජාත්‍යාදී දසපදයෙන් යම් වචනයක් ගෙණගොස් හෙද කරවන අදහසින් කේලාම් කියානම් ඒ භික්ෂුවහට පෙසුඤ්ඤහරණයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

“පිංසති සාමග්ගිං සංචුණ්ණෙති–විකඛි පතිපියභාවං සුඤ්ඤං කරෙතීතිවා පිසුණා” සමගිය සුණු කෙරෙයි යන අර්ථයෙන් හෝ ප්‍රියභාවය විසුරුවයි–සුන්‍යකරයි යන අර්ථයෙන් හෝ පිසුණා නම් වේ— අන්‍යයන් අතර පවත්නා ප්‍රියත්වය සුණුවිසුණු කරණ වචනය පිසුණාවාචා නමි. පූර්වෝක්ත ශික්ෂාපදයෙහි ඇතුළත් ජාත්‍යාදී දශාකාරයෙන්ම පිසුණාවචනය සිදුවේ.

අනුපසපනක්හට කියා නම් දුකුළා වේ. අනුසම්පන්නයකුගෙන් අසා උපසපන් භික්ෂුවකට හෝ අනුපසපනක්හට හෝ කියා නම් දුකුළා වේ. පවිටන්ට ගර්හා කිරීම් වශයෙන් කියානම් ඇවැත් නැත්තේයි.

**ආපත්තියට පැමිණීම**

ජාත්‍යාදි වස්තු කාරණකොටගෙණ අන්‍යයෙකු නොම උදෙසා ආක්‍රොශ කරණ භික්ෂුවගේ වදන් අසා අනික් භික්ෂුවක් කාරණකොටගෙණ යාමය තමා ප්‍රියකරණ කැමැත්ත හෝ අනුන් බිඳවනු කැමැත්ත හෝ යන දෙදෙනා අතුරෙන් එක එක ඇති බව ඒ භික්ෂුව එම වචනයේ අරුත් දැන ගැණීම—යන කරුණු සම්පූර්ණවීමෙන් ඇවතට පැමිණීම වේ.

4. යම් භික්ෂුවක් තෙමේ සාමණේරාදී අනුපසම්පන්නයන් සමග පදානුපද අනුඅක්ෂර අනුබ්‍යඤ්ජනයන් අතුරෙන් යම් කොට්ඨාශයක් හුගේ වශයෙන් ත්‍රිපිටක ධර්මය හා අටුවා ධර්මය එකවිට කියවන්නේ වීනම් ඒ භික්ෂුවහට පද ගණනින් පදසෝධම්ම පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.**

අනුපසම්පන්නයෙකු තමා සමීපයෙහි ත්‍රිපිටක ධර්මය හා අටුවා ධර්මය කියවා ගන්නාකල ඔහු හා සමග එක් පදයක් සම්පූර්ණයෙන් හෝ ඒ ඒ පදයෙහි ආදි අක්ෂරය පටන් අවසන් අක්ෂරය තෙක් එක්ව කියා නම් පදයක් පාසා අකුරක් පාසා පචිති ඇවැත් වේ. අනුපසම්පන්නයෙකු වෙතින් තමා කියවා ගන්නාකල හෝ පිරිවහන සඳ හෝ එක්ව හදාරණකල හෝ ඔහු හෝ තමා ප්‍රතිපුච්ඡනය කරණකල බොහෝ සුමෙන් ඔහට ප්‍රගුණ පෙළක් එක්ව කීස නම් ඇමැත් නැති වාචොද්ගතකිරීම පිළිබඳ සියලු පියෝහි දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.**

අනුපසම්පන්නයෙක් වීම, පාළි අර්ථ කථා වක් වීම, පද වශයෙන් කීයවීම, එකවිට සොළවර කිරීමය යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. යම් උපසපන් භික්ෂුවක් අනුපසම්පන්නයෙකු හා සමග දෙතුන් රැයකින් මත්තෙහි එක් සෙවෙනියක් හා එක් බිත්තියක් ඇති විහාර යෙහි එක්ව සයනය කරන්නේ නම් ඒ භික්ෂුවහට සහසෙය්‍යායෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.**

මෙහි සහසෙය්‍යට පොහොනා ගෘහය නම්:– නොයෙක් මහල් ඇති නොයෙක් කාමර ඇති සෙනසුනක් හෝ මහල්ද කාමරද නැති එක් දෙරකින් නික්මීම ඇති සෙනසුනයි.

සියල්ල වසනලද–සියල්ල වට කරණලද–සියල්ල වසනලද–බොහො මයක් වටකරණලද–සියල්ල වසනලද–අඩියක් වටකරණලද–බොහොම යක් වටකරණලද–බොහොමයක් වසනලද අටඩැඳුරුම් කුටියෙක්හි පිට පිට තුන් රැයක් සූර්‍යයා උදුවීමට පලමුවෙන් නගින රශ්මිය වැටෙන තුරු සයනයකොට සතරවන දවස් හිරු අවර පත්වූ කල පචිති වේ. මෙහි පාචිත්තියාපත්තීහු සතෙක් වෙති.

අඩක් වසනලද අඩක් වටකරණලද සෙනසුනෙහි කල්ගවනුයේ දුකුළා ඇවැත් වේ. උපසම්පන්නයෙකු කෙරෙහි අනුපසම්පන්නය යන සංඥ ඇත්තේ දුකුළා වේ. උපසපන් භික්ෂුව කෙරෙහි විමති ඇත්තේ දුකුළා වේ. සියල්ල වසනලද කුඩා තැනක් වසනලද සෙනස්නෙහි විසුයේ දුකුළා වේ. බොහෝ සෙයින් වසනලද කුඩා තැනක් වසනලද සියල්ල වට කරණලද කුඩා තැනක් වසනලද බොහෝ සෙයින් වට කරණලද කුඩා තැනක් වසනලද අඩියක් වසනලද අඩියක් වට කරණ ලද සෙනසුනෙහි වසනුයේ පස් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.**

ආපත්තියට සුදුසු විහාරයක් වීම, ඒ විහාරයෙහි ගිහි හෙරණුන් සමග සැතපීම, තුන්වන දවස් අරුණ නැගීම යන කරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

6. යම් භික්ෂුවක් තෙමේ මාගමක් හා සමග එක්ව සයනය කරන්නේ වීනම් හොත් විගසම මාතුගාම සහසෙය්‍යායෙහි පචිති ඇවැත්වේ..

**සංලක්ෂ්‍යය.**

මනුෂ්‍ය ස්ත්‍රියක් හෝ, තමා හෝ, නැගී හෝනා ප්‍රයොග ගණනින් පවිති වේ. මාගමුන් බොහෝ වුව මාගමුන් ගණනට පවිති වේ.

**මෙහි මාගම්හු.**

මනුෂ්‍ය ස්ත්‍රීහුය, පණ්ඩක, මූගටි, පරෙවි, ජීවමානක යක්ෂනී, ප්‍රෙතියක් හා සමග හොවීනම් හොත් විගසම දුකුළා ඇවැත් වේ. අවශෙෂ මූගටි ආදී මාගමුන් හෝ තමා හෝ නැගී හෝනා ප්‍රයොග ගණනින් දුකුළා වේ. අඩක් වසහලද අඞ්ගයක් වට කරණලද සෙන පුනෙහි දුකුළා ඇවැත් වේ. නො මාගමක් කෙරෙහි මාගමය යන සංඥ ඇත්තේ දුකුළා වේ. නො මාගමක් කෙරෙහි විමති ඇත්තේ දුකුළා වේ.

7. යම් කිසි භික්‍ෂුවක් සබ්භ්‍යා'සබ්භ්‍ය තෙපුල් දන්නා මිනිස් පුරුෂ යෙක් නැතිව මිනිස් මාගමකට වචන පසකින් හෝ සයකින් මතු පිටකත්‍රය ධර්මය හා අර්ථ කථා ධර්මය පෙලබසින් දෙසන්නේ නම් ඒ භික්‍ෂුවගට උත්තරජ්ජපඤ්චවාචායෙහි පවිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.**

මාගම්හු බොහෝවුව මාගම් ගණනින් පවිති වේ.

**මෙහි ධර්මය.**

බුද්ධ භාසිත, ශ්‍රාවක භාෂිත, ඍෂිභාෂිත, දෙව භාසිත, අර්ථප්‍රති සංයුක්ත ධර්මප්‍රති සංයුක්ත දෙසනාමවෝයි. මෙහි ස‍ෘපදක් නම්:- සිවුපද ගයකින් අඩකි. සපදින් මතු පදයක් පාසා පවිති වේ. අක්‍ෂර වශයෙන් වෙන් වෙන් කොට කියා නම් අක්‍ෂරයක් පාසා පවිති වේ.

පණ්ඩක, යක්‍ෂ, ප්‍රෙත, මාගමුන්ට මිනිස් වෙස් ගත් තිරිසන් මාගමුන්ට කියා නම් දුකුළා වේ. ස‍ෘපදෙන් අඩුව කියා නම් හෝ සබ්භ්‍යා'සබ්භ්‍ය තෙපුල් අගන්නා මිනිසෙක් ඇති කල දීඝ්සඟිය පමණ දෙසනාවක් උවත් ඇවැත් නැත්තේයි.

**ආපත්තියට පැමිණීම.**

පාලි අර්ථ කථා ධර්මය ස‍ෘපදයකින් අධික කොට කීම, දන්නාවූ මාගමක් වනබව, ඉරියව් නොබිඳිනබව, දන්නාවූ මනුෂ්‍ය පුරුෂයෙක් සමීපයෙහි නැතිබව, ප්‍රශ්න විසඳීමක් නැතිබව යන කරුණු පඤ්චකය සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

8. යම් භික්‍ෂුවක් තමා කෙරෙහි විද්‍යමාන (ඇත්තාවූ) ධ්‍යානාදී ප්‍රභෙදගත උතුරු මිනිස්දම් ගිහියකුට හෝ හෙරණකුට ප්‍රකාශ කෙරේ නම් ඒ භික්‍ෂුවගට භූතාරොචනයෙහි පවිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.**

මෙහි උතුරු මිනිස්දම් නම්:- ධ්‍යානය, විමොක්‍ෂය, සමාධිය, සමාපත්තිය, ඥාන දර්ශනය, මාර්ගභාවනාවය, ඵලසච්ඡිකිරිය, ක්ලෙසප්‍රහාණය, සිත නීවරණ ධර්මයන්ගෙන් තොරබව, ශූන්‍යාගාරයෙහි

අභිරතිය, ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන, ශූන්‍යතාවිමොක්ෂය, අනිමිත්ත විමොක්ෂය, අප්පණිහිත විමොක්ෂය, ශූන්‍යතා සමාධිය, අනිමිත්ත සමාධිය, අප්පණිහිත සමාධිය, ශූන්‍යතා සමාපත්තිය, අනිමිත්ත සමාපත්තිය, අප්පණිහිත සමාපත්තිය, ත්‍රිවිද්‍යා ප්‍රාප්තිය, සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්චබලය, සප්තබොධ්‍යාඞ්ග, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගී, සොතාපත්තිඵලයාගේ ප්‍රත්‍යක්ෂකිරීම, සකෘදාගාමිඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම, අනාගාමි ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම, අර්හත්වය ප්‍රත්‍යක්ෂකිරීම, රාගයාගේ ප්‍රහානය, ද්වේෂයාගේ ප්‍රහානය, මොහයාගේ ප්‍රහානය, ප්‍රථම ධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යානයන්ගෙන් යුක්තව ශූන්‍යාගාරයෙහි අභිරතිය, හෙවත් ඇලීමය, යන මේ ධර්මයෝ උත්තරි මනුෂ්‍ය ධර්මයෝයි.

"ප්‍රථමධ්‍යාන සමාපත්තියට සමවැදුනෙමි"යි කියන්නාවූ උපසපන් භික්ෂුවහට පචිති ඇවැත් වේ. ද්විතීයධ්‍යාන ධර්මයන් පිළිබඳවද මෙලෙස මැයි. තිප්පරියාය වශයෙන් තමා කෙරෙහි විද්‍යමාන ධ්‍යානාදී ධර්ම අනුපසම්පන්නයෙකුට ආරොචනය කෙරේද, අනතුරුව මේ භික්ෂුව ධ්‍යානලාභියයි කියා හෝ, ආර්‍ය්‍යයෙකැයි කියා හෝ, යම් කිසි ආකාරයකින් එම අර්ථය දැන ගණී නම් පචිති ඇවැත් වේ. ඉදින් නොම දනී නම් දුකුළා වේ. යම් භික්ෂුවක් විසින් තොපගේ විහාරයෙහි චීවර පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස බෙහෙත් රැස, පරිභොග කරණු ලැබේද ඒ භික්ෂුව විසින් ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානය ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේයයි කියන්නාවූ මහණහට දුකුළා ඇවැත් වේ.

**ආපත්තියට පැමිණීම** — උතුරු මිනිස්දම් ප්‍රකටව ඇතිබව, ගිහි හෙරණෙකුට ඇස්වීම, එකොණෙහි අර්ථය තේරුම් ගැණීම, අනිකෙකු උදෙසා නොවන බවය යන කරුණු සතර සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

9. යම් භික්ෂුවක් තෙමේ අපලොකන කර්මයෙන් සම්මත කිරීමක් නැතිව භික්ෂුවක්හුගේ ලාමකවූ සඞ්ඝාදිශෙසා පත්තියක් ගිහි–හෙරණකුට කියා නම් ඒ භික්ෂුවහට දුට්ඨුල්ලාරෙචනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණ** — ආරෙචන පියෝහි දුකුළා වේ–ආරෙචනය කළ කල්හි පචිති වේ. මෙහි සඳහන් දුට්ඨුල්ලාපත්ති නම් :–සතර පරිජි ඇවැත් හා තෙලෙස් සඟවෙසෙස් ඇවැත්හුයි–අදුට්ඨුල්ලාපත්ති ආරෙචනයෙහි දුකුළා වේ. අදුට්ඨුල්ලාපත්තියෙහි දුට්ඨුල්ලාපත්ති යන සංඥ ඇත්තේ දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම** — භික්ෂුවක්හුගේ සවසතුක සඞ්ඝාදිසෙසාපත්තියක්වීම, ගිහි හෙරණෙකුහට ඇස්වීම, සම්මුතිය නො ලැබීමය යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. යම් භික්ෂුවක් තෙමේ උද්ධන පාත්‍ර පචනාදියෙන් නොදෙන ලද හුදු මැටි හුදු පස් පොළව බොහෝ මැටි බොහෝ පස් පොළව වැසි වැස හාරමසක් ඉක්මුණු පස් රැස් මැටි රැස්ද යන මෙකී ජාතපෘථිවිය යටත් පිරිසෙයින් පොළව සමකරණු පිණිස කුරුමුසුන් ආදියකින් හෝ ගටමින් තෙමේ කණීනම් හෝ අනුන් ලවා කණවා නම් ඒ භික්ෂුව හට පඨවි ඛණනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය**

මේ පෘථිවිය කොටස් දෙකෙකි-ජාත පෘථිවිය-අජාත පෘථිවිය වශයෙනි. එහි ජාත පෘථිවිය—හුදුපස් - හුදුමැටි - ස්වල්ප ගල්-ස්වල්පයක් කැට කැබිලිති-ස්වල්පයක් බොරලු-ස්වල්පයක් වැලි ඇති බොහෝ පස් ඇති බොහෝ මැටි ඇති නොදන ලද පෘථිවිය ජාත පෘථිවිය නම්. වැසි වැස සාරමසක් ඉක්මුණු පස් රැස් මැටි රැස් ඇත්තේද ජාත පෘථිවිම වේ.

**අජාත පෘථිවිය**

හුදු පහන්, හුදු කැට, හුදු කැබිලිති, හුදු බොරලු, හුදු වැලි, ස්වල්ප පස්, ස්වල්ප මැටි ඇති බොහෝ සෙයින් පහන් කැට කැබිලිති බොරලු වැලි ඇති දවනලද පෘථිවිය අජාත පෘථිවිය නම්. මේ දෙවැදෑරුම් පෘථිවිය යම් උපසපන් භික්ෂුවක් තෙමේ කණී නම් හෝ අනුන් ලවා කණවා නම් හෝ පචිති වේ. පෘථිවිය කෙරෙහි විමති ඇත්තේ කැණීම කැණවීම බිඳීම බිඳවීම දැවීම් දැවවීම් හෝ කෙරේද දුකුලා වේ. පෘථිවිය නුවූවෙහි පෘථිවිය යන සංඥා ඇත්තේ දුකුලා වේ. තුන්කොටසින් කොටස් දෙකක් වැලි ආදිය වීනම් එක් කොටසක් පස් හෝ මැටිවීනම් කණනයෙහි ඇවැත් නැත්තේයි-මෙතන කණනය කර-මේ මුල කපව-මෙතන වළක්-ළිඳක්, පොකුණක්, වැවක්, කණනය කර, මෙතන සසු, යනාදීන් නියම කෙරේ නම් දුකුලා ඇවැත් වේ—කණනය කළ පසු පචිති ඇවැත් වේ—ස්ථානය නියම නොකොට වළක්, ළිඳක්, වැවක්, පොකුණක්, කරවයි කීයා නම් ඇවැත් නැත්තේයි.

**ආපත්තියට පැමිණීම**

ප්‍රකෘති පොළොව වන බව, පෘථිවිය යන සංඥා ඇති බව, තමා විසින් කැණීම හෝ කැණවීම යන දෙකින් එකක් වීම, යන කාරුණු තුන සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

1. ජලජ ථලජ වශයෙන් දක්වනලද වැඩුනාවූද නීලවර්ණයෙන් සජ්ජිතව වෘද්ධත්වයට පැමිණෙන්නාවූද භූතගාම සංඛ්‍යාත සියලු වෘක්ෂ තෘණ ලතාදීන්ගේද ගටගැණීම් ලක්ෂණය ඇති සියලු මුල් පුරුක් අතු ගෙඩි ඇට යන පඤ්චප්‍රකාර බීජ ග්‍රාමයාගේද, මුල් හා නිල්වන් පත්‍රද ඇති කල කැපීම්, කෑඩීම්, බිඳීම්, පැළීම්, ඉගිලීම්, ආදිය කිරීමෙන් හා මෙය කපව, කඩව, පලව, බිඳුව, උගුලව, යනාදී අකප්‍ය ව්‍යවහාරයෙන් සිඳීම් බිඳීම් ආදිය කරණ කරවන උපසපන් භික්ෂුවහට භූතගාම පාතව්‍යතායෙහි පචිති වේ.

**සංලක්ෂ්‍යය**

මෙහි දක්වෙන බීජ ග්‍රාමයෝ පඤ්ච ප්‍රකාර වෙති. එනම් :—මූලබීජ-ඛන්ධබීජ-ඵලුබීජ-අග්‍රබීජ-බීජබීජ-වශයෙනි.

මූලබීජ නම්:— කහ-ඉඟුරු-වදකහ-වජපිරිබුලු-(සංයුක්ත ටීකා පසකවචං, සුදු වදකහ-ඉවද-කුළුරැණ-සුවඳහොට-වම්මුතු-(සාලංදුරු) මුල්වලින් හටගන්නා අන්‍ය ජාතිහුද මූල බීජ නම්.

ඛන්ධබීජ නම්:—ඇසටු-නුග-පුලිල-මහිරි-කදින්හටගන්නා අන්‍ය ජාතීහුද ඛන්ධබීජ නම්.

ඵලු බීජ නම්:— උක්-හුණ-බට-පුරුක්වලින් හටගන්නා අන්‍ය ජාතීහුද ඵලුබීජ නම්.

අග්‍රබීජ නම්:—හෙලඅඳු-මුරුවා-ඉරිවේරිය-කරවි සිටුවීමෙන් හට ගන්නා අන්‍ය ජාතීහුද අග්‍රබීජ නම්.

බීජබීජ නම්:—මුං-උඳු-බීජයන්ගෙන් හටගන්නා අන්‍ය ජාතීහුද බීජබීජ නම්. මෙම පඤ්චප්‍රකාර බීජ විෂයෙහි බීජ යන සංඥ ඇත්තේ සිඳීම්-සිඳවීම්- බිඳීම්- බිඳවීම්- පිසීම්-පිසවීම් හෝ කෙරේ නම් දුකුලා ඇවැත් වේ. බීජ විෂයෙහි අබීජ සංඥ ඇත්තේ සිඳීම්-සිඳවීම්-බිඳීම්-බිඳවීම්-පිසීම්-පිසවීම් හෝ කෙරේද ඇවැත් නැත්තේයි. අබීජ විෂයෙහි බීජය යන සංඥ ඇත්තේ දුකුලා ඇවැත් වේ. අබීජ විෂයෙහි විමති ඇත්තේ දුකුලා ඇවැත් වේ. මෙය දනුව, මෙය දෙව, මෙය ආහරණය කරව, මෙයින් ප්‍රයෝජන ඇත, මෙය කැප කරවයි කියාද නොදැන නො සිහියෙන් යුක්තවූවහුට උම්මත්තකයාට ආදිකර්මිකයාට ඇවැත් නැත්තේයි.

**ආපත්තියට පැමිණීම**

භූත ග්‍රාමයක් වන බව, භූතග්‍රාමය යන සංඥ ඇතිබව, විනාශ කිරීම හෝ කරවීම යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2\. "ඇවැත්නි! තෙපි මෙනම් ආපත්තියකට පැමිණියාහුද"යි චොදනා වශයෙන් විචාරණලද කල්හි දියයුතු පිළිතුර නොදී අන්‍ය වචනයක් කිමෙහිද කියිවක් නොකියා තුෂ්ණීම්භූතව හිඳීමෙහිද සඞ්ඝයා විසින් අඤ්ඤවාදක විහෙසක කර්මය කළ කල්හිත් එලෙසම කෙරේනම් ඒ භික්ෂුවහට අඤ්ඤවාදක විහෙසකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

අධර්ම කර්මයෙහි ධර්මකර්ම යන සංඥ ඇත්තේ වේ නම් දුකුලා වේ.—අධර්ම කර්මයෙහි විමති ඇත්තේ වේද දුකුලා ඇවැත් වේ— (මෙහි අඤ්ඤවාදක විහෙසකයෙහි පචිති දෙකක් වෙති.)

**ආපත්තියට පැමිණීම**

ධර්ම කර්මයෙන් අඤ්ඤවාදක විහෙසක කර්මයට ආරොපනය කිරීම, වසනු කැමැත්ත, තුෂ්ණීම්භූතවීම යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

3\. යම් කිසි භික්ෂුවක් තෙමේ සොලෙස් සම්මුති අතුරෙන් එකක් හෝ බොහොමයක් හෝ ලද උපසපන් භික්ෂුවක්හට අවඥ (ගැරහීම්) කෙරේ නම් හෝ ගුණ පරිධංසනය කෙරේ නම් ඒ භික්ෂුවහට උජ්ඣාපනක ඛීයනකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

දොළොස් සම්මුති නම්:—භත්තුද්දෙසක-සේනාසන ගාහාපක-භාණ්ඩාගාරික-චීවර පටිග්ගාහක—චීවර භාජක—යාගු භාජක-ඵල භාජක—ඛජ්ජභාජක-අප්පමත්තක- විස්සජ්ජක- වස්සික සාටිය-පත්ත ගාහාපක-ආරාමික-පෙසක-සාමණේර පෙසක-යයි මොහුයි.

අධර්ම කර්මයෙහි ධර්ම කර්ම යන සංඥා ඇත්තේ දුකුළා වේ. අධර්ම කර්මයෙහි විමති ඇත්තේ දුකුළා වේ-අනුපසම්පන්නක්හට ගැරහීම් අගුණ කීම් හේතුකොටගෙණ දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

ධර්ම කර්මයෙන් සම්මත කිරීම, උපසපන් බව, අගතිගාමී නොවන බව, ගුණවසානු කැමැත්ත, යමකුගේ සම්පයෙහි කියා නම් ඔහු උපසපන් බව, ගර්හා කිරීම, ගුණපරිධ්වංසනය යන සාරුණු ෂට්කය සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. යම් භික්ෂුවක් තෙමේ සංඝ සන්තකවූ ඇඳ පුටු බිසි නිසීදනයන් සෙවෙනියක් නැති ප්‍රදේශයෙක්හි පනවා එම ඇඳ පුටු ආදිය නගා නො තබා හෝ නො තබ්බවා හෝ නො පිළිවිස හෝ බැහැර යන්නේ වී නම් ඒ භික්ෂුවහට අජ්ඣොකාස සන්ථරණකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

මෙහි දැක්වෙන ඇඳ නම්:—මසාරකය-බුන්දිකාබද්ධය-කුළීර පාදය-ආහච්ච පාදක යයි-සිව් මැදුරුම් වේ.

**මසාරකය**

ඇඳ සකුල් විද එහි විට්ටම් ගසා කරණ ලද ඇඳයි.

**බුන්දිකාබද්ධ**

විට්ටම් විද එහි ඇඳ සකුල් ප්‍රවේශකොට පයඝිඹකාකාරයෙන් කරණලද ඇඳයි.

**කුළීරපාද**

අස් පා, එළු පා, සමාන සකුල්වලින් යුක්තකොට කරණලද වක්වූ පා ඇති යම් මඤ්ච විශෙෂයකි.

**ආහච්චපාදක**

විට්ටම් විද එහි පාද සිඹාව බහා මත් තෙහි ඇණ දමා කරණලද ඇඳයි. පුටු පිළිබඳවද මේ විනිශ්චය මැයි.

**පඤ්චවිධ බිසි**

ඌර්ණබිසි-චොලබිසි-වාකබිසි- තෘණබිසි පර්ණබිසි යන මෙයයි—(මෙහි බිසි නම් ගුදිරියි.)

**ඌර්ණ බිසි**

අකැප මාංසයුන් මිනිසුන් අසුන් ආදීන් ගේ ලෝම හැර එළුවන් ආදීන්ගේ ලෝම හා පක්ෂි පිහාටු ආදිය ප්‍රක්ෂෙපකොට කරණලද බිසියි.

**චොල බිසි**

නව වස්ත්‍රයක් හකුළුවා හෝ රෙදි කැබිලි ඇතුලත ඔබා හෝ කරණලද බිසියි.

වැහැරි වියලා එය බහා කරණලද බිසියි.

**වාක බිසි** කෙඳිවලින් යුත් අභ්‍ය වර්ගයක් බහා කරණලද බිසිද මෙහිම ඇතුළත් වේ.

**තිණ බිසි** වියලි තණ බහා කරණලද බිසියි.

**පණ්ණ බිසි** පත්‍ර බහා කරණලද බිසියි.

**කොච්ඡ** වැහැරි-සුවඳහොඹ-මුදුතණ- බබුස්තණ- ඇතුළත් කොට කරණලද්ද කොච්ඡ නම්— මේ සිව් වැදෑරුම් සඟසතු නිසීදනයන් තගා නොතබා හෝ නො තබ්බවා නම් පචිති ඇවැත් වේ. ඇඳ පුටු ආදී සිව් වැදෑරුම් සෙනසුන් තමා නගා නො තබා හෝ අනුන් ලවා නො තබ්බවා හෝ ආපුච්ඡා නොකර උපචාර සීමාවෙන් එක් පියවරක් ඉක්මවනුයේ දුකුලා ඇවැත් වේ-දෙවන පිය ඉක්මවනුයේ පචිති වේ-පුද්ගලික වස්තු විෂයෙහි සඟසතු යන සංඥ ඇත්තේ දුකුලා වේ-පුද්ගලික වස්තු විෂයෙහි විමති ඇත්තේ දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම** ඇඳ පුටු ආදිය සඟසතු බව, අභ්‍යවකාශයෙහි ඇතිරීම, හෝ ඇතිරවීම, පීඩාවක් නැතිබව, භයක් නැතිබව, අපෙක්ෂා රහිත බව, ලෙඩ්ඩු ප්‍රහාර මාත්‍ර උපචාරය ඉක්මවීම, යන කරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. යම් භික්ෂුවක් තෙමේ සඟසතු වෙහෙර සයනය තමා පිණිස හෝ අනුන් පිණිස අතුරා හෝ අතුරවා හෝ බැහැර යන කල්හි ඒ සයනය නොම අකුලන්නේ හෝ නොම අකුලවන්නේ හෝ වේද ආපුච්ඡා නොකොට හෝ විහාරොපචාරය ඉක්මවා නම් ඒ භික්ෂුවහට විහාරසන්ථරණකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය** මෙහි සයන දශ ප්‍රකාර වේ. එනම් :— "සඞ්ඝසන්තකං භිසි චිලිමිකා-උත්තරත්ථරණං-භුම්මත්ථරණං-තට්ටිකා-චම්මඛණ්ඩො-නිසීදනං-පච්චත්ථරණං-තිණසන්ථාරො-පණ්ණසන්ථාරො"ති සඟසතු බිසිද පිරියම් කළ බිම අතුළ මතා ආස්තරණයද-මතු අතුරණ ආස්තරණයද-බුමතුරණද-තට්ටුවද-සම්කඩද-පසතුරුණද-නිසීදනචීවරයද-තෘණ පර්ණා ස්තරණයයි දශවිධ වේ. මෙම දශවිධ ශය්‍යාවන් අතුරෙන් යම් ශය්‍යාවක් නගා හෝ නොතබා හෝ නො තබ්බවා උපචාර සීමාවෙන් එක් පියවරක් ඉක්මවූ කල දුකුලා වේ. දෙවන පියවර ඉක්මවූ කල පචිති ඇවැත් වේ.

**බිසි.** සිවුරු කැබැලි කොළ ආදිය අභ්‍යන්තර යෙහි ප්‍රක්ෂෙපකොට පිටත සිවුරු ආදි යෙන් වසා කරණ ලද්ද බිසි නම්.

**චිලිමිකා.** පිරියම් කළ භූමිය හෙවත් මොනවට ඔප් නගා සකස් කරණලද භූමිය ආරක්ෂාවීම පිණිස සිවුරු කැබැලි ආදිය ගෙත්තම් කොට සකස් කරණලද ආස්තරණය චිලිමිකා නමි.

**උත්තරත්ථරණ.** ඇඳ පුටු මත්තේ අතුරණ ආස්තරණයයි.

**භුම්මත්ථරණ.** චිලිම්කා නො අතුල චිත්‍රකම් කළ භූමියෙහි අතුරණ කලාල ඇතිරියයි.

**තට්ටිකා.** තල්පත් ආදියෙන් මඩුලු යොදා කරණ ලද්දකි.

**චම්මඛණ්ඩ.** නිසීදනය සඳහා ගණු ලබන සම්කඩයි. සෙනසුන් පරිභොගයට නොවටනා සම් නැත.

**නිසීදනය.** එළු ලොම් කොට්ඨාශයෙන් කළ දශ සහිතවූ හිඳිනා චීවරයයි.

**පච්චත්ථරණ.** එළු ලොමින් කළ පසතුරුණුයි.

**තිණසන්ථාර.** තණ ඇතිරියයි. පණ්ණසන්ථාර නම්:- පත්‍ර ඇතිරියයි. මෙහි උපචාර සීමා නම් මැදුම් පුරුෂයෙකුගේ ලෙඩ්ඩු පාතවයකි. වෙයන් නො නැගෙණ සෙනාසනයෙක්හි තබා යෙත් නම් ඇවැත් නැත්තේයි. භික්ෂු සංඝයා රැස්වෙන භොජන ශාලාදී යම් තෙනක තබායේ නම් දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම.** දශප්‍රකාර සයනයන් අතුරෙන් එක්තරා සයනයක් වීම, ඒසයනය සඟ සතු බව, සඟ සතු විහාරයෙහි අනුන් ලවා ඇතිරවීම, හෝ සියතින් ඇතිරීම, පීඩාවක් නැතිබව, භයක් නැතිබව, අපෙක්ෂා රහිතබව, උපචාර සීමාව ඉක්මවා යාම, යන කාරුණු සත සම්පූර්ණ වීමෙන් ආපත්ති යට පැමිණීම වේ.

6. සංඝ සන්තක විහාරයෙහි වාසය පිණිස පළමුකොට පැමිණි ගිලන්වූ වෘද්ධ යාවෘද්ධ බවට පැමිණි භික්ෂුවක් හට සංඝයා විසින් දෙනලද බව දැන දැන ඒ භික්ෂුවට පීඩාවන පරිදි එහි මැද හිඳීම් සැතපීම් කෙරේ නම් ඒ භික්ෂුහට අනුපඛජ්ජනිසජ්ජායෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** පුද්ගලික වූවක් කොරහි සඟ සතු යන සංඥා ඇත්තේ දුකුලා වේ. පුද්ගලික වූවෙහි විමති ඇත්තේ දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම.** සඟ සතු වෙහෙරක් වනබව, නො නැගිටුවිය යුත්තෙක් බව දැනගැණීම, සයනය කරණු කැමැත්ත, ළඟ හිඳීම හෝ සයනය කිරීම, යන කාරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. යම් භික්ෂුවක් තෙමේ කිපුනු සිත්ඇත්තේ සඟසතු වෙහෙරෙන් උපසපන් භික්ෂුවක් එළවන්නේ හෝ එළවවන්නේ වීනම් ඒ භික්ෂුව හට නික්කඩ්ඪණකායෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** ඒ භික්ෂුවගේ පරිෂ්කාර වෙහෙරින් උපස්ථාන ශාලාවෙන් මණ්ඩපයෙන් වෘක්ෂ මූලයෙන් අභ්‍යවකාශයෙන් ඉවත්කරන්නේ හෝ ඉවත් කරවන්නේ වීනම් දුකුලා වේ. සුසිල්වත් භික්ෂූන්ගේ

පරිභොගයට සුදුසු ලෙස සකස් කරණලද ආරාමාදියෙන් අලජ්ජී දුසිල් වත් භික්ෂූහු නෙරපීමෙහි ඇවැත් නැත්තේයි.

8. යම් භික්ෂුවක් තෙමේ මැදුම් පුරුෂයකුගේ හිස නොවැදෙන තරම් අහසෙහි සඟසතු වෙහෙර පුවරු අතුරු ආවරණය කරණලද කිළියේ මතු මාලයෙහි තබනලද විට්ටමෙහි සවිකරණලද පා ඇති ඇඳක හෝ පුටුවක හෝ කය වතුරුවා හිඳින්නේ හෝ කය වතුරුවා හොන්නේ හෝ වීනම් ඒ භික්ෂුවහට වෙහාසකුටියෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.** මහල් දෙකකින් යුක්ත කිළියක් වීනම් එහි දෙවන මාලයද මහල් තුනකින් යුත් කිළියක තුන්වන මාලයද ගතයුතුයි. එහි මහල් සම්පාදනය මැදුම් පුරුෂයකුගේ හිස නොගැටෙන ප්‍රමාණය විය යුතුයි. එය "කඞ්ඛාවිතරණී අට්ඨුවාවෙහි" උපරිවෙහාස කුටියා උපරි අච්ඡන්නතලාය විහුම්ක කුටියා වා තිභූමක කුටියා වා පදනාජ්ජතෙ පන ඉධ අධිප්පෙතං කුටිං දසෙසතුං මජ්ඣිම පුරිසස්ස අසීස ඝට්ටාති වුත්තනත්තා" යනු දක්වේ.

**ආපත්තියට පැමිණීම.** සඟ සතු වෙහෙරක් වීම–හිස නොගැටෙන්නාවූ වෙහාස කුටියක් වීම–යටමාලය ප්‍රයොජන ගතහැකි බව–විට්ටමෙහි කුඩුම්බි වද්දනලද පා ඇති ඇඳක් හෝ පුටුවක් වීම–එහි හිඳීම හෝ සයනය කිරීම යන කරුණු සතර සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

9. මහත්වූ උල්ලිත්තාදි විහාරයක් කරවනු ලබන භික්ෂුව විසින් දොරබාව සහිත උලුවස්සෙහිද දොරබාව සහිත ජනෙල් කවුළුමෙහිද ස්ථිරත්වය පිණිස උලුවස්ස පටන් හාත්පස දොරබාවේ පළල පමණ තැන් තැවත තැවත ලිම්පනය කටයුතුයි. සෙවෙනිහුගේ දෙතුන් සෙවෙනි යක් සප්තවිධ ධාන්‍යයෙන් කිසිවක් නැති පෙදෙසෙහි සිටියහු විසින් අධිට්ඨාතව්‍යයයි. අප්පහරිතස්ථානයෙහි සිටියේ ඒ දෙතුන් සෙවෙනි යෙන් මත්තෙහි අධිෂ්ඨිත කෙළේ නම් ඒ භික්ෂුවහට කුටිලෙපනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.** අඩුවූ දෙතුන් සෙවෙනියෙහි අතිරේක සංඥ ඇත්තේ දුකුළා වේ. එහි විමති ඇත්තේ දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** මහත්වූ විහාරයක් වනබව තමාගේ වාසස්ථානය වනබව අධිවසිතකිරීම යනකරුණු තුන සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. යම්කිසි භික්ෂුවක් තෙමේ පණුවන් ඇතිබව දැන දැන ජලය මැටිවලට හෝ තෘණාදියට ඉසින්නේ හෝ ඉස්ස වන්නේ හෝ වීනම් ඒ භික්ෂුවහට උදක සිඤ්චනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.** ප්‍රාණීන් නැති ජලයෙහි සප්‍රාණිකා සංඥ ඇත්තේ දුකුළා වේ. ප්‍රාණීන් නැති ජල යෙහි විමති ඇත්තේ දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** ජලයෙහි ප්‍රාණීන් ඇතිබව දැනීම ඉසීමෙන් ඒ සතුන් මැරෙන්නේයයි දැන ගැණීම ඒ පණුවන් සහිත ජලය බව ඒ ජලය වධක චේතනාවෙන් තොරව යම්කිසි තෘණාදියක ඉසීම යන කරුණු සතර සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

## (එකොලොස්වන පරිච්ඡේදය නම් සමසතළිස් පචිති ඇවැත් රැසයි.)

1. සඞ්ඝ සම්මුතිය නොලැබූ යම් භික්ෂුවක් තෙමේ අෂ්ටවාචික උපසම්පදාව ලත් භික්ෂුණියක්හට අෂ්ට ගරු ධර්මයෙන් අවවාද කරන්නේ නම් ඒ භික්ෂුවහට පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** භික්ෂුණීන්ට අවවාද දීමට සුදුසු භික්ෂුව නම්:— සිව්පිරිසිඳු සිල් ඇතිබව-බහුශ්‍රැතබව-උභතො විභඞ්ගය හා උභය මාතෘකාව වාචොද්ගතවීම-භික්ෂුණීන්ට අවවාදදීමෙහි ප්‍රභූත්වය-ගිහිකල්හි භික්ෂුණීන්ගේ කායසංසර්ගයට හා සික්ඛමාන සාමණේරීන් හා මෙවුන්දම් සේවනයකට නොපත්බව-උපසම්පදාවෙන් විසිවස් හෝ එයින් අධික වස් ඇතිබව-මෙම අෂ්ට ගරු ධර්මයන්ගෙන් යුක්ත භික්ෂුව භික්ෂුණොවාද සම්මුතිය ලැබීමට සුදුසුසි.

**අෂ්ටවාචික උපසම්පදාව.** යම් භික්ෂුණියක් තොමෝ ප්‍රථමකොට භික්ෂුණී සංඝයා වෙතින් ලැබූ ඉක්බිති භික්ෂු සඞ්ඝයා වෙතින්ද ලැබියයුතු. භික්ෂුණී උපසම්පදා තොමෝ උභය සඞ්ඝයා විසින් ඤත්තිය දෙවරක් හා අනුශ්‍රාවණය සවරක් අස්වන හෙයින් "අට්ඨසු වාරෙසු වාචං අස්ස අත්ථි"ති යන නිර්වචන ලක්ෂණයෙන් අෂ්ටවාචික නම් වේ.

**අෂ්ට ගරු ධර්ම.** උපසම්පදාවෙන් සියක්වස් පිරුණාවූ භික්ෂුණීන් විසින් එදවස උපසම්පදාවූ භික්ෂුවට වැන්දයුතු බවය, භික්ෂූන් ලඟ නැත්තාවූ විහාරයක භික්ෂුණීන් විසින් වස් නොවිසිය යුතුබවය-මසක් පසා භික්ෂු සංඝයාගෙන් පොහෝදින විචාරීමට හා අෂ්ට ගරු ධර්මය ඇසීමට පැමිණීම බලාපොරොත්තු වියයුතු බව-වස් විසූ භික්ෂුණිය විසින් උභය සඞ්ඝයා කෙරෙහි වනන්සඳු කීමෙන් ඇසීමෙන් ගන්ධ රස ස්පර්ශයෙන් සැකකිරීමෙන් මා වරද කියනු පිණිස නිමන්ත්‍රණය කිරීමය-සංඝ තෙමේ අනුකම්පා පිණිස මට කියනු සේක්වා. වරද දන්නාවූ මම ඊට ප්‍රතිකර්ම කරන්නෙමි යි පැවරිය යුතුබවය-සඟ වෙසෙස් ඇවතට පැමිණි මෙහෙණිය විසින් උභය සඞ්ඝයා කෙරෙහි පසළොස් දිනක් මානත පිරියයුතු බවය-දෙ අවුරුද්දක් මුළුල්ලෙහි ප්‍රාණඝාත, අදත්තාදාන, අබ්‍රහ්මචරියා, මුසාවාද, සුරාපාන, විකාලභොජන යන සවැදෑරුම් ධර්මයන්ගෙන් වෙන්ව විසූ ශික්ෂමානාව උභය සඞ්ඝයා කෙරෙහි උප-

සම්පද කළයුතු බවය–භික්ෂුණියක් විසින් කිසි ආකාරයකින් භික්ෂුවක් හට ආක්‍රොශ පරිභව නොකළයුතු බව–භික්ෂුණීන් විසින් භික්ෂූන් කෙරෙහි චෝදනා නොකළයුතු බව හා භික්ෂූන් විසින් භික්ෂුණීන් කෙරෙහි චෝදනා කළයුතු බව යන කරුණු අට භික්ෂුණීන් විසින් දිවි හිමියෙන් නො ඉක්මවියයුතු හෙයින් අෂ්ට ගරු ධර්ම නම් වෙති.

ධර්ම කර්මයෙහි ධර්ම කර්ම යන සංඥ ඇත්තේ සමගි භික්ෂුණී සඞ්ඝයා වර්ගවූවන් යන සංඥ ඇත්තේ අවවාද කෙරේද දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.**

සම්මුතිය නො ලැබීම භික්ෂුණියක්හුගේ සම්පූර්ණ උපසම්පදව ඇතිබව අවවාද කිරීමෙහි පොහොසත් බැවින් අෂ්ට ගරු ධර්මය දෙසනා කිරීම යන කරුණු තුන සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. භික්ෂුණෝවාදක සම්මුතිය ලැබුවාවූ භික්ෂුවක් තෙමේ සූර්‍ය්‍යා අවරට පත්වූවායින් පසු අෂ්ට ගරු ධර්මයෙන් හෝ අන් කිසිවකින් භික්ෂුණීන්ට අවවාද කරන්නේ වී නම් ඒ භික්ෂුවහට අත්‍ථංගතයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

මෙහි සම්මුතිය නම්:— ඤත්තිය සතර වන කොට ඇති කර්ම වාක්‍යයෙන් සම්මත කිරීමයි.

**භික්ෂුණීහු**

උභතො සංඝයා වෙතින් ලත් උපසම්පදව ඇත්තියෝයි. හිරු අස්ත ගතවූ කල්හි අස්ත ගතවිය යන සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ–අස්තගත නොවූ කල විමති ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

සූර්‍ය්‍යා අස්තගතවීම, සම්පූර්ණ උපසම්පද භික්ෂුවක් වීම, අනුශාසනා කිරීම යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

3. යම් භික්ෂුවක් තෙමේ මෙහෙණවර භික්ෂුණීහු ගිලන්ව වෙසෙත් ද එම කාලය හැර අන්‍ය කාලයෙක්හි භික්ෂුණීන් වසන මෙහෙණවරට ගොස් ඔවුන්ට අවවාද කෙරේ නම් ඒ භික්ෂුවහට උපස්සයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

භික්ෂුණී උපශ්‍රය නම්:— යම් ස්ථානයෙක්හි භික්ෂුණීහු එක රාත්‍රියක් නමුත් වෙසෙත්ද එය මෙහෙණවර නමි. අෂ්ට ගරු ධර්ම හැර අන්‍ය ධර්මයකින් අවවාද කෙරේ නම් දුකුළා වේ. අනුපසම්පන්නයා කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇත්තේ දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

භික්ෂුණී මෙහෙණවරට පැමිණීම, සම්පූර්ණ උපසපන් භික්ෂුවක් වීම, සුදුසු කාලය නො වන බව, ගරු ධර්මයෙන් අනුශාසනා කිරීම යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. යම් භික්ෂුවක් තෙමේ චීවරාදී ආමිස හේතුකොටගෙණ ස්ථවිර භික්ෂූහු මෙහෙණින්නන්ට අවවාද කෙරෙත්යයි මෙසේ කියත්තේ වීනම් ඒ භික්ෂුවහට ආමිස හේතුයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය**

ආමිස නම්:— සිවුරු-පිණ්ඩපාත-සෙනසුන් - ගිලන්පස බෙහෙත් රැස වැඳුම් පිදුම් ගරුබුහුමන් ලැබීමය. සංඝයා විසින් සම්මත කරණලද හෝ සම්මත නොකරණලද හෝ අනුපසපන් භික්ෂුණොවාදකයාට ආමිස හේතුවෙන් අවවාද කෙරෙත් යයි කියා නම් දුකුළා වේ. අධර්ම කර්මයෙහි ධර්ම කර්ම යන සංඥ ඇත්තේ දුකුළා වේ. අධර්ම කර්මයෙහි විමති ඇත්තේ දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

උපසම්පද භික්ෂුවක්වීම, දැහැමින් සම්මුති ලැබූ බව, ආමිෂාපෙක්ෂාවක් නැතිබව, උපහාර කැමැතිව මෙසේ කීම යන කරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. යම් භික්ෂුවක් තෙමේ නො නෑ භික්ෂුණියක්හට මාරුකොට පෙරළා ගැන්මක් හැර හැඳීමට පෙරවීමට පොහොනා සිවුරක් දෙන්නේ වීනම් ඒ භික්ෂුවහට චීවර දානයෙහි පචිති ඇවැත් වේ. (යටකී චීවර පටිග්ගහණ ශික්ෂාපදයට කී ආපත්ති විභාග මෙහිද යෙදිය යුතුයි.) නෑ මෙහෙණ කෙරෙහි නො නෑ සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. නෑ මෙහෙණ කෙරෙහි විමති ඇත්තේ වීනම් දුකුළා වේ.

6. යම් භික්ෂුවක් තෙමේ නො නෑ භික්ෂුණියක්හුගේ සිවුරක් මහන්නේ හෝ මස්වන්නේ වීනම් ඒ භික්ෂුවහට සිබ්බනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය**

නො නෑ නම්:— මවු පසින් හෝ පිය පසින් සත්මුතු පරපුරෙන්ම කිසි සබඳකමක් නැතිබවය. එකක්හු කෙරෙන් හෙවත් (එක් පසෙකින්) ලත් උපසපුව ඇති මෙහෙණින්නකගේ චීවරය මැසීම් මැස්සවීම් කොරේනම් දුකුළා ඇවැත් වේ—නෑ සබඳ ඇති මෙහෙණ කෙරෙහි නො නෑ යන සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. ඤාතිත්වයෙහි විමති ඇත්තේද දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

ඤාතිත්වයක් නැති භික්ෂුණියෙක් සතු සිවුරක් වීම හැඳිමට පොහෝනා බව මැසීම හෝ මැස්සවීම යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. යම් භික්ෂුවක් තෙමේ කරත්ත භාණ්ඩයමක් සමග එක්වී යායුතු සැක සහිත භය සහිත මාර්ගය හැර භික්ෂුණියක් හා සමග ගිවිසගෙණ එකම දීර්ඝ මාර්ගයට යටත් පිරිසෙයින් තමන් හුන් ගමින් අන් ගමකට පිළිපන්නේ වීනම් ඒ භික්ෂුවහට සංවිධාන ගමනයෙහි පචිති ඇවැත් වේ. භික්ෂුව විසින් සංවිධාන කරණ ලදුවත් භික්ෂුණිය තොමෝ සංවිධාන නො කෙරේ ද දුකුළා ඇවැත් වේ. නියම නොකළ කල සංවිධාන කරණලදුයි යන සංඥ ඇත්තේ වීනම් දුකුළා ඇවැත් වේ. අසංවිධානයෙහි විමති ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

භික්ෂුණියක් හා භික්ෂුවක් ගිවිසගෙණ පැමිණීම, සුදුසු කාලයක් නොවීම, සැබ සම්මතයක් නැතිබව, භයක් නැතිබව, එක් ගමක් හෝ ඉක්මවීම, අඩයොදුනක් හෝ ඉක්මවීම යන කරුණු පස සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

8. යම් භික්ෂුවක් තෙමේ සරසින් එගොඩවීම හැර මෙහෙණින්න සමග ගිවිසගෙණ උඩුගං බලා යන්නාවූ හෝ යටිගම් බලා යන්නාවූ එක් නැවකට නගින්නේ වීනම් ඒ භික්ෂුවහට නාවාරොහණයෙහි පචිති වේ.

**සංලක්ෂණ**

නැගෙණියෙනි! අද හෝ හෙට හෝ අනිද්දා නැව් නගින්නෙමුයි සංවිධාන කෙරේද දුකුලා ඇවැත් වේ. භික්ෂුණිය නැව් නැගිකල භික්ෂුව නාවාභිරූහනය කෙරේද පචිති ඇවැත් වේ.

භික්ෂුව සංවිධාන නො කෙරේද භික්ෂුණී තොමෝ සංවිධාන නො කරන්නී වේද දුකුලා ඇවැත් වේ- සංවිධාන නොකළකල සංවිධාන කරණලද යන සංඥා ඇත්තේ වීනම් දුකුලා වේ. (ආපත්ති පිළිබඳ විශෙෂ විභාග පූර්ව ශික්ෂාපදයට තුල්‍යවේ.)

9. යම් භික්ෂුවක් තෙමේ ප්‍රථමකොට ගෘහස්ථයන්ගේ පටන්ගැන්මක් නැතිව භික්ෂුණියක් විසින්ම පිසන ලද්දාවූ පිණ්ඩපාතය දැන දැන අනුභව කරන්නේ වීනම් ඒ භික්ෂුවහට භික්ෂුණී පරිපාචිතයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණ**

භික්ෂුණීන් විසින් නොපිසනලද භොජනයෙහි භික්ෂුණීන් විසින් පිසනලද යන සංඥා ඇත්තේ වීනම් දුකුලා වේ. එහි විමති ඇත්තේ වීනම් දුකුලා ඇවැත් වේ.

**ආපත්තියට පැමිණීම**

මෙහෙණින්නක් විසින් පිසිනලද බව, මෙහෙණින්නක් විසින් පිසිනලද බව දැනීම ගෘහස්ථයන් විසින් නො පිසනලද බව, ඔදනාදී පඤ්චභොජනයන් අතුරෙන් එක්තරා ආහාරයක් වීම, ඒ ආහාරය වැළඳිමට පැමිණීම යන මේ කරුණු පස සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. යම් භික්ෂුවක් තෙමේ හුදකලාව හුදකලාවූ භික්ෂුණියක් සමග රහස් තන්හි නිසද්‍ය කෙළේ නම් ඒ භික්ෂුවහට රහොනිසජ්ජයෙහි පචිති ඇවැත් වේ.

රහසිගතවූයේ රහසිගත වූයේය යන සංඥා ඇත්තේ වීනම් දුකුලා වේ-එහි විමති වීනම් දුකුලා වේ. (අචෙලක වර්ගයෙහි පස්වන ශික්ෂා පදය හා සම බැව් පෙනේ.)

1. ආවාස මණ්ඩප රුක්ඛමූලාදියෙක්හි සියල්ලට දෙන පිණ්ස පනවනලද පිණ්ඩය නො ගිලන් භික්ෂුවක් විසින් එක දවසකට යැපෙන තරමට වඩා අනුභව කරන්නේ නම් ඒ භික්ෂුවහට ආවසථපිණ්ඩයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

මෙහි නො ගිලන්හු නම්:— අරමින් නික්ම අඩ යොදුනක් පමණ තැන් යාමට ප්‍රබල හැක්කෝය-එසේ නික්ම යැමට නො හැකි දුබලයෝ ගිලන්හු නම් වෙති. ගිලන් වූවනු කෙරෙහි නොගිලන් යන හැඟීම් ඇත්තහුට දුකුළා වේ. ගිලනා කෙරෙහි විමති ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

ආවසථ පිණ්ඩයක් වන බව, නො ගිලන් බව, දවස්පනා හිඳ වැළඳීම යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. යම්කිසි භික්ෂුවක් තෙමේ ගිලන් කාලය-චීවරදාන කාලය-සිවුරු මැසීම් ආදිය කරණ කාලය-දීඝී මාර්ගයට පිළිපන් කාලය-නැව් නගින කාලය-බොහෝ භික්ෂූන් රැස්වන කාලය-භික්ෂූන්ට දන් දෙන් නාවූ කාලය-යන මේ සප්තප්‍රකාර කාලය හැර අන්‍ය කාලයෙක්හි යම් භික්ෂුවක්, ගණ භොජනය වැළඳීම කෙරේ නම් ඒ භික්ෂුවහට ගණ භොජනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

පඤ්ච භොජනයන් අතුරෙන් අන්‍යතර භොජනයකින් සතර නමකට අධික භික්ෂූන්ට යම් තැනෙක්හි පවරණලද භොජනය ගණ භොජන නම්- සප්තප්‍රකාර කාලය හැර අන්‍ය කාලයෙක්හි වළඳන්නෙමියි පිළිගණිද දුකුළා ඇවැත් වේ. ගණ භොජනය නොවූවෙහි ගණ භොජනය යන සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. ගණ භොජනය නොවූවෙහි විමති ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

සතර නමකට අධික භික්ෂූන්ට පවරණ ලද ගණ භොජනයක්වීම, සුදුසු කාලය නොවන බව, ආහාරය වැළඳීමට පැමිණීම යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

3. යම් භික්ෂුවක් තෙමේ ගිලන් කාලය සිවුරු පූදන කාලය සිවුරු මැසීම් ආදිය කරන්නාවූ කාලය හැර අන්‍ය කාලයෙක්හි පළමු නිමන්ත්‍රණය කළ දායකයාගේ දානය නොවළඳ, අනික් දායකයකුගේ දානය පිළිගණීනම් ඒ භික්ෂුවහට පරම්පර භොජනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

පරම්පර භොජනය නම්:— ඔදන-කුම්මාස- සත්තු- මච්ඡ මංස යන පඤ්ච භොජනයන් අතුරෙන් පවරණලද භොජනය පරම්පර භොජනය නම්.

**මෙහි ගිලන් සමය**

එකාසනයෙක්හි හිඳ ප්‍රයොජන ඇති නාක් වැළඳීමට නො හැක්කේ වේද ඒ ගිලන් කාලයයි අනුනව කටයුතුයි.

**චීවරදාන සමය**

කඨිනය නො අතුළ වස්සාන සෘතුව පිළිබඳ පශ්චිම මාසයයි. කඨිනය අතුළ කල පඤ්ච මාසය චීවරදාන සමයයි. අනුනව කටයුතුයි.

**විචරකාර සමය**

සිවුරු කරණ කාලයයි අනුභව කටයුතුයි. මෙහි සඳහන් කාලයන් හැර අනුභව කරන්නේමියි පිළිගණීද දුකුළා ඇවැත් වේ. වැළඳීමෙහි පචිති ඇවැත් වේ. පරම්පර භොජන නොවූවෙහි පරම්පර භොජන යන සංඥ ඇත්තේ දුකුළා ඇවැත් වේ. එහි විමති ඇත්තේ වීද දුකුළාම වේ.

4. කුලයට එළඹි භික්‍ෂුවක්හට ඥතිමිත්‍රාදීන්ට ත්‍යාගිදීම පිණිස ඉදිකරණලද හෝ මාගෝපකරණ වශයෙන් සංස්කරණලද කැවුම් අග්ගලා ආදියෙන් රුචිලෙස ගැණීමට පවරන්නේ වීනම් කැමැත්තාවූ භික්‍ෂුව විසින් පිරූ දෙතුන් පාත්‍රයකට වඩා ගණීනම් ඒ භික්‍ෂුවහට චතතිපතත පටිගගහණයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය**

දෙතුන් පාත්‍රයක් පුරා ප්‍රතිග්‍රහණය කළ කැවුම් අග්ගලාදිය පිළිගත් ස්ථානයෙන් නිකුත්කොට භික්‍ෂූන් සමග බෙදිය යුතුයි- මේ විභජනය ඒ දෙතුන් පාත්‍රයක් පුරාලන් කැවුම් ආදිය පිළිගැණී මෙහි විනයානුකූල ප්‍රතිපත්තියයි.

**මෙහි කුල**

ක්‍ෂත්‍රිය- බ්‍රාහ්මණ - වෛශ්‍ය- ශුද්‍ර - වශයෙන් සිව් වැදෑරුම්ය. අඩුවූ දෙතුන් පාත්‍ර පූරණයෙහි අතිරේක සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. එහි විමති ඇත්තේද දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

පඬුරු පිණිස හෝ පාථෙය්‍ය පිණිස සකස්කරණලද කැවුම් හෝ අක්පුණු වගීයක් වීම, පඬුරුකිරීම, මාගෝපකරණයෙන් ගෙන් අවසෙස නුවූ බව, ඒ ගමන් ආදිය කෙලවර නුවූ බව, ඥාති නෑ බව, අධිකවශයෙන් පිළිගැණීම යන කරුණු පඤ්චකය සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. යම් කිසි භික්‍ෂුවක් තෙමේ වළඳන කල බෙදනු පිණිස අත්පසට ගෙණෙනලද පඤ්චවිධ භොජනයෙන් යමක් කාය වචනයෙන් පිළිකෙව් කොට අතිරිකත විනය කර්මය නොකළාවූ ඛාද්‍ය භොජ්‍යාදී ආමිෂයක් අනුභව කරන්නේ වීනම් ඒ භික්‍ෂුවහට පවාරණයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය**

පවාරිත නම් :—ඔදන–කුම්මාස–සත්තු–මච්ඡ–මංස යන මේ පඤ්චප්‍රකාර භොජනයන් අතුරෙන් එක්තරා භොජනයක් වැළඳීම පැණේද පවාරණයට සුදුසු භොජනයක් පැණේද දෙරියන් හමාරක්වූ අත්පසෙහි භොජනය අතින් ගෙණ පිළිගණුවයි කියමින් සිටි දායකයා පැණේද කායෙන් අභිමුඛයට එළඹවීම පැණේද කයින් හෝ වචනයෙන් ප්‍රතික්‍ෂෙප කිරීම පැණේද යනමේ පඤ්චඞ්ගයෙන් යුක්තවූයේ පවාරිතනම් වේ.

**ආපත්තියට පැමිණීම**

ආහාර අනුභවකිරීම- භොජනයක්වීම- අත්පසතුල අල්වාගණ සිටීම - අත්පසට එළෙව්වාට පසු කයින් හෝ වචනයෙන් හෝ වැළැක්වීම, යන කරුණු පස සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ. මේ කරුණු පස සම්පූර්ණ වීමෙන් ආහාරය පවාරණය වෙයි- ඉන්පසු ඉරියව් විකොපනය කොට නැවත අනුභව කරණු. අනුභව කරණු කැමැතිකල විනයධරයෙකු සමීපයෙහි අතිරිත්ත විනය කර්මය කොට අනුභව කටයුතුයි. මේ අතිරිත්තයාගේ අඞ්ගයෝ සත්දෙනෙකි- කැපවූ ඵලාදිය අතිරිත්ත කිරීමය- කැප වූ මස් කැප වූ භොජනය අතිරිත්ත කිරීමය- අතිරිත්ත විනය කර්මය පිණිස පැමිණියාවූ භික්ෂූන් විසින් පාත්‍රය හා තළ තැටියද විනයධරයා කරා ගොස් අතිරිත්ත කිරීමය- විනයධරයාගේ අත්පසෙහි තුබූ වස්තුව අතිරිත්ත කිරීමය- පවාරණය වියයුතු භොජනය විනයධරයා විසින් අනුභවනොකොට අතිරිත්ත කිරීමය- පවාරිතවූ භික්ෂුව විසින් හුනස්නෙන් නොනැගිට අතික් භික්ෂුවක්හුගේ භොජනය අතිරිත්ත කිරීමය-මේ සියල්ල සැහෙන්නේයයි කීමද මෙසේ අතිරිත්ත විනයකර්මය සත්පරිද්දෙකින් වන්නේයි.

පවාරිතවූ භික්ෂුතෙමේ කප්පියන් කටයුතුවූ වෘක්ෂ ඵලාදිය කප්පියන් කොට විනයධරයෙකු කරා එළඹ "අතිරිත්තං කරොථ භන්තෙ" යනු කියයුත්තේයි. විනයධරයා විසින් ඒ පාත්‍රයෙන් බත් පිඩක් හෝ ව්‍යඤ්ජන ස්වල්පයක් හෝ අනුභව කිරීමෙන් "අලමෙතං සබ්බං" යනු කියා ඒ භික්ෂුවහට ආපසු දියයුතුයි. ගිලන් භික්ෂුවට අයත්වූ ආහාරය ගිලනාගෙනුත් ඉතිරි වූයේ නම් අතිරිත්ත විනය කර්මය නොකොට කැපවන්නේයි.

**අනතිරිත්ත.**

මත්ස්‍ය-මාංස ඵලාදී භොජනයක් කැප නොකරණ ලද්දේ වේද ප්‍රතිග්‍රහණය නොකරණලද වස්තුවක් වේද- අනතිරිත්ත විනය කර්මය පිණිස පැමිණියාවූ භික්ෂුව විසින් පාත්‍රය- තළතැටිය විනයධරයා කරා එළඹ අතිරිත්ත නොකිරීමද- විනයධරයාගේ අත් පස නොතබනලද වස්තුවක් වේද පවාරණය වියයුතු භොජනය විනයධරයා විසින් අනුභව නොකරණ ලද්දේ වේද- පවාරිත භික්ෂුව විසින් හුනස්නෙන් නැගිට අතික් භික්ෂුවක්හුගේ භොජනය අනතිරිත්ත කිරීමය යන මේ සියල්ල නුසුදුසු හෙයින් අනතිරිත්ත නම් වේ.

**ඛාදනීය.**

යාමකාලික-සත්තාහකාලික-යාවජීවික- මේ ත්‍රිවිධ කාලික හැර කැයුතු පක්ව භොජනයයි.

**මෙහි යාමකාලික.**

තල්-පොල්-කොස්-ලබු-පුහුල් - කැකිරි-තියඹරා-ආදී මහා ඵලවලින් ඉතිරිවූ සිහිල් දිය මිශ්‍රකර මිරිකා ගන්නාලද ඵල පුෂ්ප පත්‍ර ආදීවූ රසයඅනුලොමපාන වර්ගයන් හා සමග මිදි-අඹ-උගුරැස්ස-කෙසෙල්-ඇටිකෙසෙල්-නෙළුම්දළි සඞ්ඛ්‍යාතවූ අෂ්ටපාන වර්ගය යාම කාලික නම් වේ. ප්‍රතිග්‍රහණය කරණලද පානවර්ගය ඇට රේණු ආදී වූ වස්තුව සහිත වීනම් නැවත ඒ රේණු ආදීවූ වස්තුව පෙරා දුන්නේ නමුදු අකැප වන්නේය.

**සත්තාහකාලික.**

කැපවූ මාංසය-අකැපවූ මාංසය ඇත්තාවූ සත්ත්වයන්ගේ කිරෙන් හටගත්තාවූ ගිතෙල් වෙඬරු-හා ඔවුන්ගේ තෙල්ද-මීපැණි-සකුරු යන පඤ්චප්‍රකාර ද්‍රව්‍යය සත්තාහ කාලික නම් වේ.

මස් කැපවූ සතුන්ගෙන් හටගත් පෙළෙහි දක්වූ නිස්සග්ගිය වස්තු වෙයි. පෙළෙහි නො ආ තෙල් ආදිය දුක්කෘත වස්තු නම් වේ. මාංස අකැප සත්ත්වයන්ගේ මස්-ලේ-ලොම්-ඇට-සම-යන පඤ්චභාගය මනුෂ්‍ය තෛලය හා සවැදෑරුම් තෛලයම කැප නොවන්නේයි. මිනිසුන්ගේ කිරි පටන් ඉතිරි සියල්ලම කැප වන්නේයි.

**යාවජීවික.**

ඒ ඒ ප්‍රදේශාදියෙහි පියෙවි ආහාර කෘත්‍යය සිද්ධ නොවන මූල-පත්‍ර-ත්වච-පුෂ්ප- ඵලාදිවූ සියල්ල යාවජීවික නම් වේ. යාවජීවිකය හා සත්තාහ කාලිකය සෙසු කාලික හා මිශ්‍රකොට අනුභව කෙලේ නම් සන්නිධිකාර පචිති ඇවැත් වේ. බොහෝ කලකට පෙර ප්‍රතිග්‍රහණය කරණලද යාවජීවිකය සත්තාහකාලිකය හා මිශ්‍රකොට වෙනස් නොවූ රස ඇත්තේ නමුදු කැප වන්නේයි. සත්තාහකාලිකය පිළිගත් දවස පටන් සතියක් ගැණ ගතයුත්තේයයි අටුවාවෙහි දක්වේ.

අනතිරිකත්ත භොජනයෙහි අතිරිකත්තය යන සංඥ ඇතිව කෑයුතු දෙයක් හෝ අනුභවකළයුතු දෙයක් කන්නේ හෝ අනුභව කරන්නේ වේනම් පචිති ඇවැත් වේ.

යාමකාලිකය-සත්තාහකාලිකය-යාවජීවිකය-ආහාර පිණිස පිළිගන්නා ලද්දේ වීනම් දුකුළා වේ.

අතිරිකත්ත භොජනාදියෙහි අනතිරිකත්ත යන සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.**

පවාරණය වීම, ආමිසය අතිරිකත්ත නො කිරීම, කාලයෙහි අනුභව කිරීම, යන කරුණු . තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

6. යම්කිසි භික්ෂුවක් තෙමේ ආහාර වළඳ ප්‍රතික්ෂෙප පවාරණයට පැමිණි භික්ෂුවක් දැන දැන රස විඳීමෙහි අපෙක්ෂා ඇත්තේ වීනම් කව අනුභව කරව කියා අතිරික්ත විනය කර්ම නොකළ ඛාද්‍යයෙන් හෝ භොජ්‍යයෙන් හෝ අභිමුඛයට එළවා පවරන්නේ ඒ අනතිරික්ත භොජනය ඒ භික්ෂුව වැළඳූකල අභිහටඨු පවාරණයෙහි පචිති ඇවැත් වේ.

**සංක්ෂෙපය.**

යාමකාලික-සත්තාහකාලික - යාවජීවික යක් ආහාරය පිණිස අභිහරණය කෙරේද දුකුළා ඇවැත් වේ. ඔහුගේ වචනයෙන් කන්නෙමි අනුභව කරන්නෙමියි පිළිගණීද දුකුළා ඇවැත් වේ. නො පවරණලද භොජන විෂයෙහි පවාරිත සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. එහි විමති ඇත්තේද දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** පවාරණය වීම, පවාරණය වූයේය යන සංඥ ඇතිබව ආසාදනය අපෙක්ෂා කිරීම, අනතිරික්ත භොජනය එලවා නිමන්ත්‍රණය කිරීම, වළඳා කෙළවර වීම, යන කරුණු පඤ්චකය සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. යම් භික්ෂුවක් තෙමේ හිරු අවරවූ තැන් පටන් පසුදව එළි වනතුරු (නොකල්හි) කඩා කැයුත්තක් හෝ වැළඳිය යුත්තක් හෝ කෑයේ නම් හෝ වැළඳුයේ නම් ඒ භික්ෂුහට විකාලභොජනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** විකාලයෙහි විකාල යන සංඥ ඇත්තේ කඩා කැයුත්තක් හෝ බුදිය යුත්තක් කන්නේ හෝ අනුභව කරන්නේ හෝ වේද පචිති ඇවැත් වේ. විකාලයෙහි කාලය යන සංඥ ඇතිව කෑ යුත්තක් හෝ බුදිය යුත්තක් කන්නේ හෝ අනුභව කරන්නේ වීනම් පචිති ඇවැත් වේ.

යාමකාලික-සත්තාහකාලික-යාවජීවිකයක් ආහාරය පිණිස පිළිගණිද දුකුලා ඇවැත් වේ. කාලයෙහි නොකල් යන සංඥ ඇත්තේ වීනම් දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම.** විකාලයවීම, යාවකාලිකයක්වීම, වැළඳීමට පැමිණීම, යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ඇවතට පැමිණීම වේ.

8. යම් භික්ෂුවක් තෙමේ තමා පිළිගත් කෑයුත්තක් හෝ වැළඳිය යුත්තක් සන්නිධිකොට තබා කෑයේ නම් හෝ වැළඳුයේ නම් හෝ ඒ භික්ෂුහට සන්නිධිකාරකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** සන්නිධිකාරක වස්තු විෂයෙහි (නිධාන් කොට තැබූ වස්තුව විෂයෙහි) සන්නිධිකාර සංඥ ඇති කඩා කෑයුත්තක් හෝ වැළඳිය යුත්තක් කෑයේ නම් හෝ වැළඳුයේ නම් පචිති ඇවැත් වේ. නිධාන් කොට තුබූ වස්තුව විෂයෙහි විමති ඇත්තේ වේද පචිති වේ. යාමකාලික-සත්තාහකාලික-යාවජීවිකයක් ආහාරය පිණිය පිළිගණිද දුකුලා වේ. නිධාන්කොට නොතබනලද වස්තු විෂයෙහි සන්නිධිකාර සංඥ ඇත්තේ වීනම් දුකුලා වේ. අසන්නිධිකාර වස්තුව විෂයෙහි විමති ඇත්තේ වීනම් දුකුලා වේ. මෙහි පිළිගන්නාලද යාවකාලිකය-යාමකාලිකය-සත්තාහකාලිකය-යාවජීවිකය-යි- තබා වැළඳීම සිව්වැදෑරුම් වේ.

පිටි-මුල්-ගෙඩි-බාණ්ඩාදිය පිළිගෙණ හිර අවර වනතුරු ප්‍රයොජන ගතහැකි සෙයින් එය යාවකාලිකයි. අනුලොම සහිත අඹපැන්-දඹපැන්-ආදී අෂ්ටවිධ පානය පසුදා එළිවනතුරු ප්‍රයොජන ගතහැකි සෙයින් එය යාමකාලිකයි. ගිතෙල්-වෙඬරු-ආදිය සත්දවසක් තබා

පරිභොග කළැහකි සෙයින් එය සත්තාහකාලිකයි. කහ–ඉඟුරු–ලූණු–ලූනු–මිරිස්–වදකහ ආදි බෙහෙත් වර්ග පිළිගෙණ ජීවිතාන්තය දක්වා පරිභොග කළහැකි සෙයින් එය යාවජ්ජීවික කාලිකයයි.

9. යම් භික්ෂුවක් තෙමේ නො ගිලන් වූයේ තමා පිණිස ගිතෙල්–වෙඬරු–තලතෙල් ආදි තෙල් මීපැණි, උක්සකුරු, දියමස්, ගොඩමස්, කිරි, දීකිරි යන මෙයින් මිශ්‍ර කරණලද හැල්, වී, යව, තණ, අමු, තිරිඟු, ගෝදමු යන සප්තවිධ ධාන්‍යයෙන් කරණලද ප්‍රණීත භොජනයන් වාක් විඥප්තියෙන් අහවා ලබාගෙණ අනුභව කරන්නේ වීනම් ඒ භික්ෂුවහට ප්‍රණීත භොජන විඤ්ඤත්තියෙහි පචිති ඇවැත් වේ. නොගිලන්වූයේ තමා සඳහා වීනවා නම් පියෝහි දුකුලා වේ.

ලැබීම සමග අනුභව කරන්නෙමියි ප්‍රතිග්‍රහණය කොරේ නම් දුකුලා වේ. ගිලන්වූයේ නොගිලන්ය යන සංඥ ඇත්තේ වීනම් දුකුලා වේ. ගිලන්වූයේ විමති ඇත්තේ වීනම් දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම.** ප්‍රණීත භොජනයක් වීම, නොගිලන්බව ඉල්වීමෙන් ලබාගැණීම, අනුභවයට පැමිණීම, යන කරුණු සතර සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. යම් භික්ෂුවක් තෙමේ ශුද්ධ ජලය හා දැහැටි දඬු හැර අන්‍ය ඛාද්‍යාදියක් දත්තකාම, අභිහාර, හත්ථපාස, ඊරණකබම, තිධාදන, මිධාගාග යන පඤ්චාඞ්ග පටිග්ගහණයෙන් නො පිළිගෙණ මුවදොරට එළවන්නේ වීනම් (වළඳන්නේ වීතම්) ඒ භික්ෂුහට අපටිග්ගහණයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** මැදුම් බලැ'ති පුරුෂයෙකු විසින් ඔසවා ගතහැකි වස්තුවක් වීම, අත් පසෙහි සිටීම ශරීරයෙන් අභිමුඛයට එළවීම, දිව්‍ය මනුෂ්‍ය තිරශ්චීනයන් විසින් කයින් හෝ කාය පිළිබඳ යමකින් දීම, භික්ෂුව විසින් කයින් හෝ කාය සම්බන්ධ යමකින් පිළිගැණීම මේ පඤ්චාඞ්ගයෙන් ප්‍රතිග්‍රහණය කිරීම වියයුතුයි.

පිළිගත් වස්තුව විෂයෙහි අප්පටිග්ගහිත සංඥ ඇත්තේ දුකුලා වේ. ප්‍රතිග්‍රහණයෙහි විමති ඇත්තේ දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම.** නො පිළි ගැණීම, අවකාශ කරණබවක් නැතිබව, අබොහාරිකයක් නොවනබව, ආහාරය වැළඳීමට පැමිණීම යන කරුණු සතර සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

1. යම් භික්ෂුවක් තෙමේ නිර්වස්ත්‍ර නිගණ්ඨයෙකුට හෝ පරිබ්‍රාජකයෙකුට හෝ පරිබ්‍රාජිකාවකට ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් සියතින් දෙන්නේ වීනම් ඒ භික්ෂුවහට අචේලක දනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** මහණ–මෙහෙණ – සික්ඛමාන– හෙරණ– හෙරණී යන පස්සහ දැමියන් හැර සෙසු තීර්ථකයෙකුට යටත් පිරිසෙයින් ජටාමඬුලු

බැඳගත්තෙකුට තමා අතින් දිය, දුහැට්දඬු තබා සෙසු වැළඳිය යුතු වස්තුවක් දේනම් දීම පිළිබඳ ඇතිවන ප්‍රයොග ගණනින් පචිති වේ. දුහැට්, දිය දුන් දුන් පියෝ ගණනින් දුකුළා වේ.

තීර්ථකයන් කෙරෙහි විමති ඇත්තේ වීනම් දුකුළා වේ. ජලය දුහැට් දඬු දේනම් දුකුළා වේ. තීර්ථක නුවූවන් කෙරෙහි තීර්ථක යන සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. තීර්ථක වූවන් කෙරෙහි විමති ඇත්තේ දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** අන්‍ය තීර්ථකයෙක් වීම, අවකාශ නො කරණලද බව, කැයුතු වස්තුවක් කණු පිණිස තමා විසින් දෙනලද බව, යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. යම් භික්‍ෂුවක් තෙමේ භික්‍ෂුවක්හට ඇවැත්නි! එව ගමට හෝ නියම්ගමට පිඬු පිණිස යම්හයි කැඳවා ගෙණ මාගමක් හා සමග හසන ක්‍රීඩා රහස් නිසජ්ජා හා අනාචාරයෙහි හැසිරෙණු කැමැත්තේ ඇවැත්නි! මට තා හා සමග කථාකිරීම හිඳීම ඵාසු නොවෙයි. හුදකලාවූ මට කථාව හෝ නිසජ්ජා පහසු වන්නේයයි කියා ඒ භික්‍ෂුවහට යම්කිසි ආමිස යක් දෙවා හෝ නොදෙවා හෝ පිටත් කරවන්නේ වීනම් ඒ භික්‍ෂුවහට උය්‍යොජනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය.** උපසපන් භික්‍ෂුව කෙරෙහි උපසපන්ය යන සංඥ ඇත්තේ පිටත්කර හරණේ වීනම් පචිති ඇවැත් වේ. අනුපසම්පන්න යෙකු පිටත්කර හරණේ වීනම් දුකුළා ඇවැත් වේ. අනුපසම්පන්නයා කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** අනාචාරයෙහි හැසිරෙණු කැමැත්ත ඒ කැමැත්ත හේතුකොටගෙණ භික්‍ෂුව පිටත් කරවීම, ඒ භික්‍ෂුවගේ දර්ශනොපචාර ශ්‍රවණොපචාරයන් ඉක්මවා යාම යන කරුණු තුන සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

3. යම් භික්‍ෂුවක් තෙමේ මෛථුන්දම් රාගයෙන් මත්වූ අඹු සැමි දෙදෙනෙක් ඇත්තාවූ ගෘහයෙහි සයනාගාරයට ඇතුල්ව දොරබා දෙරියන් වියත් අත්පස ඉක්මවා හිඳීම කරන්නේ නම් ඒ භික්‍ෂුවහට සභොජනයෙහි පචිති ඇවැත් වේ.

සයනාගාරයක් නුවූයේ සයනාගාර සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. සයනාගාරයෙහි විමති ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** රාගයෙන් මත්වූ අඹුසැමි දෙදෙනාගේ නුදුරු තන්හි හිඳීම, සයනාගාරයක් වන බව, අනික් භික්‍ෂුවක් නැතිබව, ඇතුළට වැද හිඳීම යන කරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. යම් භික්‍ෂුවක් තෙමේ රහසිගත වූයේ දොරකුඩඩ්‍යාදි පවුරකින් ප්‍රතිච්ඡන්නවූ පියෙවි නෙපුල් නො ඇසෙන තරම් තැන නිසජ්ජා කෙරේ නම් ඒ භික්‍ෂුවහට රහොනිසජ්ජයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂ්‍යය.**

මෙහි මාගම්හු නම්:- මනුෂ්‍ය ස්ත්‍රීහුයි, යක්‍ෂ, ප්‍රේත, තිරශ්චීන වූවෝ නොවෙති. යටත් පිරිසෙයින් එදවස උපන්මුත් දැරියක රහසිගත නම් දක්‍ෂිණ ශ්‍රවණ පථයට හොඳුරු නොවීමයි.

**ප්‍රතිච්ඡන්න**

භිත්ති- කවාට- තිර- ප්‍රාකාරාදි යමකින් ආවරණයයි. යක්‍ෂණියක් හෝ-ප්‍රේතියක් හෝ පණ්ඩක-තිරශ්චීනගත-මනුස්සවිග්‍රහ-ස්ත්‍රියක් හා සමග රහසිගතව ප්‍රතිච්ඡන්න ආසනයෙක්හි නිසද්‍ය කෙරේ නම් දුකුළා වේ. මාගම් නොවූවක් කෙරේ මාගම යන සංඥ ඇත්තේ වීනම් දුකුළා ඇවැත් වේ.

5. යම් භික්‍ෂුවක් තෙමේ සුදුසු කාලය හැර හුදකලාව හුදකලා මාගමක් හා සමග නොපිළිසඟ් තැන නමුදු පියෙව් තෙපුල් නො ඇසෙන තරම් තැනක නිසද්‍ය කෙරේනම් ඒ භික්‍ෂුවහට රහොනිසජ්ජ යෙහි පචිති ඇවැත් වේ.

(ආපත්ති විභාගාදිය සතරවන ශික්‍ෂාපදය හා සම වේ)

6. යම් භික්‍ෂුවක් තෙමේ සිවුරු දෙන්නාවූ කාලය සිවුරු කරන් නාවූ කාලය හැර අන්‍ය කාලයෙක්හි පඤ්චවිධ භොජනය අතුරෙන් යම් කිසිවක් ආරාධනා කරණ ලදුව කුලයන්හි හැසිරීමට සිත උපන් කල දෙලොස්රියන් අත්පස ඇති භික්‍ෂුව මෙ නම් ඇත්තහුගේ කුලයට යන්නෙමියි කියා හෝ "චාරිත්තං ආපුච්ඡාමි" කියා හෝ නො පිළිවිස නිමන්ත්‍රණය කරණලද භොජනය වැලඳීමට පූර්වභාගයෙහි හෝ පසුකාල යෙහි හෝ නිමන්ත්‍රණය කලහෙයින් අන්‍ය ගෘහයෙක්හි හැසිරීමට පැමි ණියේ නම් ඒ භික්‍ෂුවහට චාරිත්තයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂ්‍යය**

මෙහි කුල නම් :— ක්‍ෂත්‍රිය-බ්‍රාහ්මණ-වෛශ්‍ය- ශුද්‍ර-වශයෙන් සිව් වැදෑරුම් වෙත්. කුලයන්හි හැසිරීමට පැමිණීමෙහි ගෘහොප චාරය ඉක්මවන්නහුට දුකුළා වේ-පළමු පිය එළිපත ඉක්මවනුයේ දුකුළා වේ. දෙවනපිය ඉක්මවනුයේ පචිති ඇවැත් වේ.

**ආපත්තියට පැමිණීම**

පඤ්චප්‍රකාර භොජනයන් අතුරෙන් එක් තරා භොජනයකින් නිමන්ත්‍රණය කිරීම, ඉවසීම ප්‍රකටව ඇති භික්‍ෂුවක්හට ආපුච්ඡා නොකිරීමය, නිමන්ත්‍රණය කලහෙයින් අන්‍ය ගේහට වැදීම, ඉර අවර වීම, නොඉක්මවීම, ආලයක් හෝ භයක් නැතිබව, යන කාරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. යම් භික්‍ෂුවක් තෙමේ නො ගිලන් වූයේ සාරමාසයක් මුළුල්ලෙහි බෙහෙත් පසින් කරණලද නිමන්ත්‍රණය ඉවසිය යුතුයි. නැවත පැව රීමක් නැතිව නිමන්ත්‍රණයක් හෝ නැතිව ඒ නිමන්ත්‍රණය කරණලද කාලය හෝ බෙහෙත් හෝ බෙහෙත් ප්‍රමාණය හෝ ඉක්මවන්නේ වීනම් ඒ භික්‍ෂුහට භෙසජ්ජ විඤ්ඤූපනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

පවාරිත බෙහෙත් හැර අන්‍ය බෙහෙත් විනවා නම් පචිති ඇවැත් වේ. රාත්‍රි පර්‍ය්‍යන්තය ඉක්මවා අන්‍ය රාත්‍රීන්හි විනවා නම් පචිති වේ—නියමිත කාලපරිච්ඡේදයෙන් මත්තෙහි යන සංඥ ඇත්තේ විනවා නම් දුකුලා වේ—එහි විමති ඇත්තේ වීනම් දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම**

සංඝයාට නිමන්ත්‍රණය කිරීම, ඒ සංඝයා කෙරෙන් ගිලාන ප්‍රත්‍යය ඉල්වීම, නො ගිලන් බව, කාල පරිච්ඡේදය ඉක්මවීම, යන මේ කරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

8. යම් භික්ෂුවක් තෙමේ යාමට සුදුසු කරුණක් නැතිව නගරයෙන් යුද්ධය පිණිස නික්මුණු හස්ත්‍යානීකාදි සිව්රඟ සෙනඟ දැකීම පිණිස යන්නේ වීනම් ඒ භික්ෂුවහට උය්‍යුක්ත දස්සනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

යෑමට සුදුසු කරුණක් නැතිව සිව්රඟ සෙනඟ නගරයෙන් නික්මුණු කල නගරයෙන් නික්මුණේය යන සංඥ ඇත්තේ දර්‍ශණයට යේනම් පචිති ඇවැත් වේ. අනුය්‍යුක්තකල උය්‍යුක්ත යන සංඥ ඇත්තේ දුකුලා වේ—අනුය්‍යුක්තකල විමති ඇත්තේ දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම**

නගරයෙන් නික්මුණු සිව්රඟ සෙනඟ දක්නා පිණිස යාම අවසර ගන්නාලද ස්ථානයෙන් අන්‍ය දිශාවෙක්හි බැලීම, එබඳු කාරණයක් හෝ භයක් හෝ නැති බව යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

9. යුද්ධ සෙනාව කරා යාමට සුදුසු කරුණක් ඇතිකල ගොස් දෙතුන් රැයක් මුළුල්ලෙහි යුද්ධ සෙනාවෙහි විසිය යුතුයි. ඒ දෙතුන් රැයකින් මත්තෙහි වාසය කෙළේවීනම් ඒ භික්ෂුවහට සෙනාවාසයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

තුන්රැයට අඩුවූයේ අතිරේක සංඥ ඇත්තේ වීනම් දුකුලා වේ. එහි විමති ඇත්තේ වී නම් දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම**

තුන්රැයක් ඉක්මවීම, යුද්ධ සෙනාවෙහි ඇතුල්වීම, ගිලන් ආදි කාරණයක් නැති බව යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. දෙතුන් රැයක් මුළුල්ලෙහි යුද්ධ සෙනාවෙහි වසනු ලබන භික්ෂුතෙමේ නැගි නැගී යුද්ධකරණ භූමියට හෝ යුද්ධ සෙනාව ගණන් ගන්නා ස්ථානයට හෝ සෙනාබ්‍යුහයට හෝ ඇත්-අස්-රිය-පාබල යන සිව්රඟ සෙනඟ බැලීමට යන්නේ වීනම් ඒ භික්ෂුහට උය්‍යොධිකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

පුරුෂයන් දොළොස් දෙනෙකුගෙන් යුක්තවූ එක ඇතෙකු හස්ථිබ්‍යූහ නම් වේ- පුරුෂයන් තුන්දෙනෙක් හා එක අශ්වයෙකු හයබ්‍යූහ නම් වේ. පුරුෂයන් සතරදෙනෙක් සහිත එකරථය රථබ්‍යූහ නම් වේ. මේ ත්‍රිවිධ රාශියම සේනාබ්‍යූහ නම් වේ. මේ ලක්ෂණයෙන් යටත්පිරිසෙයින් ඇතුන් තුන්දෙනෙකු- අසුන් තුන්දෙනෙකු- රථ තුනක් නොහොත් පුරුෂයන් සිව්තිස් දෙනෙක් සහිත ඇතුන් තුන් දෙනෙකු පුරුෂයන් නවදෙනෙකු සහිත අසුන් තුන්දෙනෙකු පුරුෂයන් දොළොස් දෙනෙකු සහිත රථ තුනක් පිළිවෙළින් හස්ථානීක අශ්වානීක රථානීක නම්වේ. කඩුගත් අත් ඇති පුරුෂයන් සතරදෙනෙකු සේනානීක නම්වේ. මෙම බ්‍යූහයන්ගෙන් එකක් එකක් බැලීමට යේ නම් දුකුළා වේ. යම්තැනක සිට බලයිද දුකුළා වේ-දර්ශණොපචාරය විජහනය කොට නැවත නැවත බලන්නේද දුකුළා වේ.

අන්‍ය විශේෂයෝ උය්‍යුක්ත ශික්ෂාපදයට කී අයුරුයි.

1. යම් භික්ෂුවක් තෙම රහමෙර පානය කරන්නේ වීනම් ඒ භික්ෂුවහට සුරාමෙරය පානයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

පිටියෙන් කරණ පිටිසුරාය - පූවෙන් කරණ පූ සුරාය-බතින් කරන්නාවූ බත් සුරාය-සුරාබීජයෙන් කරන්නාවූ කිණ්ණ පක්ඛිත්ත සුරාය-අරළු ආදි උපකරණයෙන් කරණ ලද්දාවූ සංභාර සංයුක්ත සුරායයි මෙසේ සුරාව පඤ්ච ප්‍රකාරවේ.

මලින් පෙරන්නාවූ පුෂ්පාසවය, මුද්‍රිකාදි ඵලයෙන් පෙරන්නාවූ ඵලාසවය, මීයෙන් පෙරන්නාවූ මධ්වාසවය සකුරෙන් පෙරන්නාවූ ගුලාසවය, තිපල් ආදී ද්‍රව්‍යයෙන් පෙරන්නාවූ සංයුක්තාසවයයි මෙලෙසින් මෙයද පඤ්ච ප්‍රකාරවේ.

**පානය කිරීම**

යටත් පිරිසෙයින් තණග පිණිබිඳක් පමණකුදු පුව පචිති වේ. මද්‍ය විෂයෙහි මද්‍යය යන සංඥ ඇත්තේ පුව පචිති වේ. මද්‍යයෙහි අමද්‍යය යන සංඥ ඇත්තේ පිවද පචිතිවේ. අමද්‍යයෙහි මද්‍යය යන සංඥ ඇත්තේ දුකුළා වේ. අමද්‍ය විෂයෙහි විමති ඇත්තේ දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

සුරාමෙරයක් වන බව, රහමෙර පීම යන කරුණු වය සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. යම් භික්ෂුවක් තෙම ක්‍රීඩා'භිප්‍රායෙන් උපසපන් භික්ෂුවකගේ කාය ස්පර්ශ කෙරේනම් (කිති කවාතම්) ඒ භික්ෂුවහට අඞ්ගුලිපතොදක යෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

උපසපණනු කෙරෙහි උපසපන්ය යන සංඥ ඇතිව කිති කවා නම් පචිති ඇවැත් වේ. උපසපන් භික්ෂුව කෙරෙහි විමති ඇත්තේ හාස්‍ය පිණිස කිති කවාතම් පචිති වේ. කයින් කාය පිළිබඳ

යමක් ආමර්ශණය කෙරේ නම් දුකුළා වේ. නිස්සජ්ජනය කටයුතු වස්තුවෙන් ශරීර ස්පර්ශ කෙරේ නම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම** ක්‍රීඩාකරණු කැමැත්ත, තම හස්තයෙන් උපසපන් භික්ෂුවක්හට කිතිකැවීම යන කරුණු දෙක සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

3. යම් භික්ෂුවක් තෙමේ ජලයට බැස සිනාවට සුදුසු ක්‍රීඩා කෙරේ නම් ඒ භික්ෂුවහට උදක හස්සධම්මයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය** දියෙහි සිනාවට සුදුසු ක්‍රීඩා නම්:—යටත් පිරිසෙයින් ගොප් ඇටය ගැලෙන තරම් ජලයට බැස හාස්‍යොත්පාදනාභි වශයෙන් ගිලීම් ඉලිපීම් පීනීම් කෙරේනම් පචිති වේ. ගොප් ඇටෙන් යට ජලය ඇති තන්හි ක්‍රීඩා කෙරේනම් දුකුළා ඇවැත් වේ. බඳුන් ගත දිය හෝ කැඳ හෝ කිරි හෝ මෝරු හෝ රඳන් හෝ පස්සාව හෝ මඩ හෝ ක්‍රීඩා කෙරේනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම** යටත් පිරිසෙයින් වලලුකරක් පමණවූ හෝ ගැඹුරු ජලයක් වීම, සිනාසෙනු කැමැත්තෙන් ක්‍රීඩාකිරීම යන කරුණු දෙක සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. යම්කිසි භික්ෂුවක් තෙමේ ප්‍රඥප්ති ශික්ෂාපදයෙන් අවවාද කරණ පුද්ගලයාට හෝ ශික්ෂාවට හෝ අගෞරව කෙරේ නම් ඒ භික්ෂුවහට අනාදරයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය** මෙහි දක්වෙන අගෞරව කිරීම පුද්ගල අගෞරවය ධර්ම අගෞරවය වශයෙන් ද්විවිධවේ.

**එහි පුද්ගල අගෞරව** උපසපන් භික්ෂුවක් විසින් ප්‍රඥප්ති ශික්ෂා පදයෙන් කියනු ලබනකල මේ තෙම උක්ෂෙපනීය කර්මය කරණ ලද්දෙක. ගර්හා කටයුත්තෙකැයි කියා මොහුගේ වචනය නොකටයුතු වන්නේයයි කීම පුද්ගල අගෞරවයයි.

**ධර්ම අගෞරවය** උපසපන් භික්ෂුවක් විසින් ප්‍රඥප්ති ශික්ෂා පදයෙන් කියනුලබන කල එම ධර්ම ගාථාව නසා හෝ වනසා හෝ අතුරුදහන් කර වන්නේ හෝ ශික්ෂණය නොකටයුත්තකැයි කියමින් අනාදර කෙරේ නම් එය ධර්ම අගෞරවයයි.

උපසපන් භික්ෂුව කෙරෙහි උපසම්පන්නය යන සංඥා ඇතිව අනාදර කෙරේනම් පචිති ඇවැත් වේ. උපසපන් භික්ෂුවක් විසින් නො පනවන ලද්දෙන් කියනු ලබනකල මෙය සැහැල්ලු ප්‍රතිපදාව පිණිස, ධූතාඞ්ග පිණිස, ප්‍රසන්නතාවය පිණිස, නො පවත්නේයයි කියාතම්

දුකුලා වේ. අනුපසපන්නෙකු විසින් ප්‍රඥප්ති ශික්‍ෂාපදයෙන් කියනු ලබන කල මෙය සල්ලෙඛ ප්‍රතිපදාව පිණිස නොවෙයි. ප්‍රසන්නත්වය පිණිස නො පවතීයයි යනාදි ලෙසින් කියාතම් දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම** භික්‍ෂුවක් විසින් ප්‍රඥප්තියෙන් කීම, ඒ කියන පුද්ගලයාට හෝ ධර්මයට අනාදර කිරීම යන දෙකරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. යම් භික්‍ෂුවක් තෙමේ භය උපදවනු රිසි ඇතිව උපසපන් භික්‍ෂුවක් හමුවෙහි භයජනක අරමුණු තබන්නේ හෝ භයජනක විලාස දක්වන්නේ හෝ වීනම් ඒ භික්‍ෂුවහට භිංසාපනකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය** භය ඉපදවීම, උපසපන් භික්‍ෂුවක් තෙමේ උපසපන් භික්‍ෂුවක් භය කරවනු කැමැත්තේ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ-උපසංහරණය කෙරේද එයින් හෙතෙම භයවූයේ හෝ නොවූයේ පචිති ඇවැත් වේ. චොර කන්තාර හෝ, ව්‍යාල කන්තාර හෝ, පිශාච කන්තාර හෝ කියාද එහි භයවූයේ හෝ නොවූයේ පචිති ඇවැත් වේ.

උපසපන් භික්‍ෂුව කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇත්තේ භය කරවා නම් පචිති ඇවැත් වේ. උපසම්පන්නයා කෙරෙහි විමති ඇත්තේ භයකරවා නම් පචිති ඇවැත් වේ. අනුපසම්පන්නයෙකු භය කරණු කැමැත්තේ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ-උපසංහරණය කෙරේද හෙතෙම එයින් බියවූයේ හෝ නොවූයේ දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම** උපසම්පදා භික්‍ෂුවක් වීම, ඒ භික්‍ෂුවගේ දර්ශනපථයෙහි ශ්‍රවණ පථයෙහි හෝ, භයානක රූපයක් හෝ, ශබ්දයක් හෝ, පෙන්වා හෝ, අස්වා හෝ, භයකිරීමට උත්සාහ කිරීම යන දෙකරුණ සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

6. යම් භික්‍ෂුවක් තෙමේ පාත්‍ර පිසීම් පහන් දල්වීම් ආදි කාරණයක් හැර ගිනිතැපීම් යන අපේක්‍ෂා ඇතිව නො ගිලන් වූයේ තෙමේ ගිනි දල්වන්නේ හෝ අනුන් ලවා දල්වන්නේ හෝ වීනම් ඒ භික්‍ෂුහට ජෝතිසමාදහනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය** ගිනි දල්වීම පිණිස ගිනිපෙනෙලි ඔසවාද දුකුලා වේ-ගිලනා කෙරෙහි නොගිලන්ය යන සංඥ ඇත්තේ වීනම් දුකුලාවේ-ගිලනා කෙරෙහි විමති ඇත්තේ දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම** නොගිලන් බව, අවසරලද කරුණක් නැතිබව, ගිනි තපිනු කැමැත්ත, ගිනිදල්වීම යන කරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. මධ්‍යමණ්ඩලවාසී යම් භික්ෂුවක් තෙමේ උණ්හසමය-පරිළාහ සමය-ගිලානසමය- කම්මසමය- අද්ධානගමන සමය- වාතවුට්ඨිසමය-යන සවැදෑරුම් කාලයන් හැර ජලස්නානය කළ දවස පටන් අඩමසක් සම්පූර්ණ නොවූ කාලය තුළ ජල ස්නානය කරන්නේ නම් ඒ භික්ෂුවහට නහානයෙහි පචිති ඇවැත්වේ.

**සංලක්ෂ්‍යය**

උණ්හ සමය නම් :— ග්‍රීෂ්ම ඍතුව පිළිබඳ සාරමස්හුගේ අවශෙෂවූ අඩකින් යුක්ත මසකි. ඒ මේ කාලය උෂ්ණ කාලයයි.

**පරිළාහ සමය**

වර්ෂා ඍතුහුගේ පළමුවෙනි මාසය පරිළාහ සමයයි. මේ උෂ්ණ සමය පරිළාහ සමය කාලයෝ තුමූ දෙමස් පසළොස් දවසකි.

**ගිලාන සමය**

යමෙක්හට ජල ස්නානයෙන් තොරව පහසු නොවේද එය ගිලන් සමයයි.

**කම්ම සමය**

මළු පෙත්මන් හැමදුම් ආදි කම් කරන්නාවූ කාලයයි,

**අද්ධාන මග්ග සමය**

අඩයොදුන් පමණවූ මාර්ගයට යන්නාවූ කාලයයි. හෙවත් යමින් පවත්නා කාලය හොහොත් ගොස් අවසානවූ කාලයයි.

**වාතවුට්ඨි සමය**

දූවිලි සහිතවූ වාතය නැගී වැසි වස්නා කාලයයි. මෙහි දක්වූ සවැදෑරුම් කාලයන්හි ජල ස්නානය කළයුතුයි. මේ අවස්ථාව හැර ජල ස්නානය කළතැන් පටන් පසළොස් දිනක් සම්පූර්ණ නොවූ කාලය ඇතුළත ජල ස්නානය පචිති වේ. ඌනාඩ්ඪ මාසයෙහි ඌණක සංඥ ඇත්තේ සුදුසු කල්හැර ජල ස්නානය කෙළේනම් පචිති ඇවැත් වේ. අඩමසට වැඩිවූකල ඌණක සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. අතිරෙකාඩ්ඪ මාසයෙහි විමති ඇත්තේ වීනම් දුකුළාවේ

**ආපත්තියට පැමිණීම.**

මධ්‍යම ප්‍රදෙශයෙහි අඩමස සම්පූර්ණ නොවීම, ගඞ්ගාවෙන් එතරව යාමක් හෝ භයක් නැතිබව යන සාරැණු අඟ සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

8. යම්කිසි භික්ෂුවක් තෙමේ ඇඳීමට පෙරවීමට පොහොනා පරිභොග නොකළ සිවුරක් නීලවර්ණ, කද්මවර්ණ, කාලවර්ණ යන ත්‍රිවිධ වර්ණයන්ගෙන් යම්කිසි වර්ණයකින් මකුණුපිට පමණ හෝ මොණර ඇස තරම හෝ කප් බිඳු නොතබා පරිභොග කෙරේ නම් ඒ භික්ෂුවහට දුබ්බණ්ණ අනාදානයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.**

නුදුන්කල නුදුන්නේය යන සංඥ ඇත්තේ පරිභොග කෙරේද පචිති ඇවැත් වේ. යමෙකුට නුදුන්කල විමති ඇත්තෝ දුකුළා ඇවැත්වේ.

**ආපත්තියට පැමිණීම**

කප් බිඳු නොතැබීම, සිවුරු නැතිවීම ආදි ප්‍රත්‍යයක් නැතිබව, හැඳීම හෝ පෙරවීම යන කරුණු තුන සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

9. යම් භික්‍ෂුවක් තෙමේ භික්‍ෂුවකට හෝ භික්‍ෂුණියකට හෝ ශික්‍ෂමාණාවක් හට හෝ ශ්‍රාමණේරයක් හට හෝ ශ්‍රාමණේරියක් හට හෝ විකපුන් කරණලද පච්චුද්ධරණය නොකල අතිරේක චීවරයක් පරිභොග කරන්නේනම් ඒ භික්‍ෂුවහට විකප්පනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය.**

අතිරේක චීවරාදිය රැගෙන ව්‍යක්ත භික්‍ෂුවකගේ අත්පසට පැමිණ උක්කුටුක යෙන් හිඳ "ඉමං චීවරං තුය්හං විකප්පෙමි" යි තුන්යලක් කියා දීමයි. එය සම්මුඛ අපරසම්මුඛ පරසම්මුඛ විකප්පනයයි තුන් ප්‍රකාර වේ. එහි ප්‍රයොජනය විනය නොවිචාරිකයාහටද පඬු නොපොවනලද චීවර වස්ත්‍ර ප්‍රවේසම් කර ගැණීමට අවකාශ දීමයි.

**විකපුන්.**

සම්මුඛයෙහි විකපුන් කිරීම අසම්මුඛ යෙහි විකපුන් කිරීමයයි දෙ පරිදි වේ. එහි සම්මුඛ විකප්පනය නම් "ඉමං චීවරං තුය්හං විකප්පෙමි"යි විකපුන් කිරීමයි.

**පරම්මුඛ විකප්පන.**

"ඉමං චීවරං විකප්පනත්ථාය තුය්හං දම්මි" යි මෙය විකපුන් කිරීම පිණිස තට දෙමියි කියා විකපුන් කිරීම පරම්මුඛ විකප්පන යයි.

**පච්චුද්ධරණය.**

අධිෂ්ඨාන උගුළුවන්නාවූ පච්චුද්ධරණය විකප්පනය පෙරලන්නාවූ පච්චුද්ධරණයයි දෙවැදෑරුම් වේ. ඔවුනතුරෙන් මෙහි විකප්පන පච්චුද්ධරණය යෙදෙන්නේයි. දිගින් එක් රියන් ගමාරක්ද පුළුලින් එක්වියත් සාඟුලෙක්ද පමණ ඇත්තාවූ චීවරය හෝ වස්ත්‍රය අධිෂ්ඨාන හෝ විකප්පනය කටයුතුයි.

**ආපත්තියට පැමිණීම**

තමාම විකපුන් කල සිවුර පච්චුද්ධරණය නොකිරීම, විකප්පනය කිරීමට සුදුසුබව, පරිභොගකිරීම, යන ත්‍රිවිධ කාරණයන් සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. යම් කිසි භික්‍ෂුවක් තෙමේ උපසපන් භික්‍ෂුවක් අයත් අධිෂ්ඨාන කළ පාත්‍රයක් හෝ සිවුරක් හෝ නිසීදනයක් හෝ ඉඳිකටු කුලාවක් හෝ පටියක් හෝ යටත් පිරිසෙයින් සිනාසෙන අදහසින් තෙමේ සඟවා තබන්නේ හෝ අනුන් ලවා සඟවා තබා නම් හෝ ඒ භික්‍ෂුවහට අපනිධානයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය.**

මෙහි පාත්‍ර නම්:– අයොමය පාත්‍රය, මැටි මය පාත්‍රයයි පාත්‍ර දෙකකි.

**චීවර.** කොමුපිළිය, තිහිරිපිළිය, කපුපිළිය, සණ වැහැරි පිළිය, මුසු පිළිය, පලසය යන සවැදෑරුම් සිවුරු ජාති හෙයින් කැප සිවුරුයි.

**නිසීදන.** සුගත් වියතින් දෙවියතක් දික්වූද පුළුල එක්වියත් හමාරක්වූද දහය වියතක් ප්‍රමාණවූද නිසීදනය පිණිස ගනු ලබන චීවර යයි.

**කාබාන.** හැඳරටා පටිය—දුනුපසියක් බඳු නූරු අතුණු පටියයි දෙවැදෑරුම් වේ.

මෙයින් පිටත් අන්‍ය පරිෂ්කාරයක් ක්‍රීඩා පිණිස තෙමේ සඟවන්නේ හෝ අනුන් ලවා සඟවා නම් හෝ දුකුළා වේ. අනුපසපන්නෙකු පිළිබඳ පාත්‍රයක් හෝ සිවුරක් හෝ අන්‍ය පරිෂ්කාරයක් හෝ හාස්‍ය පිණිස සඟවා තබන්නේ හෝ තබවන්නේ වීනම් දුකුළා වේ. අනුපසපන්නහු කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇත්තේ සඟවා තබා නම් දුකුළා ඇවැත් වේ.

**ආපත්තියට පැමිණීම** භික්ෂූන් අයත් පාත්‍රාදි පරිෂ්කාරයක් සැඟවීම හෝ සඟවන බව, වෙහෙස කරණු කැමැත්ත හෝ සිනාසෙනු කැමැත්ත යන කාරණාවය සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

1. යම් භික්ෂුවක් තෙමේ සත්වයෙක යන සංඥව හා සමග හටගත් නසනු කැමති චෙතනාවෙන් උත්සාහකොට තිරිසන්ගත සත්වයෙකු ජීවිතෙන්ද්‍රියයෙන් හෙළන්නේ වීනම් ඒ භික්ෂුවහට පාණිජීවිතාරොපන යෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** මෙහි ප්‍රාණිහු නම් තිරිසන් ගත ප්‍රාණිහුයි. ප්‍රාණියෙකු කෙරෙහි ප්‍රාණියෙක යන සංඥ ඇත්තේ ජීවිතෙන්ද්‍රියයෙන් තොර කෙරේ නම් පචිති වේ. ප්‍රාණියා කෙරෙහි විමති ඇත්තේ දිවි තොර කෙරේ නම් දුකුළා ඇවැත් වේ. අප්‍රාණියෙකු කෙරෙහි ප්‍රාණියෙක යන සංඥ ඇත්තේ දුකුළා වේ.

(ආපත්ති පිළිබඳ අන්‍ය විස්තරයෝ පරිජි ඇවතට සමානයි.)

2. යම් භික්ෂුවක් තෙමේ සතුන් මැරේයයි දූන දූන ප්‍රාණීන් සහිත ජලය පරිභොග කරන්නේ වීනම් ඒ භික්ෂුවහට සප්පාණකායෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** සප්‍රාණීහු කෙරෙහි සප්‍රාණික යන සංඥ ඇත්තේ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වේ. සප්‍රාණීහු කෙරෙහි විමති ඇත්තේ පරිභොග කෙරේ නම් දුකුළා වේ. අප්‍රාණික සත්වයන් කෙරෙහි සප්‍රාණික සංඥ ඇත්තේ දුකුළා වේ. අප්‍රාණිහු කෙරෙහි විමති ඇත්තේ දුකුළා වේ.

(ආපත්තිභේදාදි විස්තර සිඛවත ශික්ෂාපදයට සමානයි.)

3. යම් භික්ෂුවක් තෙමේ දහම්වූ පරිදි සමථයට පැමිණි භණ්ඩනාධිකරණය දුන දුන තැවත විනිශ්චය කර්මය පිණිස අධිකරණයට පමුණුවා නම් ඒ භික්ෂුවහට උක්කොටණකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

මෙහි අධිකරණ නම්,— විවාදධිකරණ, අනුවාදධිකරණ, ආපත්තාධිකරණ, කිච්චාධිකරණ– යි සිව් වැදෑරුම් වේ.

**විවාදධිකරණ.**

යම් භික්ෂු කෙනෙක් දශකුසල කර්මපථ සඞ්ඛ්‍යාත ධර්මය දශ අකුසල කර්මපථ සඞ්ඛ්‍යාත අධර්මයයි ප්‍රකාශ කෙරේද, රාගාදීන්ගේ නොහික්මීමයයි කියනලද අවිනය ධර්මය විනය ධර්මයයි (හෙවත්) රාගාදීන්ගේ හික්මීමයයි ප්‍රකාශ කෙරේද්ද, රාගාදීන්ගේ හික්මීමයයි කියනලද විනය රාගාදීන්ගේ නොහික්මීමවූ අවිනයයි ප්‍රකාශ කෙරේද්ද තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්ද ප්‍රකාශ නොකරණ ලද්ද තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්දේය කථනය කරණ ලද්දේයයි ප්‍රකාශ කෙරේද්ද, තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්ද කථනය කරණ ලද්ද, තථාගතයන් වහන්සේ විසින් නොවදාරණ ලද්දේය, කථනය නොකරණ ලද්දේයයි දක්වත්ද, පුරුදු නොකරණ ලද්ද පුරුදු කරණ ලද්දේයයි ප්‍රකාශ කෙරේද්ද, පුරුදු කරණ ලද්ද පුරුදු නොකරණ ලද්දේයයි ප්‍රකාශ කෙරේද්ද, නො පනවන ලද්ද පනවන ලද්දේයයි ප්‍රකාශ කෙරේද්ද, පනවන ලද්ද නො පනවන ලද්දේයයි ප්‍රකාශ කෙරේද්ද යන අෂ්ටාරස විවාද වස්තු හේතුකොටගෙණ යම් විවාදයෙක් ඇත්තේ වේද එය විවාදධි කරණ නම් වේ.

**අනුවාදධිකරණය.**

සීල විපත්ති, ආචාර විපත්ති, දිට්ඨි විපත්ති, ආජීව විපත්ති යන මේ සිව්වැදෑරුම් විපත්තීන් හේතුකොටගෙණ චෝදනා කිරීම අනුවාදධිකරණ නම් වේ.

**ආපත්තාධිකරණ.**

සත්වැදෑරුම් ආපත්ති ස්කන්ධයන් හේතුකොටගෙණ පවත්නා අධිකරණය ආපත්තාධිකරණ නම් වේ.

**කිච්චාධිකරණ.**

අපලෝකනාදි කර්ම හේතුකොටගෙණ පවත්නා අධිකරණය කිච්චාධිකරණ නම් වේ.

ධර්ම කර්මයෙහි ධර්ම කර්මය යන සංඥ ඇත්තේ උක්කොටනය කෙරේ නම් පචිති ඇවැත් වේ. ධර්ම කර්මයෙහි විමති ඇත්තේ උක්කොටනය කෙරේ නම් දුකුළා වේ. අධර්ම කර්මයෙහි ධර්ම කර්මය යන සංඥ ඇත්තේ වී නම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

ධර්ම වූ පරිදි අධිකරණය සංසිඳවූ බව එසේ සංසිඳවූ බව දැනීම, උසස්කොට සෙලවීම, යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. යම් භික්ෂුවක් තෙමේ උපසපන් භික්ෂුවක්හුගේ ඖදරික ඇව තක් (හෙවත්) සඞ්ඝාදිසේසාපත්තියක් දැන දැන වසන්නේ වීනම් ඒ භික්ෂුව හට දුට්ඨුල්ලාපත්තියක් පිළිසන් කිරිමෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** දුට්ඨුල්ලාපත්තියෙහි දුට්ඨුල්ලාපත්තිය යන සංඥ ඇත්තේ සඟවා නම් පචිති ඇවැත් වේ. දුට්ඨුල්ලාපත්තියෙහි විමති ඇත්තේ වසා නම් දුකුළා වේ. දුට්ඨුල්ලාපත්ති විෂයෙහි අදුට්ඨුල්ලාපත්තිය යන සංඥ ඇත්තේ පටිච්ඡාදනය කෙරේ නම් දුකුළා වේ. අදුට්ඨුල්ලාපත්තිය ප්‍රතිච්ඡාදනය කෙරේ නම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම** උපසම්පද භික්ෂුවක් දුට්ඨුල්ලාපත්තිය කට අවත් බව, දැනිම වසනු කැමැත්තෙන් ආපත්ති ආරෝචනය නොකෙරෙමියි ධුර නික්ෂෙප කිරීම යන කාරුණු දෙක සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. යම් කිසි භික්ෂුවක් තෙමේ දැන දැන ප්‍රතිසන්ධියෙහි පටන් විසි වයස් සම්පූර්ණ නොවූ පුද්ගලයෙකු උපසම්පද කරන්නේ වීනම් ඒ උපසම්පද ලබන්නාවූ පුද්ගල තෙමේ අනුපසම්පන්නයෙක් වෙයි. කාරක භික්ෂූහුද ගැරහිය යුත්තාහු වෙති. (දුෂ්කෘතාපත්තියට පැමිණෙන්නාහු වෙති.) උපාධ්‍යාය භික්ෂුවහට ඌනවීසතියෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය** ඌණු විසිවයස් පුද්ගලයා උපසම්පද කරන්නෙමියි ගණයා හෝ ආචාර්‍ය්‍යයා හෝ පාත්‍රය හෝ චීවරය හෝ පරියෙසණය කෙරේද සීමාව හෝ සම්මත කෙරේද මේ හැම පියෝගිම දුකුළාවේ-ඤත්ති වාක්‍ය කීමෙහිද දුකුළාවේ. කම්මවාකිය දෙවරක් කියනුයේ දුකුළාවේ-කම්වාක්‍ය අවසන්කළ කල උපාධ්‍යායයාට පචිති ඇවැත වේ-ගණයාටද ආචාර්‍ය්‍යයාටද දුකුළාවේ-සපිරුණු විසිවයස් ඇති පුද්ගලයා කෙරෙහි ඌණු විසිවයස්ය යන සංඥ ඇත්තේ වීනම් දුකුළා ඇවැත් වේ-පිරිපුන් විසිවයස් ඇත්තහු කෙරෙහි විමති ඇත්තේ වීනම් දුකුළාවේ.

**ආපත්තියට පැමිණීම** විසි වයස් නොපිරීම, විසිවයස් නො පිරුණේය යන සංඥ ඇතිබව, උපසම්පද කිරීම යන කාරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

6. යම් භික්ෂුවක් තෙමේ දැන දැන සුංකඝාතනය කරණු කැමති සොර ගැල් භාණ්ඩයක් සමග ගිවිසගෙණ එක දීර්ඝ මාර්ගයට පිළිපන්නේ යටත් පිරිසෙයින් ග්‍රාමාන්තරයකටද පිළිපන්නේ වීනම් ඒ භික්ෂුවහට ථෙය්‍ය සත්ථයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය** සොර ගැල් සමූහය කෙරෙහි සොර ගැල් සමූහය යන සංඥ ඇත්තේ ඔවුන් සමග ගිවිසගෙණ දීර්ඝ මාර්ගයට පිළිපන්නේ වීනම් පචිතිවේ-සොර ගැල් විෂයෙහි විමති ඇත්තේ ගිවිසගෙණ දීර්ඝමාර්ගය

යටත් පිරිසෙයින් ග්‍රාමාන්තරයද ඉක්මවන්නේ වීනම් දුකුළාවේ. භික්ෂුව ගිව්ස්සේ මනුෂ්‍යයෝ හොම ගිවිස්සෝ නම් දුකුළා ඇවැත්වේ. නො සොර ගැල් සමූහයෙහි සොර ගැල් සමූහය යන සංඥ ඇත්තේ දුකුළාවේ.

**ආපත්තියට පැමිණීම**

සොර වෙළෙන්දෙක් වනබව, සොර වෙළෙන්දෙක් බව දැනගැන්ම, මන්ත්‍රණය කිරීම, එකවිට යෑම, යන කරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. යම් භික්ෂුවක් තෙමේ මාගමක් සමග මන්ත්‍රණයකොට ගෙණ දීර්ඝ මාර්ගයට පිළිපන්නේ යටත් පිරිසෙයින් ග්‍රාමාන්තරයටද පිළිපන් නේ වීනම් ඒ භික්ෂුවහට සංවිධාන ගමනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

මාගමක් කෙරෙහි මාගමකය යන සංඥ ඇත්තේ ගිවිසගෙණ දීර්ඝ මාර්ගයට පිළිපන් නේ යටත් පිරිසෙයින් ග්‍රාමාන්තරයටද පිළිපන්නේ වීනම් දුකුළා ඇවැත්වේ. මාගම කෙරෙහි විමති ඇත්තේ ගිවිසගෙණ දීර්ඝ මාර්ගයට පිළිපන්නේ වේද යටත් පිරිසෙයින් ග්‍රාමාන්තර යටද පිළිපන්නේ වීනම් දුකුළා ඇවැත්වේ.

(ආපත්ති විභංගාදි විශෙෂයෝ භික්ෂුණියක් හා සමග මන්ත්‍රණයකොට එක්ව යන්නාවූ ශික්ෂා පදයෙහි කියනලද ක්‍රම මැයි.)

8. “භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වර්ගමොක්ෂාවරණයයි වදාරණ ලද අන්තරයකර ධර්මයන් සේවනය කරන්නාහට අන්තරාය පිණිස නො පවත්නා බැව් (හෙවත්) බුද්ධවචනය වරද බැව් මම දනිමියි” යම්කිසි භික්ෂුවක් තෙමේ කියන්නේද එය ඇසූ දුටු සෙසු භික්ෂූන් විසින් දෘෂ්ටිවිපන්න එම භික්ෂුවහට ඇවැත්නි! “එසේ නොකියව, භාග්‍යවත්හට ගර්හා නොකරව” භාග්‍යවත්හට ගැරහීම නොමැනවි. භාග්‍යවතුන්වහන්සේ මෙසේ නොවදාරන්නේ මැයි යනාදි වශයෙන් තුන්යලක් අවවාද කළයුතුයි. එසේද කියනු ලබන්නේ දෘෂ්ටිය නො හරිනම් සෙසු භික්ෂූන් විසින් එය හරවනු පිණිස දෘෂ්ටිය නොහැරීමෙහි උක්ෂෙපණීය කර්මය කළයුතුයි. එසේ කරණු ලබන කලත් දෘෂ්ටිය අත් නොහලේ නම් ඒ භික්ෂුවහට දිට්ඨිඅපපටි නිස්සජ්ජනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

මෙහි භික්ෂු යනු නම් උපසම්පදාවට පැමිණි භික්ෂු තෙමේයි. හෙතෙම මෙසේ කියන්නේය යනු නම්—බුදුන්වහන්සේ විසින් දෙසිත ධර්මය මම දනිමි—යම් ලෙසකින් බුදුන්වහන්සේ විසින් අන්තරාය කර ධර්මයෝ යයි වදාරණ ලද්දෑහු ඒ ධර්මයන් ප්‍රතිසේවනය කරන්නහුට අන්තරාය කර නොවේය කියායි. මෙලෙසින් පවසන යම් භික්ෂුවක් වේද ඒ භික්ෂුවගේ අවවාද ඇසුවාවූ අන්‍ය භික්ෂූන් විසින් මෙසේ කියයුතුයි. කෙසේද? ඇවැත්නි! මෙසේ නොකියව් භාග්‍ය වතුන්වහන්සේට ගර්හා නොකරව භාග්‍යවතුන්වහන්සේට ගර්හා කිරීම නොමැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නේ මැයි, ස්වර්ග

මොක්ෂයන්ට අන්තරාය කර ධර්මයෝ අන්තරාය කර ධර්මයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. එහෙයින් ඒ අන්තරාය කර ධර්ම ප්‍රති සේවනයෙන් වෙන්වේවයි තුන්ගලනෙක් අවවාද කිරීමෙන් දෘෂ්ටිය අත්හලේ නම් මැනවි. ඉදින් අත් නොහලේ නම් දුකුළා ඇවැත් වේ. ඤත්ති අවසන් වනතුරු දෘෂ්ටිය නොහලේ නම් දුකුළාවේ. කර්මවාක්‍ය දෙවරක් කියනුයේ දෘෂ්ටිය නොහලේ නම් දුකුළාවේ. කර්මවාක්‍ය අව සන් කළ කල්හි පචිති ඇවැත්වේ. අධර්ම කර්මයෙහි ධර්මකර්මය යන සංඥ ඇත්තේ වීනම් දුකුළාවේ. අධර්ම කර්මයෙහි විමති ඇත්තේ වීනම්ද දුකුළාවේ.

**ආපත්තියට පැමිණීම** කර්මයක් වනබවය—අවවාද කිරීමය, දෘෂ්ටිය අත්නොහැරීමය යන කරුණු තුන සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

9. යම් භික්ෂුවක් තෙමේ භික්ෂූන් වෙතින් නෙරපනලද භික්ෂුවක් බව දැන දැන ඒ මිථ්‍යාවාද ඇත්තාවූ නොකරනලද ඕසාරණ කර්ම සඞ්ඛ්‍යාත ධර්ම කර්ම ඇත්තාවූ එම මිථ්‍යාදෘෂ්ටිය අත්නොහැරියාවූ ක්ෂුද්‍ර මහත් විනය කර්මයන් කරන්නේ හෝ එක්ව එක් ඡදනයකින් යුක්ත විහාරයෙක්හි සයනය කරන්නේ වීනම් ඒ භික්ෂුවහට උක්ඛිත්ත සං භොගයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය** උක්ෂේපණ කර්මය නොකරනලද භික්ෂුව කෙරෙහි උක්ෂේපණීය කර්මය කරනලද යන සංඥ ඇත්තේ ධර්මාමිස සංභොග කෙරේද දුකුළාවේ. භික්ෂූන් වෙතින් නෙරපීම නොකරනලද භික්ෂුව කෙරෙහි විමති ඇත්තේ වීනම් දුකුළාවේ.

**ආපත්තියට පැමිණීම** ඕසාරණ කර්මයකින් ඇතුළත් නොකිරීම, උක්ෂේපණීය කර්මය කරණු ලැබූවෙක් බව දැනීම, සංභොගාදිය කිරීම යන කරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වර්ග මොක්ෂාවරණයයි වදාරණ ලද අන්තරායකර ධර්මයන් සේවනය කරන්නාහට අන්තරාය පිණිස නොපවත්නා බැව් (භගවත්) බුද්ධවචනය වැරැදි බැව් මම දනිමියි යම් සාමණේරයෙක් කියාද ඒ හෙරණහට භික්ෂූන් විසින් මෙසේ කියයුතු වෙයි. ඇවැත්නි! හෙරණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ උපවාද නොකරව භාග්‍යවතුන් වහන්සේට උපවාද කිරීම නොමැනවි මෙලෙසින් තුන්යලක් අවවාද කොටත් තම දෘෂ්ටිය එසේම දැඩිකොට ගත්තේ වේද භික්ෂූන් විසින් ඒ හෙරණහට මෙසේ කියයුතුයි, එම්බා හෙරණ! අද පටන් තොප විසින් ඒ භාග්‍යවතුන්වහන්සේ ආචාර්යයීහයි නො දැක්විය යුතුයි. තොප සොරෙන් අන්‍යවූ යම් හෙරණෙක් තුමූ භික්ෂූන් හා සමග දෙතුන් මාසයක් මුළුල්ලෙහි එක් සෙවෙනියක් හා එක් බිත්ති යක් ඇති විහාරයෙක්හි එක්ව සයනය කිරීම ලබන්නාහු වේද්ද ඒ සහ සෙය්‍යාවද තා හා සමග නොලැබිය යුත්තේයි. බුදුන් කෙරේ මමත්වය නැත්තාවූ නීච සාමණේරය! සඞ්ඝාරාමයෙන් බැහැරයව මෙසේ සබබ

නාසනායෙන් නසනලද ශෙරණක් බව දැන දැන යම් භික්ෂුවක් තෙමේ පා සිවුරු ආදි පරිෂ්කාර දෙමියි පෙළ අටුවා උගන්වා දෙමියි කියා තල-වන්නේ වේද කුදුමගන් වත් පිළිවෙත් කරවා ගන්නේ වේද එක්ව අනුභව කරන්නේ වේද එක් සෙවෙනියක් හා එක් බිත්තියක් ඇති විහාරයෙහි එක්ව සයනය කරන්නේ හෝ වේද ඒ භික්ෂුවහට උපලාලන යෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.** දණ්ඩකම් නාසනයෙන් නසනලද සම ණුද්දෙසයා කෙරෙහි නසනලද සංඥ ඇතිව සිවුරු ආදී පරිෂ්කාර දෙමි පෙළ අටුවා උගන්වා දෙමියි උවටැන් කරවයිද එක්ව අනුභව කෙරේද එක්ව සය නය කෙරේද පචිති ඇවැත්වේ. සමණුද්දෙසයා කෙරෙහි විමති ඇත්තේ වීනම් දුකුලාවේ.

(ආපත්ති විභාගාදිය අරිට්ඨ ශික්ෂාපදයට සමානයි.)

1. භික්ෂුවක් විසින් ප්‍රඥප්ති ශික්ෂා පදයෙන් ඇවත මෙසේ නො කරව මෙය අකැපයයි අවවාද කරණු ලබන්නේ මෙසේ කියන්නේයි. මම යම්තාක් කාලයකින් තොප කෙරෙන් අන්‍ය ව්‍යක්ත වූ බහුශ්‍රැත විනයධර භික්ෂූන් අතින් ප්‍රතිපුච්ඡනය කෙරෙම්ද ඒතාක් කල් මේ ශික්ෂා පදයෙහි නොහික්මෙන්නෙමියි කියන්නේ වේනම් ඒ භික්ෂුවහට සහ ධම්මයෙහි පචිති ඇවැත්වේ.

**සංලක්ෂ්‍යය** උපසම්පද භික්ෂුව කෙරෙහි උපසම්පද යන සංඥ ඇත්තේ මෙසේ කීයා නම් පචිති ඇවැත් වේ. උපසම්පන්නයා කෙරෙහි විමති ඇත්තේ මෙසේ කියාද පචිති ඇවැත් වේ-නො පනවන ලද්දෙන් කියනු ලබන්නේ මෙය සල්ලෙඛ ප්‍රතිපදව පිණිස නොවන්නේය—ධූත ධර්ම පිළිබඳව නොවන්නේය. ප්‍රසන්නභාවය පිණිස නො වන්නේය. යනාදි වශයෙන් කියාද ඇවත මේ ශික්ෂාපදය විනයධර ධර්මකථික බහුශ්‍රැත භික්ෂුවකගෙන් විචාරම්ද ඒතාක් නොහික්මෙන් නෙමියි කියානම් දුකුලා ඇවැත් වේ. අනුපසම්පන්නයා කෙරෙහි උප සම්පන්නය යන සංඥ ඇත්තේ වීනම් දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම** භික්ෂුවක්හුගේ ප්‍රඥප්ති ශික්ෂාපදයෙන් කීම, නො පිළිපදිනු කැමැත්තෙන් කීම යන දෙකරුණු සම්පූර්ණ වීමෙන් ආපත්ති යට පැමිණීම වේ,

2. යම් භික්ෂුවක් තෙමේ පාමොක් දෙසනු ලබන කල්හි මේ ක්ෂුද්‍රානු ක්ෂුද්‍ර ශික්ෂාපදයන් උදෙසීමෙන් කවර ප්‍රයෝජනයෙක්ද ඒකාන්තයෙන් කුකුස් පිණිස වෙහෙස පිණිස හෘදයෙහි රෙඛා හට ගැණීම පිණිස පවතින්නේයයි මෙසේ කියන්නේ වීනම් ඒ භික්ෂුවහට ශික්ෂා පදයන්ට ගැරහීම හෙතුකොටගෙණ සිකඛාපද විවණ්ණකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය**

උපසම්පද භික්ෂුව කෙරෙහි උපසම්පද ප්‍රාප්තය යන සංඥ ඇත්තේ විනය ප්‍රඥප්තියට ගැරහීමෙහි පචිති ඇවැත්වේ, අන්‍ය ධර්‍මයකට ගැරහීමෙහි දුකුළා ඇවැත්වේ. අනුපසම්පන්නයකු සමග විනය හෝ අන්‍ය ධර්‍මයක් පිළිබඳව හෝ ගැරහීමෙහි දුකුළා ඇවැත්වේ. අනුපසම්පන්නයා කෙරෙහි උපසපන්ය යන සංඥ ඇත්තේ වීනම් දුකුළාවේ.

**ආපත්තියට පැමිණීම**

ගරහනු කැමැත්ත, උපසපන් භික්ෂුවක් ගමුයෙහි ශික්ෂාපදයන්ට ගැරහීම යන දෙකාරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

3. යම් භික්ෂුවක් තෙමේ අර්ධ මාසයක් පාසා පාමොක් උදෙසනු ලබන කල්හි ඇවැත්හි මේ ධර්‍මයත් විනයෙහි ආයේ විනයට බැසගෙණ සිටියේ අඩමසක් පාසා උදෙසීමට ඒයයි මම දැන්ම දැනගතිම්. (නොහොත්) මේ කාරණය විනයට ඇතුළත් ශික්ෂාපදයක් බව මින් ඉගත නොදැන සිටියෙමියි කියන්නේද ඒ අඥන භික්ෂුවහට නිර්ද කොට දහම්වූ පරිද්දෙන් සිදුවූ ඇවැතින් නැණීසිටීම කළයුතුයි. මත්තෙහි තුමූලා බව පිණිස මොහාරොපන කර්‍මය කළයුතුයි. (හෙවත්) ඥප්ති ද්විතීය කම්වාචානු ශ්‍රාවණ විනය කර්‍මයෙන් අඥානයෙක් බවට පැමිණවිය යුත්තේයි. එසේ මොහාරොපන කර්‍මය කළකල්හි ඒ භික්ෂුවහට මොහාරොපනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.**

අධර්‍ම කර්‍මයෙහි ධර්‍ම කර්‍ම සංඥ ඇත්තේ මූළාවේද දුකුළා ඇවැත් වේ. අධර්‍ම කර්‍මයෙහි විමති ඇත්තේද දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම**

මොහාරොපන කර්‍ම කිරීම, මූළාවෙනු කැමැත්ත තුන් වරක් ඇසූ විරූ බව, මූළා වීම යන කාරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. යම් භික්ෂුවක් තෙමේ කිපුනේ නොසතුටු සිත් ඇත්තේ උපසපන් භික්ෂුවක් හට ප්‍රහාර දානය කරන්නේ වීනම් ඒ භික්ෂුවහට පහර දානයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.**

උපසපණක්හට පහර දීමෙහි පචිති ඇවැත් වේ. ගිහි, සාමණේර, තිරිසන්ගත යන්ට පහර දීමෙන් දුකුළා ඇවැත් අවද නේයි.

**ආපත්තියට පැමිණීම.**

කිපි සිත් ඇතිබව, තම සිරුර නොමූදනු කැමැතිබව, උපසපන් මහණෙක්හට පහරදීම යන කාරුණු තුන සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. යම් භික්‍ෂුවක් තෙමේ උපසපන් භික්‍ෂුවක්හට කිපියේ නොසතුටු සිත් ඇත්තේ අතුල් තල ඔසවීම් ආදි වශයෙන් පහර දෙන ආකාර දක්වා අත උරුක් කරන්නේ වේද ඒ භික්‍ෂුවහට තලසත්තිකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය.** අනුපසපණක් කෙරෙහි කිපුනේ නොසතුටු සිත් ඇත්තේ අතුල්තල උරුක් කරන්නේ වීනම් දුකුළා ඇවැත් වේ. අනුපසම්පන්නයා කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇත්තේ දුකුළා වේ. එහි විමති ඇත්තේ දුකුළා වේ.

(අවශෙෂ ආපත්ති විභාගාදිය යට ශික්‍ෂාපදය හා තුල්‍ය වේ.)

6. යම් භික්‍ෂුවක් තෙමේ උපසම්පද භික්‍ෂුවක්හට දිට්ඨසුතමුතාදි මූලයක් නැත්තාවූ සංඝාදිසෙසාපත්තියකින් විනාශ කරණ අදහසින් යුක්තව චොදනා කරන්නේ වීනම් ඒ භික්‍ෂුවහට අමූලකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය.** අමූලක නම්:– නොදක්නාලද, නොඅසනලද සැකයට හෙතුරහිත හෙයින් අමූලක නම්.

උපසපන් භික්‍ෂුවක් කෙරෙහි උපසම්පදය යන සංඥ ඇත්තේ අමූලික සඟවෙසෙස් ඇවතකින් අනුද්ධංසනය කෙරේනම් පචිති ඇවැත් වේ. ආචාර විපත්තියකින් හෝ දෘෂ්ටි විපත්තියකින් හෝ අනුද්ධංසනය කෙරේනම් දුකුළා ඇවැත්වේ. අනුපසපණක්හට අනුද්ධංසනය කෙරේද දුකුළා වේ. අනුපසම්පන්නයා කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** උපසපන් භික්‍ෂුවක්වීම, සංඝාදිසෙසාපත්තියකින් අමූලිකාව චොදනා කිරීම, එකෙණෙහි චොදනාවෙහි අරුත් දැන ගැණීම යන කරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම් වේ.

7. යම් භික්‍ෂුවක් තෙමේ උපසම්පද භික්‍ෂුවක්හට දුක් උපදවන චෙතනා ඇතිව හෝ නොපිරුණු විසිවයස් ඇත්තෙක තා විසින් විකාලයෙහි අනුභව කරණලදී. රහමෙර පානය කරණලදී යනාදීන් දැන දැන කුකුස් උපදවන්නේ වීනම් ඒ භික්‍ෂුවහට සඤ්චිච්චයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය** - උපසම්පන්නයා කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇත්තේ කුකුස් උපදවා නම් පචිති වේ. ඔහු කෙරෙහි විමති ඇත්තේ කුකුස් උපදවා නම් පචිති වේ. අනුපසම්පන්නයකුහට දැන දැන කුකුස් උපදවාද දුකුළා වේ. අනුපසම්පන්නයා කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇතිව කුකුස් උපදවාද දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** උපසම්පද භික්‍ෂුවක් වනබව, දුක් උපදවනු කැමැත්ත කුකුස් ඉපදවීම යන තෙකරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

8. යම් භික්‍ෂුවක් තෙමේ හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති විවාදයට පැමිණි භික්‍ෂූන් කථා කරණ වචන ඇසෙන තන්හි සිටින්නේ ඒ භික්‍ෂූහු යම් වචනයක් කියාද එය අසන්නෙමියි මෙතෙහි කොටගෙණ රහස් ඇසීමට සිටින්නේ වීනම් ඒ භික්‍ෂුවහට උපස්සුතිකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය** උපසම්පදා භික්‍ෂුව කෙරෙහි උපසම්පන්නය යන සංඥ ඇත්තේ කථාකරණ වචන ඇසෙන තන්හි සිටිද පචිති ඇවැත් වේ. අනුපසපනක්හුගේ කථාකරණ වචන ඇසෙන තන්හි සිටීද දුකුළා වේ. අනුපසම්පන්නයා කෙරෙහි උපසපන්්ය යන සංඥ ඇත්තේ සිටීද කුළා වේ.

**ආපත්තියට පැමිණීම.** උපසම්පදා භික්‍ෂුවක් වනබව, චෝදනා කරණු කැමැත්ත වචන ඇසෙන තන්හි සිට ඇසීම යන තෙකරුණු සම්පූර්‍ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

9. යම් භික්‍ෂුවක් තෙමේ දහම්වූ පරිද්දෙන් කරණලද අපලෝකන කම්ම, ඤත්ති කම්ම, ඤත්තිදුතිය කම්, ඤත්ති චතුත්‍ථි කම්යන්ට ඡන්දය දී පසුව ගර්හා කරන්නාවූ ස්වභාවයට පැමිණියේ වීනම් ඒ භික්‍ෂුවහට කම්මපටිබාහනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂණය.** මෙහි විනය කර්‍ම නම්:- අපලෝකන කර්‍මය, ඤත්තිකර්‍මය, ඤත්තිදුතිය කර්‍මය, ඤත්තිචතුත්‍ථි කර්‍මය-යි චතුර්විධයි. එහි අපලෝකන කර්‍මය පඤ්චප්‍රකාර වේ. ඤත්තිකර්‍මය නව ප්‍රකාර වේ. ඤත්ති දුතිය කර්‍මය සත්ප්‍රකාර වේ. ඤත්තිචතුත්‍ථි කර්‍මය සත්ප්‍රකාර වේ.

පඤ්චප්‍රකාර අපලෝකන කර්‍මය නම්:- දණ්ඩකර්‍ම නාසනයෙන් නසනලද සාමණේරයා නැවත සාමණේරයන්ට ඇතුළත් කිරීම, කණ්ටක සාමණේරයා වැනි නැනැත්තෙකු දණ්ඩකර්‍මනාසනයෙන් සඟරමින් නෙරපීම.

පැවිදිවනු කැමැත්තෙකුගේ හිසකේ කැපීමට භික්‍ෂූන් විචාරීම, පරුෂ වචන කියන භික්‍ෂුහට අනුශාසනා නොකටයුතුය යන බ්‍රහ්මදණ්ඩනය තැබීම, කර්‍මයයි කියාම දතයුතු කර්‍මලක්‍ෂණය මෙසේ අපලෝකන කර්‍මය පඤ්චප්‍රකාර වේ. භික්‍ෂුණීන් විසින් අවන්දියාදි කර්‍මයද කර්‍මලක්‍ෂණ නම් වේ.

මෙහි නොවැන්ද යුත්තෝ නම්:- උක්‍ෂේපණීය කර්‍මය ලත් නැනැත්තේද, අනුපසම්පන්නයාද, නානාසංවාසක මාගම්ද, තමහට සග මහණද, ගරු ඇවැත් ආපන්නයාද, පණ්ඩකයාද යන මොව්හු නොවැන්ද යුත්තෝයි.

**නවැදෑරුම් ඤත්තිකර්‍මය.** උපසම්පදා කටයුතු පුද්ගලයා ඇතුළත් කරණ ඕසාරණඤත්තිය, උබ්බාහිකාවිනිශ්චයෙහි ධර්‍මකථික පුද්ගලයා නිකුත්කරණ නිස්සාරණඤත්තිය, පොහෝකිරීම පිණිස තබන්නාවූ ඤත්තිය- පවා

රණය පිණිස තබන්නාවූ ඤත්තිය, දියයුතු චීවරාදිය දෙන්නාවූ ඤත්තිය, ඇවැත් පිළිගැණීම පිණිස තබන්නාවූ ඤත්තිය, පවාරණ පච්චුක්කඩ්ඩනය කරන්නාවූ ඤත්තිය, කර්මලක්ෂණ ඤත්තිය යි මෙසේ ඤත්තිකර්මය නවප්‍රකාර වේ.

(තිණවත්ථාරක සමථයෙහි සබ්බසඞ්ගාහික ඤත්ති ආදීන්ගේ වශයෙන් ත්‍රිවිධාකාර ඤත්තිය කර්ම ලක්ෂණ නමැයි දතයුතු.)

**සත්වැදෑරුම් ඤත්තිචතුර්ථ කම්ම.** තජ්ජනීයාදී සත්වැදෑරුම් කර්මයන් සන්සිඳවීම් වශයෙන් ඇතුළත්කිරීම, තජ්ජනීයාදී සත්වැදෑරුම් කර්මයෙන් නිකුත් කිරීම, භික්ෂුණෝවාදකසම්මුතිය, පිරිවෙස් මානත්දීම, මූලායපටිකස්සනය වශයෙන් නිග්‍රහකිරීම, උක්ඛිත්තානුවත්තනකය, අෂ්ටප්‍රකාර යාවතතියකය, අරිට්ඨය, චණ්ඩකාලිය යන මේ එකොළොස්ප්‍රකාර සමනුභාසනය කර්මලක්ෂණයෝ මෙසේ ඤත්ති චතුර්ථ කර්මය සත්ප්‍රකාරවේ. උපසම්පදාකර්මය, අබ්භානකර්මය යන මෙයද කර්මලක්ෂණ නම් වේ.

ධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥා ඇත්තේ ඡන්දය දී පසුව ගර්හා කෙරේද ඔහට පචිති ඇවැත් වේ. අධර්ම කර්මයෙහි ධර්ම කර්ම සංඥා ඇත්තේ වීනම් දුකුළා වේ. අධර්ම කර්මයෙහි විමති ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** ධර්ම කර්මයක් වීම, ධර්ම කර්ම යන සංඥා ඇතිබව, ඡන්දය දී නැවත අරගල කිරීම යන කාරුණු තුන සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

10. යම් භික්ෂුවක් තෙමේ සඟ මැද විනිශ්චය කථා පවත්වනු ලබන කල්හි ඡන්දය නොදී හුනස්නෙන් නැගිට පලා යන්නේ වීනම් ඒ භික්ෂුවහට ඡන්ද ආදානයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණ.** ධර්ම කර්මයෙහි ධර්ම කර්ම යන සංඥා ඇත්තේ ඡන්දය නොදී හුනස්නෙන් නැගිට යේනම් පචිති ඇවැත් වේ. ධර්මකර්මයෙහි විමති ඇත්තේ ඡන්දය නොදී බැහැර යේනම් දුකුළා ඇවැත් වේ. අධර්ම කර්මයෙහි ධර්ම කර්ම යන සංඥා ඇත්තේ පලායේ නම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.** විනිශ්චය කථාවක් පවත්වනබව, ධර්ම කර්මයක් වනබව, ධර්ම කර්ම යන සංඥා ඇතිබව, සමාන සංවාසක සීමාවෙහි සිටීම, සමාන සංවාසක බව, කර්මය නසනු කැමැත්තෙන් අත්පස ඉක්මවීම, යන කාරුණු සය සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

11. යම් භික්ෂුවක් තෙමේ සමගි සඞ්ඝයා හා එක්ව සිවුරක් දී පසුව භික්ෂූහු සඟ සතු ලාභය සතුටු කරණ ලද්දෙක්හට පිරිනමත්යයි මෙසේ ගුණ නසන ස්වභාවයට පැමිණියේ වීනම් ඒ භික්ෂුවහට ඛීයනකයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂ්‍යය.**

ධර්ම කර්මයෙහි ධර්ම කර්ම යන සංඥ ඇත්තේ සවැදෑරුම් විවරයන්ගෙන් යම් සිවුරක් දී පසුව ගුණ නසා නම් පචිති ඇවැත් වේ. අන්‍ය පරිෂ්කාරයක් දුන් සාල්හි ගුණ නසාද දුකුළා ඇවැත් වේ. සංඝයා විසින් සම්මත නොකරණලද සෙනසුන් පැනවීම් ආදිය කරණ උපසපන් භික්ෂුවක්හට සිවුරක් හෝ අන්‍ය පරිෂ්කාරයක් හෝ දුන් සාල්හි ගුණ නසාද දුකුළා අවදනේසි.

**ආපත්තියට පැමිණීම.**

උපසපන් භික්ෂුවක්වීම, ධර්ම කර්මයෙන් ලබනලද සම්මුතිය ඇතිබව, සංඝයා සමග විකප්පනය කටයුතු සිවුරක් දීම, නැවත අරගල කිරීම යන කාරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

12. යම් කිසි භික්‍ෂුවක් තෙමේ සංඝයාට පිරිනමනලද සහ සතු ලාභය දැන දැන පුද්ගලයෙකුහට පිරිනමන්නේ වීනම් ඒ භික්‍ෂුවහට පරිණාම නයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂ්‍යය.**

සඞ්ඝයාට පිරිනමන ලද්ද අන්‍ය සඞ්ඝයාට හෝ චෛත්‍යයට හෝ පිරිනමාද දුකුළා ඇවැත් වේ. චෛත්‍යයට පිරිනමන ලද්ද අන්‍ය චෛත්‍යයකට හෝ ගණයාට හෝ පුද්ගලයෙකුට හෝ පිරිනමාද දුකුළා ඇවැත් වේ. පුද්ගලයෙකුට පිරිනමන ලද්ද අන්‍ය පුද්ගලයකුට හෝ සංඝයාට හෝ ගණයාට හෝ චෛත්‍යයට හෝ පිරිනමාද දුකුළා ඇවැත් වේ. නොපිළිගන්වනලද කල පිළිගන්වන ලදැය යන සංඥ ඇත්තේ දුකුළා වේ. නොපිළිගන්නා ලද්ද විෂයෙහි විමති ඇත්තේවීනම් දුකුළා වේ.

1. යම් භික්‍ෂුවක් තෙමේ මුර්ධාභිෂෙක කරණලද ක්‍ෂත්‍රිය රජක් හුගේ පහව නොගිය රජ ඇති පහව නොගිය රජද්‍රව්‍ය ඇති සැතපෙන ශ්‍රීයහන් ගබඩාවෙහි ප්‍රථමයෙන් තමා ආබව නොදන්වන ලද්දේ සයනාසරයෙහි එළිපත ඉක්මවූයේ නම් ඒ භික්‍ෂුවහට අනෙතපුරප්පවෙසන යෙහි පචිති ඇවැත් වේ.

**සංලක්‍ෂ්‍යය.**

සයනාසරයෙහි එළිපත පළමු පිය ඉක්ම වූයේ දුකුළා වේ. දෙවන පිය ඉක්මවූයේ පචිති වේ.

නිමන්ත්‍රණය කරණලද කල අනිමන්තිත යන සංඥ ඇත්තේ වීනම් දුකුළා වේ. නිමන්ත්‍රණයෙහි විමති ඇත්තේ වීනම් දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.**

ක්‍ෂත්‍රිය රජෙක්වීම, අභිෂෙක ලත් බව, රජ හා බිසව ශ්‍රීයහන් ගබඩාවෙන් පිටතට නොනික්මුණුබව, ප්‍රථමයෙන් තමන් ආබව නොදැන්වූබව, එළිපත ඉක්මවා ඇතුල්වීමය යන කාරුණු පස සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. යම් භික්ෂුවක් තෙමේ දශවිධ රත්නය හෝ රත්නයයි සම්මත කාරණලද යම් වස්තුවක් ආරාමය තුළ හෝ වසනා ගේ තුළ හැර තෙමේ අවුලාගන්නේ හෝ අනුන් ලවා අවුලවා ගන්නේ හෝ වීනම් ඒ භික්ෂුව ගට පටිසාමනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.** මෙහි විනයානුකූල ක්‍රමය නම්:- භික්ෂුව විසින් දශවිධ රත්නය හෝ රත්නයයි සම්මත කාරණලද අන් වස්තුවක් වාසය කරණ ආරාමය තුළ හෝ ගේතුළ තෙමේ අවුලා ගෙණ හෝ අනුන් ලවා අවුලවා ගෙණ හෝ යමෙකු සතු වස්තුවක් වේද වස්තු ස්වාමි තෙමේ ගෙණ යන්නේ වේදැයි සලකා ආරක්‍ෂාකොට බහා තැබිය යුතුයි.

මේ ඒ දැයකයන්ගේ යම්කිසි ප්‍රමාදයකින් ආරාම විහාර තුළ වැටී තුබූ වස්තුව පිළිබඳ විනයානුකූල ක්‍රමයයි.

දශවිධ රත්නයෝ නම්: - මුතු, මැණික්, වෛඩූර්‍ය්‍ය, සඞ්ඛ, සිලා, ප්‍රවාල, රජත, ජාතරූප, ලොහිතඞ්ක, මැසිරිගල් යන මේ දශවිධ රත්නයෝයි.

**ආපත්තියට පැමිණීම.** අවසර නුදුන්බව, අන්සතු වස්තුවක් වන බව, විශ්වාසග්‍රහණ සංඥව හෝ පාංශුකූල සංඥවක් හෝ නැතිබව, තමා විසින් අවුලා ගන්නේ හෝ අනුන් ලවා අවුලවන්නේ හෝ වේද, යන කරුණු සතර සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

3. යම් භික්ෂුවක් තෙමේ අවශ්‍යායික කටයුත්තක් නැතිව විද්‍යමාන භික්ෂුවක් "විකාලෙ ගාමප්පවෙසනං ආපුච්ඡාමි" යනුවෙන් ආපුච්ඡා නොකොට විකල්හි ගම්වදනේ වීනම් ඒ භික්ෂුවහට විකාලගාමප්පවෙසන යෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.** විකාලයෙහි විකල්ය යන සංඥ ඇත්තේ විද්‍යමාන භික්ෂුව නොවිචාරා අවශ්‍යායික කටයුත්තක් නැතිව ග්‍රාමයට පිවිසියේද පචිති ඇවැත් වේ. කල්හි විකාලය යන සංඥ ඇත්තේ ගම් පිවිසීමෙන් දුකුලා වේ. කාලයෙහි විමති ඇත්තේ ගම් පිවිසීමෙහි දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම.** විද්‍යමාන භික්ෂුවක්හට ආපුච්ඡානොකිරීම, අවකාශ කිරීම් සඞ්ඛ්‍යාත කාරණයක් නැති බව, විකාලයෙහි ගම්වැදීම යන කරුණු තුන සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. යම් භික්ෂුවක් තෙමේ ඇට, ඇත් දළ, මුව අං, ගෙරි අං ආදී අහින් ඉදිකටු කුලාවක් කරවන්නේ නම් ඒ භික්ෂුවහට ඉදිකටු කුලාව බිඳ දමා ඇවැත් දෙසීම අවසන්කොට ඇති සූචිඝරයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂ්‍යය.** අන්‍යයෙකු සඳහා කිරීම හෝ කරවීමේදී දුකුලා ඇවැත් වේ. අන්‍යයකු විසින් කර වන ලද්ද ලැබ පරිභොග කොරේද දුකුලා ඇවැත් වේ.

**ආපත්තියට පැමිණීම.** හිදිකාවූ කුලාවක්බව, අසපි, දනාත, විසාන යන ත්‍රිවිධ වස්තූන්ගෙන් යම් වස්තුවකින් කිරීම, තමා පිණිස කරවා ලබාගැණීම යන ත්‍රිවිධ කාරුණු සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

5. අලුත් ඇඳක් හෝ පුටුවක් කරවනු ලබන භික්ෂුව විසින් යට මච්චම හැර සුගත් අඟුලෙන් අටඟුල් පාඇති ඇඳක් හෝ පුටුවක් කර විය යුතුයි. ඒ එක්රියන් සමාරක් ප්‍රමාණය ඇත්තාවූ පාදය ඉක්ම වන්නාවූ භික්ෂුවහට පා සිඳ දමා ඇවැත් දෙසීම අවසන්කොට ඇත්තාවූ ඡේදනකපාචිත්තිය නම් වූ මඤ්චකාරුපනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** අන්‍යයෙකු සඳහා කිරීම හෝ කරවීමෙහි දුකුලා වේ. අන්‍යයෙකු විසින් කරණලද්ද පිළිගෙණ පරිභොග කෙරේද දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම.** පමණ ඉක්මවූ ඇඳක් හෝ පුටුවක් වන බව, තමා පිණිස කරවා ලබන බව, යන දෙකාරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

6. යම් භික්ෂුවක් තෙමේ එක් වස්ත්‍ර උරයක් දිග හැර එලා කපු පුළුනෙන් අතුරවා අතික් වස්ත්‍ර උරයකින් වසා නිමවනලද ඇඳක් හෝ පුටුවක් කරවන්නේ වීනම් ඒ භික්ෂුවහට කපු පුළුන් නිසුත් කොට ඇවැත් දෙසීම අවසන් කොට ඇත්තාවූ තූලොනද්ධමඤ්චකායෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.** මෙහි ඇඳ නම්:– මසාරක, බුන්දිකාබද්ධ, කුලීරපාදක, ආහච්චපාදක වශයෙන් සිව් වැදෑරුම්ය. විස්තර යට දක්වා ඇත. පීඨය පිළිබඳවද මේ ලෙසමැයි.

අනුන් සඳහා කිරීම හා කරවීමෙහි දුකුලා වේ. අන්‍යයෙකු විසින් කරණලද්ද පිළිගෙණ පරිභොග කෙරේද දුකුලා වේ.

**ආපත්තියට පැමිණීම.** තූලොනද්ධබව, තමා පිණිස කොට හෝ කරවා හෝ ලබන ලදබව යන කාරුණු දෙක සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

7. දිගින් සුගත් වියතින් වියත් දෙකකටද පුළුලින් එක් වියත් සමාරකටද, දුවලුව වියතකටද වඩා රැගෙණ හිඳිනා සිවුර (නිසීදනයක්) කරවනු ලබන භික්ෂුව විසින් ප්‍රමාණයෙන් යුක්තවූ නිසීදනයක් කරවිය යුතුයි. ඒ නිසීදනය පිළිබඳ මේ කියනු ලබන්නේ ප්‍රමාණයයි.

දිගින් සුගත් වියතින් දෙවියතෙක්ද, පුළුලින් එක් වියත් සාඟුලෙක්ද දුවල්ල එක් වියතක්ද, ඒ ප්‍රමාණය (හෙවත් දිගින් සතර රියන් සමාරෙක්ද, පුළුලින් තුන්රියන් සාඟුලෙක්ද දුවල්ල දෙරියන් සාඟුලෙක් යන ප්‍රමාණය) ඉක්ම වන්නාවූ මහණහට වැඩිප්‍රමාණය සිඳ දමා ඇවැත් දෙසීම අවසන්කොට ඇති නිසීදන කාරුපනයෙහි පචිති ඇවැත් වේ.

**සංලක්ෂණය.**

නිසීදනය නම්:- ඇඳ පුටු මතුයෙහි අතුරණ නිසීදන චීවරයයි. එහි ප්‍රමාණය නම් දිගින් සුගත් වියතින් දෙවියතකි. පුළුලින් එක් වියත් සාඟුලකි. දවල්ල වියතකි. මෙය ප්‍රමාණයයි. මේ ප්‍රමාණය ඉක්මවා කිරීම හෝ කරවීම පිළිබඳ සියලු පියෝගි දුකුළා වේ.

**ආපත්තියට පැමිණීම.**

නිසීදනයාගේ ප්‍රමාණය ඉක්මවීම, තමා පිණිස තෙමේ කරවීම හෝ අනුන් ලවා කරවා හෝ ලැබීම යන දෙකරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

8. කස් පිළිසන් සිවුරක් කරණු ලබන භික්ෂුව විසින් ප්‍රමාණවත් කස් පිළිසන් සාඩක් කරවිය යුතුයි. ඒ කඩුවේගන් වසත්‍ර පිණිස කරණ සිවුරෙහි මේ ප්‍රමාණයයි. දිගින් සුගත් වියතින් සතර වියතෙකි. පුළුලින් දෙවියතෙකි. ඒ ප්‍රමාණය ඉක්මවන්නාවූ භික්ෂුවහට සිඳ දමා ඇවැත් දෙසීම අවසන් කොට ඇත්තාවූ කණ්ඩුපටිච්ඡාදනයෙහි පචිති ඇවැත් වේ.

9. වැසිසළු සිවුරක් කරවනු ලබන්නාවූ භික්ෂුව විසින් විනයෙහි දක්වෙන ප්‍රමාණයෙන් යුක්තවූම වැසිසළු සිවුරක් කරවිය යුතුයි. එහි මේ කියනු ලබන්නේ ප්‍රමාණයයි. දිගින් සුගත් වියතින් සවියතෙකි. පුළුලින් දෙරියන් සමාරෙකි. මේ ප්‍රමාණය ඉක්මවන්නාවූ මහණහට වැඩිපමණ සිඳ දමා ඇවැත් දෙසීම අවසන්කොට ඇත්තාවූ වස්සික සාටිකයෙහි පචිති ඇවැත් වේ.

(මෙහි සුගත් වියත නම් මැදුම් පුරුෂයකුගේ තුන් වියතකි.)

10. යම් කිසි භික්ෂුවක් තෙමේ සුගත් සිවුර පමණ ඇති සිවුරක් හෝ ඉන් වැඩි දිග පුළුල පමණ ඇති සිවුරක් හෝ කරවන්නේ වීනම් ඒ භික්ෂුවහට සිඳ දමා ඇවැත් දෙසීම අවසන්කොට ඇත්තාවූ සුගත චීවරයෙහි පචිති ඇවැත් වේ.

සුගත් සිවුරෙහි ප්‍රමාණය නම්:- දිගින් සුගත් වියතින් නව වියතෙකි. පුළුලින් සවියතෙකි. මේ සුගත් සිවුරෙහි ප්‍රමාණයයි.

(විස්තර නිසීදන ශික්ෂාපදයට සමානයි.)

"පාතෙනාති කුසලං චිත්තානති පාචිත්තියං" යි නිර්වචන සෙයින් කුසල් චිත්තය හෙළානුයි පාචිත්තිය නම්.

## දෙළොස්වන පරිච්ඡේදය නම් දෙපනස් පචිති විනිස.

---

“පටිදෙසෙතබ්බං පාටිදෙනීයං” යි නිපීවන හෙයින් නැවත දෙසිය යුතු ඇවැත පාටිදෙසනීය නම් වේ.

ඒ මේ පාටිදෙසනීයාපත්තිහු සිව්වැදෑරුම් වෙති. ඔව්හු කවරහුද යත්? අඤ්ඤාතිකා පටිග්ගහණ පාටිදෙසනීයාපත්තිය, වොසාසමාන පාටිදෙසනීයාපත්තිය, සෙඛසම්මත පාටිදෙසනීයාපත්තිය, ආරඤ්ඤක පාටිදෙසනීයාපත්තිය වශයෙන් සිව්වැදෑරුම් වේ.

1. යම් භික්ෂුවක් තෙමේ ඇතුළු ගමට පිවිස නොනෑ මෙහෙණින් නකගේ අතින් ඛාද්‍ය භොජ්‍යයක් සියතින් පිළිගෙණ වළඳන්නේ වේද ඒ භික්ෂුවහට අඤ්ඤාතිකා පටිග්ගහණයෙහි පාටිදෙසනීයා'පත්තිය වේ. ඇවැත්නි! ගැරහියයුතු නොසැපවූ පාටිදෙසනීය නම් ආපත්තිධර්මයට පැමිණියෙමියි ඒ භික්ෂුව විසින් ඒ පාටිදෙසනීයා'පත්තිය දෙසිය යුතුයි.

**සංලක්ෂ්‍යය**

නො නෑ මෙහෙණින්නක් කෙරෙහි නො නෑ මෙහෙණින්නක යන සංඥා ඇත්තේ ඇතුළු ගමට පිවිස ඒ මෙහෙණින්නගේ අතින් ඛාද්‍ය භොජ්‍යයක් තම අතින් පිළිගෙණ වළඳ නම් පාටිදෙසනීයා පත්තියට පැමිණේ—යාමකාලික-සත්තාහකාලික-යාවජීවිකයක්-ආහාරය පිණිස පිළිගණිද දුකුළා ඇවැත් වේ.

**ආපත්තියට පැමිණීම**

උභතො සංඝයා කෙරෙහි ප්‍රව්‍රජ්‍යාප්‍රාප්ත උපසම්පද භික්ෂුවක් වීම, කුලයෙන් සම්බන්ධ නොවන බව, ඇතුළුගමෙහි සිටින මෙහෙණින්නකගේ අතින් තමා පිළිගැණීම, යාවකාලික වස්තුවක් වන බව, යන කරුණු සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. කුලයන්හි බතින් පවරණලද භික්ෂූහු වළඳන කල්හි භික්ෂුණියක් තොමෝ මේ භික්ෂූහුගේ පාත්‍රයෙහි ව්‍යඤ්ජන බෙදව මේ භික්ෂුවගේ පාත්‍රයෙහි බත් බෙදවයි මෙසේ විධානකරමින් සිටින භික්ෂුණියට භික්ෂු ගණයා විසින් බුහුනනිය! යම්තාක් භික්ෂූහු වළඳන්නාහු වෙත්ද ඒතාක් ඉවත් වෙවයි කිය යුත්තීය. එසේ නොකියා වළඳන භික්ෂුගණයාට වොසාසමානයෙහි පාටිදෙසනීයාපත්තිය වේ. ඇවැත්නි ගර්හාකටයුතු නොසැපවූ පසුව දෙසිය යුතු ආපත්ති ධර්මයට පැමිණියම්හ. ඒ පාටිදෙසනීය ඇවැත අපි දෙසනා කරම්හයි මෙසේ පසුව දෙසනා කටයුතුයි.

**සංලක්ෂ්‍යය**

කුල නම් :— ක්ෂත්‍රිය-බ්‍රාහ්මණ-වෛශ්‍ය-ශුද්‍ර—වශයෙන් දක්වෙන චතුර්විධ කුලයෝයි.

අනුපසම්පන්නයා කෙරෙහි උපසම්පන්නයා යන සංඥා ඇත්තේ වීනම් දුකුළාවේ. අනුපසම්පන්නයා කෙරෙහි විමති ඇත්තේ වීනම් දුකුළාවේ.

**ආපත්තියට පැමිණීම**

උභතො සංඝයා වෙතින් සම්පූර්ණ උපසම්පදාවක් ලැබූ බව, පඤ්චප්‍රකාර භොජනයන්ගෙන් එක්තරා භොජනයක් බන බව, ඇතුළුගම්හි අවකාශකරණලද ප්‍රභෙදයෙන් අන්‍යවූ ප්‍රභෙදයකින් විධාන කිරීම නොවැළැක් වීම, යන කරුණු සම්පූර්ණ වීමෙන් ඇවැතට පැමිණීම වේ.

3. ඥත්ති ද්විතීය කර්මයෙන් ශෛක්‍ෂ්‍යයයි සම්මත කරණලද ශ්‍රද්ධාධිකවූ ධනයෙන් හීනවූ යම් කුලයකොතොත් විද්‍යමාන වෙද්ද එබඳු ස්වභාව ඇති ශෛක්‍ෂ්‍ය සම්මත කුලයෙහි ගෘහොපචාරයට ඇතුළත්වීමට ප්‍රථම ආරාධනා නොකරණලද නොගිලන් යම් භික්‍ෂුවක් තෙමේ කෑයුතු දෑයක් හෝ වැළඳිය යුතු දෑයක් ස්වකීය හස්තයෙන් පිළිගෙණ අනුභව කරන්නේ වීනම් ඒ භික්‍ෂුවයට සෙඛ සම්මතයෙහි පාටිදෙසනීයාපත්තිවේ.

ඒ භික්‍ෂුව විසින් ඇවැත්නි! ගැරැහිය යුතු නොසැපවූ නැවත දෙසිය යුතු ආපත්ති ධර්මයට පැමිණියෙමි. ඒ ඇවැත පසුව දෙසමියි මෙසේ දෙසිය යුතුයි.

**සංලක්‍ෂණය**

යාමකාලික-සත්තාහකාලික-යාවජීවික යන්-ආහාරය පිණිස පිළිගැණීමෙහි දුකුළා ඇවැත් වේ. අශෛක්‍ෂ සම්මතයෙහි ශෛක්‍ෂසම්මතය යන සංඥ ඇත්තේ දුකුළාවේ. අශෛක්‍ෂ සම්මතයෙහි විමති ඇත්තේ දුකුළාවේ.

**ආපත්තියට පැමිණීම**

ශෛක්‍ෂයයි සම්මත කිරීම, ප්‍රථමයෙන් ආරාධනාවක් නොලැබීම නොගිලන් බව, ගෘහොපචාරයට බැසීම නිච්චභත්තාදිය හැර අන්‍යවූ ආමිෂයක් අනුභව කිරීම යන කරුණු පස සම්පූර්ණවීමෙන් ආපත්තියට පැමිණීම වේ.

4. අන්තරාය උපද්‍රවයන්ගෙන් යුක්ත ආරණ්‍ය ශයනාසනයෙක්හි වසන ගිලන් නොවූ භික්‍ෂුවහට ආරාමයට හෝ ආරාම උපචාරයට හෝ පැමිණි යමෙකු විසින් "ස්වාමීනි! මෙනම් කෑ යුත්තක් හෝ වැළඳිය යුත්තක් ගෙණ එන්නෙමි"යි නොදන්වනලද ඛාද්‍ය භොජ්‍යයක් ආරාමය තුළදී සියතින් පිළිගෙණ වළඳන්නේ වේනම් ඒ භික්‍ෂුවයට ආරඤ්ඤකයෙහි පාටිදෙසනීය ඇවැත වේ.

භය ඇතිකල්හි භය රහිතය යන සංඥ ඇත්තේ වීනම් දුකුළාවේ. එහි විමති ඇත්තේ වීනම් දුකුළාවේ.

**ආපත්තියට පැමිණීම**

ආරණ්‍ය විහාරයක් වීම, යාමකාලිකය, ඒ ආරාමයට නොපැමිණීම, නොගිලන් බව, ගිලනාගේ අවශිෂ්ටයක් නොවන බව, භය ඇත්තේයයි නො අසන ලද බව, ආරාමාභ්‍යන්තරයෙහි පිළිගැණීම, අනුභව කිරීම යන කරුණු සත සම්පූර්ණ වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

(සිව් වැදෑරුම් පිළිදෙස්නි ඇවැත් රැසයි.)

“දුට්ඨුල්ලභාණං දුක්කටං”යි කියාවන [illegible] කොට කරණ ලද්ද දුෂ්කෘත නම් වේ.

මේ දුෂ්කෘතාපත්තිස්කන්ධය තෙමේ සියල්ල සඞ්ග්‍රහකිරීම් වශයෙන් පූර්‍වප්‍රයෝග, සහප්‍රයෝග, අනාමාස, දුරුපචිණ්ණ, විනය, ඤත, ඤත්ති, පටිස්සව, දුක්කට වශයෙන් අට වැදෑරුම් වේ. පාරාජිකාදී ඒ ඒ ආපත්ති සාධක අඞ්ගයන්ට පෙරටුව කාය වාක් ප්‍රයෝගයන්හි සිදුවන ආපත්ති තොමෝ පූර්‍වප්‍රයෝග දුක්කට නම්වේ. ඒ ඒ ආපත්තීන්ට සාධක අඞ්ග සහිත කාය වාක් ප්‍රයෝගයන්හි සිදුවන ආපත්ති තොමෝ සහප්‍රයෝග දුක්කට නම්. දශවිධ රත්න, සප්තවිධ ධාන්‍ය, ආයුධභාණ්ඩ, තූර්‍යභාණ්ඩ, ස්ත්‍රීරූප, ස්ත්‍රීආභරණ, පරාමර්ශනයෙහි සිද්ධවන ආපත්ති තොමෝ අනාමාස දුක්කට නම්. “මෙය නොකාට යුතුය”යි පනවන ලද්ද කිරීමෙහි සිදුවන ආපත්ති තොමෝ දුරුපචිණ්ණ දුක්කට නම්. අවශෙෂ සප්ත ප්‍රකාර දුෂ්කෘතයන්හැර අතිරික්තව විනයෙහි පනවනලද්ද දුෂ්කෘතාපත්ති තොමෝ විනය දුෂ්කෘත නම්වේ. ඒකාදශ සම්නුභාෂණ කර්‍මයන්හි (භික්ෂු ප්‍රාතිමොක්ෂයෙහි යාවතතියක සඞ්ඝාදිසෙස් සතරද, දිට්ඨි අප්පටිනිස්සජ්ජන පචිත්තියද භික්ෂුණී ප්‍රාතිමොක්ෂයෙහි උක්ඛිත්තානුවත්තිකා පාරාජිකාවද යාවතතියක සඞ්ඝාදිසෙස් සතරද, චණ්ඩකාලි පචිත්තියද යන මෙකී ආපත්තීන් ආරෝපනය කරණු පිණිස කරණලද කර්‍ම ඒකාදශයකි) යමක් “ඤත්ති දුෂ්කෘතය”යි වදාරණ ලද්දේද ඒ ඤත්ති දුෂ්කෘත නම්වේ. වස්විසීම් ආදිය ගැණ දෙනලද්ද ප්‍රතිඥාව සම්පාදනය නොකරන්නාහට සිදුවන ආපත්ති තොමෝ පටිස්සව දුක්කට නම්වේ. අසවල් භික්ෂුතෙම සංඝභෙදය පිණිස උත්සාහ කරායයි අසා අරුත් දූතගත් කල්හි එය වලක්වනු පිණිස එහි ගොස් අවවාද නොකරණ භික්ෂුවහට සිදුවන ආපත්ති තොමෝ ඤාත දුක්කට නම්වේ.

## මේ දෑක්වූයේ අෂ්ට දුෂ්කෘත විනිසයි.

---

### මෙතැන් පටන් සෙඛියාගත පරිදි දුෂ්කෘතාපත්ති විභාගය දැක්වේ.

1. උපසපන් භික්ෂුවක් තෙමේ නාබි හා දෙදන යන තුන් මඬුල්ල වසා පිරිමඬුලුකොට හඳනා සිවුර හැන්ද යුතුයි. එසේ නැතිව (පෙරටුව හෝ පසුව හෝ කොන් එල්ලෙන පරිදි) පිරිමඬුලු නොකොට හඳනා සිවුර හඳින භික්ෂුවහට අපරිමණ්ඩල නිවාසනයෙහි දුෂ්කෘතාපත්තිය වේ.

අනාදර ඇතිබව, ඇවැත් නොවීමට
ආපන්නිශධ සෑමිණීම හේතුවක් නැතිබව, විසමකොට හඳනා
සිවුර හැඳීම යන කාරණාත්‍රය සම්පූර්ණ
වීමෙන් ආපත්තියට පැමිණීම වේ.

2. යම් භික්ෂුවක් තෙමේ පිරිමඬුලු නොකොට කාය වසන්නාවූ සිවුර පෙරවත්තේ වීනම් ඒ භික්ෂුවහට දුකුළා ඇවැත් වේ [illegible]

3. යම් භික්ෂුවක් තෙමේ ගණ්ඨිය පාසයෙහි තොලා සිවුරු නුවා වෙන් ග්‍රීවය නොවසා දෙකොණ සමවගෙණ එක්කොට අඹරා වැටියක් කොට මැණික් කට්ටුව දක්වා නොවසා දෙ අත්ල දෙපතුල හිස යන පස් තැන හැර සෙසු සියලු කාය ආවරණය නොකොට ඇතුළු ගමට යන්නේ වී නම් ඒ භික්ෂුවහට සුපටිච්ඡන්න අගමන පාරුපනයෙහි දුකුළා ඇවැත වේ.

4. යම් භික්ෂුවක් තෙමේ ගණ්ඨියපාසයෙහි තොලා සිවුරු නුවා වෙන් ග්‍රීවය නොවසා දෙකොණ සමව ගෙණ එක්කොට අඹරා වැටියක් කොට මැණික් කට්ටුව දක්වා නොවසා දෙ අත්ල දෙපතුල හිස යන පඤ්චස්ථානය හැර සෙසු සියලු කාය ආවරණය නොකොට ඇතුළුගම නිසීදනය කෙරේනම් ඒ භික්ෂුවහට සුපටිච්ඡන්න අනිසීදනයෙහි දුකුළා ඇවැත වේ.

5. යම් භික්ෂුවක් තෙමේ හස්ත පාදයන් ක්‍රීඩාකරවමින් (වනමින්) මොනවට ඉන්ද්‍රියයන් සංවර නොකොට ඇතුළුගම හැසිරේ නම් ඒ භික්ෂුවහට සුසංවෘත අගමනයෙහි දුකුළා ඇවැත් වේ.

6. යම් භික්ෂුවක් තෙමේ හස්තපාදයන් ක්‍රීඩාකරවමින් (වනමින්) ඉන්ද්‍රිය සංවරයෙන් තොරව ඇතුළු ගම්හි නිසීදනය කෙරේ නම් ඒ භික්ෂුවහට සුසංවෘත අනිසීදනයෙහි දුකුළා ඇවැත් වේ.

7. යම් භික්ෂුවක් තෙමේ යට හෙළනලද ඇස් ඇතිව වියදඬු පමණ දුර ඉක්මවා (සතර රියන් පමණ තැන් ඉක්මවා) බලමින් ඇතුළු ගම්හි යේනම් ඒ භික්ෂුවහට ඔක්ඛිත්තචක්ඛු අගමනයෙහි දුකුළා ඇවැත් වේ.

8. යම් භික්ෂුවක් තෙමේ එලෙසින්ම අසංවෘත නියායෙන් ඇතුළු ගම්හි නිසීදනය කෙරේද දුකුළා ඇවැත් වේ.

9. යම් භික්ෂුවක් තෙමේ එක අංශයකින් හෝ අංශ දෙකින් හෝ ඔසවනලද සිවුරු ඇතිව (හෙවත් සිවුරු කැසපට ගන්වා ගෙණ) අන්තර ඝරප්‍රවේශනය කෙරේනම් ඒ භික්ෂුවහට උක්ඛිත්තකාය ගමනයෙහි දුකුළා වේ.

10. එසේම සිවුර කැසපට ගන්වාගෙණ අන්තරඝරයෙහි නිසීදනය කෙරේද දුකුළා ඇවැත් අවදනේයි.

## පිරිමඬුලු වගයි.

---

1. යම් භික්ෂුවක් තෙමේ තොල විවෘතකොට උස්වූ හඬින් සිනාසෙමින් ඇතුළු ගම්හි යේනම් ඒ භික්ෂුවහට උජ්ජග්ඝිකාය ගමනයෙහි දුකුළා ඇවැත වේ.

2. එසේම යම් භික්ෂුවක් ඇතුළු ගම්හි මහසිනාවෙන් සිනාසෙමින් නිසීදනය කෙරේද ඒ භික්ෂුවහට උජ්ජග්ඝිකාය නිසීදනයෙහි දුකුළා ඇවැත වේ.

3. යම් භික්ෂුවක් තෙමේ උස් මහත් ශබ්ද කෙරෙමින් අන්තර ඝරප්‍රවේශය කෙරේ නම් ඒ භික්ෂුවහට මහාසද්දගමනයෙහි දුකුළා ඇවැත් වේ.

4. එසේම යම් භික්ෂුවක් උස් මහත් ශබ්ද ඊවත්වමින් අන්තර ඝරනිසීදනය කෙරේද ඒ භික්ෂුවහට මහාසද්ද නිසීදනයෙහි දුකුළා ඇවැත වේ.

5. යම් භික්ෂුවක් තෙමේ කාය සලමින් අත සලමින් හිස සලමින් ඇතුළු ගම්හි යේනම් ඒ භික්ෂුවහට කාය බාහු සීසප්පචාල ගමනයෙහි දුකුළා වේ.

6. එසේම යම් භික්ෂුවක් කාය අත හිස සලමින් ඇතුළු ගම්හි නිසීදනය කෙරේද ඒ භික්ෂුවහට කාය බාහු සීසප්පචාලක නිසීදනයෙහි දුකුළා ඇවැත් වේ.

7. යම් භික්ෂුවක් අත සලමින් ඇතුළු ගම්හි යේ නම් බාහුප්පචාලක ගමනයෙහි දුකුළා වේ.

8. එසේම අත සලමින් ඇතුළු ගම්හි නිසීදනය කෙරේනම් බාහුප්පචාලක නිසීදනයෙහි දුකුළා ඇවැත් වෙ.

9. යම් භික්ෂුවක් තෙමේ හිස සලමින් ඇතුළු ගම්හි යේ නම් ඒ භික්ෂුවහට සීසප්පචාලක ගමනයෙහි දුකුළා වේ.

10. එසේම යම් භික්ෂුවක් ඇතුළු ගම්හි හිස සලමින් නිසීදනය කෙරේ නම් ඒ භික්ෂුවහට සීසප්පචාලක නිසීදනයෙහි දුකුළා ඇවැත් වේ.

## උජ්ජග්ඝිකා වගයි.

---

1. යම් භික්ෂුවක් තෙමේ කටියෙහි තබතලද අත් ඇතිව ඇතුළු ගම්හි යේ නම් ඒ භික්ෂුවහට ඛම්භකත ගමනයෙහි දුකුළා වේ.

2. එසේම යම් භික්ෂුවක් කටියෙහි තබතලද අත් ඇතිව ඇතුළු ගම්හි නිසීදනය කෙරේ නම් ඒ භික්ෂුවහට ඛම්භකත නිසීදනයෙහි දුකුළා වේ.

3. යම් භික්ෂුවක් තෙමේ හිස වසා පෙරවගෙණ ඇතුළු ගම්හි යේ නම් ඔගුණ්ඨික ගමනයෙහි දුකුළා වේ.

4. එසේම භික්ෂුවක් හිස වසා පෙරවගෙණ ඇතුළු ගම්හි නිසීදනය කෙරේ නම් ඔගුණ්ඨික නිසීදනයෙහි දුකුළා ඇවැත් වේ.

5. යම් භික්ෂුවක් තෙමේ ඇඟිලි අග් ඔසවා විලුඹින් හෝ විලුඹ ඔසවා ඇඟිලි අගින් හෝ ඇතුළු ගම්හි යේ නම් ඒ භික්ෂුවහට උක්කුටිකා ගමනයෙහි දුකුළා වේ.

6. යම් භික්ෂුවක් තෙමේ අත් දෙකින් දනහිස් බැඳගෙණ හෝ වස්ත්‍රයෙන් දනහිස් බැඳගෙණ හෝ ඇතුළු ගම්හි නිසීදනය කෙරේනම් ඒ භික්ෂුවහට පල්ලත්ථික නිසීදනයෙහි දුකුළා ඇවැත් වේ.

7. යම් භික්ෂුවක් තෙම පිඬු පිළිගන්නෙමියි සිහිය නූපදවා පිඬු පිළිගන්නා ඒ භික්ෂුවහට සක්කච්ච අපටිග්ගහණයෙහි දුකුළා වේ.

8. යම් භික්ෂුවක් තෙමේ තමා විසින් අධිෂ්ඨාන කරනලද පාත්‍රයෙහි පාත්‍රය යහා සංඥා නැතිව පිඬු පිළිගණී නම් ඒ භික්ෂුවහට පත්තසඤ්ඤී අපටිග්ගහණයෙහි දුකුළා වේ.

9. යම් භික්ෂුවක් තෙමේ ලබනලද බතින් සතරෙන් කොටසකට වඩා මුං මෑ කොල්ලු ආදියෙන් කරනලද අතින් ගෙණයිය හැකි සූපය තමන් පිණිස ප්‍රතිග්‍රහණය කෙරේ නම් ඒ භික්ෂුවහට සමසූපක අපටිග්ගහණයෙහි දුකුළා වේ.

10. යම් භික්ෂුවක් අධිෂ්ඨානොපග පාත්‍රයෙහි මුවවිට ඉක්මවා පිඬු පිළිගන්නේ වීනම් ඒ භික්ෂුවහට සමතිත්තික අපටිග්ගහණයෙහි දුකුළා ඇවැත් වේ.

## ඛම්භකත වග්ගයි.

---

1. යම් භික්ෂුවක් තෙමේ "පිණ්ඩ භොජනය" වළඳන්නෙමියි සිහිය නූපදවා වළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට අසක්කච්ච භුඤ්ජනයෙහි දුකුළා ඇවැත් වේ.

2. යම් භික්ෂුවක් තෙමේ පාත්‍රගත සංඥාවෙන් තොරව වළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට පත්තසඤ්ඤී අභුඤ්ජනයෙහි දුකුළා ඇවැත් වේ.

3. යම් භික්ෂුවක් තෙමේ තමන් අභිමුඛයෙහි පටන් පිළිවෙළින් පිණ්ඩය නොවළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට සපදාන අභුඤ්ජනයෙහි දුකුළා ඇවැත වේ.

4. යම් භික්ෂුවක් තෙමේ බතින් සතරෙන් කොටසක් සමසූප පිණ්ඩය නොවළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට සමසූපක අභුඤ්ජනයෙහි දුකුළා වේ.

5. යම් භික්ෂුවක් තෙමේ ආහාර භාජනය මුදුනෙන් මැඩගෙණ (හෙවත් පාත්‍රය මැදින් ගෙණ) පිණ්ඩය වළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට ථූපතො මද්දනයෙහි දුකුළා වේ.

6. යම් භික්ෂුවක් තෙමේ සූපයක් හෝ මත්ස්‍ය මාංසාදි ව්‍යඤ්ජනයක් හෝ බොහෝ ලබාගනු කැමැත්තේ සූපව්‍යඤ්ජන බතින් වසා නම් ඒ භික්ෂුවහට ඔදන පටිච්ඡාදනයෙහි දුකුළා වේ.

7. යම් භික්ෂුවක් තෙමේ නො ගිලන් වූයේ නො නෑ නො පැවැරුවන්ගෙන් තමා පිණිස බත් හෝ ව්‍යඤ්ජන හෝ විනවා අනුභව කෙරේ නම් ඒ භික්ෂුවහට සූපොදන විඤ්ඤත්තියෙහි දුකුළා වේ.

8. යම් භික්ෂුවක් තෙමේ ගරහනු කැමැත්තේ අනුන්ගේ පාත්‍රය බලන්නේ වීනම් ඒ භික්ෂුවහට උජ්ඣාන සඤ්ඤීයෙහි දුකුළා වේ.

9. යම් භික්ෂුවක් තෙමේ බත් ආලොප ඉතා මහත් ලෙස ගෙණ අනුභව කරන්නේ වීනම් ඒ භික්ෂුවහට අති මහන්ත කබලකරණයෙහි දුකුළා ඇවැත වේ.

10. යම් භික්ෂුවක් තෙමේ හාත්පසින් පිරිමඬුලු නොකොට බත් ආලොප අනුභව කරන්නේ වීනම් ඒ භික්ෂුවහට පරිමණ්ඩල ආලොප කාරණයෙහි දුකුළා ඇවැත වේ.

## සඤ්ඤවම වගයි.

1. යම් භික්ෂුවක් තෙමේ බත් ආලොප මුඛද්වාරයට නො එළවූ කල්හි මුඛය විවෘත කෙරේනම් ඒ භික්ෂුවහට මුඛද්වාර විවරණයෙහි දුකුළා ඇවැත වේ.

2. යම් භික්ෂුවක් තෙමේ සියලු හස්තය (පසඟිලිම) මුඛයෙහි ප්‍රක්ෂෙප කරන්නේ වීනම් ඒ භික්ෂුවහට සකළමුඛ පවෙසනයෙහි දුකුළා ඇවැත වේ.

3. යම් භික්ෂුවක් තෙමේ ආහාර සහිත මුඛයෙන් යුක්තව කථා කරන්නේ වීනම් ඒ භික්ෂුවහට බ්‍යාහරණයෙහි දුකුළා ඇවැත් වේ.

4. යම් භික්ෂුවක් තෙමේ අහර පිඩු මුඛයට විසිකරමින් වළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට පිණ්ඩුක්ඛෙපකයෙහි දුකුළා ඇවැත් වේ.

5. යම් භික්ෂුවක් තෙමේ බත් ආලොපය සිඳිමින් (තහවත්) කාව මින් වළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට කබලාවච්ඡෙදකයෙහි දුකුළා ඇවැත් වේ.

6. යම් භික්ෂුවක් තෙමේ වඳුරන් මෙන් සක්කෙහි අහර පුරව පුරවා වළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට අවගණ්ඩකාරකයෙහි දුකුළා ඇවැත් වේ.

7. යම් භික්ෂුවක් තෙමේ අත ගසා දම දමා අහර අනුභව කරන්නේ වීනම් ඒ භික්ෂුවහට හත්ථනිද්ධුනකයෙහි දුකුළා ඇවැත වේ.

8. යම් භික්ෂුවක් තෙමේ බත්හුළු විසුරුව විසුරුවා වළඳන්නේ වීනම් ඒ භික්ෂුවහට සිත්ථාව කාරකයෙහි දුකුළා ඇවැත වේ.

9. යම් භික්ෂුවක් තෙමේ තොලෙන් පිටතට දිව නෙරව නෙරවා (දිව දික්කරමින්) අනුභව කරන්නේ වීනම් ඒ භික්ෂුවහට ජිව්හානිච්ඡාරකයෙහි දුකුළා ඇවැත් වේ.

10. යම් භික්ෂුවක් තෙමේ චපු චපු යන අනුකරණ පවත්වමින් අනුභව කරන්නේ වීනම් ඒ භික්ෂුවහට චපු චපු කාරකයෙහි දුකුළාවේ.

## කබල වගියයි

1. යම් භික්ෂුවක් තෙමේ සුරු සුරු යන අනුකරණ පවත්වමින් අහර අනුභව කරන්නේ වීනම් ඒ භික්ෂුවහට සුරු සුරු කාරකයෙහි දුකුළා වේ.

2. යම් භික්ෂුවක් තෙමේ අත ලෙව ලෙව අනුභව කෙරේ නම් ඒ භික්ෂුවහට හත්ථනිල්ලෙහකයෙහි දුකුළා ඇවැත වේ.

3. යම් භික්ෂුවක් තෙමේ පාත්‍රය ලෙව ලෙව අනුභව කරන්නේ නම් ඒ භික්ෂුවහට පත්තනිල්ලෙහකයෙහි දුකුළා වේ.

4. යම් භික්ෂුවක් තෙමේ දෙතොල ලෙවකමින් අහර අනුභව කරන්නේ නම් ඒ භික්ෂුවහට ඔට්ඨනිල්ලෙහකයෙහි දුකුළා වේ.

5. යම් භික්ෂුවක් තෙමේ ආමිසය සහිත (ඉඳුල් සහිත) අතින් පැන් බොන භාජනය ගන්නේ නම් ඒ භික්ෂුවහට ථාලක පටිග්ගහණයෙහි දුකුළා වේ.

6. යම් භික්ෂුවක් තෙමේ පාත්‍රය දෙවූ බත්හුළු සහිත ජලය ඇතුළු ගම්හි නොහොත් ගෙමිදුලුවල දමන්නේ නම් ඒ භික්ෂුවහට සසිත්ථ පිණ්ඩනකයෙහි දුකුළා ඇවැත වේ.

7. යම් භික්ෂුවක් තෙමේ කුඩයක් දරාගත් අත් ඇති නො ගිලනෙකුහට දහම් දෙසන්නේ නම් ඒ භික්ෂුවහට ඡත්තපාණි ධම්මදෙසනයෙහි දුකුළා වේ.

8. යම් භික්ෂුවක් තෙමේ සැරයටියක් ගත් අත් ඇති නො ගිලනෙකුහට දහම් දෙසන්නේ නම් ඒ භික්ෂුවහට දණ්ඩපාණි ධම්මදෙසනයෙහි දුකුළා වේ.

9. යම් භික්ෂුවක් තෙමේ කඩු ඈ ශස්ත්‍රයක් දරාගත් අත් ඇත්තෙකුට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට සත්ථපාණි ධම්මදෙසනයෙහි දුකුළා ඇවැත් වේ.

10. යම් භික්ෂුවක් තෙමේ දුනු ආදී ආවුධයක් දරාගත් අත් ඇත්තෙකුට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට ආවුධපාණි ධම්මදෙසනයෙහි දුකුළා ඇවැත් වේ.

## සුරු සුරු වගයි.

1. යම් භික්ෂුවක් තෙමේ ඛාමටන පාදුකා හෙවත් මිරිවැඩි සහල් පයලා ගත්තහුට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට පාදුකාරූළ්හ ධම්ම දෙසනයෙහි දුකුළා ඇවැත් වේ.

2. යම් භික්ෂුවක් තෙමේ වහන් පයලා ගත්තහුට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට උපාහනාරූළ්හ ධම්මදෙසනයෙහි දුකුළා වේ.

3. යම් භික්ෂුවක් තෙමේ රථාදි යානාවකට පැමිණි නො ගිලෙනෙකුට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට යානගත ධම්මදෙසනයෙහි දුකුළා වේ.

4. යම් භික්ෂුවක් තෙමේ සයන ඉරියව්වට පැමිණි නො ගිලනෙකුහට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට සයනගත ධම්මදෙසනයෙහි දුකුළා වේ.

5. යම් භික්ෂුවක් තෙමේ අතින් හෝ වස්ත්‍රයෙන් අකාවටු බැඳ ගෙණ සිටිනා නො ගිලනාහට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට පල්ලත්ථික ධම්මදෙසනයෙහි දුකුළා වේ.

6. යම් භික්ෂුවක් තෙමේ කෙසානතය වසා හිස බැඳ සිටින්නාවූ හෙවත් හිස් වෙළුම් සහිත නො ගිලනෙකුට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට වෙඨිත සීස ධම්මදෙසනයෙහි දුකුළා වේ.

7. යම් භික්ෂුවක් තෙමේ හිස වසා පෙරව සිටින්නාවූ නො ගිලනෙක්හට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට ඔගුණ්ඨිත සීස ධම්ම දෙසන යෙහි දුකුළා වේ.

8. යම් භික්ෂුවක් තෙමේ බිම හිඳගෙණ යටත්පිරිසෙයින් කලාල් පැදුරු ආදී මිටි අස්නක නමුත් හුන්නාවූ නො ගිලනාහට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට ඡමාය නිසීදන ධම්මදෙසනයෙහි දුකුළා වේ.

9. යම් භික්ෂුවක් තෙමේ මිටි අස්නෙක්හි හිඳගෙණ උස් අස්නෙහි උන්නාවූ නො ගිලනාට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට නීචාසන ධම්ම දෙසනයෙහි දුකුළා වේ.

10. යම් භික්ෂුවක් තෙමේ ඉඳගෙණ උන් නො ගිලනාට තෙමේ සිටගෙණ දහම් දෙසා නම් ඒ භික්ෂුවහට ඨාන ධම්මදෙසනයෙහි දුකුළා ඇවැත් වේ.

11. යම් භික්ෂුවක් තෙමේ පසු පස්සේ යමින් පෙරටුව යන නො ගිලනාහට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට පච්ඡතොගමන ධම්මදෙසන යෙහි දුකුළා වේ.

12. යම් භික්ෂුවක් තෙමේ නොමඟින් යන්නේ මාර්ගයෙහි යන්නා වූ නො ගිලනාට දහම් දෙසා නම් ඒ භික්ෂුවහට උප්පථ ගමන ධම්මදෙසන යෙහි දුකුළා වේ.

13. යම් භික්ෂුවක් තෙමේ නොගිලන් වූයේ සිටගෙණ මලමූත්‍ර කෙරේ නම් ඒ භික්ෂුවහට ඨිතකායෙහි දුකුළා ඇවැත වේ.

14. යම් භික්ෂුවක් තෙමේ නො ගිලන්ව නිල් තෘණ මත්තෙහි මලමූත්‍ර කෙළ සෙම් සොටු ආදිය දමා නම් ඒ භික්ෂුවහට හරිතයෙහි දුකුළා වේ.

15. යම් භික්ෂුවක් තෙමේ නො ගිලන් වූයේ පරිභොගාර්හ ජල යෙහි මල මූත්‍ර කෙල සෙම් සොටු ආදිය දමා නම් ඒ භික්ෂුවහට උදක යෙහි දුකුළා වේ.

පාදුකාරූළ්හ වග්ගං.

# දහතුන්වන පරිච්ඡේදය නම් පාටිදෙසනීය දුබ්බුල්ලාපත්ති විනිස.

---

### සත් සතළිස් දුර්භාෂිතාපත්තීහු දුර්භාෂිතාපත්තිස්කන්ධ නම් වෙති.

"දුරාභට්ඨං භාසිතං දුබ්භාසිතං" යන නිර්වචන සෙයින් නපුරුකොට ප්‍රකාශකරණලද වචනයෙන් උද්ගතවන ආපත්තිතොමෝ දුර්භාෂිතා' පත්තිනම්. ඝේ කවරේද?

1. යම් උපසපන් භික්ෂුවක් තෙමේ හීනජාතික උපසම්පදා ප්‍රාප්ත භික්ෂුවක්හට ක්‍රීඩාධ්‍යාශයෙන් සෑජුව හෝ පශ්වාය වදිමින් හෝ ගනිා

කාරණු කැමැත්තෙන් චණ්ඩාල ජාතිකයෙකි ව්‍යාධ ජාතිකයෙකි යනාදී වශයෙන් හීනජාති පරාමර්ශනයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට වචනයක් පාසා හීනාහීන ජාත්‍යෝ'මසවාද දුර්භාෂිතා'පත්ති වේ.

2. යම් භික්ෂුවක් තෙමේ හීන ජාතික උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩාධ්‍යාශයෙන් ඍජුව හෝ පර්‍ය්‍යාය වදනින් හෝ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්කෘෂ්ට ජාති පරාමර්ශනයෙන් අවමන් කෙරේ නම් ඒ භික්ෂුවහට වචනයක් පාසා හීනොත්කෘෂ්ට ජාත්‍යෝ'මසවාද දුර්භාෂිතා'පත්ති වේ.

3. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට ජාතික උපසම්පන්න භික්ෂුවක්හට ක්‍රීඩා පිණිස හෝ ගැරහීම් වශයෙන් චණ්ඩාල නෙසාදදී හීන ජාතියෙන් අවමන් කරන්නේ නම් ඒ භික්ෂුවහට වචනයක් පාසා උත්කෘෂ්ට හීන ජාත්‍යෝමසවාද දුර්භාෂිතාපත්තිය වේ.

4. යම් භික්ෂුවක් තෙමේ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්කෘෂ්ට ජාතික උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩා පිණිස හෝ කුකුස් ඇතිවන පරිදි ගහී වශයෙන් උත්කෘෂ්ට ජාති පරාමර්ශනයෙන් අවමන් කොරේනම් ඒ භික්ෂුවහට වචනයක් පාසා උක්කට්ඨොක්කට්ඨ ජාත්‍යෝමසවාද දුර්භාෂිතාපත්තිය වේ.

5. යම් උපසපන් භික්ෂුවක් තෙමේ හීන නාමික උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩා වශයෙන් ඍජුව හෝ පර්‍ය්‍යාය වචනයෙන් අවකණ්ණක, ජවකණ්ණක යනාදී ගැත්තන් අයත් නාම පරාමර්ශනයෙන් අවමන් කෙරේද ඒ භික්ෂුවහට වචනයක් පාසා හීන හීන නාමොමසවාද දුර්භාෂිතාපත්ති වේ.

6. යම් භික්ෂුවක් තෙමේ අවකණ්ණක ජවකණ්ණකාදී හීන නාමික උපසම්පන්න භික්ෂුවක්හට ක්‍රීඩාවශයෙන් හෝ ඍජුව හෝ පර්‍ය්‍යාය වචනයෙන් බුදුරැකි දම්රැකි යනාදී උත්කෘෂ්ට නාම පරාමර්ශනයෙන් අවමන් කෙරේද ඒ භික්ෂුවහට වචනයක් පාසා හීනොත්කෘෂ්ට නාමොමසවාදයෙහි දුර්භාෂිතාපත්ති වේ.

7. යම් භික්ෂුවක් තෙමේ බුදුරැකි දම්රැකි ආදී උත්කෘෂ්ට නාමික උපසම්පදාප්‍රාප්ත භික්ෂුවක්හට ගරහන රිසියෙන් උත්කෘෂ්ට නාම පරාමර්ශනයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට වචනයක් පාසා උක්කට්ඨහීන නාමොමසවාද දුර්භාෂිතාපත්ති වේ.

8. යම් උපසපන් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට නාමික උපසපන් භික්ෂුවක්හට බුදුරැකි-දම්රැකි-යනාදී නාමයකින් හෝ ඒ ඒ රටවල ජනතාව විසින් උසස් ලෙස සම්මානිත නාමයෝ වෙත්ද ඒ ඒ නම්වලින් කුකුස් උපදවන අර්ථයෙන් උක්කට්ඨ නාම පටිසංයුක්ත වචනයන්ගෙන් ක්‍රීඩා පිණිස හෝ ගරහන රිසියෙන් අවමන් කෙරේනම් ඒ භික්ෂුවහට වචනයක් පාසා උක්කට්ඨුක්කට්ඨ නාමොමසවාද දුර්භාෂිතාපත්ති වේ.

9. යම් භික්ෂුවක් තෙමේ කොසිය ගොත්‍ර භාරවාජ ගොත්‍රාදී හීන ගොත්‍ර ඇති උපසපන් භික්ෂුවක්හට අවමන්කිරීම් ගැරහීම් වශයෙන්

හීන ගොත්‍ර පරාමර්ශනයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට වචනයක් පාසා හීන හීන ගොත්ත ඕමසවාද දුර්භාෂිතාපත්ති වේ.

10. යම් භික්ෂුවක් තෙමේ පුණ්ණකත පරිදි හීන ගොත්‍ර ඇති උපසපන් භික්ෂුවක්හට ගොතම ගොත්ත-මොග්ගල්ලාන ගොත්ත-කච්චායන ගොත්ත-වාසෙට්ඨ ගොත්තාදි ගොත්‍ර වශයෙන් හෝ ඒ ඒ රටවල ජනතාව විසින් උත්කෘෂ්ට ලෙස පසස්නා උත්කෘෂ්ට ගොත්‍ර පරාමර්ශනයෙන් ක්‍රීඩා පිණිස උපහාස වශයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට වචනයක් පාසා හීන උක්කට්ඨ ගොත්ත ඕමසවාද දුර්භාෂිතාපත්ති වේ.

11. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට ගොත්‍ර ඇති උපසපන් භික්ෂුවක්හට සිතට කුකුස් උපදනා ලෙස හීන ගොත්‍ර පරාමර්ශනයෙන් අවමන් කෙරේද ඒ භික්ෂුවහට වචනයක් පාසා උක්කට්ඨ හීනගොත්ත ඕමසවාද දුර්භාෂිතාපත්ති වේ.

12. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට ගොත්‍ර ඇති උපසපන් භික්ෂුවක්හට අවඥකිරීම් වශයෙන් උත්කෘෂ්ට ගොත්‍ර පරාමර්ශනයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට වචනයක් පාසා උක්කට්ඨුක්කට්ඨ ගොත්ත ඕමසවාද දුර්භාෂිතාපත්ති වේ.

13. යම් භික්ෂුවක් තෙමේ වඩුකම් කසල ඇදීම් ආදී ඒ ඒ රටවල ජනයා විසින් පහත්කොට සලකන හීන කර්මික උපසම්පන්න භික්ෂුවක්හට එසේම හීනකර්ම පරාමර්ශනයෙන් අවමන් කෙරේ නම් ඒ භික්ෂුවහට හීන කම්මොමසවාද දුර්භාෂිතාපත්ති වේ.

14. යම් භික්ෂුවක් තෙමේ හීනකර්මික උපසපන් භික්ෂුවක්හට කෘෂිකර්ම වණික්කර්ම ගවපාලන ආදී උත්කෘෂ්ට කර්මයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට හීන උක්කට්ඨ කම්මොමසවාද දුර්භාෂිතාපත්ති වේ.

15. යම් භික්ෂුවක් තෙමේ කෘෂිකර්ම වණික්කර්ම ගොරක්ෂණාදි ඒ ඒ රටවල ජනතාව විසින් උසස් ලෙස සලකන උත්කෘෂ්ට කාර්මික උපසම්පන්න භික්ෂුවක්හට හීන කර්ම පරාමර්ශනයෙන් අවමන් කෙරේ නම් ඒ භික්ෂුවහට උක්කට්ඨහීන කම්මොමසවාද දුර්භාෂිතාපත්ති වේ.

16. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට කාර්මික උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩා වශයෙන් සෘජුව හෝ පරියාය වදනින් හෝ උත්කෘෂ්ට කර්මයෙන් අවමන් කෙරේ නම් ඒ භික්ෂුවහට උක්කට්ඨුක්කට්ඨ ඕමසවාද දුර්භාෂිතාපත්ති වේ.

17. යම් භික්ෂුවක් තෙමේ කුලුපොතුශිල්ප-කුම්භකාර-පෙසකාර-සම්කාරු ශිල්පාදී ඒ ඒ රටවල ජනයා විසින් පහත්කොට සලකන හීන ශිල්පික උපසපන් භික්ෂුවක්හට එසේම හීන ශිල්පයෙන් ක්‍රීඩා පිණිස සෘජුව හෝ පරියාය තෙපුලෙන් හෝ හීන ශිල්පයෙන් අවමන් කෙරේ නම් ඒ භික්ෂුවහට හීන හීන ශිල්ප ඕමසවාද දුර්භාෂිතාපත්ති වේ.

18. යම් භික්ෂුවක් තෙමේ හීන ශිල්පික උපසම්පදාව ලත් භික්ෂුවක්හට උපහාස වශයෙන් මුද්‍රාශිල්ප ගණිතශිල්ප ලේඛාශිල්පාදි ඒ ඒ රටවල ජනයා විසින් උසස්කොට සලකන උත්කෘෂ්ට ශිල්පයෙන් අවමන්කෙරේ නම් ඒ භික්ෂුවහට හීන උක්කට්ඨසිප්ප ඕමසවාද දුර්භාෂිතාපත්ති වේ.

19. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට ශිල්පික උපසපන් භික්ෂුවක්හට එසේ අවමන් කිරීම් වශයෙන් හීන ශිල්පයෙන් අවමන් කෙරේ නම් ඒ භික්ෂුවහට උක්කට්ඨහීන සිප්ප ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

20. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට ශිල්පික උපසපන් භික්ෂුවක්හට අවඥාකිරීම් මුඛයෙන් උත්කෘෂ්ට ශිල්පයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට උක්කට්ඨුක්කට්ඨ සිප්පඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

21. යම් භික්ෂුවක් තෙමේ හීනාබාධික උපසපන් භික්ෂුවක්හට එසේම හීනාබාධයෙන් අවමන් කරන්නේ නම් ඒ භික්ෂුවහට හීන හීනාබාධ ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

22. යම් භික්ෂුවක් තෙමේ හීනාබාධික උපසපන් භික්ෂුවක්හට (වේදනා රහිත) මධු මේහ උත්කෘෂ්ටා'බාධයෙන් ක්‍රීඩා වශයෙන් ඍජුව හෝ ගර්හාකිරීම් වශයෙන් අවමන් කෙරේ නම් ඒ භික්ෂුවහට හීන උක්කට්ඨාබාධ ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

23. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ටාබාධයෙන් යුක්ත උපසපන් භික්ෂුවක්හට හීනාබාධයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට උක්කට්ඨ හීනාබාධ ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

24. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ටාබාධයකින් පෙළෙන උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩා වශයෙන් ඍජුව හෝ අපහාස වචනයන්ගේ වශයෙන් උත්කෘෂ්ටාබාධයකින් ගටා බිණීනම් ඒ භික්ෂුවහට උක්කට්ඨුක්කට්ඨා'බාධ ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

25. යම් භික්ෂුවක් තෙමේ ඉතා දීර්ඝය ඉතා හ්‍රස්වය ඉතා කෘෂ්ණය ඉතා සුදුය යනාදී හීන සණ්ඨානික උපසපන් භික්ෂුවක්හට එසේ හීන සණ්ඨානයෙන් අවමන් කෙරේ නම් ඒ භික්ෂුවහට හීන හීන සණ්ඨානක ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

26. යම් භික්ෂුවක් තෙමේ හීන සණ්ඨානික උපසපන් භික්ෂුවක්හට සමවූ දීර්ඝත්ව හ්‍රස්වත්වාදියෙන් යුක්තය යනාදී උත්කෘෂ්ට සණ්ඨානයෙන් අවඥාකරන්නේ වීනම් ඒ භික්ෂුවහට හීන උක්කට්ඨ සණ්ඨානක ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

27. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට සණ්ඨානික උපසපන් භික්ෂුවක්හට ගරහන රිසියෙන් හීන සණ්ඨානයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට උක්කට්ඨහීන සණ්ඨාන ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

28. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ට සණ්ඨානික උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩා වශයෙන් ගරහන රිසි ඇත්තේ උත්කෘෂ්ට සණ්ඨානයෙන් ගටා බිණීනම් ඒ භික්ෂුවහට උක්කට්ඨුක්කට්ඨ සණ්ඨාන ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

29. යම් භික්ෂුවක් තෙමේ සංක්ලේශික ලෝභ ද්වේෂ මෝහාදියෙන් යුත් උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩාධ්‍යාශයෙන් ඍජුව හෝ පර්යාය තෙපුලෙන් හෝ සංක්ලේශිකතායෙන් අපහාසකරන්නේ වීනම් ඒ භික්ෂුවහට හීන හීන ක්ලේශ ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

30. යම් භික්ෂුවක් තෙමේ සංක්ලේශික උපසපන් භික්ෂුවක්හට එසේම නික්ලේශිකතායෙන් අවඥකරන්නේ වීනම් ඒ භික්ෂුවහට හීන උක්කට්ඨකිලෙස ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

31. යම් භික්ෂුවක් තෙමේ නික්ලේශික උපසපන් භික්ෂුවක්හට ලොභ දෙස මොහාදියෙන් යුත් සංක්ලේශිකතායෙන් අවඥ කරන්නේ වීනම් ඒ භික්ෂුවහට උක්කට්ඨ හීන කිලෙස ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

32. යම් භික්ෂුවක් තෙමේ නික්ලේශික අලොභ අදෙස අමොහාදියෙන් යුක්ත උපසපන් භික්ෂුවක්හට අවමන් කිරීම් හේතුවෙන් නික්ලේශිකතායෙන් ගටා බිණී නම් ඒ භික්ෂුවහට උක්කට්ඨුක්කට්ඨ කිලෙස ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

33. යම් භික්ෂුවක් තෙමේ හීනා'පත්තික උපසපන් භික්ෂුවක්හට එසේ හීනාපත්තියෙන් අවමන් කරන්නේ වීනම් ඒ භික්ෂුවහට හීන හීනාපත්ති ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

34. යම් භික්ෂුවක් තෙමේ හීනාපත්තික උපසපන් භික්ෂුවක්හට සොතාපත්ති සමාපත්ති ආදී උත්කෘෂ්ටාපත්තියකින් ක්‍රීඩා වශයෙන් සෘජුව හෝ පරියාය වචනයන්ගෙන් අවමන් කරන්නේ වීනම් ඒ භික්ෂුවහට හීන උක්කට්ඨාපත්ති ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

35. යම් භික්ෂුවක් තෙමේ සොතාපත්ති සමාපත්ති ආදි උත්කෘෂ්ටා'පත්තික උපසපන් භික්ෂුවක්හට අවඥකිරීම් වශයෙන් හීනා'පත්තියකින් ගටා බිණීනම් ඒ භික්ෂුවහට උක්කට්ඨහීනාපත්ති ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

36. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ටාපත්තික උපසපන් භික්ෂුවක්හට එසේම උත්කෘෂ්ටාපත්තියෙන් ගටා බිණින්නේ නම් ඒ භික්ෂුවහට උක්කට්ඨුක්කට්ඨාපත්ති ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

37. යම් භික්ෂුවක් තෙමේ හීනාක්‍රොශික (ගොනෙක් ගද්‍රභයෙක් තිරිසනෙක් වෙහිය) යනාදී හීනාක්‍රොශික උපසපන් භික්ෂුවක්හට එසේ හීනාක්‍රොශයෙන් ගටා බිණින්නේ නම් ඒ භික්ෂුවහට හීනහීන අක්කොස ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

38. යම් භික්ෂුවක් තෙමේ හීනාක්‍රොශික උපසපන් භික්ෂුවක්හට පණ්ඩිතය, ව්‍යක්තය, නුවණැතිය, බහුශ්‍රැතය, ධර්මකථික වෙහිය යනාදියෙන් අවමන් කිරීම් වශයෙන් උත්කෘෂ්ටාක්‍රොශයෙන් ගටා බිණින්නේ නම් ඒ භික්ෂුවහට හීන උක්කට්ඨ අක්කොස ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

39. යම් භික්ෂුවක් තෙමේ උත්කෘෂ්ටාක්‍රොශික උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩාපිණිස හෝ අවමන් කිරීම් වශයෙන් හීනාක්‍රොශයෙන් උපහාස කරන්නේ නම් ඒ භික්ෂුවහට උක්කට්ඨ හීනාක්කොස ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

40. යම් භික්ෂුවක් තෙමේ පණ්ඩිත වෙහිය, ව්‍යක්ත වෙහිය, නුවණැත්තේ වෙහිය, බහුශ්‍රැත වෙහිය යනාදී උත්කෘෂ්ටාක්‍රොශික උපසපන් භික්ෂුවක්හට ක්‍රීඩාධ්‍යාශයෙන් සෘජුව හෝ පරියාය වචනයෙන් අවඥකිරීම් වශයෙන් උත්කෘෂ්ටාක්‍රොශයෙන් ගර්හාකරණ භික්ෂුවහට උක්කට්ඨක්කට්ඨ අක්කොස ඔමසවාද දුර්භාෂිතාපත්ති වේ.

## දස සතරවන පරිච්ඡේදය නම් සම සතළිස් දුබැසි විනිස.

---

**මෛථුන් පටන් නිවන් පිණිස සසුන්වන් උපසපුව ලත් පැවිද්දන් විසින් පිරිය යුතු තුදුස්වත් විනිස සැකෙවින් දක්වනු ලැබේ.**

**තුදුස්වත් රැස.**

ආගන්තුක වත, ආවාසික වත, ගමික වත, අනුමොදනා වත, භත්තග්ග වත, පිණ්ඩචාරික වත, ආරණ්‍යක වත, සේනාසන වත, ජන්තාඝර වත, වච්චකුටි වත, සද්ධිවිහාරික වත, උපාධ්‍යාය වත, අන්තෙවාසික වත, ආචාර්‍ය්‍ය වත'යි චුද්දසාකාරවේ.

**එහි ආගන්තුක වත කෙසේද යත්?**

විහාරාරාමයන්ට ප්‍රවිෂ්ටවන ආගන්තුක භික්ෂුව විසින් විහාරූපචාර සීමාවෙහිදී පාවහන් මුදා ඉසලූ කුඩය හකුලා සිවුර සකස් කොට (කරෙහිකොට) සංවරයෙන් වෙහෙරට පිවිසිය යුතුයි. අරම්වැසි භික්ෂූන් රැස්වෙන තැන් සලකුණුකොට ගෙණ තත්ස්ථානයට පැමිණ පාත්‍රය එකත්පසෙක්හි තැබිය යුතුයි. සඟළ සිවුර මුදා තැබිය යුතුයි. සුදුසු අසුනක හින්ද යුතුයි. පියයුතු පරිභොග කටයුතු පැන් විචාළ යුතුයි. පියයුතු ජලයෙන් ප්‍රයෝජන වේ නම් එය ගෙණ පානයකටයුතුයි. පරිභොග කටයුතු ජලයෙන් ප්‍රයෝජනය වේනම් එයින් පා ධෝවනය කටයුතුයි. එක් අතකින් ජලය වත්කරණුයේ අනික් අතින් පා සේදිය යුතුයි. පා සෝදන අතින් ජලය නො වත් කළයුතුයි. පා වහන් පිසදමන වස්ත්‍ර ඛණ්ඩය ඉල්වාගෙණ වහන් පිස දැමිය යුතුයි. වහන් පිස දමන භික්ෂුව විසින් වියලි වස්ත්‍රයෙන් පිස තෙත් රෙදිකඩින් නැවත පිස දැමිය යුතුයි. එම තෙත් රෙදිකඩ අව්වේ වැනිය යුතුයි. ආවාස වැසි භික්ෂුව තමහට වැඩිමහල් නම් අභිවාදනය කටයුතුයි. නවකයෙක් නම් වස් විමසා වැන්දවිය යුතුයි. සෙනසුන් විචාළ යුතුයි. වාසා'වාසවිහාර සෙනසුන් විචාළ යුතුයි. ගොචරග්‍රාමය ගැණ විමසිය යුතුයි. අගොචරය විමසිය යුතුයි. සෙඛසම්මත කුලයන් විමසිය යුතුයි. වර්චස්ථානය විචාළ යුතුයි. කොසකිළිය විචාළ යුතුයි. කිනම් පුෂ්කරණීන්යි ජලය පියයුතුද? පරිභොග කටයුතුදැයි විමසිය යුතුයි. සැරයටිය විචාළ යුතුයි. ග්‍රාම ප්‍රවෙශනයට සුදුසු නුසුදුසු කාල විමසිය යුතුයි තමා වාසය නොකරණලද විහාරය කවුළු හැර පිටත සිටියහු විසින් ගෘහාභ්‍යන්තරය බැලිය යුතුයි. එහි කසළ - සහිත

වේද ඇඳ පුටු හෝ නග්වන ලදද ගිලන්භාවයක් නොමැත්තේ නම් එය සකස් කළයුතුයි. විහාරය ශුද්ධකරණ භික්ෂුව විසින් බිම අතුරණ පලස බැහැරකොට එක්පසෙක තැබිය යුතුයි. ඇඳ තබන අඩුගුල් පමණ පා අලු බැහැරකොට එක්පසෙක තැබිය යුතුයි. හිඳිනා කොට්ටය හා හිස තබන කොට්ටය ඉවත්කොට එක්පසෙක තැබිය යුතුයි. ඇඳ පුටුවල අතුරණලද ඇතිරිය එක්පසෙක්හි තැබිය යුතුයි. මඤ්චය කය පාත්කොට පෘථිවියෙහි නොගටන්නහු විසින් උළුවහු දොරබාවන්හි නොගටා එක්පසෙක්හි තැබිය යුතුයි. පීඨයද පාත්කොට මහාව අගුළු කණුවෙහි නොගටන්නහු විසින් බැහැරකොට එක් පසෙක්හි තැබිය යුතුයි. කෙළ පඩික්කම ඉවත්කොට එක්පසෙක්හි තැබිය යුතුයි. පිට තබන පුවරුවද එක්පසෙක්හි තැබිය යුතුයි. විහාරයෙහි මකුළුදැල් ඇත්තේනම් පළමුකොට වියන පටන් හැරිය යුතුයි. කවුළුවල ඇතුළතද පිටතද ගර්භයාගේ කොන් සතරද පිසදැමිය යුතුයි. පිරියම් කළ භිත්තිය කුණු තැවැරී තිබේනම් රෙදිකඩක් තෙමා මිරිකා පිසදැමිය යුතුයි. කළුවන් කළ භූමියද එලෙසම පිස දැමිය යුතුයි. පිරියම් නොකළ බිම දිය ඉස පිස දැමිය යුතුයි. කසළ එකතුකොට එකත්පසෙක්හි දැමිය යුතුයි. බුමතුරුණු වියළා තුබූ තැන නිසිලෙස පනවා තැබිය යුතුයි. මඤ්චප්‍රතිපාදකයෝද ශුද්ධකොට තුබූ තැන නොසිස්ම පනවා තැබිය යුතුයි. පීඨයෝද එලෙසම තැබිය යුතුයි. බිසි බිම්බෝහනද යථාස්ථානයෙහි නිසිලෙස තැබිය යුතුයි. හිඳිනා ඇතිරිය පසතුරුණ වියලා ශුද්ධකොට යථාස්ථානයෙහිම පණවා තැබිය යුතුයි. පඩික්කමද වියලා ගෙණවුත් ස්ථානයවූ පරිදි තැබිය යුතුයි. පිට තබන පුවරුවද නිසිලෙස සකස්කොට ගෙණවුත් ස්ථානය වූ පරිදි තැබිය යුතුයි. පායිවුරු සකස්කොට තැබිය යුතුයි. පාත්‍රය තබන්නහු විසින් ඇඳ පුටු යටභාගය අතගා බලා තැබිය යුතුයි. ආස්තරණ නො අතුළ බිම පාත්‍රය නොතැබිය යුතුයි. සිවුර තබන්නහු විසින් සිවුරු රැහැන එක් අතකින් පිසදමා බාහිර පාර්ශවයකි කොණ ඇතුලට නැමීමකොට සිවුර තැබිය යුතුයි. රජස් සහිත වාතයෝ පෙර දිගින් හමාතම් පෙරදිග කවුළු වැසිය යුතුයි. බස්නාහිරින් රජස් සහිත වාතයෝ හමයි නම් එ දිග කවුළු වැසිය යුතුයි. උතුර, දකුණ දිග්හිද එසේම කටයුතුයි. ශීත කාලය වීනම් දවල්හි කවුළු ඇරිය යුතුයි. රාත්‍රියෙහි වැසිය යුතුයි. උෂ්ණ කාලය වීනම් දවල්හි කවුළු වැසිය යුතුයි. රාත්‍රියෙහි හැරිය යුතුයි. පිරිවෙණ කසළ සහිත වීනම් හැමැද්ද යුතුයි. පැන් කොටුව, උපස්ථාන ශාලාව, ගිනිහල් ගෙය, වැසිකිළිය කසළ සහිත නම් හැමැද්ද යුතුයි. පියයුතු ජලය නොමැති නම් එහි ජලය එළවා තැබිය යුතුයි.

**ආගන්තුක භික්ෂූන් විසින් පැවැත්විය යුතු වත්‍රය**
**පිළිබඳ ධර්ම විනිසයි.**

---

**ආවාසික වත.**

ආවාසයෙහි වසන මහණහු විසින් වැඩි මහළු ආගන්තුක භික්ෂුව දැක අසුන් පැනවිය යුතුයි. පා සෝදන ජලය පාපුටුව-

පා තබන පුවරුව සමීපයෙහි තැබිය යුතුයි. පෙර ගමන්කොට පා සිවුරු පිළිගත යුතුයි. පියයුතු ජලයෙන් ප්‍රයෝජනදැයි විචාළ යුතුයි. පවන් සැලීමද කටයුතුයි. පා සේදිය යුතුයි. තෙලින් පාදලේපනය කටයුතුයි. හැකිනම් වහන් පිසදැමිය යුතුයි. වහන් පිසදමන රෙදිකඩ වියළනු පිණිස අව්වේ වැනිය යුතුයි. වැඩිමහළුවුම ආගන්තුක මහණ තෙමේ වැන්ද යුතුයි. මේ සෙනස්න නුඹවහන්සේට පැමිණේයයි සෙනසුන පැණවිය යුතුයි. විසීම කළත් නොකළත් සෙනසුන කිය යුතුයි. ගොචරය කියයුතුයි. අගොචරය කියයුතුයි. සෙඛසම්මත කුලයෝ කියයුත්තාහ. වර්චස්ථාන ප්‍රශ්‍රාවස්ථාන කියයුතුයි. පියයුතු පරිභොග කටයුතු ජලය කියයුතුයි. සැරයටිය කියයුතුයි. පිවිසිය යුතු යායුතු කාලය පිළිබඳ සංඝයාගේ කතිකාවත කියයුතුයි. ආගන්තුක භික්ෂුව නවකයෙක් නම් පාසිවුරු මෙහි තබව මේ ආසනය වේ මෙහි හිඳුවයි කියයුතුයි. පියයුතු ජලය කියයුතුයි. පරිභොගකටයුතු ජලය කියයුතුයි. වහන් පිසින රෙදිකඩ කියයුතුයි. නවක ආගන්තුක මහණ වැන්දවිය යුතුයි. මේ සෙනසුන යුෂ්මත්හට පැමිණේයයි කිය යුතුයි. වසනලද වෙහෙරද නොවසනලද වෙහෙරද කියයුතුයි. ගොචර-අගොචර කියයුතුයි. සෙඛසම්මත කුලයෝ කියයුත්තාහ. වර්චස්ථාන ප්‍රශ්‍රාවස්ථාන කියයුතුයි. පියයුතු පරිභොග කටයුතු ජලය කියයුතුයි. සැරයටිය කියයුතුයි. මේකල පිවිසිය යුතුයි. මේකල නික්මිය යුතුයයි සඞ්ඝයාගේ කතිකාවත කියයුතුයි. වැඩිමහළු ස්ථවිරනමක් පැමිණි කල්හි චීවරකමාදී සියල්ලම තබා සියලුවත් කටයුතුයි. දගැප් මළුව අමදින්නහු විසිනුදු මුසුන තබා ඕහට කටයුතු සියලුවත් කටයුතුයි. නැණවත් ආගන්තුක තෙමේ පළමුකොට දගැප් මළුව හැමැන්ද යුතුයයි කියයි. ගිලනහට බෙහෙත් කරන්නහු විසින්ද ගිලනා වැනි රොගාතුරයෙක් නොවේනම් ආගන්තුකවත පළමුකොට කළයුතුයි. වැනි රොගාතුරයෙක් වීනම් ආගන්තුක වත නොකොට ගිලනාටම ප්‍රතිකාර කටයුතුයි.

## ආවාසික භික්ෂුව විසින් පැවැත්විය යුතු වත්රුණ පිළිබඳ මේ විනිසයි.

---

**ගමික වත.** ගමික භික්ෂුව විසින් දැව භාණ්ඩ-මැටි මය භාණ්ඩ සඟස්කොට තබා දොර කවුළු වසා සමීපයෙහි සිටි භික්ෂු ආදී යමෙකුට භාරදී බැහැරයායුතුයි. භික්ෂුවක් නැත්තේ නම් සාමණේර තෙමේද විචාළ යුත්තේය. සාමණේරයෙක්ද නැත්තේ නම් ආරාමික කැප කරු විචාළ යුත්තේය. කිසිවෙකු නොමැතිකල ගල් සතරක් මත ඇඳ තබා පුටුමත පුටු තබා මෙලෙසින් සෙනසුන් දැව භාණ්ඩ මැටි භාණ්ඩ පුරුකිකොට තබා දොරකවුළු වසා බැහැර යා යුතුයි. විහාරය තෙමේද හැකිනම් වැසිය යුතුයි. විහාරය වැස්වීමට උත්සාහ හෝ කටයුතුයි. මෙය සිදුවන්නේනම් මැනවි. නො සිදුවන්නේ නම් නොතෙමෙන පෙදෙස්හි පූර්වෝක්ත පරිදි ඇඳ පුටු සෙනසුන් හා දැව භාණ්ඩ මැටි භාණ්ඩ පුරුකිකොට තබා බැහැර යායුතුයි. මුළු විහාරයම තෙමේනම් හෝනා

අසුන ගමට ගෙණ යා යුත්තේය. කිමෙක් දෙනෝ සෙනසුන ගමට ගෙණයනු ලබන්නේදැයි උත්සාහ හෝ කටයුත්තේය. මෙය ලබන්නේ නම් මැනවි. නොලබන්නේ නම් අභ්‍යවකාශයෙහි ගල් සතරක් මත ඇඳ පුටු සෙනසුන් තබා දුම භාණ්ඩ මැටි භාණ්ඩද පුරුකිව තබා ඒ මත තෘණයෙන් හෝ තාලපර්ණාදි කිසි පත්‍රයකින් හෝ වසා අවයව යෝ වුවත් ශෙෂ වූවානුනම් මැනවයි සලකා යා යුත්තේය.

## ගමිකා භික්ෂුව විසින් පැවැත්විය යුතු වත්රැස පිළිබඳ මේ විනිසයි.

---

**අනුමෝදනා වත.** භතත භොජන ස්ථානයෙහි අනුමෝදනා නොකිරීම හේතුකොටගෙණ මනුෂ්‍යයෝ හෙළා දැකීමට අගුණ ප්‍රකාශකිරීමට පැමිණියාහුය. මෙය නිමිත්තකොට ගෙණ බුදුරජනන්වහන්සේ විසින් අනුමෝදනාවත අනුදැන වදාරණලදී. කෙසේද? මහණෙනි, දන් වළඳන ස්ථානයෙහි අනුමෝදනාව කරන්ට අනුදනිමියි වදාළසේක. කවරෙකු විසින් භක්තභොජන ස්ථානයෙහි අනුමෝදනාව කටයුතුදැයි මෙබඳු සිතක් පහළ විය. එකල්හි ස්ථවිර භික්ෂූහු විසින් භක්තභොජන ස්ථානයෙහි අනුමෝදනාව කරන්ට අනුදනිම්සි වදාළසේක. එකල සමූහයකගේ එක්තරා සඟ බතක් විය. බුදුරජනන්වහන්සේ විසින් භක්තභොජන ස්ථානයෙහි අනුමෝදනාව ස්ථවිරභික්ෂූන් විසින් කටයුතුයයි අනුදන්නා ලද්දේයයි ආයුෂමත් සාරිපුත්‍ර ස්ථවිරයන් හැර අන්‍ය භික්ෂූහු බැහැර ගියාහුය. ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඒ මනුෂ්‍යයන් සතුටුකරවා හුදකලාව වැඩියසේක. දුරින් වඩින්නාවූ සාරිපුත්‍ර ස්ථවිරයන් දැක (භාග්‍යවත් තෙමේ) බත සමෘද්ධ වූයේදැයි විචාළසේක. භාග්‍යවතුන්වහන්ස! සමෘද්ධ වූයේමය. එසේ නුමුත් භික්ෂූහු හුදකලා මා හැර බැහැර ගියාහුයයි සැලකෙළේය. මෙය මුල කාරණාකොටගෙණ භික්ෂූන් රැස්කරවා භක්තභොජන ස්ථානයෙහි ථෙරානුථෙර සතර පස්නමක් භික්ෂූන් විසින් බලාපොරොත්තු වන්ට අනුදනිමියි වදාළසේක. එකල එක්තරා ස්ථවිර නමක් භක්තභොජන ස්ථානයෙහි වර්චසින් පීඩාවනු ලබන්නේ බලාපොරොත්තු විය. වර්චස උසුලන්නාවූ භික්ෂුව මූර්ඡිතව වැටුනේය. මෙය බුදුරජනන්වහන්සේට සැලකෙළේ කටයුත්තක් ඇතිකල්හි සමීප භික්ෂුවක් විචාරා යන්ට අනුදනිමියි වදාළසේක.

## භක්තභොජන ස්ථානයෙහි අනුමෝදනා වත පිළිබඳ මේ විනිසයි.

---

**භත්තාග්‍රවත.** බුදුරජනන්වහන්සේ විසින් භක්තාග්‍රයෙහි පැවැතිය යුතු පරිදි පණවනලද වත් රැස සැකෙවින් දක්වනු ලැබේ-එනම්:-ආරාමයෙහි (භික්ෂූන් විසින් ගම් වදිනු සඳහා) කල් දන්වන ලද කල්හි නාභිය හා දන මඩුල්ලෙන් යට කොණ්ඩා ඇටයෙන් උඩ අටඟුලක් පමණ වසන්නනු

විසින් හාත්පසින් වටකොට (හෙවත් දෙකොණ සමකොට) අඳනය හැඳ
කා බහන බැඳ ගුණ සහිතකොට සඟළ සිවුර පොරවා ගණ්ඨිය අමුනා
සේදූ පාත්‍රය ගෙණ යුහුසුළු නොවූවහු විසින් ගම් වැදියයුතුයි. ස්ථවිර
භික්ෂූන්ගේ ඉදිරියෙන් නොයා යුතුයි. මනාකොට කය වසා
පොරවන ලද්දහු විසින් ඇතුළුගම්හි යායුතුයි. මනා ඉන්ද්‍රිය සංවර
යෙන් යුක්ත වූවහු විසින් ඇතුළු ගම්හි යායුතුයි. බිම බලා හෙළනලද
(යුගමාත්‍ර දර්‍ශනයෙන් යුක්තව) ඇස් ඇත්තහු විසින් ඇතුළුගම්හි
යායුතුයි. ඔසවනලද සිවුරු ඇතිව ඇතුළුගම්හි නොයා යුතුයි. මහ
සිනාවෙන් යුක්තව ඇතුළුගම්හි නොයායුතුයි. ස්වල්ප ශබ්දයෙන්
යුක්තව ඇතුළුගම්හි යායුතුයි. කය සොලවා සොලවා ඇතුළුගම්හි
නොයායුතුයි. අත සොලවමින් ඇතුළුගම්හි නොයායුතුයි. හිස සොල
වමින් ඇතුළුගම්හි නොයායුතුයි. උකුලෙහි තබනලද අත් ඇතිව
ඇතුළු ගම්හි නොයායුතුයි. හිස වසා පෙරවගෙණ ඇතුළුගම්හි නොයා
යුතුයි. විළුඹ එසවීමෙන් ඇතුළුගම්හි නොයායුතුයි. මනාකොට කය
වසා පොරවන ලද්දහු විසින් ඇතුළුගම හිඳීම කටයුතුයි.

(මනාකොට කය වැසීම නම්:— ගලවාටය පටන් හිසද මැණික්
කට්ටුව පටන් දෙ අත්ද, විළුඹ මස පටන් දෙ පාදයන්ද විවෘතකොට
අවශෙෂ සියල්ල වසා පෙරවීමයි.) මනාකොට සංවර කරණ ලද්දහු
විසින් ඇතුළුගම හිඳීම කටයුතුයි. බිම බලා හෙළනලද ඇස් ඇත්තහු
විසින් ඇතුළුගම හිඳීම කටයුතුයි. සිවුර එසවීමෙන් යුක්තව ඇතුළු
ගම්හි හිඳීම නොකටයුතුයි. මහසිනාවෙන් යුක්තව ඇතුළුගම්හි
හිඳීම නොකට යුතුයි. ස්වල්ප ශබ්දයෙන් යුක්තව ඇතුළුගම්හි
හිඳීම කටයුතුයි. කය සොලවා සොලවා අත් සොලවා සොලවා හිස
සොලවා සොලවා ඇතුළුගම්හි හිඳීම නොකටයුතුයි. උකුලෙහි තබන
ලද අත් ඇතිව ඇතුළුගම්හි හිඳීම නොකටයුතුයි. හිස වසා පෙරව
ගෙණ ඇතුළුගම නොසිටිය යුතුයි. සඟළ සිවුර වතුරු වන්නහු
විසින් ඇතුළුගම හිඳීම නොකටයුතුයි. ස්ථවිර භික්ෂූන් ගටා හිඳීම
නොකටයුතුයි. නවක භික්ෂූහු ආසනයෙන් බැහැර නොකටයුත්තාහ.
සඟළ සිවුර යටකොට ඇතුළුගම හිඳීම් නොකට යුතුයි. පාත්‍ර සෝදන
ජලය දෙනු ලබන කල දෙ අතින් පාත්‍රය ගෙණ ජලය පිළිගත යුතුයි.
පාත්කොට පාත්‍රය නොගටමින් සේදිය යුතුයි. ජලය පිළිගන්න
බඳුනක් ඇත්තේ වේද උදක ප්‍රතිග්‍රාහකය ජලයෙන් නොතෙමෙවා
භික්ෂූහුද ජලයෙන් නොතෙමෙවා සඟල සිවුරද ජලයෙන් නොතෙමේ
වායි පාත්කොට උදක ප්‍රතිග්‍රාහකයෙහි ජලය වත්කළ යුතුයි. උදක
ප්‍රතිග්‍රාහකයක් නැත්තේ නම් හාත්පස භික්ෂූහු ජලයෙන් නොතෙමෙත්
වා සඟළ සිවුර නොතෙමේවායි පාත්කොට ජලය භූමියෙහි වත්කළ
යුතුයි. අහර දෙනු ලබන විට පාත්‍රය දෙ අතින් පිළිගෙණ අහර
පිළිගත යුතුයි. මුද්ගාදි සූපයන්ට අවකාශ තැබිය යුතුයි. ගිතෙල්
තලතෙල් කැවිලි වර්‍ගයක් හෝ ඇත්තේ වීනම් සියල්ලන්ටම සමකොටස්
ඇතිකොට සම්පාදනය කරවයි ස්ථවිර භික්ෂුව විසින් කියයුතුයි. සකස්
කොට (සිහි එළවා) පිඬු පිළිගතයුතුයි. පාත්‍රගත සංඥ ඇත්තහු විසින්

පිණ්ඩපාතය පිළිගත යුතුයි. සමවූ ව්‍යඤ්ජන ඇති පිණ්ඩපාතය පිළිගත යුතුයි. සම පිරිම ඇත්තාවූ පිණ්ඩපාතය පිළිගත යුතුයි. සියල්ලන්ට යම්තාක් අහර නොපැමිණියේ වේද ඒ තාක් සථවිර භික්ෂුව විසින් නොවැළඳිය යුතුයි. සකස්කොට පිණ්ඩපාතය වැළඳිය යුතුයි. පාත්‍ර ගත සංඥ ඇත්තහු විසින් පිඬු වැළඳිය යුතුයි. පිළිවෙළින් පිඬු වැළඳිය යුතුයි. සමවූ ව්‍යඤ්ජන ඇති පිණ්ඩපාතය වැළඳිය යුතුයි. ආහාරයා ගේ මුදුණෙන් මැඩ නොවැළඳිය යුතුයි. බොහෝ කනු කැමැතිබවක් සිතින් ගෙණ මුද්ගාදි සූපයක් හෝ ව්‍යඤ්ජනයක් හෝ බතින් නොවැසිය යුතුයි. නොගිලන්වූවහු විසින් විනවා මුද්ගාදි සූපයක් හෝ ඕදනයක් හෝ නොවැළඳිය යුතුයි—අගුණ කියන රිසියෙන් අනුන්ගේ පාත්‍රය නොබැලියයුතුයි. බත් පිඩ ඉතා මහත් නොකටයුතුයි—වටවූ ආලොපය කටයුතුයි. ආලොපය (මුවදෙර සමීපයට) නොගත්තා කල්හි මුවදෙර නොහැරිය යුතුයි. වළඳන්නහු විසින් සියලු අත මුව දෙර නො බහාලියයුතුයි. ආහාර සහිත මුඛයෙන් කථා නොකළ යුතුයි. මුඛයෙහි පිඬු වීසිකොට නො වැළඳිය යුතුයි. ආලොපය කඩ කඩා නො වැළඳිය යුතුයි. වඳුරන්සේ කපොලයෙහි රැස්කරමින් නො වැළඳිය යුතුයි. අත ගසා දමමින් නො වැළඳිය යුතුයි. බත්හුලු ඉසි මින් නො වැළඳිය යුතුයි. දිව නෙර නෙරා නො වැළඳිය යුතුයි. චපු චපු යන ශබ්ද නගා නො වැළඳිය යුතුයි. සුරු සුරු යන ශබ්ද නගමින් නො වැළඳිය යුතුයි. අත-තොල්-පාත්‍රය ලෙව ලෙව නො වැළඳිය යුතුයි. ඉඳුල් සහිත අතින් පැන් භාජනය නොගතයුතුයි. සියල්ලන්ම වළඳා අවසන් වනතුරු සථවිර භික්ෂූහු ජලය නොපිළිගත යුත්තාහ. ජලය දෙනු ලබනකල දෙඅතින් පාත්‍රය පිළිගෙණ ජලය පිළිගතයුතුයි. නො ගටන්නහු විසින් මනාකොට පාත්‍රය සේදිය යුතුයි. උදක ප්‍රති ග්‍රාහකයක් ඇත්තේ නම් එය ජලයෙන් නොතෙමේවා භික්ෂූහු ජල යෙන් නොතෙමේවා සඟළ සිවුර නොතෙමේවායි පාත්කොට උදක ප්‍රතිග්‍රාහකයෙහි ජලය වත්කළ යුතුයි. උදකප්‍රතිග්‍රාහකයක් නැත්තේ නම් භික්ෂූහු-සඟළ සිවුර ජලයෙන් නොතෙමේවායි පාත්කොට ජලය භූමියෙහි වත්කළ යුතුයි. බත්හුළු සහිත පා සේදූ ජලය ඇතුල් ගෙහි නො දැමියයුතුයි. (භක්තභොජන සථානයෙන් නැග්ට) පසු හැරී එන් නාවූ නවක භික්ෂූන් විසින් පළමුකොටම පසු හැරී ආ යුතුයි. සථවිර වරුන් විසින් නැවත පසු හැරී ආයුතුයි. මනාකොට කය වැසීමෙන් යුක්තව ඇතුළුගම යායුතුයි. මනා සංවරයෙන් යුක්තව ඇතුළුගම යායුතුයි. සිවුරු එසවීමෙන් යුක්තව ඇතුළුගම නොයායුතුයි. මහ සිනාවෙන් යුක්තව ඇතුළුගම නොයායුතුයි. සවල්ප ශබ්දයෙන් යුක් තව ඇතුළුගම යායුතුයි. කය-අත-හිස-සොලවමින් ඇතුළුගම නො යායුතුයි. කටියෙහි තබනලද අත් ඇත්තහු විසින් ඇතුළුගම නො යායුතුයි. හිසවසා පෙරවගෙණ ඇතුළුගම නො යායුතුයි. විළුඹ එස වීමෙන් ඇතුළුගම නො යායුතුයි.

**භික්ෂූන් විසින් භක්තාග්‍රයෙහි පැවැත්විය යුතු වත්රැස-පිළිබඳ මේ විනිසයි.**

**පිණ්ඩචාරිය වත.**

පිණ්ඩාය හැසිරෙන භික්ෂූන් විසින් දැන් ඇතුළුගමට ප්‍රවිෂ්ටවන්නෙමියි ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනය කොට අඳනය ගැඳ කාබගන් බැඳ ගුණ සහිතකොට සඟළ සිවුර පෙරවා ගණ්ඨිය අමුනා සේදූ පාත්‍රය ගෙණ සුහුඬුල් නොව ගම පිවිසිය යුතුයි. කාය මොනවට වසන ලද්දේ-ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ-බිම බලා හෙලනලද ඇස් ඇත්තේ ඇතුළු ගම්හි යායුතුයි. ඔසවනලද සිවුරු ඇතිව-මහ සිනහයෙන් යුක්තව ඇතුළු ගම්හි නො යායුතුයි. ස්වල්ප ශබ්දයෙන් යුක්තව යා යුතුයි. කාය සොලවමින්-අත සොලවමින්-හිස සොලවමින් නොයා යුතුයි. උකුලෙහි තබනලද අත් ඇතිව-හිසවසා පොරවන ලදුව-විළුඹ එසවීමෙන් යුක්තව-ඇතුළු ගම්හි නොයායුතුයි. ගෘහයට පිවිසෙන්නහු විසින් මේ මගින් පිවිසෙන්නෙම් මේ මගින් නික්මෙන්නෙමියි සැලකිය යුතුයි--ඉතා ඉක්මනින් යැම හෝ නික්මීම නොකටයුතුයි. ඉතා දුරද ඉතා ලඟද නොසිටිය යුතුයි. වැඩිකලක් නොසිටිය යුතුයි. ඉතා ඉක්මනින් නොපසු හැරිය යුතුයි. සිටියහු විසින් භික්ෂාව දෙනු කැමැත්තේද නොදෙනු කැමැත්තේදැයි සැලකිය යුතුයි. ආසනයෙන් නැගීසිටිද හැන්ද හෝ ආමශීනය සොරේද බඳුන හෝ අල්වා තබන්නීද දෙනු කැමැත්තියයි සිටිය යුතුයි. භික්ෂාව දෙනුලබන කල්හි වම් අතින් සඟළසිවුර ඔසවා දකුණතින් පාත්‍රය පාත්කොට දෙඅතින් පාත්‍රය පිළිගෙණ භික්ෂාව පිළිගත යුත්තිය. භික්ෂාව දෙන්නියගේ මුහුණ නොබැලිය යුතුයි. මුද්ගසූපාදිය දෙනු කැමැත්තීද නොදෙනු කැමැත්තීදැයි සැලකිය යුතුයි. හැන්ද හෝ බඳුනක් හෝ අල්වා තබන්නීද දෙනු කැමැත්තියයි සිටියයුතුයි. භික්ෂාව දුන් කල්හි සඟළ සිවුරෙන් පාත්‍රය වසාගෙණ මනාසේ ඉක්මන් නැතිව ආපසු හැරී යා යුතුයි. මොනවට වසනලද කාය ඇත්තේ-මනා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ-බිම හෙලනලද ඇස් ඇතිව-යා යුතුයි. ඔසවනලද සිවුරු ඇතිව-මහ සිනාවෙන් යුක්තව- නොයා යුතුයි. ස්වල්ප ශබ්දයෙන් යුක්තව යා යුතුයි. කාය සොලවමින්-අත සොලවමින්-හිස සොලවමින් නොයායුතුයි. උකුලෙහි තබනලද අත් ඇතිව-හිසවසා පොරවන ලදුව-විළුඹ එසවීමෙන් යුක්තව නොයායුතුයි. පිඬු පිණිස ගොස් පළමු ආ තැනැත්තේ අසුන පැනවිය යුතුයි. පාදෝදක ජලය-පා පුටුව-පා තබන පුවරුව සමීපයෙහි එලවා තැබිය යුතුයි. වැඩි පිඬු දමන භාජනය ශුද්ධකොට තැබිය යුතුයි. පැන් හා පරිභොග ජලයද එලවා තැබිය යුතුයි. යමෙක් පිඬු පිණිස ගොස් පසුව ගමින් ආයේද වළඳා ඉතිරිවූවක් ඇත්තේ විනම් කැමැත්තේ නම් අනුභව කටයුතුයි. නො කැමැත්තේ නම් තිල් තෘණ නැති තන්හි හෝ දැමිය යුතුයි. ප්‍රාණීන් නැති ජලයෙහි හෝ පාංශුකොට හැරිය යුතුයි. ඔහු විසින් ආසනය ඔසවා තැබිය යුතුයි. පාදෝදක ජලය-පාපුටුව-පාතබන පුවරුව සමීපයෙහි තැබියයුතුයි. වැඩිවූ පිඬු දමන භාජනය ශුද්ධකොට මනාසේ තැබිය යුතුයි. පැන් හා පරිභොග ජලය නැන්පත්කොට තැබිය යුතුයි. භක්තාග්‍රය හැමැද්ද යුතුයි. පියයුතු පැන් බඳුන හෝ පරිභොග කටයුතු පැන් බඳුන හෝ වැසිකිළි පැන් බඳුන හෝ හිස්ව

තිබේනම් එහි පැන් වත්කළ යුතුයි. තමහට නොහැක්කේ නම් දෙවැන්නෙකු අමතා දෙදෙනාගේම අත්වලින් පැන් එලවිය යුතුයි. එය ප්‍රත්‍යයකොට ඇති වදන් නොබිඳිය යුතුයි.

## පිණ්ඩචාරික භික්ෂුව විසින් පැවැත්විය යුතු වත්රැස පිළිබඳ වේ විනිසයි.

**ආරණ්‍යක වත.**

මහණෙනි! වනවාසී භික්ෂූන් විසින් උදෑසනම නැගී සිට පාත්‍රය පසුම්බියෙහි බහා ඇකයෙහි එල්වාගෙණ සිවුර කරෙහි කොට වහන් පයලා දැවභාණ්ඩ මෘත්මය භාණ්ඩ සුරැකිව තබා දොර කවුළු වසා සෙනසුනෙන් බැස්ස යුතුයි. දැන් ගමට ප්‍රවිෂ්ටවන්නෙමියි වහන් මුදා ගසා දමා වහන් පසුම්බියෙහි බහා ඇකයෙහි එල්වා තෙමඩුලු වසන්නහු විසින් හාත්පසින් වටකොට හඳනය ඇඳ කාබහන බැඳ ගුණ සහිතකොට සහළ සිවුර පොරවා ගණ්ඨිය අමුනා පාත්‍රය සෝදාගෙණ මනාව යුහුසුළු නොවූවහු විසින් ගම පිවිසිය යුතුයි. මොනවට වසනලද කය ඇතිව-ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව-බිම බලා හෙලන ඇස් ඇතිව යායුතුයි. ඔසවනලද සිවුරු ඇතිව-මහසිනාවෙන් යුක්තව නොයායුතුයි. සවල්ප ශබ්දයෙන් යුක්තව යායුතුයි. කය සොලවමින්-අත සොලවමින්-හිස සොලවමින්-උකුලෙහි තබනලද අත්ඇතිව හිසවසා පොරවන ලද්දුව-විළුඹ එසවීමෙන් යුක්තව නොයා යුතුයි. ගෘහයට ප්‍රවිෂ්ටවන්නහු විසින් නික්මෙන්නෙමි කියායි-ඉතා වහා ප්‍රවිෂ්ට නොවිය යුතුයි. ඉතා වහා නොනික්මිය යුතුයි.' ඉතා දුර නොසිටිය යුතුයි. ඉතා ලඟ නොසිටීය යුතුයි. වැඩිකල් නොසිටිය යුතුයි. ඉතා යුහුව පසු නොගැරිය යුතුයි. සිටියහු විසින් භික්ෂාව දෙනු කැමැත්තීද නොදෙනු කැමැත්තීදැයි සැලකිය යුතුයි. ඉදින් කම්යක් හෝ බහා තබාද ආසනයෙන් හෝ 'නැගී සිටීද සැන්ද හෝ ආමශීනය කෙරේද බඳුන හෝ අල්ලා තබන්නීවේද සිටිය යුතුයි. භික්ෂාව දෙනුලබන කල්හි වමතින් සහළ සිවුර පාත්‍රයෙන් ඉවත්කොට පිළිගතයුතුය. භික්ෂාව දෙන්නියගේ මුහුණ නොබැලිය යුතුයි. මුද්ගසූපාදියක් දෙනු කැමැත්තීද නොදෙනු කැමැත්තියක්දැයි සැලකිය යුතුයි. හැන්ද හෝ අල්වාද බඳුනක් හෝ අල්වා තබන්නී වේද දෙනු කැමැත්තියක් මෙන් වේයයි සිටියයුතුයි. භික්ෂාව දුන් කල්හි සහළ සිවුරෙන් පාත්‍රය වසාගෙණ මනාකොට යුහුසුළු නොවූවහු විසින් ආපසු හැරිය යුතුයි. මනාකොට කය වසන්නහු විසින් මනා ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූවහු විසින් බිම බලා හෙලන ඇස් ඇතිව යායුතුයි. ඔසවනලද සිවුරෙන් යුක්තව මහසිනහගෙන් යුක්තව නොයායුතුයි. සවල්ප ශබ්දයෙන් යුක්තව ගම්හි යායුතුයි. කය සොලවමින්-අත සොලවමින්-හිස සොලවමින්-උකුලෙහි තබනලද අත් ඇතිව-හිස වසා පෙරවගෙණ විළුඹ එසවීමෙන් යුක්තව ගම්හි නොමයායුතුයි. ගමින් නික්ම පාත්‍රය පසුම්බියෙහි බහා ඇසයෙහි එල්වා සිවුර අකුලා හිසෙහි කොට වහන් නැගී යායුතුයි. අරණ වැසි මහණහු විසින් පියයුතු පැන් එලවිය

යුතුයි. පරිභොග කටයුතු පැන් එලවා තැබියයුතුයි. ගිනි එලවා තැබියයුතුයි. ද්‍රව්‍ය සහිත ගිනිගානා දඬු කඩ එලවා තැබියයුතුයි. සැරයටිය එලවා තැබියයුතුයි. සියලුම හෝ එකදෙශවූ නැකැත් ඉගෙණගත යුත්තාහ. දිසාවන්හි දූතීමෙහි දක්‍ෂ වියයුතුයි.

## වනවාසී භික්ෂූන් විසින් පිළිපැදියයුතු වත්රැස පිළිබඳ මේ විනිසයි.

---

**සෙනාසන වත.**

වෙහෙර වසන භික්ෂුව විසින් විහාරයෙහි කැලිකසළ ශුඞ කටයුතුයි. වෙහෙර ශුඞ කරන්නහු විසින් පළමුකොට පාසිවුරු බැහැරකොට එකත්පස්හි තැබියයුතුයි. නිසීදනය හා පසුතුරුණ බැහැරින් තැබියයුතුයි. ඇඳ අගුල් කණුවෙහි නොගටන්නහු විසින් බැහැරකොට එකත්පසෙක්හි තැබියයුතුයි. පුටුවද එලෙස තැබියයුතුයි. ඇඳෙහි පාඅලු බැහැරකොට එක්පසෙක තැබියයුතුයි. කෙල පඬික්කම බැහැර තැබියයුතුයි. පිටතබන පුවරුව බැහැර එක්පසෙක තැබියයුතුයි. බුමතුරුණ පැණවූ අයුරු සලකා බැහැරකොට එක් පසෙක තැබියයුතුයි. විහාරයෙහි මකුළුදැල් වේද මතු භාගය පටන් හැරියයුතුයි. කවුළු සන්ධි කොන් භාගයෝ පිසදූමියයුත්තාහ. පිරියම් කරණලද නික්කිය රෙදිකඩක් තෙමා මිරිකා පිසදූමියයුතුයි. කළුවන් කරණලද බිමද එලෙසින්ම පිසදූමියයුතුයි. පිරියම් නොකළ බිම ජලය ඉස පිසදූමියයුතුයි. කසළ එකතුකොට එක්පසෙක්හි දූමියයුතුයි. භික්ෂූන් හාත්පස්හි සෙනසුන ගසා නොදූමිය යුතුයි. විහාරය හාත් පස්හි සෙනසුන ගසා නොදූමියයුතුයි. පියයුතු ජලය පරිභොග කළයුතු ජලය-උඩුසුළඟ ඇති අභ්‍යවකාශයෙහි යටිසුළඟෙහි සෙනසුන ගසාදූමිය යුතුයි. බුමතුරුණ වියලා ශුඞකොට ගසා දමා තුබූ පරිදි පනවා තැබිය යුතුයි. මඤ්චප්‍රතිපාදකයෝද එසේ සකස්කොට යථාස්ථානයෙහිම තැබියයුතුයි. ඇඳ-පුටුද එලෙසම සකස්කොට තුබූ තන්හිම පණවා තැබියයුතුයි. බිසි හා කන්වයින් නිසීදනය හා පසතුරුණ-කෙල පඬික්කම-හේත්තුවන පුවරුව නිසිලෙස සකස්කොට යථාස්ථානයෙහිම තැබියයුතුයි. පාත්‍රය හා සිවුර සකස්කොට තැබියයුතුයි. පෙරදිගින්-බටහිරින්-උතුරු දිගින්-දකුණු දිගින් රජස් සහිත වාතයෝ හමද්දී ඒ ඒ දිග්හි කවුළු .වැසියයුත්තාහ. ශීත කාලය වීනම් දහවල්හි කවුළු වැසියයුතුයි. රාත්‍රියෙහිද වැසියයුත්තාහ. උෂ්ණ කාලය වීනම් දවල් වැසියයුතුයි. රාත්‍රියෙහි කවුළු ඇරියයුත්තාහ. සෙනස්න කසළ සහිත නම් හැමැන්දයුතුයි. පැන්කොටුව-උපස්ථානශාලාව-ගිනිහල් ගෙය - වැසිකිළිය කසළ සහිත වීනම් හැමැන්දයුතුයි. පියයුතු-පරි භොගකටයුතුජලය එලවා තැබියයුතුයි. වැසිකිළියෙහි ජලය නොමැති වීනම් සෝදන ජලය තබන සැළියෙහි ජලය වත්කළයුතුයි. වැඩිමහල් ලෙකු සමග වාසය කෙරේනම් හෙතෙම නොවිචාරා දෙශනාපෙළ නො කියවියයුතුයි. පරිපුච්ඡා නොමෝ නොදියයුතුයි. පාඩම් නොකිය යුතුයි. දහම් නොදෙසියයුතුයි. පහන් නොදල්වියයුතුයි. නොනිමිය

යුතුයි. කාවුළු නොහැරිය යුත්තාහ. කාවුළු නොවැසිය යුත්තාහ. වැඩිමහල්ලෙකු සමග සක්මණෙහි සක්මන් කෙරේනම් වැඩිමහලුතෙමේ යම් දිශාවෙක්හිද එතැන්හි නැමියායුතුයි. වැඩිමහලු තෙමේ සඟළ සිවුරු කොණින් නොගැටියයුතුයි.

## සෙනසුන්හි වසන භික්ෂුව විසින් පිළිපැදියයුතු වත්රැස පිළිබඳ මේ විනිසයි.

---

**ජන්තාඝර වත.**

ගිනිහල්ගෙට පළමුවෙන් පැමිණි භික්ෂු තෙමේ එහි අලු වැඩිනම් බැහැර කළයුතුයි. එහි කසළ සහිත වේනම් හැමැන්ද යුතුයි. ඉදිරිපිට මිදුල කසළ සහිත වීනම් නිසවත හැමැන්ද යුතුයි. ගෙයද කසළ සහිත නම් හැමැදිය යුතුයි. පැන් කොටුව-ගිනිහල්ගෙහි ශාලාව කසළ සහිත නම් හැමැන්ද යුතුයි. ඇඟ ගානා සුණුදියෙන් තෙමා පිඩු කට යුතුයි. මැටි තෙමියයුතුයි. දියබරුවෙහි ජලය වත්කළයුතුයි. ගිනිහල් ගෙට ප්‍රවිෂ්ට වියයුතුයි. ගිනිහල්ගෙට පිවිසෙන්නහු විසින් මැටියෙන් මුහුණ ආලිප්තකොට ඉදිරියෙන්ද පස්සෙන්ද වසාගෙණ ගිනිහල් ගෙහි පුටුවගෙණ එහි පිවිසියයුතුයි. ස්ථවිර භික්ෂුවක් ගටා නොහින්ද යුතුයි. නවක භික්ෂූන් ආසනයෙන් බැහැර නොකටයුත්තාහ. හැකිනම් ස්ථවිර භික්ෂූන්ට පිරියම් කටයුතුයි. ගිනිහල් ගෙයින් (පූර්වෝක්ත පරිදි) නික්මිය යුතුයි. හැකිනම් ස්ථවිර භික්ෂූන්ට ජලයෙන්ද පිරියම් කටයුතුයි. ස්ථවිර භික්ෂූන්ගේ ඉදිරියෙහි ස්නානය නොකට යුතුයි. මතුභාගයෙහි ස්නානය නොකට යුතුයි. ස්නානය කොට ගොඩනගින්නහු විසින් බස්නවුන්ට මාර්ගය දියයුතුයි. ගිනිහල් ගේ මඩවීනම් සේදිය යුතුයි. මැටි දියභාරණ ඔරුව සෝදා ගිනිහල් ගෙහි පුටුව තැන්පත් කොට ගිනි නිවා දොර වසා බැහැර යා යුතුයි.

## භික්ෂූන් විසින් ගිනිහල් ගෙයි විධීම පිළිබඳ වත් විනිසයි.

---

**වච්චකුටි වත.**

යම් භික්ෂුවක් වැසිකිළියට යේද පිටත සිටියහු විසින් උගුරැසිය යුතුයි. ඇතුළත සිටියහු විසින්ද උගුරැසිය යුතුයි. සිවුරු දමන දන්ඩෙහි හෝ රැහැණෙහි සිවුර බහා යුහුසුළු නොවූවහු විසින් වැසිකිළියට පිවිසිය යුතුයි. සිවුර ඔසවාගෙණ නොම පිවිසිය යුතුයි. ඉතා වහා නො පිවිසිය යුතුයි. පාදුකාවෙහි සිටියහු විසින් සිවුර එසවියයුතුයි. නහනමින් වර්චස් නොකළ යුතුයි. දැහැටිදඬු කන්නහු විසින් වර්චස් නොකළයුතුයි. වර්චස් දෙණිකාවෙන් පිටත වර්චස් නොකට යුතුයි. මූත්‍ර ඔරුවෙන් පිටත මූත්‍ර නොකටයුතුයි. ප්‍රශ්‍රාව දෙණිකාවෙහි කෙළ නොගැසිය යුතුයි. පරුෂවූ දන්ඩෙන් අශුචි සූරු නොදැමිය යුතුයි. පිසදැමූ කාෂ්ඨය වැසිකිළියෙහි නොදැමිය යුතුයි. වර්චස් පාදුකාවෙහි සිටියහු විසින් සිවුරෙන් වසාගත යුතුයි. ඉතා යුහුසුළුව නොනික්මිය යුතුයි. සිවුර ඔසවාගෙණ බැහැර නොයා යුතුයි.

වර්චස් ශුද්ධකරණ පාදුකාවෙහි සිටියහු විසින් සිවුර ඔසවා ගතයුතුයි. චපු චපු යන අනුකරණයෙන් නොසේදිය යුතුයි. අශුචි ශුද්ධකරණ මලාවෙහි දිය ඉතිරි නොකළ යුතුයි. සෝදන පාදුකාවෙහි සිටියහු විසින් (සිවුරෙන්) වසාගතයුතුයි. වැසිකිළිය කෙළසෙන ලද්දේද ශුද්ධකට යුතුයි. අවලේඛන භාජනයන් (පුෂන්කුරු) දමන බඳුන පිරුනේනම් බැහැර දැමිය යුතුයි. වැසිකිළිය-ඉදිරිපිට මිදුල-වෙහෙර-කොටුව-යන ස්ථානයෝ කසළ සහිත වේත් නම් හැමැන්ද යුත්තාහ. සෝදන ජලය තබන බඳුනෙහි ජලය නොමැති නම් වත්කළ යුතුයි.

## වැසිකිළිය පිළිබඳ පිළිපැදියයුතු වත් විනිසයි.

---

**සද්ධිවිහාරික වත.**

සද්ධිවිහාරිකයා හෙමේ උපාධ්‍යායයාට ප්‍රථම නැගිට වහන් මුදා තනිපට සිවුර ඒකාංශ කොට දැහැටි දඬු පිළිගැන්වියයුතුයි. මුව සෝදන ජලය දියයුතුයි. අසුන් පැනවියයුතුයි. බඳුන සෝදා කැඳ ඇත්තේනම් පිළිගැන්වියයුතුයි. කැඳ වැළඳූ පසු බඳුන සෝදා නිසි ලෙස තැබියයුතුයි. උපාධ්‍යායයා නැගිටි විට ආසනය තැන්පත්කොට තැබියයුතුයි. ගම්වදිනු කැමැති උපාධ්‍යායයාහට හඳනය දියයුතුයි. පෙරළූ හඳනය පිළිගතයුතුයි. කාබඳන දියයුතුයි. සඟළ සිවුර දිය යුතුයි. පාත්‍රය සෝදා ජලය සහිතව දියයුතුයි. උපාධ්‍යායයා පසුව යන්නෙකු කැමැත්තේනම් තෙමඬුලු වසා ඇඳ කාබඳන බැඳ සඟළ සිවුර පොරවා ගණ්ඨිය අමුනා පාත්‍රය ගෙණ යායුතුයි. ඉතා ඈතින් නොගියයුතුයි. ඉතා ආසන්නයෙන්ද නොගියයුතුයි. පාත්‍රස්ථභොජනය පිළිගතයුතුයි. උපාධ්‍යායයා කථාකරණ කල්හි අතරතුර කථා නොපහලියයුතුයි. උපාධ්‍යායයා ඇවතට සමීපකොට කථාකරන්නේ වැළැක්වියයුතුයි. පළමු පැමිණි තැනැත්තේ ආසනය පැනවියයුතුයි. පා සෝදන ජලය, පා පුටුව, පා පුවරුව සමීපයෙහි තැබියයුතුයි. පෙර ගමන්කොට පාත්‍රය සිවුර පිළිගතයුතුයි. පෙරළූ අඳනය දියයුතුයි. අඳනය පිළිගතයුතුයි. සිවුර ඩහගත්තාලද්දේ වීනම් මොහොතක් කල් අව්වෙහි ලා වියලියයුතුයි. සිවුර කලක් අව්වෙහි නොදැමියයුතුයි. සිවුර හකුලා තැබියයුතුයි. සිවුර හකුලන්නහු විසින් දිනපතා අමුනු ළකාට නැමියයුතුයි. සිවුර නිසිලෙස තැබියයුතුයි. පිණ්ඩභොජනය ඇත්තේවීනම් එලවියයුතුයි. පැනින් පිවාළයුතුයි. වැළඳූ පසු පාත්‍රය සකස්කොට තැබියයුතුයි. උෂ්ණයෙහි නොදැමියයුතුයි. පාත්‍රය හා සිවුර නිසිලෙස තැබියයුතුයි. පාත්‍රය යොග්‍යලෙස තැබියයුතුයි. නො අතුරණලද බිම පාත්‍රය නොතැබියයුතුයි. සිවුර තබන්නහු විසින්ද නිසිලෙස තැබියයුතුයි. උපාධ්‍යායයා නැගිටිකල ආසනය සකස්කළ යුතුයි. පා සෝදන ජලය එලවියයුතුයි. ඒ ප්‍රදේශය කසළ සහිතනම් හැමැන්දයුතුයි. නාහනු කැමැත්තේ නම් නහනදිය සකස්කළයුතුයි. සිහිල් නහනුවෙන් ප්‍රයෝජනවීනම් සිහිල් නහනු පිළියෙළ කටයුතුයි. උණු නහනුවෙන් ප්‍රයෝජන වීනම් උණුනහනු පිළියෙළ කටයුතුයි.

උපාධ්‍යායයා ගිනිහල්ගෙට යනු කැමැත්තේ නම් සුණුදියෙන් තෙමා පිඩු කටයුතුයි. මැටි තෙමිය යුතුයි. ගිනිහල්ගෙහි පුටුව දී සිවුර ගෙණ එකත්පසෙක්හි තැබියයුතුයි. සුණු දියයුතුයි. මැටි දියයුතුයි. හැකි නම් ගිනිහල්ගෙට පිවිසිය යුතුයි. ගිනිහල්ගෙට පිවිසෙන් නහු විසින් ජනතාන්තරයෙහි කිලෙස පිවිසියයුතුයි. ස්ථවිර භික්ෂූන් ගවාහිදීම නොකටයුතුයි. නවක භික්ෂූහු ආසනයෙන් ප්‍රතිබාහනය නොකට යුත්තාහ. ගිනිහල්ගෙහි උපාධ්‍යායයාගේ පිරියම් කට යුතුයි. ගිනිහල් ගෙයින් නික්මිය යුතුයි. ජලයෙහි උපාධ්‍යායයාගේ අත් පා ඉලීම් ආදිය කටයුතුයි. උපාධ්‍යායයාගේ සිරුරෙහි ජලය පිස දැමියයුතුයි. අඳනය, සිවුර දියයුතුයි. ගිනිහල්ගෙහි පුටුව ගෙණ පළමු කොට පැමිණ ආසනය පැනවියයුතුයි. පා සෝදන ජලය සමීපයෙහි තැබියයුතුයි. උපාධ්‍යායයා පැනින් විචාලයුතුයි. හඳුරවාගණු කැමැත් තේනම් හඳුරවා ගතයුතුයි. පිළිවිසිනු කැමැත්තේ පිළිවිසියයුතුයි. උපාධ්‍යායයා වසන වෙහෙර කසළ සහිත නම් ශුද්ධකටයුතුයි. වෙහෙර ශුද්ධකරන්නහු විසින් පූර්වෝක්ත පරිදි තිසිලෙස කළයුතුයි. නිසීදනය බිස්ස හා කන්වයින්, ඇඳ, පුටු, මඤ්චප්‍රතිපාදකයෝ, කෙළපඩික්කම, පිට තබන පුවරුව තිසිලෙස තැබියයුත්තාහ. බුමතුරුණ ශුද්ධකොට පළමු පරිදි යථාස්ථානයෙහි තැබියයුතුයි. මකුළුදැල් ඉවත්කළයුතුයි. කවුළු සන්ධි කොන් භාගයෝ පිසදැමියයුත්තාහ. ආලෙප කරණලද බිත්තිය කළුවන් කරණලද පැල්ලන් සහිත භූමිය රෙදිකඩක් තෙමා මිරිකා පිස දැමියයුත්තීය. එසේ නොකළ භූමිය දිය ඉස රජස් නොනගිනලෙස ශුද්ධ කටයුතුයි. කසළ ඉවත්කළයුතුයි. බුමතුරුණ, මඤ්චප්‍රතිපාදකයෝ, ඇඳ, පුටු, බිස්ස හා කන්වයින්, නිසීදනය හා පසතුරුණ පණවා තැබියයුත් තාහ. කෙළපඩික්කම, පිටතබන පුවරුව, පාත්‍රය හා චීවුර, තිසිලෙස තැබියයුත්තාහ. පාත්‍රය අතුරණලද තන්හි තැබියයුතුයි. නොඅතුරණලද තන්හි පාත්‍රය නොතැබියයුතුයි. පෙරදිග, බටහිර, උතුර, දකුණ රජස් සහිත වාතයෝ වෙත්නම් සුදුසු පරිදි වා කවුළු වැසියයුත්තාහ. ශීත කාලයෙහි, උෂ්ණකාලයෙහි පූර්වෝක්තලෙස වාකවුළු වැසියයුත්තාහ. පිරි වෙණ, පැන්කොටුව, උපස්ථානශාලාව, ගිනිහල, වැසිකිළිය කසළ සහිත නම් හැමැත්දයුත්තාහ. පියයුතු පරිභොග කටයුතු පැන්එළවා තැබිය යුත්තාහ. වැසිකිළියෙහිද එලෙසින් ජලය තැබියයුතුයි. උපාධ්‍යායයාට ශාසනයෙහි නොඇලීමක් වීනම් සද්ධිවිහාරිකයා විසින් හෙතෙම අන් තැනෙක්හි ගෙණයායුතුයි. අනුන් ලවා හෝ ගෙන්වියයුතුයි. ඔහට ධම් කථාවක් හෝ කටයුත්තීය. උපාධ්‍යායයාහට යම් කුකුසක්වීනම් සද්ධිවිහා රිකයා විසින් පහකටයුතුයි. අනුන් ලවාත් හැරවියයුතුයි. ඔහට ධර්මකථා වක් හෝ කියයුත්තීය. උපාධ්‍යායයාහට මිථ්‍යාදෘෂ්ටියක් උපන්නීවිද එය සද්ධිවිහාරිකයා විසින් දුරුකළයුතුයි. අනුන් ලවා හෝ දුරුකර වියයුතුයි. ධර්මකථාවක් හෝ කටයුත්තීය. උපාධ්‍යායයා ගරු ඇවත කට පැමිණියේ පිරිවෙසට සුදුසුවූයේ සංඝතෙමේ උපාධ්‍යායයාහට පිරි වෙස දෙන්නේදැයි උද්‍යොග කටයුත්තේය. උපාධ්‍යායයා මූලායපටිකස්ස නාවට යොග්‍යවීනම් ඒ පිළිබඳවද උද්‍යොග කටයුත්තේය. උපාධ්‍යායයා

මාහනතට යොග්‍යවීනම් එසේම උද්‍යොග කටයුත්තේය. එසේම අබ්භාන යට සුදුසුවීනම් කිමෙක සංඝතෙමේ උපාධ්‍යායයා අබ්භාන කරන්නේදැයි සද්ධිවිහාරිකයා විසින් උද්‍යොග කටයුත්තේය. සංඝතෙමේ උපාධ්‍යාය යාහට තජ්ජනීයකර්මය, නියස්සකර්මය, පබ්බාජනීයකර්මය, පටිසාරණීය කර්මය, උක්ඛෙපනීයකර්මය යන මෙයින් යම්කර්මයක් කරණු කැමැතිවේද කිමෙක්ද සංඝතෙමේ කර්මය නොකරන්නේද සැහැල්ලුබවට හෝ පිරිනමන්නේදැයි සද්ධිවිහාරිකයා විසින් උද්‍යොග කටයුත්තේය. මේ කර්‍ම යන්ගෙන් යමක් කරණ ලද්දේ හෝ වේද? උපාධ්‍යාය තෙමේ මනාකොට පවත්නේද අනුලොම්ව පවත්නේද නිස්තරණය පිණිස පවත්නේද සඞ්ඝතෙමේ ඒ කර්මය සංසිඳුවන්නේදැයි සද්ධිවිහාරිකයා විසින් උද්‍යොග කටයුත්තේය. උපාධ්‍යායයාගේ සිවුර සද්ධිවිහාරිකයා විසින් සේදියයුතුයි. උපාධ්‍යායයාට සිවුරක් කවරෙකු විසින් කරණු ලබන්නේදැයි සද්ධිවිහාරිකයා විසින් උද්‍යොග කටයුත්තේය. රඳනක් පිසියයුතුද සද්ධිවිහාරිකයා විසින් පිසියයුතුයි. පඬුජලයක් යමෙක් පිසන්නේදැයි උද්‍යොගී වියයුතුයි. සද්ධිවිහාරිකයා විසින් උපාධ්‍යායයාගේ සිවුර පඬු පොවාදියයුතුයි. එය යමෙක් පඬු පොවාදැයි උද්‍යොගී වියයුතුයි. පඬු පොවන්නහු විසින් නිසිලෙස පඬු පෙවියයුතුයි. පොදනුසුන් කල්හි බැහැර නොයායුතුයි. උපාධ්‍යායයා නොවිචාරා උපාධ්‍යායයාහට අවැඩ කැමැති විසභාගවූවෙකුට පාත්‍රය නොදියයුතුයි. අන්‍යයෙකුගේ පාත්‍රය නොපිළිගතයුතුයි. අන්‍යයෙකුට සිවුරක් නොදියයුතුයි. අන්‍යයෙකුගේ සිවුරක් නොපිළිගත යුතුයි. අන්‍යයෙකුට අවශෙෂ පරිෂ්කාරයක් නොදියයුතුයි. අන්‍යයෙකුගේ පිරිකරක් නොපිළිගත යුතුයි. අන්‍යයෙකුගේ කෙසයෝ නොකැපියයුත්තාහ. අන්‍යයෙකු ලවා කෙසයෝ නොකැපවිය යුත්තාහ. අන්‍යයෙකුට (පාදසම්බාහනාදි) පිරියම් නොකටයුතුයි. අන්‍යයෙකු ලවා පිරියම්කරවා නොගතයුතුයි. අන්‍යයෙකුට වතාවත් නොකටයුතුයි. අන්‍යයෙකු ලවා වතාවත් නොකරවා ගතයුතුයි. අන්‍යයෙකුට පසුව යන මහණෙකු නොවියයුතුයි. පසුව යන මහණෙක් නොගතයුතුයි. අන් අයගේ පිණ්ඩපාතය ගමින් ගෙණ නොආයුතුයි. අන්‍යයෙකු ලවා පිණ්ඩපාතය ගෙන්වා නොගතයුතුයි. උපාධ්‍යායයා නොවිචාරා ගම් නොවැදියයුතුයි. මෘතශරීර දර්‍ශනාදිය පිණිස සොහොනට නොයා යුතුයි. දිසාවන්හි නොයා යුත්තීය. උපාධ්‍යායයා ගිලනෙක් නම් දිවිහිම්කොට උවටැන් කටයුතුයි. ඔහුගේ රෙගයෙන් නැගීසිටීම බලාපොරොත්තු වියයුතුයි.

## සද්ධිවිහාරිකයා විසින් පිළිපැදියයුතු වත් රැස පිළිබඳ විනිසයි.

---

**උපාධ්‍යාය වත.**

උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරික තෙමේ උදෙසීමෙන්ද, පිළිවිසීමෙන්ද, අවවාදයෙන්ද, අනුශාසනාවෙන්ද සංග්‍රහ කටයුතුයි. උපාධ්‍යායයාට පාත්‍රයක් ඇත්තේ වේ. සද්ධිවිහාරිකයාට පාත්‍රයක් නැත්තේ වීනම් උපාධ්‍යායයා විසින් පාත්‍රයක් දියයුතුයි. සද්ධිවිහාරිකයාට පාත්‍රයක් කිම ලැබේදැයි උද්‍යොග හෝ කටයුතුයි. උපාධ්‍යායයාට

සිවුරක් ඇත්තේ වේද සද්ධිවිහාරිකයාට සිවුරක් නොමැත්තේ නම් දිය යුතුයි. උක්තප්‍රකාරයෙන් උද්යෝගද වියයුතුයි. අන්‍ය පරිෂ්කාර සම්බන්ධ යෙන්ද මේලෙසමැයි. සද්ධිවිහාරිකයා ගිලනෙක් වීනම් සද්ධිවිහාරිකයාට ප්‍රථම නැගිට දැහැටිදඬු මුවදෝනා ජලය දියයුතුයි. ආසනය පැනවිය යුතුයි. කැඳ ඇතිවීනම් එලවියයුතුයි. කැඳ වැළඳුවාසින් පසුව බඳුන් සනස්කොට තැබියයුතුයි. අස්න අකුලා තැබියයුතුයි. එම ප්‍රදේශය හැමැන්දයුතුයි. සද්ධිවිහාරිකයා ගම්වදිනු කැමැත්තේ හඳනය දිය යුතුයි. පෙරළු හඳනය පිළිගතයුතුයි. කාබගන දියයුතුයි. සඟළ සිවුර දියයුතුයි. පාත්‍රය සෝදා ජලය සහිතව දියයුතුයි. ආසනය පැනවියයුතුයි. පාදෝනා ජලය එලවියයුතුයි. පෙර ගමන්කොට පිළිගතයුතුයි. පෙරළු අඳනය දියයුතුයි. අඳනය පිළිගතයුතුයි. සිවුර වියළියයුතුයි. උෂ්ණෙහි සිවුර නොදැමියයුතුයි. සිවුර හැකිලියයුතුයි. සිවුර හකුලන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුර දමන දණ්ඩ හෝ රැහැණ පිසදමා පරභාගයෙහිවූ කොණ මැත භාගයට නැමීම ඇත්තක්කොට සිවුර තැබියයුතුයි. පිණ්ඩපාතය ඇත්තේවීනම් එලවියයුතුයි. සද්ධිවිහාරිකයා විචාළයුතුයි. වැළඳුවාට පසු පාත්‍රය වියළියයුතුයි. උෂ්ණෙහි පාත්‍රය නොදැමියයුතුයි. පාත්‍රය හා සිවුර බහා තැබියයුතුයි. පාත්‍රය තබන්නහු විසින් නිසිලෙස තැබිය යුතුයි. නොඅතුරණලද භූමියෙහි නොතැබියයුතුයි. සිවුර තබන්නහු විසින් නිසිලෙස බහා තැබියයුතුයි. ආසනය ඔසවා තැබියයුතුයි. පා දෝනා ජලය තැන්පත්කොට තැබියයුතුයි. වෙහෙර හැමැන්දයුතුයි. නානු පිළියෙල කටයුතුයි. සිහිල් ජලයෙන් ප්‍රයෝජන ඇතිකල්හි සිහිල් ජලය පිළියෙල කටයුතුයි. උණු නහනුවෙන් ප්‍රයෝජන ඇති කල්හි එයද පිළියෙල කටයුතුයි. සුණුදියෙන් තෙමා පිඩුකටයුතුයි. මැටි තෙමියයුත්තිය. ගිනිහල්ගෙහි පුටුව එකත්පසෙක්හි තැබියයුතුයි. සුණු දියයුතුයි. මැටි දියයුතුයි. ඉදින් හැක්කේ නම් නොගටා පිවිසියයුතුයි. ගිනිහල්ගෙට ප්‍රවිෂ්ට වන්නහු විසින් මැටියෙන් මුහුණ ආලේපකොට ඉදිරියෙන්ද පස්සෙන්ද වසාගෙණ ගිනිහල්ගෙහි පුටුව ගෙණ ගිනිහල් ගෙට පිවිසියයුතුයි. ස්ථවිර භික්ෂූන් ගටා නොහින්දයුතුයි. නවක භික්ෂූහු ආසනයෙන් ප්‍රතිබාහනය නොකටයුත්තාහ. ගිනිහල්ගෙහි සද්ධිවිහාරිකයාගේ පරිකර්ම්ම කටයුතුයි. ගිනිහල් ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල්ගෙහි පුටුව ගෙණ ඉදිරියෙන්ද පස්සෙන්ද වසාගෙණ ගිනිහල්ගෙයින් නික්මියයුතුයි. ජලයෙහිද ගිලන් සද්ධිවිහාරිකයා පිළිබඳ පරිකර්ම කටයුතුයි. ස්නානය කළාහු විසින් උපාධ්‍යාය තෙමේ පළමුකොට ජලස්නානයකර ගොඩැවිත් දිය වියලා හඳනය ඇඳ සද්ධි විහාරිකයාගේ ජලය පිසදැමිය යුතුයි. අඳනය දියයුතුයි. සිවුර දිය යුතුයි. ගිනිහල්ගෙහි පුටුව රැගෙණ ප්‍රථම කොට පැමිණ ආසනය පැනවියයුතුයි. පාදෝනා ජලය, පාපුටුව, පාපුවරුව සමීපයෙහි එලවා තැබියයුතුයි. සද්ධිවිහාරිකතෙමේ පියයුතු ජලයෙන් පිළිවිසියයුතුයි. සද්ධිවිහාරික තෙමේ යම් වෙහෙරක වෙසේද එහි කසළ වේද හැකිනම් ශුද්ධකටයුතුයි. විහාරය ශුද්ධකරන්නහු විසින් පළමුකොට පාසිවුරු බැහැරකොට තැබියයුතුයි. නිසීදනය හා පසතුරුණ බිස්සභාකන්

වයිත, ඇඳ, පුටුව, මඤ්චප්‍රතිපාදකයෝ, තෙලපඩික්කම, පිටතබත පුමරුම්, බුමැතුරුණ නිසිලෙස සකස්කොට තැබියයුත්තාහ. පාත්‍රය හා සිවුර නිසිලෙස පුළුණේකත පරිදි තැබියයුතුයි. පාත්‍රය ආස්තරණ රහිතබිම නොතැබියයුතුයි. සිවුරද නිසිලෙස හමා තැබියයුතුයි. පෙරදිග, බටහිර, උතුරුදිග, දකුණුදිග රජස් සහිත වාතයෝ හමත්ද ඒ ඒ දින්හි කවුළු වැසියයුත්තාහ. ශීත කාලය වීනම් දවල්හි කවුළු ඇරියයුත්තාහ. රාත්‍රියෙහි වැසිය යුත්තාහ. උෂ්ණ කාලය වීනම් දවල්හි කවුළු වැසිය යුත්තාහ. රාත්‍රියෙහි හැරිය යුත්තාහ. පිරිවෙණ, පැන්කොට්ටුව, උපස්ථාන ශාලාව හැමැන්දයුතුයි. ගිනිහල්ගෙය, වැසිකිළිය හැමැන්දයුතුයි. පියයුතු පරිභොග කටයුතු ජලය එළවා තැබියයුතුයි. ඉදින් සෝදන කළයෙහි ජලය නොමැත්තේනම් ජලය වත්කළයුතුයි. සද්ධිවිහාරිකයාට ශාසනයෙහි නොඇලීමක් උපන්නීනම් උපාධ්‍යායයා විසින් අන්තැනෙක්හි ගෙණයායුතුයි. අනුන් ලවා හෝ ගෙන්වියයුතුයි. ඕහට ධර්මකථාවක් හෝ කටයුත්තීය. සද්ධිවිහාරිකයාට කුකුසක් උපන්නේනම් එය පහකටයුතුයි. අනුන් ලවා හෝ පහකරවියයුතුයි. ඕහට ධර්මකථාවක් හෝ කටයුත්තීය. සද්ධිවිහාරිකයාට මිථ්‍යාදෘෂ්ටියක් උපන්නීවීද- උපාධ්‍යායයා විසින් තොරකටයුත්තීය. අනුන් ලවා හෝ තොරකරවියයුත්තීය. සද්ධිවිහාරික තෙමේ ගරු ඇවැතකට ඇවැදුනේවේද පිරිවෙසට සුදුසුවූයේ කිම සඞ්ඝ තෙමේ සද්ධිවිහාරිකයාහට පිරිවෙස දෙන්නේදැයි උද්‍යොග කටයුත්තේය. මූලායපටිකස්සනාහීයෙක් වේද සද්ධිවිහාරිකතෙමේ මානතට සුදුස්සෙක් වේද, අබ්භානාහීයෙක් වේද කිම සංඝ තෙමේ සද්ධිවිහාරිකයාහට මූලායපටිකස්සනය, මානත, අබ්භානය කරන්නේදැයි උපාධ්‍යායයා විසින් උද්‍යොගීවියයුතුයි. සංඝතෙමේ සද්ධිවිහාරිකයාට තජ්ජනීය කර්මය, නියස්ස කර්මය, පබ්බාජනීය කර්මය, පටිසාරණීයකර්මය, උක්ඛෙපනීය කර්මය යන මෙයින් යම්කිසි කර්මයක් කරණු කැමැතිවේද සංඝ තෙමේ කර්මය නොකරන්නේද සැහැල්ලු බවට පිරිනමන්නේදැයි උපාධ්‍යායයා විසින් උද්‍යොගී වියයුතුයි. සද්ධිවිහාරිකයාගේ සිවුර සෝදනු ලබන්නේදැයි උද්‍යොග හෝ කටයුතුයි. සද්ධිවිහාරිකයාට සිවුරක් කටයුතුවේද මෙසේ කරන්නෙහියයි උපාධ්‍යායයා විසින් කියයුතුයි. සිවුරක් කරන්නේදැයි එහි උද්‍යොග හෝ කටයුතුයි. සද්ධිවිහාරිකයාට පඬු ජලයක් පිසියයුතු වේද මෙසේ පිසන්නෙහියයි කියයුතුයි. කිම පඬුජලය පිසන්නේදැයි උද්‍යොග හෝ වියයුතුයි. සද්ධිවිහාරිකයාගේ සිවුර පඬු පොවනු ලබන්නේදැයි උද්‍යොග හෝ කටයුතුයි. පඬු පොවන්නහු විසින් නිසිලෙස පඬු පෙවියයුතුයි. නොඅනුසුන්කල්හි බැහැර නොයායුතුයි. සද්ධිවිහාරික තෙමේ ගිලනෙක් වේද දිවිහිම්කොට උපස්ථාන කරවියයුතුයි. ඔහුගේ රෝගයෙන් නැගීසිටීම බලාපොරොත්තු වියයුතුයි.

## උපාධ්‍යායයා විසින් සද්ධිවිහාරිකයා කෙරෙහි පැවැතිය යුතු වත් රැස පිළිබඳ විනිසයි.

**අනෙතවාසික වත.**

අනෙතවාසික තෙමේ කලින් නැගිට වහන් මුදා පොරෝණය ඒකාංශකොට දැහැටි දඬු දියයුතුයි.. මුව දෝනා පැන් දියයුතුයි. ආසනය පැනවියයුතුයි. කැඳ ඇතිනම් බඳුන සෝදා කැඳ එළවියයුතුයි. කැඳ වැළඳුවායින් පසු ජලයදී බඳුන පිළිගෙණ පහන් කොට නොගටන්නහු විසින් මනාකොට ධෝවනය කර තැන්පත්කර තැබියයුතුයි. ආචාර්‍ය්‍යයා නැගිටිකල්හි ආසනය අකුලා තැබියයුතුයි. ඒ ප්‍රදේශය කසළ සහිත වීනම් හැමැන්දයුතුයි. ඉදින් ආචාර්‍ය්‍යතෙමේ ගමට පිවිසෙනු කැමැත්තේද අඳනය දියයුතුයි. පෙරළු හඳනය පිළිගතයුතුයි. කාබගහ දියයුතුයි. ගුණ සහිතකොට සඟළ සිවුර දියයුතුයි. පාත්‍රය සෝදා දිය සහිතව දියයුතුයි. ඉදින් ආචාර්‍ය්‍යතෙමේ පසුව යන භික්‍ෂුවක් කැමැත්තේද තෙමඬුලු වසා පිරිමඬුලුකොට කැඳ කාඩගහ බැඳ සඟළ සිවුර පොරවා ගණ්ඨිය අමුනා දෙවී පාත්‍රය ගෙණ ආචාර්‍ය්‍යයාගේ පසුව යන මහණෙකු වියයුතුයි. ඉතා දුරින් නොයායුතුයි. ඉතා ලඟ නොයායුතුයි. පාත්‍රයට ඇතුළත්වූ භොජනය පිළිගතයුතුයි. කථාකරණු ලබන ආචාර්‍ය්‍යයාට අතුරු කථා නොහෙළියයුතුයි. ආචාර්‍ය්‍යතෙමේ ඇවැතට සමීපකොට කියනු ලබන්නේ වැළැක්වියයුතුයි. ආචාර්‍ය්‍ය තෙමේ ඇවැතට සමීපකොට කථාකරන්නේ වැළැක්වියයුතුයි. ආපසු හැරෙන්නහු විසින් ප්‍රථමකොට අවුත් ආසනය පැනවියයුතුයි. පා දෝනා ජලය, පා පුටුව, පා පුවරුව සමීපයෙහි තැබියයුතුයි. පෙර ගමන්කොට පා සිවුරු පිළිගතයුතුයි. පෙරළු අඳනය දියයුතුයි. ඇඳ තුබූ අඳනය පිළිගතයුතුයි. ඉදින් සිවුර ඩහ ගන්නා ලද්දේ වීනම් මොහොතක් කල් අව්වෙහි ලා වියලියයුතුයි. අව්වෙහි සිවුර කලක් නොදැමිය යුතුයි. සිවුර හකුලා තැබියයුතුයි. සිවුර හකුලන්නහු විසින් සතරඟුලක් කොට ඔසවා හැකිලියයුතුයි. (නැමීම කරණ තැන දවස්පතා අමුතුකොට නැමීම කටයුතුයි. සියලු දවස්වලම එකතැන නැමීම කෙරේනම් සිවුර දුර්වල වේ. එහෙයින් එසේ නොකටයුතුයි.) මැදින් බිඳීම නොවේවා කියායි. සිවුර නැමූ මැද පූජොකත පර්දි කටයුතුයි. පිණ්ඩපාතය ඇත්තේ වේද ආචාර්‍ය්‍ය තෙමේ වළඳනු කැමැත්තේ වේද පැන් පිළිගන්වා පිණ්ඩපාතය එළවියයුතුයි. ආචාර්‍ය්‍ය තෙමේ පියයුතු ජලයෙන් පිළිවිසියයුතුයි. වැළඳූවාට පසු ජලය දී පාත්‍රය රැගෙණ පහන්කොට මනාව නොගටන්නහු විසින් ධෝවනය කොට දිය සහිත වීනම් මොහොතක් අව්වෙහි තැබියයුතුයි. ("නච උණ්හෙ පතෙතා නිදහිතබෙබා" පාත්‍රය දිය සිඳෙන පමණට වඩා අව්වෙහි නොතැබියයුතුයි) පාත්‍රය හා සිවුර තැබියයුතුයි. පාත්‍රය තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳයට හෝ පුටුව යට හෝ අතගා පාත්‍රය තැබියයුතුයි. සිවුර තබන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුර දමන දණ්ඩ හෝ රැහැණ හෝ පිසදමා පරභාගයෙහිවූ කොණ මැදභාගයට නැමීම ඇත්තක් කොට සිවුර තැබියයුතුයි. ආචාර්‍ය්‍යයානැගිකල්හි ආසනය අකුලා තැබියයුතුයි. පා දෝනා ජලය, පා පුටුව, පා පුවරුව තැන්පත් කටයුතුයි. ඒ ප්‍රදේශය කසළ සහිත නම් හැමැන්දයුතුයි. ආචාර්‍ය්‍යතෙමේ

නහනු කැමැත්තේද නහන ජලය පිළියෙළකළයුතුයි. සිහිල් නහනු උණු නහනු කැමැත්තේනම් ඒ ඒ ජලය පිළියෙල කටයුතුයි. ඉදින් ආචාර්‍ය්‍ය තෙම ගිනිහල්ගෙට පිවිසෙනු කැමැත්තේ වේද සුණුදියෙන් තෙමා පිඬු කටයුතුයි. මැටි තෙම්යයුත්තීය. ගිනිහල්ගෙහි පුටුව දී සිවුර පිළිගෙණ එක්පසෙක්හි තැබියයුතුයි. සුණු දියයුතුයි. මැටි දියයුත්තීය. ඉදින් කැමැත්තේ නම් ගිනිහල්ගෙට පිවිසියයුතුයි. ගිනිහල්ගෙට පිවිසෙන්නහු විසින් පුරෝකත පරිදි පිවිසියයුතුයි. ස්ථවිර භික්ෂූන් ගටා නොසිටියයුතුයි. නවක භික්ෂූහු ආසනයෙන් බැහැර නොකටයුත්තාහ. ගිනිහල්ගෙහි ඇදුරු පරිකර්‍මම කටයුතුයි. ජලයෙහිද ඇදුරු පිළියම් කටයුතුයි. ස්නානය කළාහු විසින් ප්‍රථමයෙන් ගොඩැවිත් තම සිරුර දිය සිඳුවා අඳනය ඇඳ ඇදුරු සිරුරින් ජලය පිසදැමිය යුතුයි. අඳනය දියයුතුයි. සඟළ සිවුර දියයුතුයි. ගිනිහල්ගෙහි පුටුව පැනවියයුතුයි. පා දෝනා ජලය, පා පුටුව, පා පුවරුව එලවියයුතුයි. ආචාර්‍ය්‍ය තෙමේ පියයුතු පැනින් පිළිවිසියයුතුයි. ඉදින් හදුරවාගණු කැමැත්තේ හදුරවා ගතයුතුයි. පිළිවිසිනු කැමැත්තේ පිළිවිසියයුතුයි. යම් වෙහෙරෙක ආචාර්‍ය්‍ය තෙමේ වාසය කෙරේද එම විහාරය කසළ සහිත වේද හැකිනම් ශුද්ධකටයුතුයි. විහාරය ශුද්ධකරන්නහු විසින් පළමුකොට පා සිවුරු බැහැරකොට එකත්පසෙක්හි තැබියයුතුයි. නිසීදනය හා පසතුරුණ, බිස්සභාකන්වයින, ඇඳ, පුටු, මසුවප්‍රතිපාදනයෝ, කෙලපඩික්කම, පිටතබන පුවරුව එකත්පසෙක්හි තැබියයුත්තාහ. බුමතුරුණ පනවනලද ස්ථානය සලකා බැහැරකොට එකත්පසෙක තැබියයුතුයි. ඉදින් විහාරයෙහි කසළ වේද පළමුකොට මකුළුදැල් ශුද්ධ කටයුතුයි. කවුළු සඤ්ඤි කොණ් භාගයෝ පිසදැමිය යුත්තාහ. ඉදින් සිරියෙල් පිළියම් කරණලද බිත්ති කුණු තැවැරුණේ වේද රෙදිකඩක් තෙමා පිසදැමියයුත්තීය. ඉදින් කළුවන් කරණලද බිම කුණු තැවැරුණේ වේද රෙදිකඩක් තෙමා පිසදැමිය යුතුයි. කළුවන් නොකරණලද බිම දිය ඉස හැමැන්දයුතුයි. වෙහෙර කසළ එකතුකොට බැහැර දැමියයුතුයි. බුමතුරුණ නිසිලෙස සකස්කොට යථා ස්ථානයෙහිම පනවා තැබිය යුතුයි. ඇඳ, පුටුව, බිස්සභාකන්වයින, නිසීදනය, කෙලපඩික්කම, පිට තබන පුවරුව නිසිලෙස පනවා තැබියයුත්තාහ. පාත්‍රය හා සිවුර නික්ෂෙපකොට තැබියයුතුයි. පාත්‍රය තබන්නහු විසින් එක අතකින් පාත්‍රය ගෙණ එක අතකින් ඇඳයට හෝ පුටුව යට හෝ පරාමර්ශනය කොට පාත්‍රය තැබියයුතුයි. නො අතුරණලද බිම පාත්‍රය නොතැබිය යුතුයි. සිවුර තබන්නහු විසින් පෙර කියනලද අයුරින් කටයුතුයි. ඉදින් පෙරදිග, බටහිර, උතුර, දකුණු දිගින් රජස් සහිත වාතයෝ හමත්ද ඒ ඒ දිග්හි වාකවුළු වැසියයුතුයි. ඉදින් ශීත කාලය වේද දවල් වාකවුළු හැරියයුත්තාහ. රාත්‍රියෙහි වැසියයුතුයි. උෂ්ණ කාලය වේද දවල් වැසියයුතුයි. රාත්‍රියෙහි හැරියයුතුයි. ඉදින් පිරිවෙණ කසළ සහිත වේද හැමැන්දයුතුයි. පැන් කොටුව, උපස්ථාන ශාලාව, ගිනිහල, වැසිකිළිය කසළ සහිත වේද්ද හැමැන්දයුතුයි. ඉදින් පැන් නොමැතිනම් පැන් එලවා තැබියයුතුයි. පරිභොග කටයුතු පැන් නැත්තේනම් එලවා තැබියයුතුයි. ඉදින් සෝදනා ජලය තබන සැළියෙහි

ජලය නැත්තේ නම් ජලය වත්කළයුතුයි. ආචාර්‍ය්‍යයාහට ශාසනයෙහි නොඇලීමක් වේද අන්තේවාසිකයා විසින් අන් තැනෙක්හි ගෙණයායුතුයි. අනුන් ලවා හෝ ගෙන්වියයුතුයි. ඔහට ධර්‍මකථාවක් හෝ කටයුත්තීය. ආචාර්‍ය්‍යයාහට මිථ්‍යාදෘෂ්ටියක් උපන්නේ වේද අතැවැසියා විසින් පහකටයුත්තීය. අනුන් ලවා හෝ පහකරවිය යුත්තීය. ඔහට ධර්‍මකථාවක් හෝ කටයුත්තීය. ඉදින් ආචාර්‍ය්‍යයා ගරු ඇවැත්කට පැමිණියේ වේද පිරිවෙසට සුදුසුවූයේ කිම සඞ්ඝ තෙමේ ආචාර්‍ය්‍යයාහට පිරිවෙස දෙන්නේදැයි උද්‍යොග කටයුත්තීය. ඉදින් ආචාර්‍ය්‍යතෙමේ මූලායපටිකස්සනාවට යොග්‍යයෙක් වීනම් කිම සංඝ තෙමේ ආචාර්‍ය්‍යයා මූලායපටිකස්සනය කරන්නේදැයි අන්තේවාසිකයා විසින් උත්සුකවිය යුතුයි. මානත්ත–අබ්භානය–(පිළිබඳවද මේ අයුරුමැයි.) ඉදින් සඞ්ඝ තෙමේ ආචාර්‍ය්‍යයාහට කර්‍මය නොකරන්නේද සැහැල්ලුබවට හෝ පිරිනමන්නේදැයි අන්තේවාසිකයා විසින් උත්සුක වියයුතුයි. සංඝයා විසින් ඔහට තජ්ජනීයවූ හෝ– නියස්සවූ හෝ–පබ්බාජනීයවූ හෝ– පටිසාරණීයවූ හෝ– උක්ඛෙපනීයවූ හෝ– කර්‍මයක් කරණලද්දේ වේද කිම ආචාර්‍ය්‍ය තෙමේ මනාකොට පවත්නේද අනුලොම්ව පවත්නේද නිස්තරණය කිරීම පිණිස පවත්නේද සංඝ තෙමේ ඒ කර්‍මය සංසිඳුවන්නේදැයි අන්තේවාසිකයා විසින් උත්සුක වියයුතුයි. ඉදින් ආචාර්‍ය්‍යයාට සිවුරක් කටයුතුවේද අන්තේවාසිකයා විසින් කටයුතුයි. කිම ආචාර්‍ය්‍යයාට සිවුරක් කරණු ලබන්නේදැයි අන්තේවාසිකයා විසින් උත්සාහ කටයුතුයි. ආචාර්‍ය්‍යයාට රඳනක් පිසියයුතු වේද අන්තේවාසිකයා විසින් පිසියයුතුයි. කිම? ආචාර්‍ය්‍යයාට රඳනක් පිසනු ලබන්නේදැයි අන්තේවාසිකයා විසින් උත්සුක වියයුතුයි. (පඬු පෙවීම පිළිබඳවද මේලෙස මැයි.) පඬු පොවනලද සිවුර පොදනුසුන් කල්හි බැහැර නොයායුතුයි. ආචාර්‍ය්‍යයා නොවිචාරා අන්‍යයෙකුට (ආචාර්‍ය්‍යයාට අවැඩ කැමැති විසභාගවූවෙකුට) පාත්‍රය නොදියයුතුයි. අන්‍යයෙකුගේ පාත්‍රය නොපිළිගතයුතුයි. අන්‍යයෙකුට සිවුරක් නොදියයුතුයි. අන්‍යයෙකුගේ සිවුරක් නොපිළිගතයුතුයි. අන්‍යයෙකුට අවශේෂ පරිෂ්කාරයක් නොදියයුතුයි. අන්‍යයෙකුගේ පිරිකරක් නොපිළිගතයුතුයි. අන්‍යයෙකුගේ කේසයෝ නොකැපිය යුත්තාහ. අන්‍යයෙකු ලවා කේසයෝ නොකැප්පවිය යුත්තාහ. අන්‍යයෙකුට (පාදසම්බාහනාදි) පිරියම් නොකටයුතුයි. අන්‍යයෙකු ලවා පිරියම් කරවා නොගතයුතුයි. අන්‍යයෙකුට වතාවත් නොකටයුත්තාහ. අන්‍යයෙකු ලවා වතාවත් නො කරවියයුත්තාහ. අන් අයෙකුට පසුව යන මහණෙක් නොවියයුතුයි. අන් පසුව යන මහණෙක් නොගතයුතුයි. අන්‍යයෙකුගේ පිණ්ඩපාතය නොගෙණ ආයුතුයි. අන්‍යයෙකු ලවා පිණ්ඩපාතය ගෙන්වා නොගතයුතුයි. ආචාර්‍ය්‍යයා නොවිචාරා ගම් නොවැදියයුතුයි. සොහොනට නොයායුතුයි. දිශාවන්හි නොයායුත්තේය. ආචාර්‍ය්‍ය තෙමේ ගිලනෙක් වේද දිවිහිමියෙකොට උපස්ථාන කටයුතුයි. ආචාර්‍ය්‍යයාගේ රොගයෙන් නැගීසිටීම බලාපොරොත්තු වියයුතුයි.

## අන්තේවාසිකයා විසින් ආචාර්‍ය්‍යයා කෙරෙහි පැවැත්විය යුතු වත්රැස පිළිබඳ විනිසයි.

**ආචාර්‍යවත.**

ආචාර්‍ය්‍යයා විසින් අන්තෙවාසික තෙමේ උදෙසීමෙන් පිළිවිසීමෙන් අවවාද කිරීමෙන් අනුශාසනා කිරීමෙන් සඞ්ග්‍රහ කටයුතුයි. අනුග්‍රහ කටයුතුයි. ඉදින් ආචාර්‍ය්‍යයාට (වැඩි) පාත්‍රයක් ඇත්තේ වේද අන්තෙවාසිකයාට පාත්‍රයක් නැත්තේවේද ආචාර්‍ය්‍යයා විසින් අන්තෙවාසිකයාට පාත්‍රයක් දියයුතුයි. කිම? අන්තෙවාසිකයාට පාත්‍රයක් ලැබෙන්නේදැයි උද්‍යොග හෝ කටයුතුයි. ඉදින් ආචාර්‍ය්‍යයාට සිවුරක් ඇත්තේ වේද අන්තෙවාසිකයාට සිවුරක් නැත්තේ වේද ආචාර්‍ය්‍යයා විසින් අන්තෙවාසිකයාට සිවුරක් දියයුතුයි. කිම? අන්තෙවාසිකයාට සිවුරක් ලැබෙන්නේදැයි උද්‍යොග හෝ කටයුතුයි. ඉදින් ආචාර්‍ය්‍යයාට පිරිකරක් ඇත්තේ වේද අන්තෙවාසිකයාට නැත්තේ වේද ආචාර්‍ය්‍යයා විසින් අන්තෙවාසිකයාට පිරිකරක් දියයුතුයි. කිම? අන්තෙවාසිකයාට පිරිකරක් ලැබෙන්නේදැයි ආචාර්‍ය්‍යයා විසින් උද්‍යොග හෝ කටයුතුයි. අන්තෙවාසික තෙමේ ගිලනෙක් වේද (අන්තෙවාසිකයාගේ නැගිටීමට පෙර) කලින් නැගිට දැහැටි දඬු දියයුතුයි. මුවදෝනා ජලය දියයුතුයි. ආසනය පැනවියයුතුයි. ඉදින් කැඳ ඇතිනම් භාජනය සෝදා කැඳ එළවියයුතුයි. කැඳ වැළඳුවාට පසු ජලය දී භාජනය පිළිගෙණ පහත්කොට නොගටන්නහු විසින් තැන්පත්කොට තැබියයුතුයි. අන්තෙවාසිකයා නැගිටිකල්හි අස්න අකුලා තැබියයුතුයි. ඉදින් ඒ ප්‍රදෙශය කසළ සහිත වේද හැමැද්දයුතුයි. අන්තෙවාසික තෙමේ ගම් පිවිසෙනු කැමැත්තේ වේද හඳනය දියයුතුයි. පෙරළූ හඳනය පිළිගත යුතුයි. කාබන්ධන දියයුතුයි. ගුණ සහිතකොට සඟළ සිවුර දියයුතුයි. පාත්‍රය සෝදා ජල සහිතව දියයුතුයි. මෙතෙකින් නවතින්නේයයි ආසනය පැනවියයුතුයි. පා දෝනා ජලය, පා පුටුව, පා පුවරුව සමීප යෙහි තැබියයුත්තාහ. පෙර ගමන්කොට පා සිවුරු පිළිගතයුත්තාහ. පෙරළූ අඳනයදියයුතුයි. අඳනය පිළිගතයුතුයි. ඉදින් සිවුර ඛග සහිත වේද මොහොතක් අව්වෙහි තැබියයුතුයි. උෂ්ණෙහි සිවුර (වැඩිවේලා වක්) නොදැමියයුතුයි. සිවුර හැකිලියයුතුයි. සිවුර හකුලන්නහු විසින් සතරඟුලක් කොණ ඔසවා හැකිලියයුතුයි. (නැමීම කරණ තැන දවස් පතා අමුතුකොට නැමීම කටයුතුයි. සියලු දවස්වලම එක තැන නැම්ම කොරේනම් සිවුර දුබල වේ. එහෙයින් එසේ නොකටයුතුයි.) මැදින් බිඳීම නොවේවා කියායි. සිවුර නැමූ මැද කාබන්ධන කටයුතුයි. ඉදින් පිණ්ඩපාතය ඇත්තේ වේද අන්තෙවාසික තෙමේ වළඳනු කැමැත්තේද ජලය දී පිණ්ඩපාතය එළවියයුතුයි. අන්තෙවාසික තෙමේ පැන් විචාළ යුතුයි. වැළඳූවහුට ජලය දී පාත්‍රය ගෙණ පහත්කොට මනාසේ නොගටන්නහු විසින් ධොවනය කොට දිය සිඳෙනතුරු වියලියයුතුයි. අව්වෙහි පාත්‍රය නො දැමියයුතුයි. පාත්‍රය හා සිවුර නිසිලෙස තැබියයුතුයි. පාත්‍රය තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳයට හෝ පුටුව යට හෝ පරාමසනය කොට පාත්‍රය තැබියයුතුයි. නො අතුරණලද බිම පාත්‍රය නොතැබියයුතුයි. සිවුර තබන්නහු විසින් (ළඹු කෙලෙස) තැබියයුතුයි. අන්තෙවාසිකයා නැගිටිකල්හි ආසනය ඔසවා තැබියයුතුයි. පා දෝනා ජලය, පා පුටුව, පා පුවරුව තැන්පත්

කොට තැබියයුත්තාහ. ඉදින් ඒ ප්‍රදේශය කසළ සහිත නම් හැමැන්ද යුතුයි. අතැවැසි තෙමේ නහනු කැමැත්තේ නම් නානු පිළියෙල කළ යුතුයි. සිහිල් නානුයෙන් ප්‍රයෝජන වේද එය පිළියෙල කටයුතුයි. උණු නහනුයෙන් ප්‍රයෝජන වේද එයද පිළියෙල කටයුතුයි. අතැවැසි තෙමේ ගිනිහල්ගෙට යනු කැමැත්තේ සුණුදියෙන් තෙමා පිඩුකටයුතුයි. මැටිතෙම්යයුත්තීය. ගිනිහල්ගෙහි පුටුව එකත්පස්හි තැබියයුතුයි. සුණු දියයුතුයි. මැටි දියයුත්තීය. හැකිනම් ගිනිහල්ගෙට යායුතුයි. (යට කියනලද අයුරිනි.) ස්ථවිර භික්ෂූන් ගටා නොහින්දයුතුයි. නවක භික්ෂූහු ආසනයෙන් පසු නොබැස්විය යුත්තාහ. ගිනිහල්ගෙහි අත වැසියා පිළිබඳ පරිකම් කටයුතුයි. ගිනිහල් ගෙයින් නික්මෙන්නහු විසින් (පූර්වෝක්ත පරිදි) නික්මියයුතුයි. ජලයෙහිද අතැවැසි පිරියම් කටයුතුයි. ස්නානය කළාහු විසින් පළමු ගොඩැවිත් තම සිරුර දිය සිඳුවා අඳනය ඇඳ අතැවැසියාගේ සිරුරින් ජලය පිසදැමිය යුතුයි. හඳනය දියයුතුයි. සඟළ සිවුර දියයුතුයි. ගිනිහල්ගෙහි පුටුව රැගෙණ පළමුකොට අවුත් ආසනය පැනවියයුතුයි. පා දෝනා ජලය, පා පුටුව, පාපුවරුව එලවියයුත්තාහ. අතෙවාසික තෙමේ පියයුතු පැනින් විචාළ යුතුයි. යම් වෙහෙරක අතැවැසි තෙමේ වාසය කෙරේද එම විහාරය කසළ සහිත වේද හැකිනම් ශුඬකටයුතුයි. විහාරය ශුඬකරන්නහු විසින් පළමුකොට පා සිවුරු බැහැරකොට එකත්පසෙක්හි තැබියයුතුයි. නිසිද නය හා පසතුරුණ, බිස්ස හා කන්වයින, ඇඳ පුටු, මඤ්චප්‍රතිපාදනයෝ, කෙළපඬික්කම, පිටතබන ලෑල්ල එකත්පසෙක්හි තැබියයුත්තාහ. බුම තුරුණ පනවනලද ස්ථානය සලකා බැහැරකොට එකත්පසෙක තැබිය යුතුයි. ඉදින් විහාරයෙහි කසළ වේද පළමුකොට මකුළු දැල් ශුඬ කට යුතුයි. කවුළු සඬි කොන් භාගයෝ පිසදැමිය යුත්තාහ. ඉදින් සිරියල් පිරියම කරණලද බිත්ති කුණු තැවැරුනේ වේද රෙදිකඩක් තෙමා පිසදැමියයුතුයි. ඉදින් කළුවන් කරණලද බිම කුණු තැවරුනේ වේද රෙදිකඩක් තෙමා පිසදැමිය යුතුයි. කළුවන් නොකරණලද භූමිය දිය ඉස හැමැන්දයුතුයි. වෙහෙර කසළ එකතුකොට බැහැර දැමිය යුතුයි. බුමතුරුණ නිසිලෙස සකස්කොට පනවා තුබූ අයුරු පැනවිය යුතුයි. මඤ්චප්‍රතිපාදනයෝද එලෙසම යථාස්ථානයෙහි පනවා තැබිය යුත්තාහ. ඇඳ, පුටුව, බිස්ස හා කන්වයින, නිසීදනය, කෙළපඬික්කම, පිටතබන පුවරුව නිසිලෙස සකස්කොට පළමු පනවා තුබූ අයුරු පැනවිය යුත්තාහ. පාත්‍රය හා සිවුර නික්ෂෙප කොට තැබියයුත්තාහ. පාත්‍රය හා සිවුර තබන්නහු විසින් නිසිලෙස තැබිය යුත්තාහ. ඉදින් පෙර දිගින්–බටහිර දිගින් – උතුරින් – දකුණු දිගින් රජස් සහිත වාතයෝ හමත්ද ඒ ඒ දිග්හි වා කවුළු වැසිය යුත්තාහ. ඉදින් ශීත කාලය වේද දවල් වා කවුළු ඇරිය යුත්තාහ. රාත්‍රියෙහි වැසියයුත්තාහ. උෂ්ණ කාලය වේද දවල් වැසියයුත්තාහ. රාත්‍රියෙහි වා කවුළු හැරිය යුත්තාහ. ඉදින් පිරිවෙණ කසළ සහිත වේද හැමැන්ද යුතුයි. පැන් කොටුව – උපස්ථාන ශාලාව – ගිනිහල–වැසිකිළිය–කසළ සහිත වේද හැමැන්ද යුත්තාහ. වැසිකිළි භාජනයෙහි ජලය නොමවේද

එහි ජලය වත්කළ යුතුයි. අන්තේවාසිකයාහට ශාසනයෙහි නො ඇලීමක් වේද ආචාර්‍ය්‍යයා විසින් හෙතෙම අන්තැනක ගෙණයායුතුයි. අනුන් ලවා හෝ ගෙන්වියයුතුයි. ඕහට ධර්‍ම කථාවක් හෝ කටයුත්තීය. ඉදින් අන්තේවාසිකයා ගරු ඇවතකට පැමිණියේ වේද පිරිවෙසට සුදුසුවූයේ කිම සංඝතෙමේ අන්තේවාසිකයාට පිරිවෙස දෙන්නේදැයි උද්‍යොගකටයුත්තේය. ඉදින් අන්තේවාසික තෙමේ මූලායපටිකස්සනාවට යොග්‍යයෙක් වීනම් කිම, සංඝ තෙමේ අන්තේවාසිකයා මූලායපටිකස්සනය කරන්නේදැයි ආචාර්‍ය්‍යයා විසින් උත්සුක වියයුතුයි. මානත-අබ්භානය-(මෙම අයුරුමැයි) ඉදින් සංඝ තෙමේ අන්තේවාසිකයාට කර්‍මය නොකරන්නේද සැහැල්ලු බවට හෝ පිරිනමන්නේ දැයි ආචාර්‍ය්‍යයා විසින් උත්සුක වියයුතුයි. සංඝයා විසින් ඕහට තජ්ජනීය-නියස්ස-පබ්බාජනීය-පටිසාරණීය-උක්ඛෙපනීය වූ හෝ කර්‍මයක් කරණලද්දේ වේද කිම අන්තේවාසික තෙමේ මනාකොට පවත්නේද අනුලොම්ව පවත්නේද නිස්සාරණය කිරීම පිණිස පවත්නේද සංඝ තෙමේ ඒ කර්‍මය සංසිඳුවන්නේ දැයි ආචාර්‍ය්‍යයා විසින් උත්සුක වියයුතුයි. (පඬු පෙවීම් ආදිය පිළිබඳවද මේ ලෙසමැයි) පඬු පොවනලද සිවුර පොදනුසුන් කල්හි බැහැර නොයායුතුයි. ඉදින් අන්තේවාසික තෙමේ ගිලන් වේද දිවිහිම්කොට උපස්ථාන කරවිය යුතුයි. අන්තේවාසිකයාගේ නැගී සිටීම බලාපොරොත්තු විය යුතුයි.

**ආචාර්‍ය්‍යයා විසින් අන්තේවාසිකයා කෙරෙහි පැවැතිය යුතු වත්රැස පිළිබඳ විනිසයි.**

---

## පසළොස්වන පරිච්ඡේදය නම් තුදුස්වත් විනිසයි.

# පරිශිෂ්ටය.

## සුදින්න.

විසාලා මහනුවරට නුදුරුතැන්හි කලන්දනම් ගමෙකි. එගම සතළිස් කෝටියක් ධනය ඇති කලන්දනම් සිටුවරයෙක් විය. ඔහුගේ පුතනුවෝ සුදින්නයෝයි. දිනක් බුදුහු විසාලා මහනුවර මහත් පිරිසකට දම් දෙස මින් සිටිනා'තර සුදින්නයෝද මිත්‍රයනුත් සමග එතනට පැමිණියාහ.

බණ ඇසූ ඔහුට මහණ වෙන්නට සිත් වූයෙන් මහණකම ඉල්ලන ලදී. මව් පියන්ගෙන් අවසර ගතයුතු බැව් බුදුන් විසින් වදාරණ ලදින් හේ ගොස් මව් පියන්ගෙන් අවසර ඉල්විය. තෙවරක් මහණ වෙන්නට අවසර ඉල්ලූ නමුත් නොලත් හෙයින් "එහිම මැරේය"යි කියවූ මව් පියන් විසින් අකැමැත්තෙන් වුවද පසුව අවසර දෙන ලදින් මහණව උපසම්පදුවද ලැබූ හේ ආරඤ්ඤක පිණ්ඩපාතිකාදි ධූත ගුණයන්ගෙන් යුක්තව විසීය.

දිනක් කලන්දගමට පිඩු පිණිස වැඩමකල උන්වහන්සේ සිය ගෙදරට ද වැඩියෝය. ප්‍රණීත ආහාර පානාදියෙන් වැළඳවූ මව්පිය දෙදෙනාද පුරාණ දුතියිකාවද මෙසේ ආයාචනා කළහ. "මේ රන් රිදී ධන ධාන්‍යාදි මහා සම්පත ලැබ ගිහිගෙහි සිට ඕනෑ පමණ පින්දහම් කළහැක. සිවුරු හරිණු මැනව" කියායි. නැවත නැවතත් එසේ කියනලද නමුත් ඒ උත්සාහය නිෂ්ඵල විය.

සුදින්නස්ථවිරයෝ විසාලාමහනුවර සමීපයෙහි මහවනයට වැඩිසේක පෙර සුදින්න භාර්‍යාව අලඞ්කාර අන්දමින් සරසවා ගත් සුදින්න මාතාව වනයට ගොස් නැවතත් සිවුරු හරිණමෙන් සුදින්න තෙරුන් ගෙන් ඉල්ලුවාය. එයද නිෂ්ඵල වූයෙන් පරපුර පැවැත්ම සඳහා පුතකු ලබාදෙනමෙන් ඉල්ලන ලදුව ඊට සතුටුවූ ස්ථවිරතෙමේ පුරාණ දුතියි කාව සමග තෙවරක් මෙවුන්දම් සෙවීය. එයින් ඈගේ කුසැ දරු ගැබක් හටගත්තේය. ඒ ඇසූ බුදුහු උන්වහන්සේට ගරහා "යොපන භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය පාරාජිකො හොති අසංවාසො"යි වදාළෝය.

## ධනිය.

කුම්භකාරයකුගේ පුත්‍රයෙක්වූ මෙතෙමේ මහණව උපසපන් වූයේ ඉසිගිලි පර්වත පාර්ශ්වයෙක්හි තෘණ කුටියක් කොට එහි විසීය. දර තෘණාදිය ගෙණයන්නට පැමිණි ස්ත්‍රීහු එය කඩාගෙණ ගියෝය. දෙවන තෙවන වරද තනනලද එය ඔව්හු කඩාගෙණ ගියෝය. ඊටපසු හේ මැටියෙන් අලඞ්කාර කුටියක් කොට එහි විසීය. අතිශය-දර්ශනීය මැටිමය එය භික්ෂූන්ට අයෝග්‍යයයි බුදුන් විසින් කඩවනලදි. ඉක්බිති දූවදඬු වලින් කුටියක් කරන්නට සිතූ උන්වහන්සේ දූවදඬු පාලකයා වෙත ගොස් දූවදඬු ඉල්වී, දූවදඬු පාලකතෙමේ මෙසේ කියා රජු සන්තක

නගර ප්‍රතිසංස්කරණාදි උවමනාවක් (අපදාවක්) වූ විට ගැනීම සඳහා දූව දඬු ටිකක් ඇත. රජතෙමේ දෙසිතම් අසා එයින් ගණුමැනව කියායි. ධනිය ස්ථවිරයෝ රජුගෙන් නො අසාම දූවදඬු උවමනා පරිදි කැබලි කොට ගෙණවුත් කුටිය කළෝය. ඒ ඇසූ බුදුහු එසේ නුදුන් දේ ගැණි මෙහි ලා ගරහා දෙවන ශික්‍ෂාපදය පනවා වදාළෝය.

**සෙය්‍යසක.**

බුදුසස්නෙහි මහණව උපසම්පදාව ලැබ සිටි මෙ තෙමේ කාමරාග යෙන් දැවුනේ විය. එහෙයින් හේ කෘශද දුර්වර්ණද වී. උදායි තෙරහු දිනක් සෙය්‍යසකය! තෝ කෘශද දුර්වර්ණද වන්නෙහිය. ඒ කිමදැයි ඇසූ හ. මම බ්‍රහ්මචර්‍යයෙහි නො කැමැත්තෙමි. කාමරාගයෙන් දැවුනේද වෙමි. එහෙයින් එසේ වන්නේයයි හේ කී. උදායි තෙරුන් විසින් මෙසේ කියනලදි. සෙය්‍යසකය! එසේ නම් තෝ හොඳට ඇතිතාක් කා බී නහා හස්තෝපක්‍රමයෙන් සුකුරු මුදව කියායි. හේ එසේ කෙළේ ය. ඉන්පසු ඔහු තරද දශිනියද වූයෙන් භික්ෂූන් විසින් විචාරණ ලදුව එය තත්වූ පරිද්දෙන් කියෙන් භික්ෂුහු බුදුරජනන්වහන්සේට කිවාහුය. ඒ ඇසූ බුදුහු එසේකිරීම තගහම් කොට සුකකවිසඞ්ඨි සංඝාදිසෙසා පත්තිය පනවා වදාළෝය.

**උදායි.**

මුන්වහන්සේ ආරණ්‍යයෙහි දැකුම්කළු පන්සලක් තනාගෙණ ඇඳ පුටු බිසි බිම්බෝහනාදියෙන් එය සමලංකෘත කොට එහි වාසය කළෝ ය. දශීනීය පන්සල බැලීමට බොහෝ මිනිස්සු පැමිණෙති. දිනක් එක් තරු බමුණෙක් සිය බිරිඳත් සමග එය බැලීම සඳහා පැමිණියේය. පන් සල පෙන්වීමට ගිය හේ දෙර ජනෙල් අරිමින් වහමින් පසු පස යමින් බැමිණියගේ අඞ්ග පරාමර්ශණය කෙළේය. දෙවන සංඝාදි සෙසය පැණ වූයේ එය නිමිතිකොට ගෙණය.

**ඡන්න.**

සිදුහත් කුමරු මහබිණික්මන් කරණ විට අශ්වයා මෙහෙය වූ තැනැත්තේ මේ තෙමේය. පසුව ඔහුද මහණ විය. කොසඹෑනුවර වුසූ උන්වහන්සේට උපස්ථායක ගෘහපතියෙක් සිටියේය. ඔහු පන්සලක් තනාදීම සඳහා සුදුසු බිමක් කියන්නට කීය. මූන්වහන්සේ ඒ සඳහා රටවැසියා පුදනු ලැබූ චෛත්‍ය වෘක්‍ෂයක් කප්පවන ලදි. එයට මහ ජනයා දොෂාරොපනය කරන්ට පටන්ගත්හ. ඒ ඇසූ බුදුහු විහාරකාර සඞ්ඝාදිසෙසය පණවා වදාළෝය.

**දෙවදත්ත.**

භද්දියාදි කුමරුන් සමග ගොස් මහණව පඤ්චාභිඥා අෂ්ට සමාපත් හිද නිපදවාගත් මෙතෙමේ අජාසත් කුමරු බියගන්වා පහදාගෙණ මහත් ලාභ සත්කාරද ලැබීය. යළි අජාසත් කුමරු ලවා බිම්බිසාර රජු මැර වීමටද, තමන් විසින් බුදුන් මැරීමටද උපක්‍රම යොදවන ලදි. සඞ්ඝයා භෙදකොට කොටසක් ස්වපක්‍ෂයට ගරවාගන්නා අදහසින් මේ පඤ්ච වස්තූන් පණවන ලෙසද දෙවදත්තයෝ බුදුන්ගෙන් ඉල්වූහ.

1. භික්ෂූහු දිවි ඇතිතාක් අරණ්‍යයෙහි විසිය යුත්තාහ.
2. භික්ෂූහු දිවි ඇතිතාක් පිණ්ඩපාතික විය යුත්තාහ.
3. භික්ෂූහු දිවි ඇතිතාක් පංසුකූලික විසිය යුත්තාහ.
4. භික්ෂූහු දිවි ඇතිතාක් රුක්මුල විසිය යුත්තාහ.
5. භික්ෂූහු දිවි ඇතිතාක් මත්ස්‍ය මාංශ අනුභව නොකළ යුත්තාහ.

එහෙත් එය බුදුහු නොපිළිගත්හ. බුදුහු විසින් අල්පෙච්ඡාදි ගුණයන්හි ගුණ වණ්ත ලද්දේ නමුත් මේවා නො පණවන ලද්දාහ. ඒ කිම යයි තැනින් තැන කියමින් සඞ්ඝයාද (මහජනයාද) හෙදකරන්නට උත්සාහ කොලේය. එ කාරුණෙහි ලා සඞ්ඝභෙද සංඝාදිසෙසය බුදුහු පණවා වදාළසේක. බුදුන්ට සාපරාධී ක්‍රියාකළ මෙතෙම අනන්‍යයෙහි පොළොව පලාගෙණ ගොස් අවීචියෙහි උපන්නේය.

**උපනන්ද.**

ආයුෂ්මත් උපනන්දයෝ දම් දෙසීමට අතිදක්ෂයෝයි. දිනක් එක් සිටු වරයෙක් ඔවුන්වහන්සේ වෙත පැමිණ බණ අසා පැහැදුනේ මෙසේ කීය.—"ස්වාමීනි ඔබවහන්සේට සිව්පසයෙන් යමක් උවමනා නම් මට කියනු මැනව" කියායි. උපනන්දයෝ ඔබ මට දෙනු කැමැත්තෙහි නම් මේ (හැඳ පොරවනලද) දෙවතින් එකක් දුන මැනවයි කීහ. ස්වාමීනි! මා වැනි කුලපුත්‍රයෙක් මෙයින් එකක් දී කෙසේ යම්ද? එසේ නොව මම ගෙදර ගොස් මෙයින් එකක් හෝ මීට වඩා හොඳ සළුවක් හෝ එවන්නම් යයි සිටුතෙමේ කී.

එහෙත් උපනන්ද ස්වාමීහු එයින් එකක් නැවත නැවතත් ඉල්වති. සිටුවරයා එයින් එකක් දී ගියේය. එම්බා සිටුවරය! කිම, "එකසාටක වැ" යයි මිනිස්සු ඇසූහ. සිටුතෙමේ පුවත කීය.

මිනිස්සු "ශ්‍රමණයෝ මහෙච්ඡය, අසන්තුෂ්ටය, ධර්‍මයෙන් නිමන්ත්‍රනය කරන්නට නුසුදුස්සෝ"යයි කියන්නට පටන් ගත්හ. ඒ ඇසූ බුදුහු උපනන්දයන්ට ගරහා අඤාඤාතකප්පවාරිත ශික්ෂාපද පණවා වදාළහ.

**පිළින්දිවච්ඡ.**

දිනක් පිළින්දිවච්ඡ තෙරනුවෝ ලෙනක් කරගනු කැමැත්තෙන් පර්‍වතයක් යට ශුඬකරමින් සිටියෝය. එතනට පැමිණි බිම්බිසාර රජු විසින් ඒ අරමට ආරාමික කුලයන් පන්සියයක් දෙන ලද්දේය. එගම "පිළින්දිවච්ඡ ගම" නමුදු වී. පිළින්දිවච්ඡයෝ ඒ ගම්කයන් කොරෙහි කුලූපග වූවෝය.

එගම මහත් උත්සවයක් විය. ළමයි මල් නෙලා ආභරණාදියෙන් සැරසී ක්‍රිඩා කරමින් සිටියෝය. පිළින්දිවච්ඡයෝ එදින ආරාමික කුලය කට වැඩියෝ හඬමින් සිටි ලදුරියක් දැක මේ කිමැයි ඇසූ. සැරසුනු අන්‍ය ළමයි දැක මල්මාලාදිය ඉල්ලමින් ඈ අඬන්නීයයි මවුපියන් විසින් විසින් කියනලදී. තෘණචුම්බටක (තෘණමාලාවක්) යක් ගත් තෙරුන් වහන්සේ එය හිසෙහි තබවයි කීහ. .. තැබිය. පුදුමයෙකි. එය රන් පියුම් මල්දමක්වී. අලංකාරවූද මහාහිවූද එය දුටු මිනිස්සු මේ දුගියන්ට

මේ තරම් වටිනා එබන්දක් කොයින්ද සොරාගෙණ විය හැකැයි සිතා රජ්ජුරුවන්ටද ඒබව දන්වන ලදි. රජ්ජුරුවන් විසින් ඔව්හු අල්වා ගෙණ යන ලදහ.

ඒ බැව් ඇසූ පිළින්දිවච්ඡයෝ මහා රජ මැදුරට වැඩියෝ මහරජ අස වල් කුලය හිරකරණලද්දේ මන්දැයි ඇසූහ. ස්වාමීනි! ඔවුන් විසින් රන් මල්දමක් සොරකම් කරණ ලදුවයයි රජතෙමේ කීය.

ස්ථවිරයන්වහන්සේ රජපහය ස්වර්ණමය වේවායි අධිෂ්ඨාන කළහ. එය එසේ වී. මහරජ රජපහය ස්වර්ණමය කිරීමට තරම් රන් ඔබට කොයින්දැයි තෙරුන් විසින් අසන ලදි. රජ තෙමේ පුදුම වී බලා, "හො! හෝ!! රන් මාලාවක් තෙරුන්ගේ වැඩක් තමා" යයි සිතා ඒ ඔබගේ ඍද්ධ්‍යානුභාවයෙකැයි කීය. ආරාමික කුලය නිදහස් වීමට වැඩි වේලාවක් නො ගියේය.

මෙහිලා පැහැදුනු බොහෝ මිනිස්සු තෙරුන්ට පස් බෙහෙත් ආදියෙන් බොහෝ සේ පුදන්ට පටන් ගත්තාහ. වළඳ ඉතිරි ඒවා භාජන පුරවාද තැතින් තැන එල්ලාද තබන ලදහ. ඒ දුටු මිනිස්සු දෙස් කිවෝ බුදුරජානන්වහන්සේ විසින් හෙසජ්ජ ශික්ෂාපදය පණවන ලදි.

### හත්‍ථක.

බුද්ධකාලයෙහි ශාක්‍ය කුලයෙන් අසුදුහක් මහණ වූහ. මූන් වහන්සේ ඔවුන් වහන්සේලාගෙන් කෙනෙකි. මූන් වහන්සේ තීර්ථකයන් සමග වාද කෙරෙති. වාද කරණ විට වරක් කියන ලද්ද අවාසියක් දුටුවිට මා විසින් එසේ නොකියන ලද්දේයයි යෙති. වාසියක් වන විට නැවතත් ඔව් එය මා විසින් කියන ලද්දේයයි කියති. අන්‍ය කරුණකින් අන්‍ය කරුණක් වසනු ලැබේ. මෙසේ දැන දැනම බොරු කියයි. ඒ ඇසූ බුදුන් විසින් "සම්පජාන මුසාවාදෙ පාචිත්තියං"යි වදාරණ ලදි.

### අනුරුද්ධ.

දිනක් මූන් වහන්සේ කොසොල් ජනපදයෙහි සිට සැවතට වඩින්නාහු එක් ගමකට සම්ප්‍රාප්ත වූහ. එගම ස්ත්‍රියක් මාර්ගිකයන් උදෙසා විශ්‍රාම ශාලාවක් තනවා තිබිණ. ඇයගෙන් අවසර ගත් අනුරුද්ධ ස්ථවිරයෝ එහි නවාතැන් ගත්හ. එහි නවාතැන් ගැණීම සඳහා ස්ත්‍රියක් ද ආවාය. උන්වහන්සේ පිළිබඳ සිත් ඇති ඕතොමෝ ස්වාමීනි! මිනිසුන් ගෙන් ආකීර්ණවූ විට මෙහි සිටීම දුෂ්කරවෙයි. මම ඔබගේ ඇඳ යට සිටින්නට දැයි ඇසුවාය. උන්වහන්සේ නිශ්ශබ්දවිය. එසේ කළ ඇය සුවඳ ආදිය ගල්වා සුවඳ විහිදුවමින් අවුත් ස්වාමීනි! ඔබ ලක්ෂණය දර්ශනීයය මමද රූපත් වෙමි. දර්ශනීය වෙමි. එහෙයින් මම ඔබගේ බිරින්ද වීමට සතුටුවෙමියි කීවාය. දෙවන තුන්වන වරද එසේ කියනලද නමුත් උන්වහන්සේ නිශ්ශබ්ද වූහ. ඉක්බිති ඕතොමෝ සක්මන් කළාය. හිඳ ගත්තාය. නිදගත්තාය. නිශ්සන්‍ව සිටියාය. තෙරුන් බැලීමකුදු නො කරණලදි. පුදුමයෙකි! බොහෝදෙන සිය දහස් ගණනින් මා පතා එවයි. මා මෙතරම් දේ කොටත් මේ ශ්‍රමණ තෙමේ නිහඬව සිටියි.

යනාදි විසින් හිතූ ඇයට ලැජ්ජ සිතුනි. රෙද්ද හැඳගත්තාය. දෙපා වැඳ සමාව ඉල්ලුවාය. පසුදින ප්‍රණීත ආහාර පානාදියෙන් උන්වහන් සේ වැළඳවූ ඕතොමෝ රත්නත්‍රය සරණ ගිය උපාසිකාවක්ද වූවාය.

## චූලපන්ථක.

මාර්ගයෙහි උපන්නේ පන්ථකය. පසුව උපන් බැවින් චූලපන්ථක නමුදු විය. මුන්වහන්සේගේ මව් තොමෝ සිටු දුවකි. ඒ සිටුගෙදර සිටි දාසයෙකි පියා. වැඩිමල් සොහොවුරු මහාපන්ථක තෙරුන් වෙත මහණව සාරමසක් වීර්යකොටත් එක් ගයක් පාඩම් කරගන්නට නො හැකිවූයෙන් මහාපන්ථක තෙරුන් විසින් එළවා දමනුලැබීය. එයින් ශොකයට පැමිණි චූලපන්ථක තෙමේ විහාර ප්‍රත්‍යන්තයෙහි හඬමින් සිටියේය. ඒ දුටු බුදුන් විසින් කිම හඬන්නෙහිදැයි අසනු ලැබ ඒ පුවත කීය. මහාපන්ථකයන්ට පරපුද්ගලයන් පිළිබඳ ආසයානුසය දැනීමෙක් නැත. තෝ බුඩ වෛනෙය පුද්ගලයෙකැයි වදාළ බුදුන් විසින් සුදු රෙදි කැබැල්ලක් දී මෙය “රජොහරණං රජොහරණං” කියා පිරිමදිනු මැනැවැයි වදාරණ ලදී. එසේ කරණ විට චූලපන්ථකයෝ රහත් වූහ.

එකල්හි භික්ෂුණීන්ට භික්ෂූහු පිළිවෙළින් දම් දෙසත්. මුන්වහන්සේට පැමිණි වාරයෙහි ඍද්ධිප්‍රාතිහාර්ය පා දම් දෙසන-අවවාද කරණ අතර රෑ බෝවූයෙන් භික්ෂුණීහු නගරයෙන් පිට සිට අලුයම නගරයට ගියෝය. ඒ දකින සමහරු මෑලා බ්‍රහ්මචාරිනිහු නම් නොවෙති'යි කීහු. දොස් කීහ. මහජනයා විසින් කියනු ලැබූ දෝෂාරොපන ඇසූ බුදුහු හිර බැසීමෙන් පසු භික්ෂුණීන්ට අවවාද කිරීම-දම්දෙසීම භික්ෂූන්ට තහනම් කර වදාළ සේක.

## බෙල්ලකී සික.

ආරණ්‍යයෙහි වුසූ මුන්වහන්සේ පිඬු පිණිස වඩිනුයේ සාලාතුර කින්ය. වරක් ගෙණගිය ආහාර වියලා තබාගෙණ උවමනා විටක තෙමා වළඳන බැවිනි. එක් දවසක් භික්ෂූහු ඔබ පිඬු පිණිස වඩින්නේ කල කින්ය. ඒ මක්නිසාදැයි ඇසූහ. මම ආහාර වියලා තබාගෙණ වළඳන් නෙමැයි කීය. භික්ෂූන් විසින් එය බුදුන්ට සැළකරණ ලදුව බුදුහු වරක් පිළිගත් දෙය තබාගෙණ වැළඳීම තහනම් කොට සන්නිධිකාරක ශික්ෂා පදය පණවා වදාළ සේක.

## ආනන්ද.

බුදුන්වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩවසන කාලයෙහි සංඝයාට බොහෝ කෑ යුතු දේ ලැබෙන්නට විය. ආනන්ද තෙරුන්විසින් ඒ බැව් බුදුන්ට සැලකරණු ලැබ බුදුහු වැඩිපුර තිබෙන දේ කුස ගින්නෙන් පෙළෙන්නන්ට දෙන්නට නියම කළහ. කුස ගින්නෙන් පෙළෙන්නන් පිළිවෙළින් සිටුවා කැවුම් එක බැගින් බෙදූ දෙන අතර එක් පරිව්‍රාජිකාවකට කැවුම් දෙකක් දෙවුනේය. ඒ දුටු අන් පරිව්‍රාජිකාවක්තොමෝ “අහා! තීගේ සොර සැමියා” යයි කීවාය. “නැත සොරසැමියා නිසා නොව එකැකැයි දෙකක් වැරැදීමෙන් ඇවිත්

තිබේ"යයි ඕ කීවාය. මෙසේ ඔව්හු කොලාහල කරගත්තෝය. ඒ ඇසූ බුදුහු අචෙලක පරිව්‍රාජකයෙකු හෝ පරිව්‍රාජිකාවකට හෝ සියතින් කෑම දීම භික්ෂූන්ට තහනම් කළෝය.

**සාගත.**

එක් දවසක් මුන්වහන්සේ අම්බතිත්ථ ජටිලයාගේ අසපුවට වැඩ එහි ගිනිහල්ගෙයි වැඩ සිටිසේක. එහි ඝෝර විෂ ඇති නාගයෙකි. සාගත තෙරුන් දුටු නා රජතෙමේ විෂධූමය හැරියේය. තෙරුන් විසින් ද එසේ කිරීම් ආදියෙන් නාගයා දමනය කරණු ලැබීය. නාග දමන යෙහි ලා පැහැදුන කොසඹෑනුවර වැසි උපාසකවරු උවමනා කුමක්ද? අසා මද්‍ය ද්‍රව්‍යයෙක් ගෙයක් ගෙයක් පාසා පිළියෙල කළාහුය. එය පානය කොට වැඩි මුන්වහන්සේ නුවර දොරටුව සමීපයෙහි වැටුණාහ. සංඝයා සහිත බුදුරජානන් වහන්සේ එතැනින් වඩිනසේක් ඒ දැක්කාහ. බුදුන් විසින් භික්ෂූන් ලවා තෙරුන් විහාරයට පමුණුවන ලද්දේය. සාගතයෝ බුදුන් දෙසට පා හරවා අගෞරව ලෙස නිදාගත්හ. පෙර බුදුනට මහත්සේ ගෞරව කළ මුන්වහන්සේ එසේ කරනලද්දේ මද්‍යපානයෙ නැයි දැන වදාළ බුදුරජානන් වහන්සේ "සුරාමෙරය පානෙ පාචිත්තියං"යි රහමෙර පානය කිරීම තහනම් කළසේක.

**අරිට්ඨ.**

එක් කාලෙක මොවුන්වහන්සේට මෙබඳු ලාමක අදහසෙක් ඇති විය. බුදුන්වහන්සේ විසින් අන්තරාය කරයයි යමක් වදාරණ ලද්දේ නම් එය එසේ අන්තරායක් නොවේ. "යමක් අන්තරායකර නොවේයයි වදාරණලද නම් එය අන්තරාය කරය කියායි. ඒ මිථ්‍යාදෘෂ්ටිය නැති කිරීමට භික්ෂූන් විසින් උත්සාහ කරණලද නමුත් එය ව්‍යර්ථවිය. ඒ ඇසූ බුදුරජානෝ එබඳු දෘෂ්ටියක් ඇතිවූ විට එය හැරිය යුතුයයි භික්ෂූන් විසින් තුන්වරක් කියයුතුයි. එසේ කියනු ලැබත් පිළිනොගත්තොත් පචිත්තියක් වේයයි වදාළෝය.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු